




# දිනමිණ

The Dinamina | 1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත | දිනමිණ

ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ මැදින් අව විසේනිය ලත් ගුරු දින | කාණ්ඩය 112 | පත්‍රය 91 | පිටු 40 | මිල රු.30 | web: www.dinamina.lk | ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ පුවත් පතකි | 2021 අප්‍රේල් 01 බ්‍රහස්පතින්දා



ස්වර්ණභූමියේ අතීතාවලෝකනය
කුමාරයා
අද පත්‍රය සමග


## නව ව්‍යවස්ථාවක් ගෙනෙන තෙක් පළාත් ඡන්දය කල් දාන්න

හිමිවරු දස නමක් ජනපතිට ලියති පිට 06

## පාස්කු ප්‍රහාර සමයේ කඩු 6,000ක් ගෙනා හැටි සොයන්න CID කණ්ඩායම් දෙකක්

පිට 06

# රවි හංසි යාත්‍රාවේ කෝටි 8100ක කුඩු ගෙනල්ලා



මහින්ද අලුත්ගෙදර

කෝරළයේ විසන්ජම් මුහුදු තීරයේදී ඉන්දීය ආරක්ෂක අංශ මඟින් අත්අඩංගුවට ගනු ලැබූ ශ්‍රී ලාංකික ධීවර යාත්‍රාවේ තිබී සොයා ගන්නා ලද හෙරොයින් තොගයේ වටිනාකම ඉන්දීය රුපියල් කෝටි 3000ක් බව එරට බලධාරීන් අවධාරණය කර තිබේ. පිට 06

**පතරොම් 1000ක් සමඟ ගිනි අවි 5කුත් ළඟ තිබිලා**

# රන්ජන්ට එරෙහි මහින්දානන්දගේ නඩුව සමථයට

## රන්ජන් කනගාටු වුණ නිසා ඉල්ලා අස් කර ගත්තා



රෝෂන් තුෂාර සහ නදී මාණික්කගේ

යහපාලන සමයේදී ප්‍රවෘත්ති සාකච්ඡාවක් කැඳවමින් කරන ලද ප්‍රකාශයකින් වර්තමාන කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතාට අපහාසයක් අපකීර්තියක් සිදු වූයේ නම් ඊට කනගාටුව පළ කරන බව හිටපු ඇමැති රන්ජන් රාමනායක මහතා ඊයේ (31) නුගේගොඩ දිසා අධිකරණයේදී ප්‍රකාශ කිරීම හේතුවෙන් රන්ජන් රාමනායකට එරෙහි නඩුව ඉල්ලා අස් කර ගැනීමට ඇමැතිවරයා කටයුතු කළේය. පිට 06

## ජනපති පොරොන්දුව ඉටු කරයි

## ගම්මිරිස් කිලෝවකට රු. 800ක්

වැඩසටහන මීමුරෙන් අරඹයි

මහින්ද අලුත්ගෙදර

ගම සමඟ පිළිසඳර වැඩසටහනකට සහභාගි වූ අතරතුර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් මීමුරේ ජනතාවට දුන් පොරොන්දුවක් ක්‍රියාත්මක කරමින් ගම්මිරිස් කිලෝ ග්‍රෑමයක් රුපියල් 800 බැගින් මිලට ගැනීමට රජය තීරණය කරයි. පිට 06

## කොවිඩ් මර්දන චීන එන්නත් ජනපතිට භාර දෙයි



නුවන් කොඩිකාර

චීන රජය ප්‍රදානය කළ කොවිඩ් මර්දන එන්නත් තොගය චීන තානාපති චී. ජෙන්හොන් (Qi Zhenhong) මහතා විසින් ඊයේ (31) දහවල් කොළඹ බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපොළේදී ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත නිල වශයෙන් භාර දෙනු ලැබීය.

ජනාධිපතිවරයා චීන ජනාධිපති ෂී ජිං පින් මහතාගෙන් කළ ඉල්ලීම අනුව එන්නත් තොගය ශ්‍රී ලංකාවට ප්‍රදානය කෙරිණි. පිට 06

## අඩු මිලට අද සිට සහල්

නදී මාණික්කගේ

ජනතාවට පොරොන්දු වූ පරිදි අද සිට (01) අඩු මිලට සහල් දෙන බව කෘෂිකර්ම ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ මහතා ඊයේ (31) පැවසුවේය. පිට 06

**නාඩු 97යි**
**කැකුළු 93යි**

## ආණ්ඩුවේ වැඩ ජාතික ආරක්ෂාවට තර්ජනයක්



ආණ්ඩුවේ ක්‍රියාකාරකම් හේතුවෙන් රටේ ජාතික ආරක්ෂාවට තර්ජනයක් වී ඇති බව විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා පවසයි. පිට 06

## උත්සව සමයට සතොසෙන් සහන මල්ලක්



අනුර ප්‍රේමලාල්

සිංහල හා හින්දු අලුත් අවුරුද්ද වෙනුවෙන් සතොස පාරිභෝගික ජනතාවට සහන මල්ලක් දීමට වෙළෙඳ අමාත්‍යාංශය පියවර ගෙන තිබේ. පිට 06

## විෂ පොල් තෙල් ගැන සීඅයිඩියෙන් පරීක්ෂණයක්

පිට 06

## පළමු එන්නත් මෙරට සිටින චීන ජාතිකයන්ට

සන්ධ්‍යා කරුණාරත්න

මෙරට සිටින චීන ජාතිකයන්ට සයිනොෆාම් එන්නත පළමුවෙන්ම දෙන බව වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධානි විශේෂඥ වෛද්‍ය සුදත් සමරවීර මහතා දිනමිණට ඊයේ (31) පැවසුවේය. පිට 06

## පොල්තෙල් ප්‍රතිඅපනයනය විසඳුම නොවෙයි



පිට 06

## ගම්වලට ගිහින් බොරු නොකියා විවාදයකට එන්න

දේශප්‍රේමී එජාප නායක සුගත්ගෙන් සජිත්ට අභියෝගයක් පිට 06

## රිෂාඩ්ට අපහාස නොකරන්නැයි පැනවූ වාරණය 12 දා දක්වා දීර්ඝ කරයි

පිට 06

## බැඳුම්කර නඩුවල ඇප නියෝග අද

රවි ඇතුළු විත්තිකරුවෝ යළි රිමාන්ඩ් පිට 06

## පොල්තෙල් බවුසර් රේගුවට දුන්නැයි මහෙස්ත්‍රාත් පොලිසියට දෙහි කපයි



පිට 06

## ආනයනික භාණ්ඩ 7,500ක්: නියාමනය 1,500ක විතරයි

රේගු අධ්‍යක්ෂ

මහින්ද අලුත්ගෙදර

කේත අංක 7,500ක් යටතේ ආහාර ද්‍රව්‍ය ඇතුළුව යම් යම් ද්‍රව්‍ය ශ්‍රී ලංකාවට ආනයනය කළද මේ වන විට නියාමනය වන්නේ 1,500ක පමණක් බව රේගු අධ්‍යක්ෂ ජනරාල්, මේජර් ජනරාල් විජිත රවිප්‍රිය මහතා ප්‍රකාශ කරයි. පිට 06

## ඩොලරය රු. 202ට නඟී

මහින්ද අලුත්ගෙදර

ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව මෙරට ඉතිහාසයේ පළමු වරට රුපියලේ අගය ඊයේ (31) රුපියල් 202 සීමාව ඉක්මවා ගියේය. පිට 06

## මාස තුනකදී මාර්ග අනතුරුවලින් පොලිසියේ 18ක් මරුට - 72කට තුවාල

පිට 06

## පරිසර විනාශ කරන්නන් අත්අඩංගුවට ගන්න

පොලිස්පතිගෙන් උපදෙස්

සුභාෂිණී සේනානායක

පරිසරය සහ වන විනාශයන් කරන්නන් වහාම අත්අඩංගුවට ගෙන නීතිය හමුවට ඉදිරිපත් කරන ලෙස පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න මහතා සියලු පොලිස් නිලධාරීන්ට දැනුම් දී ඇත. පිට 06



දිනමිණ
The Dinamina
1909 ඇරැඹි ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත

35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341

2021 අප්‍රේල් 01 බ්‍රහස්පතින්දා

# අපි මං තීරුවක ඇවිදිමු

සෑම දිස්ත්‍රික්කයකටම ගැළපෙන අයුරින් ඇවිදින මං තීරු ඉදිකිරීමටත්, නාගරික වන භූමි ඇති කිරීමටත් රජය තීරණය කර තිබේ. මේ දෙකම සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට අදාළ මූලික අඩිතාලම ඇති කරයි. මං තීරු ශාරීරික යෝග්‍යතාව සඳහාය. නාගරික වන භූමි පිරිසුදු වාතය ආශ්වාසය සඳහාය. ඉන්දියාවේ නව දිල්ලි නුවර මිනිස්සු කොවිඩ් කඩා වැදීමට පෙර පටන්ම මුඛ ආවරණ පලඳින්නට පටන් ගත්හ. නව දිල්ලියේ වාතය අපිරිසුදුය. වාතය පිරිසුදු කරන ගහ කොළ ද එහි අඩුය. ව්‍යායාම නොමැතිකම නිසා ලොව පුරා වාර්ෂිකව විශාල පිරිසක් මිය යති. තව පිරිසක් බෝ නොවන රෝගවලට ගොදුරු වෙති. රටක් දියුණුවීමට නම් එහි ජනතාව නීරෝගී විය යුතුය.

ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් හරි අඩකට වඩා පිරිසකට බෝ නොවන රෝග තිබේ. එක්කෝ හෘද රෝගයකි. නැත හොත් ස්වසන රෝගයකි. ඒත් නැත හොත් දියවැඩියාව හෝ අධි රුධිර පීඩනය හෝ තිබේ. 'කොලෙස්ට්‍රෝල්' නමින් අලුත් රෝගයක් ද තිබේ. ජනතාවගේ රෝගී තත්ත්වය දැක බලා ගැනීමට නම් රෝහලක් වෙත යා යුතුය. රජයේ රෝහල් මෙන්ම පෞද්ගලික රෝහල් ද ලෙඩුන්ගෙන් පිරී ඇත. නව රෝහල් ඉදිවෙමින් පවතී. වෛද්‍ය සායන සඳහා නිතිපතාම රෝහල් වෙත ඇදී එන විශාල පිරිසක් සිටිති. චැනල් සේවය ගෙන බැලුව හොත් වෛද්‍යවරයකුට නිවාඩුවක් ගත නොහැකි තරමට ලෙඩ්ඩු සිටිති. මේ හැරෙන්නට කුඩා ඩිස්පෙන්සරිවල ද සෙනඟ පිරී ඇත. බලාගෙන යන විට මුළු රටම රෝගීන්ගෙන් පිරී ඇත.

වෛද්‍ය මතයට අනුව මිනිසා ලෙඩ වීමට බලපාන ප්‍රධාන කරුණු කිහිපයක් තිබේ. එක: හොඳ ආහාර සංස්කෘතියක් නැතිකමය. දෙක: ශාරීරික ව්‍යායාම නැතිකමය. තුන: මිනිසාට හිතකර පරිසරයක් නැතිකමය. හතර: නීරෝගී ජීවිතයකට අවශ්‍ය සෞඛ්‍ය පුරුදු අත හැර දැමීමය. රටේ නිෂ්පාදන ක්‍රියාවලිය සමඟ ද මේ කරුණු බද්ධ වෙයි. ශාරීරික ව්‍යායාම නැති පුද්ගලයා කාර්යක්ෂම ලෙස සිය කටයුතුවල යෙදෙන්නේ නැත. හිතකර පරිසරයක් නැතිකොට මිනිසා ඉබේම ලෙඩ වෙයි. නාගරික තට්ටු නිවාසවල ජීවත් වන පුද්ගලයාට ගහ කොළ සමඟ ගනුදෙනුවක් නැත. ඔහු ජීවත් විය යුත්තේ ගිනි ගහන අව්ව හා දූවිලි සමඟය. මේ තත්ත්වය වෙනස් කිරීම සඳහා නාගරික වන භූමි ඇති කළ යුතුය.

සම්ප්‍රදායට ගරු කරන චීන ජාතිකයා හිමිදිරි උදෑසන පිබිදී ශ්වසන ව්‍යායාම්වල යෙදෙයි. ඔහු බොහෝ විට උදෑසන ආහාරය සඳහා ගනු ලබන්නේ ඖෂධීය පානයකි. චීන ජාතිකයාට අනන්‍ය වූ ආහාර රටාවක් ද ව්‍යායාම රටාවක් ද තිබේ. එම ව්‍යායාම ශාරීරික නම්‍යතාව, ශක්තිය පමණක් නොව, ඔරොත්තු දීමේ ශක්තිය ද වැඩි කරයි. ඉන්දියාවේ සමහරු හිමිදිරි උදෑසන යෝගී ව්‍යායාම කිරීමට පුරුදු වී සිටිති. යෝගී ව්‍යායාම මඟින් බලවත් රෝග පවා සුව කර ගත හැකිය. මේ ව්‍යායාම ක්‍රමය අද බටහිර රටවල් තුළ පවා ප්‍රචලිතය. දියුණු රටවල ජනතාව තම දෛනික ජීවිතයෙන් සැලකිය යුතු කොටසක් ව්‍යායාම සඳහා වෙන් කරති. ව්‍යායාම සංස්කෘතියක් එම රටවල තිබේ. ශ්‍රී ලංකාවේ ද එය ඇති කළ යුතුය. කය වෙහෙසා වැඩ කිරීම එකකි. ව්‍යායාම කිරීම තවත් එකකි. වැඩ කිරීමෙන් ව්‍යායාම්වල අවශ්‍යතාව පිරිමැසෙන්නේ නැත.

හෘදයේ සැත්කම්වලට මුහුණ දුන් බොහෝ රෝගීන්ට දෙන වෛද්‍ය උපදේශනයක් වන්නේ දිනපතාම කි.මී. කිහිපයක් ඇවිදීම කළ යුතු බවය. එහෙත් නාගරිකයා ඇවිදින්නේ කොතැනක ද? ඇවිදීම සඳහා මහා මාර්ගය තෝරාගැනීම පැතිකඩ කිහිපයකින්ම අවදානම් සහගතය. ශ්‍රී ලංකාව යනු රිය අනතුරු බහුල රටකි. මෙරට රියැදුරන් ළඟ පදිකයන් පිළිබඳ අදහසක් ඇත්තේම නැත. මහ පාරේ ඇවිදීමට ගිය ඇතැම්හු රථවාහනවලට යට වී පරලොව ගියහ. තව අතකින් මහ පාරේ ඇවිදිය යුත්තේ වාහන දුම හා දුහුවිල්ල උරමින්ය. එය හෘද රෝගීන් සඳහා කිසිසේත්ම සුදුසු නැත. නගරයේ පමණක් නොව, ග්‍රාමීය ප්‍රදේශවල පවා පාරවල්වල ඇවිදීම නැති කරදර ඇති කරන්නකි. ඇවිදීම සඳහා සුදුසුම ක්‍රමය වන්නේ ඇවිදින මං තීරු භාවිත කිරීමය. එහෙත් රට පුරා ඇවිදින මං තීරු නැත.

මං තීරු සංස්කෘතිය මෙන්ම නාගරික වන භූමි ක්‍රමය ද ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත කළේ ගෝඨාභය රාජපක්ෂ මහතාය. ගෝඨාභය මහතා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස කටයුතු කරන කාලයේ කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්ක තුළ මෙබඳු ස්ථාන ගණනාවක් ඇති කළේය. මුලදී එය ජනතාවගේ වැඩි සැලකිල්ලකට ලක් වූයේ නැති වුව පසුව ජනතාව ඊට හුරු වූහ. අද එකී ප්‍රදේශවල ව්‍යායාම සංස්කෘතියක් බිහි වී ඇත. ඇතැම්හු ගෝඨාභය මහතාට පින් දෙති. කොළඹ නගරය හොඳම පාරිසරික නගරයක් හැටියට අන්තර්ජාතික පිළිගැනීමට ලක් වී ඇත. එහෙත් ගෝඨාභය මහතාගේ ප්‍රතිසංස්කරණවලට පෙර කොළඹ පැවතියේ කසළ ගොඩක් ලෙසය. බංග්ලාදේශයේ ඩකා අගනුවර ලොව අපිරිසිදුම නගරය ලෙස අපකීර්තියට ලක් වී තිබිණි. එහෙත් දැන් එය ප්‍රතිසංස්කරණවලට ලක් වෙයි. නගර හදන්නට පුළුවන. ඒවා හැදිය යුතුය.

රටක් හා ජාතියක් මෙහෙයවන දේශපාලකයන් සෑම අංශයක්ම නිරීක්ෂණය කොට අවශ්‍ය ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. ජාතියක ශාරීරික හා මානසික සෞඛ්‍ය මේ අතින් ඉතා වැදගත් අංශයකි. බුද්ධ දේශනාවට අනුව මිනිසා ලබන පරම ලාභය නීරෝගිකමය. රෝගී ජාතියකට ලෝකයේ සෙසු ජාතීන් සමඟ ඉදිරියට යෑමේ හැකියාවක් නැත. එසේ නම්, රටේ දියුණුවේ පදනම විය යුත්තේ නීරෝගී ජනතාවකි. රජය ඒ ගැන ගැඹුරින් කල්පනා කිරීම බෙහෙවින් වැදගත්ය. ඉහත තීරණයෙන් පෙනී යන්නේ රජය පරිපූර්ණ දැක්මකින් යුතුව රට මෙහෙයවන බවය.

දිල්රුගෙ සීවිදි

| | |
|---|---|
| රැවටෙමින් මුළා වී අන්ධ වූ ලෙස දෙ | ඇස් |
| සිටිති මිනිසුන් බැලූ විටෙක ගණනින් | දහස් |
| බොරු සමඟ වෙසෙන තුරු ඇත්ත කරමින් | උගස් |
| අද නෙවෙයි හැමදාම මෝඩයාගේ | දවස් |

# ජල සම්පත් කළමනාකරණයට නව උපායමාර්ගික ප්‍රවේශයක්



ලෝකයේ සියලු ජීවීන්ගේ ප්‍රාණය රැඳී ඇත්තේ ජලයෙනි. ජලය නොමැතිව කිසිවකුට ජීවත් වීමට නොහැකිය. මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ජලය දේවත්වයෙන් පුදනු ලැබුවේ එහි ඇති විස්මිත බලය සහ ගුණය හේතුවෙනි. පැරණි පඬිවරුන් පවා ජලය සැලකුවේ දිව්‍යමය ඔසුවක් වශයෙනි. බොහෝ රෝගාබාධවලට ජලය තරම් වෙනත් ඔසුවක් මේ මිහිපිට නොමැත. විද්‍යාව, තාක්ෂණය කෙතරම් දියුණු වුව ද මිනිසා ඇතුළු සියලු සතුන්ට පමණක් නොව ගහ කොළට පවා ජලය නොමැතිව ජීවත් විය නොහැකි බව පරම සත්‍යයකි. එය මුළු විශ්වය රඳා පවතින තුරු වෙනස් නොවන, වෙනස් කළ නොහැකි සදාතනික වටිනාකමකි. දිය පිපාසය තරම් උසුලාගෙන සිටීමට නොහැකි අන් කිසිවක් නොමැත. වතුර නොමැති වුව හොත් තොල කට වේළී ගොස් ඉතා ඉක්මනින්ම මරණය කරා ළඟා වීම සිදු වන බව නොරහසකි.

මේ තරම් වටිනා දිව්‍යමය ඖෂධීය පානයක් සොබාදහම් අපට දායාද කොට ඇත. එහෙත් මුළු ලෝකයම ඒ ස්වභාවික දායාදය අහිමි කර ගැනීමේ දරුණු ඛේදවාචකයට මුහුණ දෙමින් සිටිති. අපේ බෞද්ධ සාහිත්‍යයේ එන ශාක්‍ය කෝලිය වංශිකයන්ගේ දරුණු යුද්ධයට හේතු වූයේ රෝහිණී නදියේ ජල ප්‍රශ්නයයි. ඉන්දීය සමාජයේ දැඩි කුල පීඩනය හමුවේ කුලහීනයන්ට කුලීනයන්ගේ පූජනීය ස්ථානවල මෙන්ම පොදු ස්ථානවලින් ජලය බීම පවා සපුරා තහනම් කළේය. මේ හින්දු අමානුෂික ක්‍රියාදාමයට එරෙහිව ඉන්දියාවේ පළමු අධිකරණ ඇමැතිවරයා වූ කුල පීඩනයෙන් පීඩා විඳි ආචාර්ය ආම්බේඩ්කර් සටන් කළේය. ඔවුන් බලහත්කාරයෙන් හින්දූන්ගේ ජල තටාකවලට, පොකුණුවලට පැන ස්නානය කළේ වතුර කාටත් අයිති පොදු සම්පතක් බව තහවුරු කරමිනි. එසේම කුලහීනයන් ගිය පාර පවා කුලීනයන් සෝදා දැමුවේ ජලයෙනි. ජලය ඒතරම් ශුද්ධ වස්තුවක් ලෙස හින්දු සමාජය පමණක් නොව මුළු විශ්ව සමාජයම සැලකීමට, ගෞරවයට පාත්‍ර වූයේ එහි ඇති විශ්ව ශක්තිය නිසාය. රෝගාබාධ රැසකට සුවය දෙන ජලය රෝගාබාධ කීපයකට හේතු වන බව ද පැහැදිලිය. එනම් පාචනය, කොලරාව, අතීසාරය වැනි රෝග ඇතිවන්නේ ජලයෙනි. උපතේ සිට මිය යන මොහොත දක්වා මිනිසා ඇතුළු සත්ත්ව සංහතියම ජලය සමඟ පැවතියේ අවියෝජනීය සබඳතාවයකි. විශේෂයෙන් මිනිසාගේ විවිධ චාරිත්‍ර වාරිත්‍රවලදී පවා ජලයට මුල් තැන දුන් බව නොරහසකි. අපේ සිංහල අලුත් අවුරුද්ද වෙනුවෙන් පැවැති ගනුදෙනු කිරීමේ චාරිත්‍රයේදී පවා ජලය සමඟ ගනුදෙනු කිරීම අපේ සිංහල සංස්කෘතිය හා බැඳී පවතින උතුම් චාරිත්‍රයකි. පෙර රජ දවස පැවැති රාජකීය ජල ක්‍රීඩා තරඟ තුළින් පවා ජලය සමඟ අප අතර පැවැති බැඳීම අරුත් ගැන්වූයේය. තව ද අපේ බෞද්ධ පෙරහර වැනි සංස්කෘතික වටිනාකම්වලදී පවා අවසානයේ දිය කැපීමේ මංගල්‍යයෙන් පවා පෙන්වා දුන්නේ ජලයට ඇති මානව බැඳීම තවදුරටත් සංකේතවත් කරමිනි.

## පානීය ජලය

මුළු විශ්වය පුරාම ජලය බහුලව ඇති උතුම් සම්පතකි. එහෙත් ලෝකයේ ජීවත් වන සෑම මිනිසුන් හතරදෙනකුගෙන් තුන්දෙනෙක්ම පිරිසුදු පානීය ජලය නොමැතිකමින් පීඩා විඳිති.

මහ පොළොව මත රැඳී ඇතැයි සැලකෙන මුළු ජල පරිමාව 1,386,000 km3ක් (ඝන කිලෝමීටර) පමණ උත්තර හා දක්ෂිණ ධ්‍රැව කලාපවල හිම ලෙස පවතියි. ඉතිරිය පොළොව මත ඇති ඇළ දොළ, ගංගා, විල්, වැව් තුළ ද වාෂ්ප ලෙස වායුගෝලයේ ද භූගත ජලය පොළොව මතුපිටට ආසන්න පාෂාණ ස්තර තුළ ද ගබඩා වී ඇත.

මිහිතලය මත වූ මුළු මිරිදිය ප්‍රමාණය සැලකීමේදී එනම් 27,747,720 km3කින් (ඝන කිලෝමීටර) 77%ක් පවතින්නේ ධ්‍රැවයන්හි අයිස් හා හිම වශයෙනි. 72,927,920 km3 (ඝන කිලෝමීටර) ඉතිරිය ඇළදොළ, ගංගා, විල්, වැව් හා වායුගෝලයේ ද පැතිර ඇත. මින් පැහැදිලි වන්නේ මිනිසාට ප්‍රයෝජනයට ගත හැකි ලෙසින් ජලය ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකි.

ජලය ශ්‍රී ලංකාව සතු ප්‍රධානතම ස්වාභාවික සම්පතක් වන අතර, එය අතීතයේ පටන් මෙරට ආර්ථික සංවර්ධනයට දායක වන ප්‍රධානතම සාධකයක් ද වේ. කෘෂිකාර්මික රටක් වන අප ශ්‍රී ලංකාවේ අතීතයේ සිට අද දක්වාම විවිධාකාර වූ වාරි කර්මාන්ත තුළින් මෙරට කෘෂි ආර්ථිකයට දී ඇති දායකත්වය සුවිශේෂ එකකි. ඒ හැරුණු කොට කර්මාන්ත, සේවා සැපයීම, පානීය ජල අවශ්‍යතා පමණක් නොව විනෝදාස්වාදක කටයුතු හා සංචාරක කර්මාන්තයටත්, ජල විදුලිය නිෂ්පාදනයටත් ශ්‍රී ලංකාවේ ජල සම්පත ඉතා වැදගත් මූලාශ්‍රයක් බවට පත් වී තිබේ.

21 වැනි සියවසට අවැසි නව ආර්ථික චින්තනයක් ඔස්සේ සංවර්ධන මඟකට අවතීර්ණය වී ඇති ශ්‍රී ලංකාවේ ජල සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් නව උපායමාර්ගික ප්‍රවේශයක අවශ්‍යතාව ද ජාතික සංවර්ධන සැලසුම් හා න්‍යාය පත්‍රයන්හි අන්තර්ගත වී තිබේ. ශ්‍රී ලංකාව ප්‍රධාන ගංගා ද්‍රෝණි 103කින් සමන්විත රටකි. මෙම ගංගාවලින් 20ක් පමණ වර්ෂය පුරා ගලන ගංගා වන අතර, ඉතිරිය කාලීන ගංගා ගණයට අයත් වේ. විශාලත්වය අනුව ගංගා ද්‍රෝණිවල ප්‍රමාණය වෙනස් වන අතර, එය වර්ග කිලෝමීටර 10 සිට 10,000 දක්වා වෙනස් වේ. භූගෝලීය වශයෙන් සලකා බලන විට ගංගා ද්‍රෝණිවලට අයත් බිම් ප්‍රමාණය ශ්‍රී ලංකාවේ සමස්ත බිම් ප්‍රමාණයෙන් 90%ක් පමණ වේ.

## ජල මූලාශ්‍රය

ශ්‍රී ලංකාවේ විශාල ස්වාභාවික ජලාශ නොමැති වුව ද විවිධ පරිමාණ නිර්මිත වැව් හා වාරි ඇළ පද්ධතියකට හිමිකම් කියනු ලැබේ. සමහර වැව් මීට ශතවර්ෂ ගණනාවකට පෙර ඉදි කර ඇති අතර, වර්තමාන තත්ත්වයට ප්‍රතිසංස්කරණය කර ඇත. මේ වන විට වැව් 14,000ක් පමණ වියළි කලාපීය ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇති අතර, විශාලත්වය අනුව හෙක්ටයාර් 1 සිට 6500 දක්වා විවිධ වේ. කෙසේ වුව ද වැඩි වැව් ප්‍රමාණයක් හෙක්ටයාර් 300ට වඩා විශාලත්වයෙන් අඩුය.

එමෙන්ම වියළි කලාපීය ප්‍රදේශවල වැව් කීපයක් එකිනෙකට සම්බන්ධ වීමෙන් එල්ලංගාව පද්ධති ද (Cascade) ශ්‍රී ලංකාවේ ජලසම්පත් සංරක්ෂණයේදී ඉතා වැදගත් සංරචකයක් වේ. ඉහත දක්වන ලද ජල මූලාශ්‍රවලට අමතරව අතිවිශාල ජල උල්පත් ප්‍රමාණයක් දිවයින පුරා ව්‍යාප්තව පවතී. නිදසුනක් ලෙස නුවරඑළිය දිස්ත්‍රික්කයේ මෙබඳු ජල උල්පත් 1544ක් ද මහනුවර දිස්ත්‍රික්කයේ 204ක් ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ 319ක් ද මොනරාගල දිස්ත්‍රික්කයේ 210ක් ද මාතලේ දිස්ත්‍රික්කයේ 288ක් ද වාර්තා වී ඇති අතර, සමස්ත දිවයිනේ මේ වන විට හඳුනාගෙන ඇති ජල උල්පත් ගණන 3540කි.



මේ හැරුණු විට දිවයිනේ වියළි කලාපීය ප්‍රදේශවල පොළොව අභ්‍යන්තර හුනු ගල් ස්තර අතර පිහිටි භූගත ජල නිධි ද ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍රය අතර ප්‍රධාන ස්ථානයක් ගනී. පානීය ජල අවශ්‍යතාවයන් හා කෘෂිකාර්මික ජල අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා මෙම ජල නිධි සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි.

## ප්‍රධාන සංරචක

පොදුවේ එහෙත් පුළුල්ව සලකා බලන විට 'ජල මූලාශ්‍රය' යන්න පිළිබඳ නිර්වචනයන් විමසීමේදී ගංගා, ඇළ, දොළ, ජලාශ හා ජල පෝෂක, ජල උල්පත් හා තෙත්බිම් පමණක් නොව අයිස් කඳු, හිම පතනයන්, වායුගෝලීය ජල වාෂ්ප, වලාකුළු හා ටොනෙඩෝ (Tonedo) හෙවත් 'දියගොබ වලාවන්' ද ඇතුළත් වේ. එසේ වුවද ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍රය සංරක්ෂණය හා ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රධාන සංරචකයන් 03ක් එහි වැදගත්කම අනුව මෙම ප්‍රතිපත්තිය සැකසීමේදී සැලකිල්ලට ගෙන ඇත. ඒවා පහත දැක්වේ.

අ. ගංගා ඇළ දොළ ඒවායේ රක්ෂිත හා එම ගංගා ආරම්භක ස්ථාන ඇතුළත් ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශ හා (Micro Catchments) ගංගා පිටාර තැනි.

ආ. ස්වාභාවික හෝ කෘත්‍රිම වැව් හා ජලාශ හා විල්ලු ඒවායේ රක්ෂිත හා එම වැව් සහ ජලාශවල 'සමීපතම පෝෂක ප්‍රදේශ' (Immediate Catchments) සහ වාරි ඇළ මාර්ග සහ ඒවායේ රක්ෂිත ඇ. භූගත ජල නිධි හෝ භූතල ජල උල්පතක් හෝ දිය බුබුළක් හෝ එබඳු පොදු පරිහරණයක් සඳහා විභවතාවක් ඇති ස්ථානයක් හා එහි පැවැත්ම තහවුරු වීමට අවශ්‍ය රක්ෂිත සීමාවන්ය.

මේ අනුව බලන කල ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍රය ඒවායේ පෝෂක ප්‍රදේශ හා රක්ෂිත ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට ඇත.

## අවිධිමත් ක්‍රියාකාරකම්

1977න් පසුව ඇති වූ මහා පරිමාණයේ දැව ජාවාරම්කරුවන්ගේ ග්‍රහණයට ලක් වූ අපේ රටේ රක්ෂිතවල තිබූ ජල පෝෂක ප්‍රදේශ පමණක් නොව ජල මූලාශ්‍රය ඉතා ශීඝ්‍රයෙන් සිඳී යෑමේ තර්ජනයට ලක් විණි. අද අප මුහුණ දෙන්නේ ඒ අවිධිමත් ක්‍රියාකාරකම් හමුවේ ඇති වූ ප්‍රතිඵලවලටය. ඒවා ඉතා තීරණාත්මක මෙන්ම ඉතා ඛේදනීය යැයි කීවොත් එය නිවැරැදිය.

මේ තත්ත්වයට වගකිවයුත්තන් අද පැමිණිලිකරුවන් බවට පත් වී ඇත. අනාදිමත් කාලයක සිට ගස් කපමින්, වැලි ගොඩදමමින්, පස් කපමින් සිදු කළ පරිසර විනාශය වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා බලයට පත් වූ මේ සුළු කාලයකදී සිදු වූවක් නොවන බව ඕනෑම පුංචි දරුවෙකු පවා දන්නා පරම සත්‍යයකි. එහෙත් මේ විනාශයේ විත්තිකරුවන් පැමිණිලිකරුවන් බවට පත් වීම තරම් විහිළු සහගත ක්‍රියාවක් තවත් නොමැත. මේ සියලු ක්‍රියාදාමයන්ගේ අවසන් ප්‍රතිඵලය වීමට තිබුණේ පිපාසයට දිය බිඳක් සොයමින් හූල්ලමින් මිය යන ජාතියක් බවට අප පත් වීම පමණකි. එහෙත් මේ තත්ත්වය සැලකිල්ලට ගත් වර්තමාන ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන් සැමට ජලය හිමි කර දෙන ජාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කළේය. රුක් රෝපණය මෙන්ම වාරි සෞභාග්‍යා තුළින් වැව් ප්‍රතිසංස්කරණය කිරීම 'සුරකිමු ගංගා' වැඩසටහන යටතේ අපවිත්‍ර වී ඇති ගංගා පවිත්‍ර කිරීම ආදී පරිසර හිතකාමී වැඩපිළිවෙළක් දියත් කළේය. මෙවර අයවැයෙන් ජල කළමනාකරණය සඳහා බිලියන 1000 (දාහක) මුදලක් වෙන් කළේ ජලය නොමැතිව පීඩා විඳින ජනතාවගේ ජල පිපාසය සංසිඳවීමට බව සිහිපත් කළ යුතුව ඇත.

ජල පෝෂක ප්‍රදේශවල කුඹුක් ගස්, මී ගස් සිටුවමින් සිදු කරන දීප ව්‍යාප්ත පරිසර හිතකාමී වැඩසටහන් ඇසුරෙන් අපේ රටින් අහිමි වී යන ජල සම්පත තවදුරටත් රැකගැනීම ඒකායන අරමුණ බවට පත් වී ඇත. විශේෂයෙන් මේ කටයුත්ත වෙනුවෙන් වර්තමාන අගමැති මහින්ද රාජපක්ෂ මහතා මෙන්ම ජලසම්පාදන අමාත්‍ය වාසුදේව නානායක්කාර මහතා මෙන්ම ජලසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ප්‍රියත් බන්දු මහතා ඇතුළු කාර්ය මණ්ඩලය ගන්නා උත්සාහය අනාගත පරපුරේ ජල අවශ්‍යතාව සපුරා නීරෝගී ජනතාවක් බිහි කිරීමට බව සිහිපත් කළ යුතුව ඇත. ජලය යනු සෞභාග්‍යයේ සංකේතයයි. සමෘද්ධිමත් දේශයක් ගොඩනැඟීමේදී ජලය පණ මෙන් රැකගැනීම අප සියලු දෙනාගේම ජාතික වගකීමයි.




**මහින්ද ආරියවංශ**

# රථවාහන අනතුරුවලට මාර්ගවල ප්‍රමිතිය ඍජුව බලපානවා



## ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අමල් කුමාරගේ

මාර්ග අනතුරු, මාර්ගවල ප්‍රමිතිය සහ රථ වාහනවල අඩුපාඩු නිසා සිදුවන ජීවිත අහිමිවීම් පිළිබඳ වර්තමාන සමාජය තුළ බලවත් කතාබහකට ලක් වෙයි. මේ තත්ත්වයට හේතු මොනවාද ? ඒවා නිවැරැදි කරගන්නේ කෙසේද ? යන්න ගැන ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අමල් කුමාරගේ මහතා සමඟ කළ සාකච්ඡාවකි මේ.

**● මාර්ගවල ප්‍රමිතියක් නොමැතිකම සහ මාර්ග පද්ධතියේ ඇති අඩුපාඩු රටේ රිය අනතුරු බහුල වීමට හේතුවක් වී ඇතැයි බොහෝ අය කියනවා. මේ ගැන ඔබේ අදහස කුමක් ද?**

අද වන විට මාර්ගවල විතරක් නොවෙයි මාර්ග පාවිච්චි කරන රියැදුරාගේ ප්‍රමිතියකුත් නැහැ "ලයිෂන්" දෙන එකේ ප්‍රමිතියක් නැහැ. මාර්ගය පාවිච්චි කරන පදිකයාගේ ප්‍රමිතියක් නැහැ. ඒ විදිහට ගත්තාම රටේ රියැදුරන්ගේත්, පදිකයන්ගේත් හරි ප්‍රමිතියක් නැහැ. ඒ නිසා මාර්ග අනතුරු සිදුවීම මේ මට්ටමෙන් හෝ පාලනය වීම ගැන සතුටු වෙන්න ඕනෑ. පාරක් අලුත්වැඩියා කරන කොට කාපට් එක ඇතිරීම ගැන විතරයි බලන්නේ. ඉන් පසු පාර නඩත්තු වෙන්නෙ කොහොමද කියල සොයා බැලීමක් නැහැ. මහා මාර්ග දෙපාර්තමේන්තුව , ජලාපවහන දෙපාර්තමේන්තුව, ටෙලිකොම් වගේ ආයතන සමග සම්බන්ධීකරණයක් නැහැ. ඒ නිසා වෙන්නේ හදපු අලුත් පාර ඉක්මනට අබලන් වීම, කඩතොලු වීම. මේ විදිහේ දේවල් නිසා පාර අබලන් වීමත් මාර්ග අනතුරු වැඩවීමත් සිදුවෙනවා. මම මේ සඳහන් කළේ එක් දෙයක් පමණයි. රියැදුරන් වාහන ධාවනය කළාට ඔවුන් තුළ තිබිය යුතු මූලික ගුණයක් වන ඉවසීමවත් නැහැ. එහෙම අයට පාරක වාහනයක් ධාවනය කරන්න පුළුවන්ද කියන දේ හොඳින් සිතා බලන්න ඕනෑ. රියැදුරු බලපත්‍රය කොහොම හරි ගත්තාට වැඩක් නැහැ රියැදුරන්ගේ විනය නැතිනම්. අද වෙලා තියෙන්නේ ලොකු සිද්ධියක් වුණාම සති දෙකක් යනකම් ලොකු අවධානයකින් වැඩ කරනවා. ඊට පස්සේ ආයෙත් පුරුදු පීල්ලටම වැටෙනවා. එහෙම වුණාම තමයි අනතුරු ඇති වෙන්නේ.

**● මාර්ගවල ප්‍රමිතිය දීර්ඝ කාලීනව ආරක්ෂා කර ගන්නේ කොහොම ද ?**

අපේ රටේ නැති වුණාට විදෙස් රටවල නම් මාර්ගවල ප්‍රමිතියේ අඩුපාඩු මොනවාද කියන දේ සොයා බලනවා. රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල වාර්ෂිකව විගණනයක් සිදු කරනවා. ඒ විදිහට විදෙස් රටවල විගණනයක් නැති නම් සොයා බැලීමක් මාර්ගවල සිදු කරනවා. අපත් ඒ කාර්යය ඉටු කළ යුතුයි. එහෙම වුණොත් අඩුපාඩු රාශියක් අපට මග හරින්නට පුළුවන්කම ලැබෙනවා.

**● මාර්ගවල ප්‍රමිතිය සහ විනය ඇති කිරීමට රජයට විශාල වගකීමක් පැවරී තිබෙනවා නේද.?**

ඇයි ඔබ රජයට විතරක් වගකීමක් තියෙනවා කියලා හිතන්නේ. ඒ සිතුවිල්ලම වැරැදියි. රජයට විතරක් නිල වශයෙන් වගකීමක් දීලා අපිට අහක බලා ගෙන ඉන්න පුළුවන් ද ? අපට සමාජයක් විදිහට ලොකු වගකීමක් තියෙනවා රටක් විදිහට සාමූහිකව මේ වැඩේට එකතු වෙන්න.

අපේ ක්‍රමය තමයි පස්සර සිද්ධිය වගේ ප්‍රබල දෙයක් වුණාම අවදියෙන් කතා කර කාලයත් සමඟ එය අමතක කිරීම. ඒක කිසිසේත්ම හොඳ දෙයක් නොවෙයි. ජනතාව අතරට යන මාධ්‍යයටත් ලොකු වගකීමක් සහ කාර්ය ප්‍රමාණයක් තියෙනවා. සිදු වීමක් වුණාම "අනේ අපොයි" පන්නයේ නිවුස් ටිකක් දාලා පත්තරේ අලෙවිය චැනල් එකේ "රේටින්" ටික වැඩි කරගෙන වැඩක් නැහැ. අපට පුළුවන්කම තියෙන්න ඕනෑ නිසි දැනුම්වත් කිරීමකට යන්න. උදාහරණයකට ගනිමු කොවිඩ් තත්ත්වය. මෙම තත්ත්වය ගැන ජනතාවට ලොකු දැනුවත් කිරීමක් කරන්න මාධ්‍ය හරහා හැකියාව ලැබුණා. ඒ නිසා ජනතාව මේ වසංගත තත්ත්වය ගැන ලොකු අවබෝධයක් ලබා ගත්තා. රිය පැදවීම මහා මාර්ග භාවිතය වැනි දේ ගැනත් ජනතාව වෙත හොඳ දැනුම්වත් කිරීමක් කළ හැකියි. එහෙම වුණොත් අපට ඇතිවන අනතුරුදායක තත්ත්වයන් පාලනය කිරීමට හැකියාව ලැබේවි.

එහෙම නැතිව අපි අපේ වගකීම හරියට ඉටු කරන්නේ නැතිව අනුන්ට චෝදනා කිරීමෙන් සහ තමන්ගේ වගකීම මඟ හැරීමෙන් වැඩක් වෙන්නේ නැහැ.

## මාර්ග අනතුරු වැළකීම සමාජීය වගකීමක්



### රිය අනතුරුවලින් වසරකට 3000ක් මිය යනවා

### පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කිරීමෙන් රිය අනතුරු අවම කරන්න පුළුවන්

### ජාතික ප්‍රතිපත්තියක් සඳහා විෂය දැනුමක් ඇති උගතුන් එක් කර ගන්න ඕනෑ

**● අනතුරු බහුල වීමටත් ඇති වන අනතුරු මාරාන්තික වීමටත් බලපාන ප්‍රධාන හේතුවක් ලෙස සඳහන් වන්නේ අනාරක්ෂිත වාහන මාර්ගයේ බහුල වීමයි. මේ තත්ත්වය ගැන ඔබේ අදහස පැහැදිලි කළ හැකි ද?**

අපේ රටේ ආරක්ෂිතම ප්‍රවාහන ක්‍රමය විදිහට තියෙන්නේ පොදු ප්‍රවාහන සේවයයි. පස්සර වැනි සිදුවීමක් ඉඳහිට වෙන්න පුළුවන් ඒත්, හැමදාම එහෙම දේවල් වෙන්නේ නැහැ. ඒත් මෝටර් බයිසිකලයක් හැප්පිලා දවසකට දෙන්නෙක් තුන් දෙනෙක් මැරෙනවා. ත්‍රීරෝද රථත් එහෙමයි මේ වාහන තමයි ලෝකයේ ඇති අනාරක්ෂිතම වාහන විදිහට හඳුන්වන්න පුළුවන්කම තියෙන්නේ.

ඒත්, අපේ රටේ සියයට හැත්තෑවක් රියැදුරන්ගේ වාහනය වෙලා තියෙන්නේ මෝටර් සයිකලය නැති නම් ත්‍රීරෝද රථය තවත් පිරිසක් පාවිච්චි කරන්නේ අඩුම වශයෙන් එයාර් බෑග් එකක්වත් නැති මෝටර් රථයක් ඒ වගේ වාහනයකින් මගී ආරක්ෂාව ඇති කරන්න බැහැ. ඒකට ප්‍රධාන හේතුව බවට පත් වෙලා තියෙන්නේ අපේ රටේ වාහන මත පනවා ඇති විශාල බදු ප්‍රමාණයයි. ඒ නිසා සාමාන්‍ය කෙනෙකුට ඉහළ ආරක්ෂාවක් තියෙන වාහනයක් මිලට ගන්න බැහැ. ඒ නිසා තමයි ගොඩක් අය යතුරු පැදි, ත්‍රීරෝද රථ බජට් කාර් මිලට ගන්නෙ. ඒවායේ ආරක්ෂාව අන්තිම පහළ තැනක තියෙන්නේ. ඒ නිසා රජය තීන්දුවක් ගන්න ඕනෑ ආරක්ෂාව වැඩි වාහනවල බදු මුදල් අඩු කර ඒවා පහසුවෙන් මිලට ගත හැකි තත්ත්වයක් ඇති කරන්න එහෙම වුණොත් පමණයි මෙරට රිය අනතුරුවලින් සිදුවන හානි පහළ මට්ටමකට ගෙන ඒමට හැකියාව ලැබෙන්නේ.

**● වසංගත රෝගවලින් සහ සෙසු රෝගවලින් මිය යන ප්‍රමාණය ඉක්මවන පිරිසක් රිය අනතුරුවලින් මිය යන බව සඳහන්. මේ තත්ත්වය ගැන ඔබේ විශ්ලේෂණය මොන වගේද?**

ඔව්. ඇත්තෙන්ම තිස් අවුරුදු යුද්ධයට ජීවිත දහස් ගණනක් බිලි වුණා. ඒත්, රිය අනතුරුවලින් අවුරුද්දකට තුන් දහසකට වඩා පිරිසක් මිය යනවා. තව අවුරුදු කිහිපයක් ගත වෙනකොට රිය අනතුරුවලින් මිය යන ප්‍රමාණය යුද්ධයෙන් මිය ගිය ප්‍රමාණය ඉක්මවා යාමක් සිදු වෙයි. පසුගිය අවුරුද්දෙ සංචරණ සීමා තිබීම නිසා අනතුරු ප්‍රමාණය අඩු වුණත් ඒක වර්තමානය වන විට වැඩිවෙමින් තිබෙනවා.

ඒ නිසා අපේ රටට අනාගතයේ ඇති වෙන්න පුළුවන් ලොකුම අනතුර තමයි රිය අනතුරු බහුල වීම. ඒ නිසා මූලික වශයෙන් කළ යුතු දේ වන්නේ වැඩි වැඩියෙන් පොදු ප්‍රවාහනය ශක්තිමත් කිරීමයි. වාහනයක සුවදායකව යන කෙනෙකුට හෙට ඉඳන් බස් එකේ යන්න කිව්වට ඒක වැඩක් වෙන්නෙ නෑ බලධාරීන් පොදු ප්‍රවාහන පද්ධතිය වර්තමානයට ගැළපෙන විදිහට වෙනස් කළ යුතුයි. පොදු ප්‍රවාහනය හරියට තියෙනවා නම් මිනිස්සු අනතුරක් අතේ තියා ගෙන මෝටර් සයිකලයෙන් කොළඹ එන්නේ නැහැ. මෙතැනදී දුම්රිය පද්ධතියද දියුණු කරන්න පුළුවන්කම තියෙනවා ඇත්තෙන්ම දුම්රිය කියන්නේ ලාභදායි වගේම ඉක්මනින් ගමනාන්ත වෙත යන්න පුළුවන් මාධ්‍යයක්. ඒ නිසා බස් රථ පමණක් නොවෙයි දුම්රිය පද්ධතියෙන් ද සාර්ථක ප්‍රතිඵල ගන්න පුළුවන්.

**● ගමනාගමන ප්‍රමාදවීම්වලට මාර්ග පද්ධතියේ ඇති අඩුපාඩු කොයි විදිහටද බලපාන්නේ?**

මෙහෙමයි. පාරක් හොඳට කාපට් අතුරා අලුත්වැඩියා කළ පමණින් එය දියුණු පාරක් වෙන්නේ නැහැ. මම මුලිනුත් කිව්වා වගේ පාරක් දිගින් දිගටම නඩත්තු කළ යුතුයි. උදාහරණයකට ගනිමු එක් මාර්ගයක් හොඳට හදනවා, කාපට් කරනවා. ඒත්, පටු පාලමක් තියෙනවා. ඒ පාලම පුළුල් කරන්නේ නැහැ. එතැනම තියෙනවා අනතුර අලුත්වැඩියා කළ කාපට් පාරෙ එන කෙනා පාලමේ ගැටෙනවා. ඒකෙන් ඔහුට ජීවිත අනතුරක් වුණත් වෙන්න පුළුවන්. සංවර්ධනයක් කරද්දී එහි නිසි සංවර්ධනයක් තිබිය යුතුයි කියා මා සඳහන් කළේ ඒ නිසයි. මාර්ගයක ප්‍රමිතිය හොඳින් තිබිය යුතුයි කියන්නේ ඒකයි. පාර කාපට් වුණත් අධි වේගී මාර්ගයක් වුණත් ඇත්තෙන්ම එහි ප්‍රමිතිය තියෙන්න ඕනෑ කියල මා කීවෙ ඒකයි. එහෙම හරියට නඩත්තු කරන පාරකින් අපට සාර්ථක ප්‍රතිඵල වගේම කාර්යක්ෂමතාවය වැඩි කර ගන්න පුළුවන්.

**● මාර්ග ආරක්ෂාව ඇතුළු මාර්ග පිළිබඳ රජයේ ප්‍රතිපත්ති කාලයෙන් කාලයට වෙනස් වෙනවා. මේ තත්ත්වය ගැන ඔබේ අදහස පැහැදිලි කළ හැකිද?**

අනිවාර්යෙන්ම මේ ගැන රජය අවධානය යොමු කළ යුතුයි. අවධානය යොමු කරනවා කියන්නේ මැතිවරණයෙන් මැතිවරණයට ආණ්ඩු මාරුවෙන් ආණ්ඩු මාරුවට වෙනස් වන ක්‍රමයක් නොවෙයි. සියල්ලන්ටම පොදු ජාතික ප්‍රතිපත්තියකට අනුගත විය යුතුයි. ඒ සඳහා විෂය පිළිබඳව දැනුමක් ඇති උගතුන් එක් කර ගන්න ඕනෑ. එහෙම වුණොත් අපට අනාගතයේ ඇති විය හැකි අභියෝග ජය ගැනීමට හැකි විදිහට සැලසුම් කරන්න පුළුවන්කම තියෙනවා.

**උදිත ගුණවර්ධන**




## පළාත් සභා මැතිවරණය කල් දැමීම තුළ රටට කිසිදු වාසියක් අත් නොවේ

පළාත් සභා මැතිවරණය පැවැත්විය යුතු ද යන ප්‍රශ්නය මේ දිනවල ප්‍රධාන දේශපාලන මාතෘකාවක් බවට පත්ව තිබේ. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සහාය දක්වන භික්ෂූන් වහන්සේ පිරිසක් පළාත් සභා ඡන්දයක් පැවැත්වීමේ අවශ්‍යතාවක් නැති බවත් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කර ගැනීමෙන් පසුව පමණක් මැතිවරණය පැවැත්වීම පිළිබඳව තීරණය ගත හැකි බවත් ප්‍රකාශ කර තිබේ. ඒ අතර, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පළාත් සභා මැතිවරණය හැකි ඉක්මනින් පැවැත්වීමට කටයුතු කරන ලෙසට අදාළ අංශවලට උපදෙස් දුන් බව ද මාධ්‍යවල වාර්තා විය.

සබරගමුව සහ නැගෙනහිර පළාත් සභාවල නිල කාලය 2017 සැප්තැම්බර් මාසයේදී අවසන් විය. ඉන්පසු කාල පරිච්ඡේදය තුළ අනෙකුත් සියලු පළාත් සභාවල නිල කාලය අවසන් විය. මේ වන විට පළාත් සභා නවයම මහජන නියෝජිතයන්ගෙන් තොරව පවතී. මේ වසරේ සැප්තැම්බර් මාසය වන විට පළාත් සභා මැතිවරණය කල් දමා වසර හතරක් පිරේ.

යහපාලන රජය බලයට පත් වී වසර දෙකක් යෑමටත් පෙර තමන් මුහුණ දී සිටින ජනතා අප්‍රසාදය හමුවේ පළාත් සභා මැතිවරණය ජය ගත නොහැකි බව අවබෝධ කර ගත්තේය. ඒ සඳහා ඇති එකම විසඳුම එම මැතිවරණ කල් තැබීම බව අවබෝධ කරගත් එම පාලනය පළාත් සභා මැතිවරණ පැවැත්වීම කූට ලෙස කල් දැමුවේය. එකල විපක්ෂ නායකයාව සිටි සම්බන්ධන් මහතාගේ නායකත්වයෙන් යුත් ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණවත් ඡන්දය කල් තැබීමට විරුද්ධ වූයේ නැත. ඔහුට අවශ්‍ය වූයේ හැකි සෑම අවස්ථාවකදීම කවරාකාරයකින් හෝ මහින්ද රාජපක්ෂ මහතාට පහර ගැසීම මිස තමන් සැබැවින්ම ද්‍රවිඩ ජනතාවට දුන් බලාපොරොත්තු අනුව කටයුතු කිරීම නොවේ. ද්‍රවිඩ ජනතාවගේ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා වූ ව්‍යාපාරයේ හැරවුම් ලක්ෂ්‍යයක් බවට පළාත් සභා පත් විය. ඒ ඒ පළාත් සභාවල මහජනතාව විසින් තෝරාගන්නා මහජන නියෝජිතයන්ට තමන්ගේ ප්‍රදේශ පාලනය කිරීම සඳහා එමගින් අවස්ථාව සැලසුණි. එහෙත් ඒ බව හෝ නොතකා ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පළාත් සභා කල් දැමීමට එකඟත්වය පළ කළේය. ඒ මහින්ද රාජපක්ෂ මහතා නායකත්වය දුන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ එම පළාත් සභා ඡන්දයෙන් ජය ගන්නා බව ඉතා පැහැදිලිව පෙනෙන්නට තිබූ බැවිනි.

ශ්‍රී ලංකාවේ ප්‍රථම පළාත් සභා මැතිවරණය පැවැත්වූයේ 1988 අප්‍රේල් මස 28 දාය. එදා සිට මේ දක්වා වසර 33ක් ගත වී ඇත. ප්‍රථම පළාත් සභා මැතිවරණයට ජනතා විමුක්ති පෙරමුණ දැඩිව විරුද්ධ විය. එය කඩාකප්පල් කර ගැනීම සඳහා සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබීය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රථම පළාත් සභා මැතිවරණයට තරග කළේ නැත. එහෙත් එම පක්ෂවල ප්‍රතිපත්ති ක්‍රමයෙන් වෙනස් විය. ජනතා විමුක්ති පෙරමුණ පළාත් සභාවලට තරග කර ඒවායේ මන්ත්‍රීධුර හිමිකර ගත්තේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ද ඒවාට තරග කර ඒවායේ බලය හිමි කර ගත්තේය. පළාත් සභා පිහිට වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වෙනි සංශෝධනය මගින් ඒවාට පොලිස් බලතල සහ ඉඩම් බලතල දී තිබුණ ද පළාත් සභාවල බලය අත්පත් කර ගත් එක්සත් ජාතික පක්ෂයත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් ගත වූ වසර 33ක කාලය තුළ කිසිදු අවස්ථාවක එම බලතල ක්‍රියාත්මක කිරීමට පළාත් සභාවලට ඉඩ ලබා නොදුන්නේය.

පළාත් සභා ක්‍රමය පිළිබඳව නැගෙන ප්‍රධාන චෝදනාවක් වන්නේ වාර්ෂිකව රජයේ අරමුදල්වලින් අති විශාල ප්‍රමාණයක් පළාත් සභා සඳහා වෙන් කරන නමුදු ඒ හා සමාන සේවාවක් එම පළාත්වලට නොලැබෙන්නේය යන්නයි. එම මුදල්වලින් වැඩි ප්‍රමාණයක් පඩිනඩි සඳහා වැය වෙන බවයි. බැලූ බැල්මට මෙම චෝදනාවේ සත්‍යයක් ගැබ්ව පවතී. පළාත් සභාවලට රජයෙන් ලැබෙන මුදල්වලින් විශාල ප්‍රතිශතයක් වැටුප් සඳහා වැය කිරීමට සිදුව තිබේ. එහෙත් සැබෑව ඊට වඩා වෙනස්ය. රජය පළාත් සභා පිහිටුවීමෙන් පසු ඒ දක්වා තමන් යටතේ ක්‍රියාත්මක වූ ආයතන, දෙපාර්තමේන්තු සහ කාර්යාල රැසක් ඒවායේ සේවකයන් ද සමඟ පළාත් සභාවලට පවරා දුන්නේය. උදාහරණයක් ලෙස පළාත් සභාවලට පෙර අධ්‍යාපන කටයුතු ක්‍රියාත්මක වූයේ මධ්‍යම රජයෙනි. එහෙත් පළාත් සභා ඇති කිරීමෙන් පසු ගුරුවරු ද සමඟ පාසල් පළාත් සභාවලට පවරා දුන්නේය. දැන් ඒවායේ වැටුප් ගෙවන්නේ පළාත් සභා විසිනි. මේ ආකාරයට මධ්‍යම රජයේ ආයතන පළාත් සභාවලට පැවරීමෙන් පසු ඒ ආයතනවල වැටුප් ගෙවීමට පළාත් සභාවට විශාල වියදමක් දැරීමට සිදු විය. ඒ දක්වා රජය විසින් ගෙවූ වැටුප් දැන් පළාත් සභා විසින් ගෙවනු ලබයි. එය පළාත් සභාවල නාස්තියක් ලෙස හඳුන්වා දීම අසාධාරණය. ඒවා නොකළේ නම් රජය විසින් එම මුදල් ගෙවනු ලබයි.

පළාත් සභා ක්‍රමය හේතුවෙන් රාජ්‍ය පාලනය මහ ජනතාවට වඩාත් සමීප වී ඇතැයි යන්න අමතක කළ නොහැකිය. ඒ ඒ ප්‍රදේශවල අවශ්‍යතාවන් හඳුනා ගැනීමෙන් ප්‍රදේශයටම ආවේණික වූ ස්වරූපයකින් ඒවාට විසඳුම් දීමට පළාත් සභාව නිසා අවස්ථාව සැලසී ඇත. පළාත් සභා තුළින් ප්‍රධාන දේශපාලන ධාරාවට පිවිසෙන පළාත් නායකත්වයක් ගොඩනැගී ඇත.

දැන් නගන ප්‍රශ්නයක් වන්නේ වසර හතරක් තුළ පළාත් සභා නොමැතිව රටම ක්‍රියාත්මක වීමට හැකි වූවා නම් දැන් ඒවා යළි ක්‍රියාත්මක කළ යුත්තේ ඇයි ද යන්නයි. මැතිවරණ නොපැවැත්වීමෙන් පමණක් පළාත් සභා අහෝසි වී නැත. ආණ්ඩුකාරවරයාගේ ප්‍රධානත්වයෙන් පළාත් සභාවට අයත් සියලුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන ක්‍රියාත්මක වේ. එකම අඩුපාඩුව මහජනතාව විසින් පත් කර ගනු ලබන මහජන නියෝජිතයන් දැනට නොසිටීමයි. මහජන නියෝජිතයින් විසින් ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරනු ලබයි. එහෙත් ඒ සඳහා දේශපාලන මඟපෙන්වීමක් සිදු නොවේ.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සහාය දැක්වූ ඇතැම් කණ්ඩායම් පළාත් සභා මැතිවරණය පැවැත්වීම අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරද්දී විපක්ෂය ප්‍රකාශ කරන්නේ තමන් මැතිවරණවලින් පරාජය වන බව දන්නා නිසා ආණ්ඩුව පළාත් සභා මැතිවරණය කල් දමන බවයි. එම මැතිවරණ කල් දැම්මේ දැනට විපක්ෂයේ සිටින පිරිස විසිනි. එය ඔවුන්ටම දැන් මතක නැත. මැතිවරණය කල් දමන බවට දැන් ඔවුහු රජයට චෝදනා කරති. මහින්ද රාජපක්ෂ මහතා කිසිදු අවස්ථාවක මහජනතාව ඉදිරියට යෑමට බිය වූවකු නොවේ. රටේ වැඩිම මැතිවරණ ප්‍රමාණයක් පවත්වා ඇත්තේ ඔහුගේ පාලන කාලය තුළය. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වහා පළාත් සභා මැතිවරණය පවත්වන ලෙස නියම කිරීම තුළ පැහැදිලි වන්නේ මහජනතාවගේ කැමැත්ත විමසා බැලීම සඳහා ඔහුගේ ඇති කැමැත්තයි.

නව ව්‍යවස්ථාවක් සම්පාදනය කරන බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා තමන්ගේ 'සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය' මඟින් ප්‍රතිඥා දුන් අතර එය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රබල ජනවරමක් ලැබී තිබේ. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පළාත් සභා අහෝසි කරන බවට හෝ ඒවායේ මැතිවරණ කල් දමන බවට හෝ කිසිම අවස්ථාවක ප්‍රතිඥාවක් දී නැත.

උතුරු නැගෙනහිර ඇතැම් වර්ගවාදී දේශපාලන පක්ෂ විසින් නිරන්තරයෙන්ම දක්වන අදහසක් වන්නේ එම කොටස් වෙත ප්‍රමාණවත් තරමින් බලය විමධ්‍යගත කිරීමක් සිදුව නැති බවයි. උතුරු නැගෙනහිර පළාත් සභා ඡන්දයට ඉදිරිපත් වී එම සභාවල ක්‍රියාකාරීත්වයට පසුගිය කාලපරිච්ඡේදය තුළ ඔවුන් හවුල් වී සිටින ආකාරය අපට දැක ගත හැකි විය. මැතිවරණය කල් දැමීම ජාතීන් අතර සමඟිය බිඳ දැමීම සඳහාත් ඔවුන් අතර වෛරය වැපිරීම සඳහාත් හේතුවක් කර ගැනීමට සුළු පක්ෂවලට ඉඩක් ලැබේ. ඒ තුළින් අන්තර්ජාතික බලවේගවලට රටට ඇඟිලි ගැසීමට ඉඩක් දීම සඳහා පසුබිමක් සැකසේ.

පළාත් සභා පිහිට වූයේ ඉන්දියාවේ මැදිහත්වීම මත බව සත්‍යයකි. තවමත් ඉන්දියාව පළාත් සභා ක්‍රියාත්මක කිරීමට අපට බල කරන බව ද සත්‍යයකි. එහෙත් පළාත් සභා දැන් අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම කොටසකි. එය සියලු දේශපාලන පක්ෂ විසින් පිළිගෙන ඇත.

අප විසින් විමසා බැලිය යුත්තේ පළාත් සභා ඡන්දය නොපැවැත්වීම තුළ කවර හෝ වාසියක් හෝ ජයක් ශ්‍රී ලංකාවට ලැබේ ද යන්න පිළිබඳවයි. ඒවා වසර 33 ක් රට තුළ ක්‍රියාත්මක විය. වර්ධරාජා පෙරුමාල් පළාත් සභාව ස්වාධීන රාජ්‍යයක් බවට පත් කිරීමට උත්සාහ කළ නමුත් ප්‍රතිඵලයක් අත් නොවීය. ඒවා පැවතීම රටේ ඒකීයත්වයට බලපෑමක් එල්ල නොකරන බව ඉන් පැහැදිලි වේ.

පළාත් සභා මැතිවරණය කල් දැමීම තුළ රටට කිසිදු වාසියක් අත් නොවේ. සිදු වන එකම දෙය රජය අපහසුතාවයට පත් වීමය. අන්තර්ජාතික ඇඟිලි ගැසීම් සඳහා අවස්ථාවක් සලසා දීමය. ජයග්‍රහණය කිරීමට නොහැකි වීම නිසා රජය මැතිවරණය නොපවත්වන බව ප්‍රකාශ කිරීමට විපක්ෂයට අවස්ථාව සලසා දීමය. ඒ සඳහා අවස්ථාවක් සලසා දිය යුතු ද යන්න මහා මැතිවරණය නොපැවැත්විය යුතු බවට ප්‍රකාශ කරන අය සිතා බැලිය යුතුව ඇත.

පළාත් සභා මැතිවරණය කල් දැමීම තුළ කිසිදු ප්‍රයෝජනයක් හෝ ප්‍රතිලාභයක් රටට නොලැබෙන්නේ නම් පළාත් සභා මැතිවරණය තවදුරටත් කල් දැමිය යුත්තේ ඇයි? අප සහාය දැක්විය යුත්තේ රජය තවත් අපහසුතාවයට පත්වන තත්ත්වයකට ඇද දැමීමට නොවේ.

**මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර**

# නව නිෂ්පාදන හෝ සේවා පටන් ගන්නා ව්‍යවසායකයකුට ප්‍රාග්ධනය ඉක්මනින් සැපයීම බැංකුකරුවන්ගේ වගකීමක්

## ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති මහින්ද සාලිය

ජයසිරි මුණසිංහ





ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරි සිසිල් ද සිල්වා

නව නිෂ්පාදනයක් හෝ සේවාවක් ආරම්භ කරන ව්‍යවසායකයකුට අවශ්‍ය ප්‍රාග්ධනය ඉක්මනින් සැපයීම බැංකුකරුවන්ගේ අද දවසේ වගකීම විය යුතු බව ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති මහින්ද සාලිය මහතා ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකාවේ සංවර්ධන බැංකුකරණයේ මහගෙදර නම් ලත් අප බැංකුව වඩාත් කාර්යක්ෂම සහ විශ්වසනීය බැංකුව බවට පත්වෙමින් නව ව්‍යවසායක ප්‍රජාවක් දිරිගන්වා ඉදිරියට ගෙනඒමට කැපවීමෙන් කටයුතු කරන බව ද සභාපතිවරයා සඳහන් කළේය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ බස්නාහිර පළාත් කාර්යාලයේ මෙහෙයවීමෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව කුට්ටිදූව ප්‍රදේශයේ ධීවර ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට ඍජුවම බලපාන බෝට්ටු එන්ජින් සහ ධීවර ආම්පන්න ගැනීම සඳහා අඩු පොලී අනුපාත යටතේ මූල්‍ය පහසුකම් පිරිනැමීම වෙනුවෙන් පසුගිය 25දා පැවති චාම් උත්සව අවස්ථාවක් අමතා අදහස් දක්වමින් සභාපතිවරයා මේ බව කීය.

බැංකුකරුවන් වශයෙන් අපගේ අද දවසේ වගකීම විය යුත්තේ කුමක්දැයි සිතා බැලිය යුතුයි. මේ වන විට රටේ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සහ ඉකුත් පාස්කු ඉරිදා ප්‍රහාරය නිසා ආර්ථිකයේ යම් මන්දගාමී ස්වරූපයක් ඇතිවී තිබෙනවා. එසේ පවතින විට ජනතාවගේ දුප්පත්කම, විරැකියාව, ආදායම් ලැබීමේ විෂමතා වැනි දුර්විපාක පැන නඟිනවා. මේවායින් පීඩාවට පත් නොවී වේගවත් ආර්ථික සංවර්ධනයක්, පුද්ගලයෙක්, ජනසමාජයක්, ප්‍රදේශයක්, රට ළඟාකර ගන්නේ කෙසේදැයි අප කල්පනා කර බැලිය යුතුයි. මෙහිදී අඩපණ වී ඇති කෘෂිකාර්මික වේවා, කාර්මික වේවා, සේවා අංශය වේවා යම් පිබිදීමක් ඇතිකරවන මූල්‍ය ප්‍රදානයන් හැකි තරම් වේගවත්ව හිමිකරදීම කෙරෙහි අපගේ අවධානය යොමු වී තිබේ. නව නිෂ්පාදනයක් සිදුකිරීමට දිරිමත් ව්‍යවසායකයකුට අවශ්‍ය මූලික කාරක ප්‍රාග්ධනය බැංකුකරුවන් වන අප දිය යුතුයි. එසේ කාරක ප්‍රාග්ධනය ලබාදීම තුළ නව නිෂ්පාදනයක්, සේවාවක් බිහිවෙනවා. එවැනි බලගැන්වීමක් ලැබීම තුළ නැවතත් ආර්ථිකයේ පිබිදීමක් සිදුවීම අප සැමගේ අපේක්ෂාවයි. මේ අපේක්ෂා මල්ඵල ගන්වමින් නිෂ්පාදන ක්‍රියාවලියක් තුළ නැවත ආදායම් උපයන තත්ත්වයක් ඇතිවෙනවා. ජනතාව අතර ආදායම් ලැබීම් ඉහළ ගිය විට ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ යනවා. සමාජ තත්ත්වය ඉහළ යනවා. ඒ වගේම ඔවුන් නව ඉතුරුම් කිරීමට පෙලඹෙනවා. ඒ වගේම නව ආයෝජන සිදුකිරීමට උනන්දු වෙනවා. එලෙස නව ආයෝජන ඇතිකොට ජනතාව සවිමත් කිරීමට පුංචි පියවරක් වුණත් අද දවසේ අප ගත හොත් අනාගතයේදී එය විශාල සාර්ථක ව්‍යාපාරිකයෙකු බිහි කිරීමට තරම් සමත්කමක් දක්වනු ඇති. ඒ අනුව මීගමුව ධීවර ප්‍රජාවට යළි නැඟී සිටීම සඳහා මෙම මූල්‍ය ප්‍රදානයන් ලබාදීම සිදු කළා.

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ බස්නාහිර පළාත් ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරි සිසිල් ද සිල්වා මහතා -**


මීට වසර 35කට පෙර ඉතා කුඩාවට ආරම්භ කළ අප බැංකුව යුග කිහිපයක් පසුකර අද මෙවැනි දියුණු තත්ත්වයකට ළඟා වී තිබෙනවා. එදා අප සමඟ මුලින්ම ගනුදෙනු කළ පිරිස් අප හමුවූයේ කුඩා කඩමණ්ඩියක ගසක් යට නැතිනම් පුංචි ගෙදරක මිදුලක. නමුත් අද බැංකුකරුවන් වශයෙන් අපත්, ගනුදෙනුකරුවන් වශයෙන් ඔබත් ඉහළ පහසුකම් ලබන තත්ත්වයකට ළඟා වී තිබෙනවා. මෙය සෑහීමකට පත්විය හැකි තත්ත්වයක් නොවේ. අප තවදුරටත් ග්‍රාමීය දුප්පත්කම තුරන් කළ යුතුව තිබෙනවා. ඒ අරමුණ ජයගැනීම සඳහා කුඩා කණ්ඩායම් වශයෙන් එකතු වූ ධීවර ප්‍රජාව සවිබල ගැන්වීමට 'ගමට සංවර්ධන ණය' වැඩසටහන යටතේ මෙම මුදල් ආධාර හිමිකර දෙන්නේ.

මෙම අවස්ථාවේදී බස්නාහිර පළාත් සහකාර සාමාන්‍යාධිකාරි දීප්ති මහානාම, ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික් කළමනාකරු ඊ. එම්. එම්. බී. ඒකනායක, මීගමුව ශාඛාවේ කළමනාකරු එල්. ඩබ්. ඩී. ආර්. නිශාන්ත, කුට්ටිදූව ධීවර සමිතියේ සාමාජිකා ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නිර්මලා ප්‍රනාන්දු යන මහත්ම මහත්මීහු ද සභාව ඇමතූහ.

මීගමුව වැල්ලවීදිය දේවස්ථානයේ මීසම් සේවක අචින්ත රෙක්සිනිමා පියතුමා විසින් ධීවර යාත්‍රා ආශිර්වාද කිරීම සිදු කරනු ලැබූහ.



ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සභාපති මහින්ද සාලිය, බස්නාහිර පළාත් ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරි සිසිල් ද සිල්වා යන මහත්වරු ධීවර සමිති සාමාජිකාවන්ට ධීවර බෝට්ටු එන්ජින් සහ දැල් ආම්පන්න ගැනීමට මූල්‍ය ප්‍රදානයන් සිදුකළ අවස්ථාවයි මේ.



චන්දිමා ලියනආරච්චිගේ දෙවන කාව්‍ය සංග්‍රහය වන"තත් සිඳ වයමි හද වෙණ" එළි දැක්වීම අප්‍රේල් මස 03 වැනිදා ගම්පහ හොටෙල් කායා ( පැරණි ලංකේශ්) පරිශ්‍රයේදී පැවැත්වේ.

මෙහිදී ප්‍රවීණ ගී පද රචක සුදත් ගාමිණී බණ්ඩාර මුලසුන හොබවන අතර මහාචාර්ය හිනිදුම සුනිල් සෙනෙවි, , කිවිවර වසන්ත ප්‍රියංකර නිවුන්හැල්ල, ගී පද රචක රවී සිරිවර්ධන යන මහත්වරු දෙසුම් පවත්වති

# මුඛ පිළිකා ඇතුළු බරපතළ රෝග රැසකට විසඳුමක් ලෙස හෙළ ඔසු විටක්



ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව නිෂ්පාදනය කළ හෙළ ඔසු විට සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය සහ දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ඇමැති නීතිඥ සිසිර ජයකොඩි මහතා විසින් ආදිවාසී නායක වනස්පති ඌරුවරිගේ වන්නිලඇත්තන්ට ප්‍රදානය කළ අයුරු.

සන්ධ්‍යා කරුණාරත්න

මුඛ පිළිකා ඇතුළු බරපතළ රෝග රැසකට විසඳුමක් ලෙස හෙළ ඔසු විටක් හඳුන්වාදීමට දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය තීරණය කරයි.

ඉඟුරු පියලි, කරාබු නැටි, එනසාල්, කුරුඳු පොතු, මහදුරු වැනි හෙළ ඔසු සහ දේශීය කුළුබඩු ආශ්‍රයෙන් ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාව මගින් මෙම හෙළ ඔසු විට නිෂ්පාදනය කර ඇත.

නිරෝගී සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම උදෙසා හඳුන්වා දුන් මෙම හෙළ ඔසු විට සෞඛ්‍ය ඇමැතිනී පවිත්‍රා වන්නිආරච්චි මහත්මිය සහ දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය ඇමැති නීතිඥ සිසිර ජයකොඩි මහතාගේ ප්‍රධානත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ ලෝටස් උත්සව ශාලාවේදී සිදුකෙරිණ.

තරුණ ප්‍රජාව, රියදුරන් ඇතුළු විවිධ වෘත්තීන්හි නියැලෙන ග්‍රාමීය මෙන්ම නාගරික ජන කොටස් විස සහිත දුම්කොළ හා පුවක් ආශ්‍රයෙන් නිෂ්පාදනය කරන විට සැපීමට ඇබ්බැහිව ඇති නිසා එම ප්‍රජාව ඉන් මුදවා ගැනීමේ අරමුණෙන් මෙම විශේෂිත "සංස්ථා බුලත් සැපේ" විට නිපදවා ඇත.

දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය විසින් බටහිර වෛද්‍ය ක්‍රමත්, ආයුර්වේද හා දේශීය වෛද්‍ය ක්‍රමයේ මෙන්ම අපේ සාම්ප්‍රදායික ජීවන රටාව සහ ආදිවාසී ජනතාව සමඟ සිදු කළ විද්‍යාත්මක පර්යේෂණ මගින් සකසන ලද "බුලත් විටට සැබෑ අරුතක්" ග්‍රන්ථය එළිදැක්වීම ද සිදුකෙරිණ.

මෙම අවස්ථාවට ආදිවාසී නායක වනස්පති ඌරුවරිගේ වන්නිලඇත්තෝ, ශ්‍රී ලංකා ආයුර්වේද සංස්ථාවේ සභාපතිනි සාගලා අබේවික්‍රම, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරියේ සභාපති සමාධි රාජපක්ෂ මහත්ම මහත්මීහු සහභාගී වූහ.

# එක් දිනකදී රුහුණ විශ්වවිද්‍යාලයේ 2174කට උපාධි පිරිනමති

රුහුණ විශ්වවිද්‍යාලයේ (2020) උපාධි ප්‍රදානෝත්සවය කුලපති ධර්මශාස්ත්‍රෝන්නතී ආචාර්ය පූජ්‍ය අකුරටියේ නන්ද මහථේර ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් පසුගිය 26 වැනි රුහුණ විශ්වවිද්‍යාලයීය රබීන්ද්‍රනාත් තාගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරයේ දී පැවැත්විණි.

පෙර පැවති උපාධි ලබා දීමේ උත්සවයන් දින 03 ක් පුරා පැවැත්වූ අතර මෙවර උපාධි ප්‍රදානෝත්සවය (2020) කොරොනා - 19 දෙවැනි රැල්ල ව්‍යාප්තිය හමුවේ කල් දැමීම සිදුකර සෞඛ්‍ය උපදෙස් වලට මුල්තැන දෙමින් එක් දිනක දී සැසි හතරකින් පෙරවරු 07.00 සිට රාත්‍රී 9.42 වන තෙක් උපාධි ලබා දීම සිදු කෙරිණි.

උපාධිලාභීන් පමණක් රබීන්ද්‍රනාත් තාර්ගෝර් අනුස්මරණ ශ්‍රවණාගාරයට ඇතුල් වීමට අවස්ථාව සලසා තිබූ අතර එක් උපාධිලාභියකුට එක් ආරාධිතයකු පමණක් රැගෙන ඒමට අවසර ලබා දීමත් සමඟ ආරාධිත පිරිස සඳහා දේශන ශාලා හයක නව තාක්ෂණය යටතේ නැරඹීම සඳහා පහසුකම් සලසා දී තිබුණි.

මෙවර උපාධි ප්‍රදානෝත්සවයේ දී පීඨ දහයක උපාධිලාභීන් 2174 ක් උපාධි ලබාගත් අතර එම උපාධිලාභීන් අතර රන් පදක්කම් ලාභීන් 48 ක් රන් පදක්කම් ලබා ගත්හ. රන් පදක්කම් 48 ක් ලබා ගත් හෝ විශේෂ දක්ෂතා දැක් වූ උපාධිලාභීන්ගෙන් රන් පදක්කම් 40 ක් උපාධිලාභී ශිෂ්‍යාවන් විසින් හිමි කර ගැනීම විශේෂ සිදුවීමකි.

උපාධි ප්‍රදානෝත්සවයේ දෙවැනි සැසියට සහභාගී වූ රන් පදක්කම් ලාභීන් 48 දෙනා අතරින් රන් පදක්කම් 04 ක් හිම කර ගැනීමට කෘෂිකර්ම පීඨයේ කෘෂි සම්පත් කළමණාකරණ හා තාක්ෂණ විද්‍යාවේදී උපාධිය ලබා ගත් ඩී.එම්. එන්. දිල්රුක්ෂි ශිෂ්‍යාව සමත් විය.

උපාධි ප්‍රදානෝත්සවයේ පළමු සැසියේ ආරාධිත දේශනය රුහුණ විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති වෛද්‍ය පීඨයේ සහ ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විද්‍යාලයේ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුසිරින් මෙන්ඩිස් මහතා විසින් සිදු කෙරුණි.

මෙවර රුහුණ විශ්ව විද්‍යාලයේ 2020 නොවැම්බර් මස උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීමට සැලසුම් කර තිබුණි. නමුත් කෝවිඩ් - 19 දෙවැනි රැල්ලෙහි ව්‍යාප්තිය සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව යම්තාක් දුරකට හෝ තත්ත්වය පාලනයකට ලක් වන තෙක් විශ්වවිද්‍යාලයීය උපාධි ප්‍රදානෝත්සවය කල් දැමීමට තීරණය කරනු ලැබීය. නමුදු උපාධි ප්‍රදානෝත්සවය දැඩි සෞඛ්‍ය නීති රීති යටතේ විද්‍යාර්ථයින්ගේ සහභාගීත්වයෙන් සිදු කරනු ඇත.



# තරුණ තරුණියන්ගේ සෞන්දර්යාත්මක වින්දනයට කොට්ඨාසයකට රුපියල් 50000 බැගින්

සුභාෂිණී සේනානායක



උසස් මානසික ඒකාග්‍රතාවයක් ඇති කර ගැනීම සඳහා තරුණ තරුණියන් සෞන්දර්යාත්මක වින්දනයට ප්‍රවේශ වීම තුළින් සතුටින් සිටින පවුල් පරිසරයක් සමාජයට බිහිකර ගැනීමේ අරමුණින් ජාතික තරුණ සේවා සභාවේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් තෙෂාර ජයසිංහ මහතා විසින් රුපියල් එක්කෝටි හැට හත් ලක්ෂයක් යෞවන සමාජ සම්මේලනයේ ලේකම් වෙත භාර දීම සිදු කෙරිණි.

රට පුරා ඇති එක් තරුණ කොට්ඨාසයකට රුපියල් 50 000.00 බැගින් කොට්ඨාස 334 ක් සඳහා මෙම මුදල් ලබා දීමට නියමිත අතර පෙරේදා 30 නිල වශයෙන් එම මුදලට අදාළ චෙක්පත් භාර දීම මහරගම ජාතික තරුණ සේවා සභාවේදී සිදු කෙරිණි.

තරුණයන්ගේ චින්තනය මානව හිතකාමී වීම සහ ශික්ෂණයකින් යුතු වීම අතිශය වැදගත් බවත් එමෙන්ම පාසල් අධ්‍යාපනය නිම වීමත් සමඟ සමාජානුයෝජන ක්‍රියාවලිය සඳහා තරුණ පරම්පරාවට අවහිර වන ඉඩකඩ අප නිර්මාණය කිරීමට උත්සහ කළ යුතු බවත් මේ අවස්ථාවට එක් වෙමින් ජාතික තරුණ සේවා සභාවේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් තෙෂාර ජයසිංහ මහතා කියා සිටියේය.

තරුණ පරම්පරාවට අවහිර වන ඉඩකඩ අප නිර්මාණය කිරීමට උත්සහ කළ යුතු වුවද එය ඵලදායී මුහුණුවරකින් සිදු කළ යුතුය. එකී කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් සමාජ හිතකාමී ප්‍රවේශයක් ලබා ගැනීම මෙම ව්‍යාපෘතිය මඟින් සිදුකෙරෙන බවත් කියා සිටි ඒ මහතා තරුණයා තුළ වූ නිර්මාණශීලී කලාත්මක හැකියාව ඵලදායී අයුරින්රටේ සුන්දරත්වය,අනන්‍යතාවය, සංස්කෘතිය, අභිමානය, පිළිබිඹු කිරීමෙහිලා යොදවා ගැනීමට ජාතික තරුණ සේවා සභාව සුදානම් බවද සභාපතිවරයා මෙහිදී අවධාරණය කළේය.

සිතුවම්කරණය පමණක් නොව නගර අලංකරණය කෙරෙහි අවධානය යොමු කරමින් ඒ සඳහා භාවිත කිරීමට හැකි නිර්මාණශීලී ක්‍රමවේදයන් උපයෝගීකර ගනිමින් තරුණයන් තුළ වූ නිදහස් සිතුවිලි රටට මුහු කිරීමට හැකියාව මෙම ව්‍යාපෘතිය හරහා අවස්ථාව සැලසෙන බවද කියා සිටි ඒ මහතා මෙමඟින් රට පුරා පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 334 පුරා විහිදී ඇති යෞවන සමාජ තරුණ තරුණියන්ගේ නිර්මාණශීලී චින්තනය උදෙසා නවදිරිගැන්වීමක් ලබා දෙන බවත් අපේකම , අපේ දේ පිළිබඳ පොදු හැඟීමක් , අභිමානයක් ඇති පිරිස එකට ඒකරාශී වූ විට තමන්ගේ ගමට , රටට ගෞරවයක් ඇති වන පරිදි ක්‍රියා කිරීමට උත්සහ කරනු ඇති බවත් අවධාරණය කළේය.

ඒ සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන සහ අවශ්‍ය දායකත්වය ලබා දීම "ලස්සන රටක්" නව ව්‍යාපෘතිය මඟින් සිදු කෙරෙන බව කියා සිටි සභාපතිවරයා මෙහි මූලික අරමුණු වන්නේ අ.පො.ස සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ නිමා කර සිටින තරුණ තරුණියන්ගේ විවේක කාලය රටේ අභිවෘද්ධිය උදෙසා ඵලදායී ආකාරයෙන් යොදා ගැනීම බවත් විභාග වලින් පසුව ලැබෙන අවකාශය තුළ ඇති කරන රික්තකය නිසා තරුණ තරුණියන් ඍණාත්මක ප්‍රවේශ සඳහා ඇදී යාමට ඇති ඉඩකඩ අසුරවමින් ඔවුන්ට සම වයස් කණ්ඩායම් සමඟ පොදු අරමුණු සඳහා එක්වීමට අවස්ථාව සැලසීම සහ එමඟින් රටට වැඩදායී කාර්යක් සිදු කිරීමට දායකත්වය ලබා දීම බවද කියා සිටියේය. එමෙන්ම එම තරුණ තරුණියන් ජාතික තරුණ සේවා සභාව මඟින් සිදු කරන අධ්‍යාපන හා නායකත්ව වැඩසටහන් සඳහා යොමු කර ගැනීම, තරුණ තරුණියන්ට තමන් ජීවත්වන ප්‍රදේශය පිළිබඳ හැඟීමක් ඇති කිරීම, යෞවන සමාජ තරුණ තරුණියන්ට සිය ගම/නගරය තුළ පිළිගැනීමක් ඇති සමාජයට වැඩදායී පිරිසක් යන දැක්ම සෙසු පිරිස තුළ ඇතිකරවීම, රටේ විවිධ ප්‍රදේශ තුළ වූ අනන්‍යතාවයන් ඉස්මතු කර පෙන්වා, සිතුවම්කරණය සහ නගර අලංකරණය විෂය ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන කණ්ඩායම් සඳහා අභිප්‍රේරණයක් ලබා දීම, පරිසරහිතකාමී තරුණ පිරිසක් නිර්මාණය කිරීම මෙහි අරමුණ බවද සභාපතිවරයා අවධාරණය කළේය.

ඡායාරූප ලයනල් පී පෙරේරා - කැලණිය විශේෂ

# පොල්තෙල්වල ප්‍රමිතිය සොයා බලන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මිස ආණ්ඩුව නොවේ

## ඇමැති ජෝන්ස්ටන් ප්‍රනාන්දු

ක්‍රිසන්ති විතාරණ



පොල්තෙල්වල ප්‍රමිතිය සොයා බලන්නේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මිස ආණ්ඩුව නොවන බව ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා පැවසීය.

ඇමැතිවරා මේ බව පැවසුවේ පසුගිය (30) දා කුරුණෑගල කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේ පැවැති දිස්ත්‍රික්කයේ සංවර්ධන කමිටු රැස්වීමට සහභාගි වෙමිනි

මෙහි දී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක මාර්ග සංවර්ධන ව්‍යාපෘතීන්, වාරි සෞභාග්‍යා වැඩසටහන මගින් ක්‍රියාත්මක වාරිමාර්ග ව්‍යාපෘතීන්, දේශීය ආහාර ප්‍රවර්ධන වැඩසටහන්, විදුලිය නොමැති අඩු ආදායම්ලාභී පවුල් වෙනුවෙන් විදුලිය ලබා දීමේ ව්‍යාපෘතීන්, පානීය ජල ගැටලුවට විසඳුම් ලබා දීම, ඉඩම් ඔප්පු ලබා දීම ඇතුළු කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාවට බලපාන පොදු ගැටලු පිළිබඳ සාකච්ඡා කළ අතර ඒවා කඩිනමින් විසඳීමට අවශ්‍ය උපදෙස් අදාළ රාජ්‍ය නිලධාරීන්ට ලබා දෙන ලදී.

මෙම රැස්වීමෙන් අනතුරුව මාධ්‍යවේදීන් විසින් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු දුන් ඇමැතිවරයා.

බදු වලින් නිදහස් වී රටට ආයෝජකයන් එනවා නම් ඒක හොඳයි. එදා ජේ.ආර් ජයවර්ධන මහත්තයා තමයි බදු නිදහස් කෙරුවේ. දැන් තමයි විපක්ෂයට බදු නිදහස් කරන ඒවා පෙනෙන්නේ. බදු නිදහස් කරන ඒවා විවෘත ආර්ථිකය හරහා මේ රටට ඉගැන්නුවෙ එක්සත් ජාතික පක්ෂයයි. ආයෝජකයෝ එනකොට ආයෝජකයන් මේ රටට ගෙන්නගන්න අපිට ක්‍රම සහ විධි තියෙන්න ඕන. එම නිසා නිදහස් කළ යුතු බදු අපි නිදහස් කළ යුතුයි. ඒවා වළක්වනවා කියන්නේ ආයෝජකයෝ මෙරටට එන එක නතර කරන්න හදන වැඩපිළිවෙළක්. බදු දුන්නා, බදු නිදහස් කරා කිය කිය විපක්ෂය කරන්න හදන්නෙ මේ රටට ආයෝජකයො එන එක නවත්වන්න. ආයෝජකයන්ව මේ රටට ගෙන්වගන්න තියන ක්‍රමයක් තමයි මේ ක්‍රමය.

වරාය නගර සැලසුම් පනත මම සම්පූර්ණයෙන් කියවලා නැහැ. කැසිනෝ සමාජ ශාලා දැනටත් ශ්‍රී ලංකාවෙ තිබෙනවා. කැසිනෝ සමාජශාලා මේ රටට ගෙනාවෙත් එක්සත් ජාතික පක්ෂයයි. මේ සූදු සියල්ල ශ්‍රී ලංකාවට ගෙනාවෙ එක්සත් ජාතික පක්ෂය.මතක නැද්ද සජිත් ප්‍රේමදාස මහත්තයාගෙ තාත්තා ජෝසිම් ගෙනාවෙ ලංකාවට ඒ කාලෙ හිටපු කැසිනෝ රජානෙ.

පිළිකා කාරක පොල්තෙල් වෙළඳපොළේ තියනව කියලා මතයක් යනවා. ඒ සම්බන්ධයෙන්

රජයක් විදියට නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. පොල්තෙල් විතරක් නෙවෙයි සත්ව ආහාර පවා මිනිස්සුන්ගෙ පරිභෝජනයට ගෙනාව කියලා ලංකා ඉතිහාසයේ අපි අහල තියනවා. මේවා ව්‍යාපාරිකයො කරන දේවල්. ඔවුන් හිතාමතා කරනවාද හොරෙන් කරනවද කියල දන්නේ නැහැ. කොහොම කෙරුවත් ඒවයේ ප්‍රමිතිය බලන්න ශ්‍රී ලංකාවේ ප්‍රමිති ආයතන තියනවා. ඒ ආයතන හරහා මේ සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. ආණ්ඩුව පොල්තෙල් ගේන්නේ නැහැ. අපේ ආණ්ඩුව එවැනි දේවලට කිසිසේත්ම ඉඩ දෙන ආණ්ඩුවක් නෙවෙයි. ඒ නිසා තමා මේ දේවල් අපිට අහුවෙන්නෙ. එම නිසා නීතිය අනුව දඬුවම් කළ යුතුයි යනුවෙන්ද පැවැසීය.

# 'හරිත' රූපවාහිනී නාලිකාවේ මංගල විකාශය ජනපති අතින් ඇරඹේ









**නුවන් කොඩිකාර**

'හරිත' රූපවාහිනී නාලිකාවේ මංගල විකාශය ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (31) පෙරවරුවේ කොළඹ හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී ආරම්භ කෙරිණ.

කෘෂි කර්මාන්තයෙන් පෝෂිත මෙරට අතීත සෞභාග්‍යය යළි උදාකරණු පිණිස ආගමික පසුබිමක් තුළ යහපත් කෘෂි ආර්ථිකයකට මඟ පෙන්වීම නාලිකාවේ ප්‍රධාන අරමුණයි.

කෘෂි කර්මාන්තයෙන් ජීවත් වන ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම, නව කෘෂි තාක්ෂණවේදීය ක්‍රම සහ පුරාතනයේ පැවති උසස් කෘෂි තාක්ෂණික විධි නැවත ස්ථාපනය කිරීම, පාරිසරික සුරක්ෂිතතාවය ආරක්ෂා කිරීම, වාරි හා ධීවර කර්මාන්ත ඇතුළු සෑම ක්ෂේත්‍රයකින්ම ජනතාව දැනුමින් පෝෂණය කිරීම හරිත ටීවී තුළ අන්තර්ගත මූලික සංකල්ප වේ.

"හෙළවත්, හරවත්, හිතවත්" යන්න එහි තේමාවයි."හරිත" රූපවාහිනී නාලිකාව ගංගාරාම විහාරස්ථානයට අනුබද්ධ ශ්‍රී ජිනරතන අධ්‍යාපන පාලක සභාව නිර්මාණය කොට ඇත.

සෙත් පිරිත් සජ්ඣායනය මධ්‍යයේ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් රූපවාහිනී මංගල විකාශය ආරම්භ කළ අතර ජනාධිපතිවරයා අතින් හරිත වෙබ් අඩවිය (www.harithatv.com) සහ තේමා ගීතය එළිදැක්විණි.

පැළ බෙදාදීම සංකේතවත් කරමින් කිරින්දේ අස්සජි හිමියෝ ජනාධිපතිවරයා වෙත පැළයක් පිරිනැමූහ.

ඩයලොග් නාලික අංක 16 සහ PEO TV නාලිකා අංක 09 ඔස්සේ "හරිත"රූපවාහිනිය ජනතාවට නැරඹිය හැකිය.

මහානායක, අනුනායක හිමිවරුන් ප්‍රමුඛ මහා සංඝරත්නය, සෙසු ආගමික පූජකවරුන්, කථානායක මහින්ද යාපා අබේවර්ධන, ජනමාධ්‍ය ඇමැති ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල, බස්නාහිර පළාත් ආණ්ඩුකාර මාර්ෂල් ඔෆ් ද එයාර් ෆෝස් රොෂාන් ගුණතිලක යන මහත්වරුන්, මැති ඇමතිවරුන්, තානාපතිවරුන්, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග මහතා සහ රාජ්‍ය නිලධාරීන්, ආරක්ෂක අංශ ප්‍රධානීන් ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

## සංචාරක ක්ෂේත්‍රයේ නිරතව සිටින්නන්ගේ බදු අඩු කිරීමට ආණ්ඩුවේ අවධානය

**මහින්ද අලුත්ගෙදර**

සංචාරක ක්ෂේත්‍රයේ නිරතව සිටින්නන්ගෙන් පළාත් පාලන මට්ටමෙන් අය කර ගන්නා බදු අඩු කිරීම කෙරෙහි ආණ්ඩුවේ අවධානය යොමුව තිබේ.

ඒ අනුව සංචාරක ක්ෂේත්‍රයේ නියැළී සිටින්නන්ගෙන් පළාත් බදු අය කිරීමේ දී ලියාපදිංචි ආයතන සහ ලියාපදිංචි නොවන ආයතන අතර පවතින බරපතළ බදු පරතරය සම්බන්ධයෙන් දීර්ඝ කාලයක් පුරාපවතින අර්බුදය විසඳීමේ අරමුණින් දැනටමත් සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පළාත් ආණ්ඩුකාරවරුන් සමඟ සාකච්ඡා ආරම්භ කොට තිබේ.

මෙම විශාල බදු පරතරය හේතුවෙන් රජයට අයවියයුතු බදුගෙවීම පැහැර හැරීමට ඇතැමුන් උත්සහ දරන අතර රජයේ ලියාපදිංචි නොවී ආයතන පවත්වාගෙන යෑමට තවත් පිරිසක් කටයුතු කිරීම නිසා විශාල මුදලක් වාර්ෂිකව රජයට අහිමි වෙයි. බදු සහන ලබාදීම තුළින් පළාත් මට්ටමින් සංචාරක ක්ෂේත්‍රයේ නියැළී සිටින්නන් දිරිමත් කිරීම සහ එම සංචාරක ස්ථාන ප්‍රවර්ධනය කිරීම සඳහා පියවර ගැනෙන අතරම බදුගෙවීම දිරිමත් කිරීමට ද අපේක්ෂා කෙරෙයි.

කොළඹ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කිරීමට නියමිත නාගරික සංචාරක ස්ථාන ප්‍රවර්ධන වැඩසටහනට සමගාමීව කොළඹ දිස්ත්‍රික්කයේ සංචාරක ක්ෂේත්‍රයේ නියැළී සිටින්නන්ගෙන් අයකෙරෙන පළාත් බදු ප්‍රමාණය පහත දැමීම අත්‍යවශ්‍ය කරුණක් වී තිබේ. කොළඹ දිස්ත්‍රික් නාගරික සංචාරක ස්ථාන ප්‍රවර්ධන වැඩසටහනට සමගාමීව නිදහස් අනුස්මරණ ශාලාව, සීමාමාලක භාවනා මධ්‍යස්ථානය, කොටුව පාවෙන වෙළෙඳපොළ, රන් මධ්‍යස්ථානය, තුරඟ තරඟපිටිය, ප්‍රදීපාගාරය, නෙළුම්කුළුණ, ග්‍රීන්පාත්, ලන්දේසි රෝහල, විහාරමහා දේවි උද්‍යානය, ජාතික කෞතුකාගාරය, ගාලුමුවදොර, පැරණි පාර්ලිමේන්තුව, සීතාවක තෙත් කලාපීය උද්‍යානය, ගල්කිස්ස වෙරළ තීරය, බෙල්ලන්විල අත්තිඩිය අභයභූමිය, ගංගාරාම විහාරස්ථානය, ආකේඩ් නිදහස් චතුරස්‍ර කලාපය, පෝට්සිටි යන ස්ථාන ප්‍රවර්ධනය කිරීමට නියමිතව තිබේ.

මේ යටතේ සංචාරක ආකර්ෂණීය ස්ථානවල දේශීය නිෂ්පාදන අලෙවිය ප්‍රවර්ධනයට පහසුකම් සැපයීම, නව ව්‍යවසායකයන් සංචාරක කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදන සඳහා සම්බන්ධ කර ගැනීම, පැයක් තුළ සංචාරක ආකර්ෂණීය ස්ථානවලට ගමන් කිරීමට හැකිවන පරිදි ප්‍රවාහන සේවා ක්‍රියාත්මක කිරීම, සංචාරක යතුරු පැදි සේවා සහ ඇලමාර්ග ආශ්‍රිත බෝට්ටු සේවා ඇති කිරීම, පයින් ගමන් කළ හැකි සංචාරක ස්ථාන පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම යන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

දිවයිනේ සංචාරය කරනු ලබන සංචාරකයන් කොළඹ ඇතුළු නාගරික ප්‍රදේශවල නවාතැන් ගැනීම සුලබ දසුනක් වන අතර මෙම වැඩසටහන තුළින් වැඩි විදේශ විනිමය ප්‍රමාණයක් මෙරටට ලබා ගැනීමට අපේක්ෂා කෙරෙයි. මෙම නව වැඩපිළිවෙළ ක්‍රියාත්මක වීමට සමගාමිව විශාල රැකියා ප්‍රමාණයක් උත්පාදනය කිරීමට අපේක්ෂා කෙරෙන අතර ද්‍රව්‍ය සැපයීම් ජාලයක් බිහිවීම තුළින් නව ව්‍යවසායක අවස්ථා රැසක් බිහිකිරීමට ද අපේක්ෂා කෙරෙයි.

පළාත් බදු අඩුකිරීම මගින් මෙම ක්‍රියාදාමය සඳහා පළාත් මට්ටමින් වැඩි ව්‍යවසායකයන් පිරිසක් ආකර්ශනය කර ගැනීමට අපේක්ෂිත අතර දැනට සංචාරක කර්මාන්තයේ නියැළී සිටින කණ්ඩායම්වල ජීවන මට්ටම ඉහළ නංවාලීමට ද අපේක්ෂා කෙරේ.

## 'Made in Sri Lanka සන්නාමය' තෝරා ගත් දේශීය නිපැයුම් ගණනාවකට

**රක්ෂණ ශ්‍රියන්ත**



සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව යමින් ස්වදේශීය ව්‍යවසායකයා බලගැන්වීමට කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතාගේ සංකල්පයකට අනුව කර්මාන්ත අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධිත ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) දියත් කරනු ලබන 'Made in Sri Lanka' වැඩපිළිවෙළ යටතේ තෝරා ගත් දේශීය නිපැයුම් ගණනාවකට 'Made in Sri Lanka සන්නාමය' පිරිනැමිණි.

ඒ සුවිශේෂ අවස්ථාව කොළඹ 02, හිල්ටන් රෙසිඩන්සිස් හෝටල් පරිශ්‍රය තුළ නිරෝධායන නීතිරීතිවලට අනුකූලව කර්මාන්ත ඇමැති විමල් වීරවංශ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මෙම අවස්ථාවට වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ප්‍රසන්න රණවීර, කර්මාන්ත ඇමැති උපදේශක සුනිල් හෙට්ටිආරච්චි, කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම් චාමින්ද පතිරාජ, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ සභාපති අනුෂ්ක ගුණසිංහ යන මහත්වරුන් ඇතුළු රාජ්‍ය නිලධාරීහු ද එක්ව සිටියහ.

## ගෙවී ගිය වසර එකහමාර තුළ දැවැන්ත සංවර්ධනයක් සිදුව තිබෙනවා

### අධිකරණ ඇමැති කියයි

**රෝෂන් තුෂාර**



ගෙවී ගිය වසර එකහමාර තුළ දැවැත්ත සංවර්ධනයක් සෑම ක්ෂේත්‍රයකම සිදුව ඇති බවත්, කොවිඩ් තත්ත්වය හමුවේ අත්කර ගත් ජයග්‍රහණ පසෙක ලා ඇතැම් පුද්ගලයන් පොඩි පොඩි දේවල් අල්ලා ගෙන ආණ්ඩුවට මඩ ගසන බවත් අධිකරණ ඇමැති ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා පැවසීය.

සිරකරුවන්ට පොදු සමාව ලබාදීම පිළිබඳ ප්‍රතිපත්තිමය කම්ටු වාර්තාව එළි දැක්වීමෙ උලෙළට සහභාගි වෙමින් ඇමැතිවරයා එසේ පැවසිය.

අධිවේගි මාර්ග ඇති කිරීම හා එම ගිවිසුම් කඩිනම් කිරීමේ සංවරධන ක්‍රියාවලිය දියත් කර ඇති ආණ්ඩුව පසුගිය දා පොට් සිටි නීතිමය ගිවිසුම ද අත්සන් කළ බවත් එම සියලු සංවරධන ක්‍රියා අතර බන්ධානාගාර රැදවියන් කෙරෙහි ද අවධානය යොමු කර ඇති බවත් ඒ මහතා පෙන්වා දුන්නේය.

ආණ්ඩුව භාරගන්නා විට රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ගොඩ ගැසී තිබු නඩු 8000කට අදාළ වාර්තා ලබාදීමට එම දෙපාර්තමේන්තුවට හැකිව ඇති බවත් අද වන විට කඩිනමින් හා මාසයක් ඇතුලත රස පරීක්ෂක වාර්තාවක් නිකුත් කිරීමේ හැකියාව ආණ්ඩුවට ඇති බවත් ඇමැතිවරයා පැවසීය.

නඩු විභාගය ප්‍රමාදවීම අවම කිරීමට මෙය මනා පිටුබලයක් වන බව පෙන්වා දුන් ඇමැතිවරයා රජයේ ආයතන හෝ රජයේ නිලධාරීන් අකාර්යක්ෂම නොවන බව මේ මඟින් පෙනී යන බව පැවසීය. ආණ්ඩුවට අවශ්‍ය වනුයේ නිවැරදි නායකත්වයක් හා නිවැරදි මග පෙන්විමක් බව පැවසු ඇමැතිවරයා, වත්මන් ජනාධිපතිවරයා ප්‍රමුඛ ආණ්ඩුව එම නිවැරදි නායකත්වය හා මගපෙන්වීම කර ඇති බැවින් මෙම දැවැන්ත සංවර්ධනය සිදුවන බව පැවසීය.

සිරකරුවෝ මනුෂ්‍යයෝය යන පාඨය සටන් පාටයක් හෝ බෝඩ් ලෑල්ලකට සීමා නොකර ආණ්ඩුව සිරකරුවන් වෙනුවෙන් බන්ධනාගාර සංකීර්ණයක් ඉදි කිරීමට කටයුතු කරන බවත්, එම සංකීර්ණය දැනට මෙරට ඇති බන්ධනාගාර මෙන් දස ගුණයකින් විශාල වන බවත් පෙන්වා දුන්නේය. විවිධ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිව සිරගත වන රැඳවියන් පුනරුත්ථාපනය කිරීමට හැකි මධ්‍යස්ථාන ස්ථාපිත කරන බවත් දැනට දහසක් පමණ සිදු වන පුනරුත්ථාන ක්‍රියාවලිය අට දහස දක්වා වැඩි කිරීමට කටයුතු කරන බවත් පෙන්වා දුන්නේය. මාස නවයක් සිරගතව යළිත් එම මතටම අබ්බැහිව යළි සිරගත වන පුද්ගලයන් වෙනුවට යළි සමාජගත සක්‍රිය පුද්ගලයන් රටට දායාද කිරීම රජයේ වගකීම බව පෙන්වා දුන්නේය.

## අය වැය පරතරය, උද්ධමනය, බැංකු පොලිය පාලනය කර ගත්තොත් අපට ස්ථාවර මූල්‍යමය ශක්තියක් ඇති කර ගත හැකියි

### ජනමාධ්‍ය ඇමැති, ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල

**නුවන් හෙට්ටිආරච්චි**



අය වැය පරතරය, උද්ධමනය, බැංකු පොලී වැනි කරුණු පාලනය කර ගන්නේ නම් අපට ස්ථාවර මූල්‍යමය ශක්තියක් ලබාගත හැකි යැයි ජනමාධ්‍ය ඇමැති, ආචාර්ය කෙහෙලිය රඹුක්වැල්ල මහතා පැවසීය .

කොළඹ දිස්ත්‍රික්කය සහ ගම්පහ දිස්ත්‍රික්කය තුළ සිටින කුඩා පරිමාණ ස්වයං රැකියාවන්හි නියුතු ප්‍රජාවගේ ආර්ථික ශක්තිය වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් "ඇසිදිසි අවුරුදු මේලා" සහ " සියනෑ අවුරුදු මේලා" නමින් ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ කොළඹ ව්‍යාපාරික සංගමය එක්ව පවත්වන වැඩසටහන් පිළිබඳ මාධ්‍ය දැනුම්වත් කිරීමට පැවැති උත්සවයට කොළඹදී එක්වෙමින් ජනමාධ්‍ය ඇමැතිවරයා මෙම අදහස් පළ කෙළේය.

මෙම උත්සවයේදී කොළඹ ව්‍යාපාරික සංගමය මාධ්‍යවේදීන් සඳහා නොමිලේ නිකුත් කරන වරප්‍රසාද කාඩ්පත හඳුන්වාදීම ද සිදු විය.

තවදුරටත් මෙහිදී අදහස් දැක්වූ ජනමාධ්‍ය ඇමැති කෙහෙලිය රඹුක්වැල්ල මහතා මෙසේද පැවසීය.

මේ රට අපට ගොඩනගන්න පුළුවන්. එහෙත් ඊට විටින් විට බාධා පැමිණුණා. කොවිඩ් වසංගතයත් එක්ක අපේ රටේ ආර්ථික අවපාතයක් ඇති වුණා. නමුත් අපේ රට සාපේක්ෂව හොඳ තැනක සිටිනවා. සමහර රටවල වැටුප් ගෙවන්නේ වවුචර් මඟින්. නමුත් අපේ රටේ එහෙම නැහැ. ඔය ධනවත් කියන රටවල අය මැරෙනකම්ම ණයයි. 77 දී ඩොලර් 1ක් රුපියල් 11 යි.

අපි කියන්න ඕනෑ සැම දේශපාලන කණ්ඩායමක්ම කරන හොඳ වැඩවලට අපි හොඳයි කියන්න අවශ්‍යයි. එදා සිරිමාවෝ මැතිණිය 70 ගණන්වලදී කිව්වා කහ ගේන එක නවතනවා කියලා. අපි අදත් ඒකම කියනවා. පිට රටින් ගේනවට මම අදත් විරුද්ධ දෙයක් තමයි කිරි. මොකද අපේ රට තණ කොළවලින් ජලාශවලින් ස්වයං පෝෂිතයි. මෙහෙම රටවල් හරි අඩුයි. අපට වැරදුණු තැන අපි හදාගත යුතුයි.

වර්තමාන ජනාධිපතිතුමා දේශීය දේ නිර්මාණය කරන්න ගොවිතැනට මුල් තැන දෙන්න කටයුතු කර තිබීම පිළිබඳ සතුටුයි. අපේ රට හරිම ස්වයංපෝෂිත රටක්. අපට වැරදුණු තැන් හදා ගෙන අපි ඉදිරියට යා යුතුයි. අප සාමූහිකව වගකීමකින් ඉදිරියට යා යුතුයි.අපි සුළු සුළු දේවල් පිළිබඳවයි බැලිය යුත්තේ.

එදා වතුර බෝතල් කරලා විකුණද්දී මම හිතුවේ මේක නම් කවදාවත් දියුණු වන එකක් නැහැ කියලායි. නමුත් අද වතුර බෝතලේ අත හෝදන්නත් පාවිච්චි කරනවා. අපි සිතන්නේ නැති දේවල් සමහර විට සිදු වෙන්න පුළුවන්. යම් දෙයක් කරලා එය සාර්ථක වුණොත් ජාතික මට්ටමෙන් එය ක්‍රියාත්මක කිරීමට හැකියි. බලන්න අද ඉන්දියාව දියුණු වෙලා තිබෙන හැටි. ඉන්දියාවේ කෙනෙක් කියන්නේ නෑ මම කේරළයේ, මුම්බායිවල කියලා. එයා කියන්නේ මම ඉන්දියාවේ කෙනෙක් කියලායි. මෙවැනි පුංචි දේවල්වලින් අපි බොහෝ දේ ඉගෙන ගත යුතුයි. සමහරු කියනවා වෙස්වළා ගත් ආශීර්වාද කියලා. මේ කොවිඩ් වසංගතයත් එහෙම දෙයක් වෙන්න පුළුවන්. ඒවා අප උදාහරණ ලෙස ගත යුතුයි. මම මේ වැඩපිළිවෙළට සුබ පතනවා.

**ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් ජගත් පී. විජේවීර මහතා-**

අද ජනමාධ්‍ය සහෝදර සහෝදරියන්ට විශේෂ දිනයක්. ඔවුන්ට අවුරුදු සමරන්නට සහනයක් හිමි වී තිබෙනවා. කොළඹ ව්‍යාපාරික සංගමය ඊට මූලිකත්වය ගෙන තිබීමත් සතුටුයි. ඒ වගේම ජනමාධ්‍ය අමාත්‍යාංශයටත් ඊට සම්බන්ධවීමට ලැබීම පිළිබඳ සතුටුයි.

මාධ්‍ය සහෘදයන්ට මේ අද ලැබෙන කාඩ්පත වෙළෙඳ පොළට අරගෙන ගියහම එම වෙළෙඳ පොළෙන් විශේෂ වට්ටමක් ලැබෙනවා. මෙය ජනමාධ්‍ය ඇමැතිවරයාගේත් අදහසක්. ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සිටින සියලු දෙනාට මේ කාඩ්පත ලබාදෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වගේම අනාගතයේ දී මෙම කාඩ්පතින් ලැබෙන වට්ටම් ප්‍රමාණය තවදුරටත් වැඩිකරලා ලබා දෙන්නත් කටයුතු කරනවා.

ඒ වගේම ජනමාධ්‍යවේදීන්ට විශේෂ ණය මුදලක් ලබාදීමටත් අපි ඉදිරියේදී කටයුතු කරනවා. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව මඟින් ඉදිරියේදී එය ජනමාධ්‍ය සහෘදයන්ට ලබා ගත හැකිවේවි.

**කොළඹ ව්‍යාපාරික සංගමයේ සභාපති ආරියශීල වික්‍රමනායක මහතා-**

අපි අපේ රට අනාගත දරු පරපුර වෙනුවෙන් රැකගත යුතුයි. ලෝකේ කොහේවත් මෙවැනි රටක් නැහැ. අපේ රටේ බොහෝ පෝෂ්‍යදායි ආහාර තියෙද්දී ඇයි අපි පාන් කන්නේ. අද පාසල් යන ළමයින්ටත් දියවැඩියාව හැදිලා. එදා 1970 ගණන්වල ඩොලර් 1 රුපියල් 4යි. අද ඒක දෙසිය ගණනක් වෙලා.

ඩොලර් මිලියන 1850ක් වාර්ෂිකව අපි හක්කට තියලා කනවා. මේ රටේ හැම දෙයක්ම තියෙනවා. ඇයි අපි ලෙඩ හැදෙන කෑම කන්නේ. ඩොලර් 1 රුපියල් 4 නොවේ ඊටත් පල්ලෙහාට අපිට ගන්න පුළුවන්. මේ රටේ සම්පත් අප රට තුළින්ම නිපදවිය හැකියි.

**කොළඹ ව්‍යාපාරික සංගමයේ ප්‍රධාන ලේකම් චමින්ද විදානගමගේ-**

දේශීය ආර්ථිකයක් ගොඩනැඟීම වෙනුවෙන් ජනමාධ්‍ය ඇමැතිවරයාත් එහි ලේකම්වරයාත් ගෙනයන වැඩපිළිවෙළ අප අගය කළ යුතුයි. අපේ සංගමයට වගකීමක් තිබෙනවා. දේශීය ආර්ථිකය ගොඩනැඟීමට. ජනමාධ්‍යවේදීන් කියන්නේ මේ රටේ 4 වැනි පුරවැසියා. ඒ නිසා අපේ වැඩපිළිවෙළ ප්‍රථමයෙන්ම ජනමාධ්‍යවේදී සම්බන්ධ කරගත යුතුයි කියන මතයේ අප සංගමය සිටිනවා.

අපි කාලයක් තිස්සේ කතා කරනවා සිය රට දේ සිරි සැප දේ කියලා. ගන්න අපේ දේ දේශීය දේ ඇගයීම පිළිබඳ නමුත් දේශීය දේට වටිනාකමක් එක්කරන්නට නම් එහි ගුණාත්මක භාවයත් එහි වෙළෙඳ පොළත් වෙළෙඳ සන්නාමයක් ගොඩනැඟිය යුතුයි. එහෙම ගොඩනගන්න නම් එම ව්‍යාවසායකයන්ට ලැබෙන තාක්ෂණ දැනුම. අවශ්‍ය සන්නාමයන් ගොඩනගන්න ඒ කියන්නේ දේශීය වෙළෙඳ සන්නාමයක් ගොඩනගන්නට කටයුතු කළ යුතුයි.

**ඡායාරූපය - රන්ජිත් අසංක**

# ගිණුම් වාර්තා නොදුන් පක්ෂ 4කට වැඩ වරදී

**අනුර ප්‍රේමලාල්**

පිළිගත් දේශපාලන පක්ෂ 04ක් 2019 වර්ෂයට අදාළ විගණනය කරන ලද ගිණුම් වාර්තා මේ දක්වා මැතිවරණ කොමිෂන් සභාට ඉදිරිපත් කර නැත. එම දේශපාලන පක්ෂවල නියෝජිතයන්ට මෙම මස 22දා කැඳවීමක් කර ඇති කොමිසම අදාළ වාර්තාද එදිනට පෙර බාර දිය යුතු ලෙස දන්වා ඇත. එදිනටත් එම වාර්තා දීමට අපොහොසත් වුවහොත් එම පක්ෂ අත්හිටුවීමටද කොමිෂන් සභාව තීරණ කර ඇත.

දැනට ලියාපදිංචි කොට ඇති පිළිගත් දේශපාලන පක්ෂවල නිල නාම ආගමික හෝ වාර්ගික වශයෙන් නම් කොට තිබේද යන්න සහ එම පක්ෂවල ව්‍යවස්ථාවලටද එවැනි වගන්ති ඇතුළත්වී තිබේද යන්න පරීක්ෂා කොට බලා වාර්තා කිරීම පිණිස අතිරේක මැතිවරණ කොමසාරිස්වරයකුගේ ප්‍රධානත්වය සහිත නිලධාරින් පස් දෙනකුගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම හා එම කාර්යයන් අධීක්ෂණය කිරීම සඳහා කොමිෂන් සභාවේ සාමාජිකයකු මැතිවරණ කොමාසාරිස් ජනරාල් හා ලේකම්වරයා පත් කිරීමටද මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇත.

ඉදිරි මැතිවරණවලදී පැමිණිලි කළමනාකරණ ඒකකවල රාජකාරි සඳහා අනුයුක්ත කිරීමට අපේක්ෂිත රාජ්‍ය නිලධාරීන්, පොලිස් නිලධාරීන්, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන නියෝජිතයන් සඳහා සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇත.


නීතිඥ නිමල් පුංචිහේවා

# හොරණ පොදු වෙළෙඳපොළ
## අගමැති අතින් විවෘත කිරීම අද

**ස්වර්ණා විජේකෝන්**

රුපියල් මිලියන 2391ක මුදලක් වැය කරමින් සංවර්ධනය කළ හොරණ පොදු වෙළෙඳපොළ අද (01) ජනතා අයිතියට පත් කෙරේ.

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය, අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් පරිදි, සංවර්ධනය කරන ලද හොරණ පොදු වෙළෙඳපොළ ජනතා අයිතියට පත්කිරීම නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය ඇමැති ආචාර්ය නාලක ගොඩහේවා සහ ජාතික උරුම, ප්‍රාසාංගික කලා හා ග්‍රාමීය කලා ශිල්ප ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් අද (01) පෙරවරු 2.00 ට ජනතා අයිතියට පත් කිරීම සිදු වේ.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා, ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ව සිටි සමයේදී ක්‍රියාත්මක කළ ලංකාවේ පොළ භූමි සංවර්ධනය කිරීමේ සැලසුම යටතේ ඉදිකර විවෘත කෙරෙන මෙම වෙළෙඳපොළෙහි වැඩ කටයුතු 2015ට පෙර නිමවා අවසන් කර තිබිණ.

එහෙත් 2015න් පසු ඇති වූ දේශපාලන වෙනස්කම් හේතුවෙන් පසුගිය ආණ්ඩුව පැවති කාලය තුළ මෙම පොදු වෙළෙඳපොළ ජනතා අයිතියට පැවරීම ප්‍රමාද වෙමින් පැවතිණ. මෙම අවස්ථාවට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ ලේකම් සිරිනිමල් පෙරේරා, නාගරික සංවර්ධන අධිකාරියේ සභාපති, වරලත් වාස්තු විද්‍යාඥ හර්ෂාන් ද සිල්වා, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, වරලත් නගර නිර්මාණ ශිල්පි ප්‍රසාද් රණවීර සහ හොරණ නගර සභාවේ සභාපති විතාරමගේ සිරිසෝම යන මහත්වරුන් ඇතුළු පිරිසක් ද මෙම අවස්ථාවට සහභාගී වීමට නියමිතවේ .

# ප්‍රතිශක්තිකරණ සේවාව ශක්තිමත් කිරීමට
## ජපානයෙන් ඩොලර් මිලියන 3ක ප්‍රදානයක්

**චන්දන විජේකෝන්**



ශ්‍රී ලංකාවේ ශීතාගාර දාම පද්ධතිය වැඩිදියුණු කිරීම තුළින් ප්‍රතිශක්තිකරණ සේවාවන් සැපයීමත්, ශක්තිමත් කිරීමත් සඳහා ජපාන රජය යුනිසෙෆ් සංවිධානය හරහා ඩොලර් මිලියන 3කට ආසන්න මුදලක් ලබාදීමට පියවර ගෙන ඇත.

ජපානයෙන් ලැබුණු මෙම නව කාලීන දායකත්වය පහසුවෙන් ඇතුළු විය හැකි විශාල ශීත කාමර, අයිස් ආස්තරණය සහිත ශීතකරණ හා එන්නත් ප්‍රවාහන ආම්පන්න ඇතුළු ශීතගාර දාම උපකරණ ප්‍රසම්පාදනය කිරීම සඳහා යොදා ගැනෙනු ඇත. මීට අමතරව මෙම ප්‍රදානය සියලු දිස්ත්‍රික්කවල ශීතාගාර දාම උපකරණ ක්‍රියාකරවීම හා නඩත්තු කිරීම, සාර්ථක එන්නත් කළමනාකරණය සහ උෂ්ණත්ව නිරීක්ෂණ පද්ධති පුළුල් කිරීම යන කටයුතු සඳහා ද සහාය වෙයි.

ජපානයෙන් ලැබෙන මෙවැනි දායකත්වයන් තීරණාත්මක ලෙස වැදගත් වෙන බව යුනිසෙෆ් ශ්‍රී ලංකා නියෝජිත එමා බ්‍රිග්හැම් මහත්මිය පෙන්වා දෙයි.

පේරාදෙණි සරසවියට අනුබද්ධ ආයතනයකින්

# කෝටි පහක් සොරා ගැනීම ගැන ඇමැති නියමයෙන් පරීක්ෂණ

**සිතාරා සේනානි**

පේරාදෙණිය පශ්චාත් විද්‍යා උපාධි ආයතනයේ පසුගිය සමයේ රුපියල් කෝටි පහක මූල්‍ය වංචාවක් සිදුව ඇති බවට පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී (කෝප්) අනාවරණය වී ඇති බැවින් ඒ පිළිබඳ සොයා බලා වහාම වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්. පීරිස් මහතා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා වෙත උපදෙස් දී ඇත.

එමෙන් ම, මෙරට සියලු විශ්වවිද්‍යාල සහ පශ්චාත් උපාධි ආයතනයන්හි ද මෙවැනි මූල්‍ය අක්‍රමිකතා සිදුව ඇත් ද යන්න සම්බන්ධව සොයා බලන ලෙස ද, අධ්‍යාපන අමාත්‍යවරයා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත දැනුම් දී ඇති අතර, ඒ පිළිබඳ අවධානය යොමු කරන ලෙස අධ්‍යාපන ලේකම් මහාචාර්ය කපිල පෙරේරා මහතාට ද උපදෙස් දී තිබේ.



පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් විද්‍යා උපාධි ආයතනය විසින් පවත්වා ගෙන යන ලද ස්ථාවර තැන්පතු ගිණුම් 14ක කාලය අවසන් කර ගත් රුපියල් 93,287,025 මුදලින් රුපියල් 50,338,160ක් එහි ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරයා වංචා සහගත ලෙස ගෙන ඇති බවට කෝප් කමිටුවේදී අනාවරණය වී ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශය සඳහන් කරයි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ද මේ පිළිබඳ පරීක්ෂණයක් ආරම්භ කර ඇති අතර, විගණකාධිපති දෙපාර්තමේන්තුව අධිභාර පැනවීමක් සිදුකරන බව ද සඳහන් කර ඇතැයි ද අමාත්‍යාංශය සඳහන් කරයි.

# මෙරට ව්‍යාප්ත කොවිඩ් ප්‍රභේද ගැන සොයන්න පරීක්ෂණයක් අරඹයි

මෙරට ව්‍යාප්ත කොවිඩ් ප්‍රභේද ගැන ජාන අනුක්‍රමණ පරීක්ෂණයක් අද (1දා) ආරම්භ කරන බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආසාත්මිකතා හා ප්‍රතිශක්ති විද්‍යාව සහ ශෛල්‍ය ජෛව විද්‍යාතනයේ අධ්‍යක්ෂ වෛද්‍ය ආචාර්ය චන්දිම ජීවන්දර පවසයි. මේ සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශවල කොවිඩ් ආසාදිතයන්ගෙන් ජෛව සාම්පල පසුගිය මාසයේදි එක්රැස් කර ගනු ලැබිණි.

මෙයට අමතරව විදේශගතව සිට මෙරටට පැමිණි පුද්ගලයන් ද ඇතුළු මුලතිව්, වව්නියාව, කොළඹ, වරකාපොළ, යාපනය, සපුගස්කන්ද ඇතුළු දිවයිනේ විවිධ ප්‍රදේශවලින් කොවිඩ් ආසාදිතවූ පුද්ගලයන්ගේ සාම්පල මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ආසාත්මිකතා හා ප්‍රතිශක්ති විද්‍යාව සහ ශෛල්‍ය ජෛව විද්‍යාතනයට ලැබී ඇති බව ද හෙතෙම කියා සිටියි.

මෙම පර්යේෂණය සඳහා දින 7ක් සහ 10ක් අතර කාලයක් ගතවන බවත් එහිදී මේ වන විට ව්‍යාප්තවන කොරෝනා ප්‍රභේදයන් සම්බන්ධයෙන් තොරතුරු දැන ගත හැකි බවද ඔහු පවසයි. විදේශ රටවල ව්‍යාප්තවන කොවිඩ් ප්‍රභේදයන් කිහිපයක් විදේශගතව සිට පැමිණි නිරෝධායන මධ්‍යස්ථාන තුළ සිටි පුද්ගලයන්ගේ වයිරස් සාම්පල්වලින් හඳුනා ගැනීමට හැකි වූ බවත් කියා සිටියි.

# තදබදය නැති කරන්න
## රැඳවූවන් 25,224ක් නිවෙස්වලට

**බුද්ධිකා ඉඹුලාන**

බන්ධනාගාර තදබදය අවම කිරීමේ අරමුණින් සුළු වැරදි සම්බන්ධයෙන් බන්ධනාගාරගත වූ රැඳවූවන්ට නිදහස හා ඇප දීමේ වැඩපිළිවෙළ යටතේ ඉකුත් වසරේ දෙසැම්බර් මස සිට මේ වසරේ මාර්තු මාසය දක්වා කාලය තුළ බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් සිරකරුවන් 25,224ක් නිවෙස් වෙත යොමු කර ඇත. මේ අතර සිර දඬුවම් නියම වූ රැඳවූවන් (කාන්තා සහ පිරිමි) 3,364ක් සහ රිමාන්ඩ් රැඳවූවන් (කාන්තා සහ පිරිමි) 21,860ක්ද වන බව බන්ධනාගාර කොමසාරිස් (පාලන හා පුනරුත්ථාපන) බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක චන්දන ඒකනායක මහතා දිනමිණට කීය.මේ වැඩපිළිවෙළ යටතේ ඉකුත් වසරේ දෙසැම්බර් මස පළමු වැනිදා සිට මේ වසරේ පෙබරවාරි මස 28 දක්වා නිදහස්ව හා ඇප ලබා ගිය (සිර හා සැක) රැඳවූවන් සංඛ්‍යාව 19,985කි.

# සෝම හිමියන්ගේ මෑණියෝ කලුරිය කරති



අපවත් වී වදාළ ගංගොඩවිල සෝම හිමියන්ගේ මෑණියන් වූ චාලට් වීරතුංගආරච්චි මහත්මිය අභාවප්‍රාප්ත වූවාය.

මියයන විට 94 හැවිරිදි වියෙහි පසුවූ ඇය දූ දරුවන් පස් දෙනකුගේ ආදරණීය මවකි. කලක් රෝගාතුරව සිටි ඒ මහත්මිය රෝහල්ගතව ප්‍රතිකාර ලබමින් සිටිය දී මිය ගොස් තිබේ.

දේහය කඩුවෙල, කොතලාවල පාර, අංක 283 ලිපිනයේ තැන්පත් කර ඇති අතර අවසන් කටයුතු පසුව දැනුම් දෙනු ලැබේ.

# විභාග දෙපාර්තමේන්තුව පෞද්ගලිකකරණය කරන්නේ නැහැ

විභාග කොමසාරිස් ජනරාල් බී. සනත් පූජිත



**සිතාරා සේනානි**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පෞද්ගලීකකරණය කරන බවට සමාජ මාධ්‍යවල පළ කර ඇති ප්‍රවෘත්ති සම්පූර්ණයෙන් අසත්‍ය හා පදනම් විරහිත බව විභාග කොමසාරිස් ජනරාල් බී. සනත් පූජිත මහතා පවසයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ලකුණු පරිගණකගත කිරීම සිදුවන්නේ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කාර්ය මණ්ඩලයක් මඟින් බවත්, ඒ සඳහා අන් කිසිදු පෞද්ගලික ආයතනයක් හෝ වෙනත් පාර්ශ්වයක් සම්බන්ධ කර ගැනීමක් සිදුනොවන බවත් ඒ මහතා සඳහන් කරයි.

ඩිජිටල්කරණ ක්‍රියාවලිය යටතේ සිදුකරනු ලබන වැඩසටහන් ද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර නිලධාරීන් විසින් සිදුකරනු ලබන අතර, දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය බාහිර අයතනයක් වෙත හෝ බාහිර පාර්ශ්වයක් වෙත හෝ දීමක් කිසිසේත් සිදු නොකරන බවද විභාග කොමසාරිස්වරයා අවධාරණය කරයි.

# කැකිරාවේ ඇතා ඝාතන පරීක්ෂණය සීඅයිඩියට පවරන්න

මහේස්ත්‍රාත් පොලීසියට දන්වයි

කැකිරාවේ හේන් යායකදී රේවත ඇතාට විදුලි සැර වැදීමට සලස්වා ඝාතනය කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක් පැවැත්වීම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පවරන්නැයි කැකිරාව මහේස්ත්‍රාත් සමන් කාරියවසම් මහතා ඊයේ (31දා) පොලීසියට නියෝග කළේය. නීතිපතිවරයා ද මේ සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක් පවත්වන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට දැනුම් දී ඇත. සිද්ධියට සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරු මේ වන විට ඇප මත මුදා හැර තිබේ.

# දිස්ත්‍රික්ක 4කට දැඩි හිරු රැස්

**උපාලි කරුණාරත්න**

දිස්ත්‍රික්ක කිහිපයක උණුසුම් කාලගුණ තත්ත්ව පිළිබඳ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව දැනුම්දීමක් කර ඇත. ඒ අනුව අනුරාධපුර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය, මඩකලපුව, මුලතිව් සහ වවුනියාව යන දිස්ත්‍රික් සඳහා එම නිවේදනය බලපැවැත්වේ. එම දිස්ත්‍රික්කවල ඇතැම් ස්ථානවල උණුසුම් දර්ශක එනම් මිනිස් සිරුරට දැනෙන උණුසුම "වැඩි අවධානය" යොමු කළ යුතු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන බව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිවේදනය කරයි.

# ඇමැති නිමල් ඇතුළු 18කට නොතීසි නිකුත් කිරීම ගැන තීරණය 5දා

**නෙල්කා මැදගෙදර**

තේ සහ රබර් වතු කම්කරුවන්ට ගෙවිය යුතු දෛනික අවම වැටුප රුපියල් 1000ක් බවට නියම කර නිල ගැසට් නිවේදනය බලරහිත කරන රිට් ආඥාවක් නිකුත් කරන ලෙස ඉල්ලා, වතු සමාගම් 20ක් ගොනු කළ රිට් පෙත්සමෙහි වග උත්තරකරුවන්ට නොතීසි නිකුත් කරනවාද නැද්ද යන්න පිළිබඳ තීන්දු ව අප්‍රේල් මස 05 වැනිදා ප්‍රකාශය කිරීමට අභියාචනාධිකරණය ඊයේ (31දා) තීරණය කළේය.

එසේම එම ගැසට් නිවේදනය ක්‍රියාත්මක කිරීම අත්හිටුවන අතුරු නියෝගයක් නිකුත් කරනවාද යන්න පිළිබඳ තීරණය ද එදින ප්‍රකාශ කිරීමට නියම කෙරිණ.

අභියාචනාධිකරණ සභාපති විනිසුරු අර්ජුන ඔබේසේකර සහ විනිසුරු මායාදුන්නේ කොරයා යන මහත්වරුන් හමුවේ මෙම පෙත්සම කැඳවනු ලැබිණ.

එහිදී පෙත්සම්කාර සහ වගඋත්තරකාර පාර්ශ්වයන්ගේ කරුණු දැක්වීම් අවසන් කරන ලදී. ඒ අනුව පෙත්සම ලබන 05 වැනිදා කැඳවීමට තීරණය විය.

වතු කම්කරුවන්ගේ වැටුප් වැඩි කිරීම නිසා වතු කර්මාන්තය අර්බුදයකට ලක් වන බව පවසමින් මෙම පෙත්සම ඉදිරිපත් කර ඇත. ආගරපතන වැවිලි සමාගම, ඇල්පිටිය වැවිලි සමාගම ඇතුළු වතු සමාගම් 20ක් මෙම පෙත්සම් ඉදිරිපත් කර ඇත.

කම්කරු ඇමැති නිමල් සිරිපාල ද සිල්වා, කම්කරු කොමසාරිස් ජනරාල් ප්‍රභාත් චන්ද්‍රකීර්ති, තේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සභාපතිවරයා ඇතුළු 18 දෙනකු වගඋත්තරකරුවෝ ලෙස නම් කරනු ලැබ සිටිති. නීතිඥ සනත් විජේවර්ධන මහතා මාර්ගයෙන් මෙම පෙත්සම ගොනු කර ඇත.

# උඩවලවේ රම්බෝ
## වෙනත් තැනකට රැගෙන යෑමට විරෝධයක්

උඩවලව ජාතික වනෝද්‍යානයේ සැරිසරන රම්බෝ නැමැති වන අලියා වෙනත් ස්ථානයකට රැගෙන යෑමට වනජීවී නිලධාරීන් ගෙන ඇති තීරණයට පරිසරවේදීහු විරෝධය පළ කරති.

මෙම වන අලියා හොරොව්පොතාන අලි සංරක්ෂණාගාරයට ඊයේ (31දා) රැගෙන යෑමට නියමිතව තිබිණි. උඩවලව ජලාශයේ බැම්ම අසලින් යන ඕනෑම කෙනකුගේ ආදරය මේ දැවැන්තයා හිමිකර ගෙන ඇත. උඩවලව ජාතික වනෝද්‍යානයේම ඉපිද වනෝද්‍යාන මායිමේ විදුලි වැට ආසන්නයට පැමිණ මිනිසුන් දෙන ආහාර ගැනීමට පුරුදුව සිටින මේ සද්දන්තයාට වයස අවුරුදු 50කි.

මේ වන තෙක් කිසිදු ජීවිත හෝ දේපළ හානියක් සිදු කර නැතැයි වාර්තා වන මෙම අලියා හොරොව්පොතාන අලි සංරක්ෂණාගාරයට රැගෙන යෑම අනතුරුදායක බව පරිසරවේදීහු පෙන්වා දෙති.

# වෘත්තීය පුහුණු විශිෂ්ටතා
## සම්මාන ප්‍රදානය 5 දා

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ සහ නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය, තෘතීයික වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හා නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන එක්ව 2020 වසර සඳහා ජාතික වෘත්තීය පුහුණු විශිෂ්ටතා සම්මාන ප්‍රදානෝත්සවය ලබන 05දා සවස 2.00ට බණ්ඩාරනායක අනුස්මරණ අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාවේ ලෝටස් ශාලාවේදී පැවැත්වේ.

# රන්ජන්ගේ පෙත්සම විභාගය ගැන තීරණය 5 දා

**නෙල්කා මැදගෙදර**

අධිකරණයට අපහාස කිරීමේ වරදට වසර හතරක බරපතළ වැඩ සහිත සිර දඬුවම් නියමව සිටින තමන්ගේ පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය අහෝසි කිරීම වළක්වන ලෙස ඉල්ලා රන්ජන් රාමනායක මහතා ගොනු කළ රිට් පෙත්සමෙහි වගඋත්තරකරුවන්ට නොතිසි නිකුත් කරනවාද නැද්ද සහ එම පෙත්සම විභාගයට ගන්නවාද නැද්ද යන්න පිළිබඳ තීන්දුව ප්‍රකාශ කිරීම අප්‍රේල් මස 5 වැනිදා තෙක් කල් තැබීමට අභියාචනාධිකරණය ඊයේ (31) තීරණය කළේය.

එම තීන්දුව ඊයේ (31) ප්‍රකාශයට පත් කිරීමට නියමිතව තිබුණි.

අභියාචනාධිකරණ සභාපති විනිසුරු අර්ජුන ඔබේසේකර සහ විනිසුරු මායාදුන්නේ කොරයා යන මහත්වරුන් හමුවේ මේ පෙත්සම කැඳවනු ලැබූ අවස්ථාවේදී එම තීන්දුව මෙතෙක් සූදානම් නැති බව සඳහන් කෙරිණි. ඒ අනුව පෙත්සම අප්‍රේල් මස පස්වැනිදා කැඳවීමට තීරණය විය.

නීතිඥ දිනේෂ් විදානපතිරණ මහතා සහ විදානපතිරණ නීතිඥ සමාගම මඟින් මේ පෙත්සම ඉදිරිපත් කර තිබිණි.

# කැනඩාවෙන් මිලියන 13ක් හොර පාරෙන් ගෙන්වා ගෙන

**සුභාෂිණී සේනානායක**

අන්තර්ජාල ඔස්සේ වට්ස්ඇප් මගින් කැනඩාවේ සිට නීති විරෝධීව රුපියල් මිලියන 13ක් තම ගිණුමට ගෙන්වා ගෙන බෙදාහැරිය බව කියන යාපනයේ පදිංචිකරුවකු ලබන අප්‍රේල් මස 07දා දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා ඊයේ (31දා) නියෝග කළේය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සෙල්වරාසා උදයරාජා නැමැති අය රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණි.

# ලැසීගේ ගෝලයා ගිනි අවියක් සමඟ අත්අඩංගුවට

**රක්ෂණ ශ්‍රියන්ත**

කොස්ගොඩ ලැසී නමැති අපරාධකරුගේ ගෝලයකු ගිනි අවියක් සමග ඊයේ (31) අහංගම ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බළකාය විසින් අත්අඩංගුවට ගෙන තිබේ.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38ක් වන කොස්ගොඩ ප්‍රදේශයේම පදිංචිකරුවෙකි. සැකකරු යුද හමුදාවේද සේවය කර ඇති පුද්ගලයකු බව පොලිස් පරීක්ෂණවලදී අනාවරණය වී තිබේ. මොහු වැඩි දුර පරීක්ෂණ සඳහා අහංගම පොලිස් ස්ථානය වෙත භාර දී තිබේ.

# ශ්‍රී ලංගමය සතු එකම ඩිපෝවක්වත් වසා දමන්නේ නෑ

## ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය සතු එකම ඩිපෝවක්වත් වසා නොදමන බව ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා ප්‍රකාශ කළේය.

වත්මන් ආණ්ඩුව බලයට පත් වන විට තම ආදායමෙන් වැටුප් ගෙවිය නොහැකි ඩිපෝ 15ක් වැනි සංඛ්‍යාවක් තිබූ බවත් එම තත්ත්වය වෙනස් කිරීමට වත්මන් ආණ්ඩුවට හැකි වූ බවත් ඇමැතිවරයා පැවසීය.

කෙසේ වුවද ඇතැම් ස්ථානවල ආසන්නවම ඩිපෝ දෙක තුනක් පවතින බවත් එවැනි ස්ථානවල පිහිටි ඩිපෝ බස් නවතා තබන ස්ථාන (බස් පාර්ක්) බවට පත් කිරීමට රාජ්‍ය ඇමති දිලුම් අමුණුගම මහතා තීරණය කර ඇති බවත් ඇමැතිවරයා සඳහන් කළේය.

බස් පාර්ක් බවට පත් කරන ඩිපෝ කිහිපයෙහි සේවකයන් වෙනත් ස්ථානවලට අනුයුක්ත කිරීමට තීරණය කර ඇති අතර, සෑමවිටම වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරන බවද ඇමැතිවරයා පැවසීය.

ඇමති ගාමිණී ලොකුගේ මහතා මේ බව සඳහන් කළේ රාජ්‍ය ඇමති දිලුම් අමුණුගම මහතා කර ඇති ප්‍රකාශයක් පදනම් කරගනිමින් ලංකා ප්‍රවාහන සේවක සංගමය විසින් කර ඇති ප්‍රකාශයක් සම්බන්ධයෙන් සිය අදහස් දක්වමිනි.

අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා මේ බව සඳහන් කළේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂ කාර්යාලයේදී ඊයේ (31) පෙරවරුවේ පැවැති මාධ්‍ය සාකච්ඡාවකට සහභාගී වෙමිනි.

එහිදි වැඩිදුරටත් අදහස් දැක්වූ ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ මහතා,

මම "අද පත්තරයේ" දැක්කා ලංගම උප ඩිපෝ වසා දමන බවට ඇමැති



දිලුම් කර ඇති ප්‍රකාශයට ඉඩ දෙන්න එපා කියලා ලංකා ප්‍රවාහන සේවක සංගමය ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටිනවා කියලා. අපි එක ඩිපෝ එකක්වත් වහන්නේ නෑ.

අද අපේ පක්ෂය පිහිටුවලා අවුරුදු 04ක් වෙනවා. ආණ්ඩුව පිහිටුවලා අවුරුද්දකුත් වෙනවා. අද විපක්ෂය හිතන්නේ අපේ ආණ්ඩුව මුකුත් කරලා නෑ කියලා. මේ මොහොත වෙනකොට උපාධිධාරීන්ට, 8 සමත් දුප්පත් අයට රැකියා දීලා තිබෙනවා. ඒ වගේම කෘෂිකර්මය දියුණු කරන්න වැඩපිළිවෙළක් ආරම්භ කළා. කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් කියා තිබෙනවා ආණ්ඩුවට තව බොහෝම කෙටි කාලයයි ආයුෂ තිබෙන්නේ කියලා. එතුමාට එක වැරදිලා. අපි පළාත් සභා මැතිවරණය පවත්වන කොට බලාගන්න පුළුවන් අපේ ශක්තිය. අපි පළාත් සභාවට තරග කරනවා ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ විදිහට. අපි ඇස් ඇරෙන්න ජයග්‍රණය කරනවා. ඒ නිසා අද අපි වැඩ කරන පංතියත් එක්ක සමීප සම්බන්ධතාවක් පවත්වාගෙන යන්නේ. ඒ අයගේ ප්‍රශ්න පිළිබඳව ජනාධිපතිතුමා, බැසිල් රාජපක්ෂ මැතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා මැදිහත් වෙලා ප්‍රශ්න විසඳා දෙනවා. අපි ඉතාමත් කිට්ටු සම්බන්ධතාවක් තියාගෙන වැඩකටයුතු කරන්නේ. ඒ වගේම ස්වයං රැකියා කරන අයට විවිධාකාර ආධාර දුන්නා. අද අපි එහෙම කටයුත්තක් කරන්නේ නෑ. අපි සියලු දේ භාර දී තිබෙන්නේ පොලිස් දෙපාර්තමේන්තුවටත්, බුද්ධි අංශයටත්, නීතිපතිටත් ඒ කටයුතු පරීක්ෂා කරලා කටයුතු කරන්න. අපි ආණ්ඩුවක් විදිහට බලයට ආවේ දේශපාලනඥයන්ගේ පළිගැනීමට නෙවේ. මේ රටේ අහිංසක ජනාතාවට නිදහසේ ජීවත්වන සමාජයක් නිර්මාණය කිරීම සඳහායි. අපි වැඩ කටයුතු කරන්නේ.

**පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය රංජිත් බණ්ඩාර මහතා,**

පරිසරය විනාශ කළේ කවුරු ද කියා මේ රටේ මහජනයා දන්නවා. පරිසරය වෙන්නත් පුළුවන්, වෙනත් කාරණයක් වෙන්නත් පුළුවන් ඒක සංවේදි නම් ඒක පවිච්චි කරනවා ජනතාව මුළා කරන්න. මේ රටේ මහජනයාගෙන් අපි ඉල්ලනවා අමු අමුවේ එකතැන මිනිස්සු තුන්සීයත් මිය යන කොට බලාගෙන හිටපු ආණ්ඩුවක ඇමැතිකම් කරපු අය අද පාරට බැහැලා මාතෘකාවන් හොයාගෙන මේ රටේ ජනතාව මුළා කරනවා. මේ සංවේදි මාර්ගයන් යොදා ගෙන ජනයා මුළා නොකරන්න. මේ රටේ ඉතිහාසයේ පැවැති එක සංවර්ධන දශකයක් මහින්ද රාජපක්ෂ මැතිතුමා ඇති කළා. සුද්දට පස්සේ කෝච්චියක් අඩියක් ඉස්සරහට ගියා නම්, මේ රටේ ආර්ථිකය අවුරුදු 73ක කාලසීමාව තුළ 8% වර්ධනයට අරගෙන ගියා නම් ඒ මහින්ද රාජපක්ෂ යුගයේ පමණයි. දැන් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ යුගය මේ දෙවැනි සංවර්ධිත දශකයයි.

මේ පහුගිය කාලය තුළදි මේ රටේ ජාතික ආරක්ෂාව තහවුරු වෙලා තිබෙනවා. මේ රටේ සංස්කෘතික උරුමය ආරක්ෂා වෙලා නැත්ද? සැබෑ සංහිඳියාව ඇතිවෙමින් පැවැතියේ නැත්ද? සංහිඳියාව දැන් හොඳ තැනකට ඇවිත් තිබෙනවා. ජනාධිපතිතුමා සෑම සෙනසුරාදාම ගමින් ගමට ගිහින් ගම සමඟ පිළිසඳර වැඩසටහන මඟින් ජනතාවට සවන් දීලා අසරණ මිනිස්සුන්ගේ ඕනෑ එපාකම් ඉටු කරනවා. ඒත් මේ වැඩසටහනෙදි යන වාහන ගැනයි පෙන්වන්නේ. කරන දේවල් පෙන්වන්නේ නෑ. යහපාලන ආණ්ඩුව උපාධිධාරීන්ට රැකියා ලබා දුන්නේ නෑ.

ජනාධිපතිතුමා පොරොන්දු ඉෂ්ට කරනවා. එතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම සරල රාජ්‍ය නායකයෙක්. සෑම ග්‍රාමසේවා වසමකම ගෙවල් හදලා දෙනවා. විපක්ෂ නායකතුමා නිවාස ඇමැතිවරයා විදිහට හිටපු කාලයේ ගෙවල් හැදුව ද කියලා තවම සාකච්ඡා වුණේ නෑ. එතකොට බලන්න පුළුවන් ගෙවල් හැදුව ද ප්‍රචාරණය කරා ද කියලා.

# විෂ පොල් තෙල් ගෙන්වූ සමාගම්වලට නීතිය කෝ?

## එජාප නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන

**ආරියරත්න ගනේගොඩ**
**මැදකොළඹ සමූහ**

පෞද්ගලික ආයතනයක් විසින් මෙරටට ගෙන්වන ලද පොල්තෙල්වල ඇෆ්ලටොක්සින් අඩංගු බව දෙවැනි වරටත් කරන ලද පරීක්ෂණවලින් හොඳින් තහවුරුව තිබියදී පොල්තෙල් ගෙන්වූ ආයතනයේ කිසිවෙක් මේ දක්වා අත්අඩංගුවට ගෙන නොමැති බව පිටකෝට්ටේ සිරිකොත මූලස්ථානයේ පැවැති මාධ්‍යහමුවකදී එජාප නියෝජ්‍ය නායක රුවන් විජයවර්ධන මහතා ප්‍රකශ කළේය.



මෙම විෂ පොල්තෙල් ආනයනය පිටුපසින් සිටින්නේ කවුද? මේ පිළිබඳව රටේ බහුතර ජනතාව ප්‍රකාශ කර සිටින්නේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු රජයේ වගකිව යුතු අයකුගේ උපදෙසින් ගෙන්වා තිබෙන බවත් මෙම විස සහිත පොල්තෙල් පිළිබඳ රටේ වැඩ කරන ජනතාවට විශාල බියක් පහළ වී ඇතැයි ද විස පොල්තෙල් නිසා මෙවර සිංහල අවුරුද්දට කැවිලිපෙවිලි සෑදීමට ජනතාව බිය වෙනු ඇතැයි ද ඒ මහතා සඳහන් කළේය.

පිළිකාකාරක සහිත පොල්තෙල් ගෙන්වීම නීති විරෝධි කටයුත්තක් බව සඳහන් කළ ඒ මහතා මෙතෙක් ඒ සම්බන්ධයෙන් කිසිවකු අත්අඩංගුවට ගෙන නැත්තේ ඇයි දැයි ප්‍රශ්න කළේය. රටේ මිනිස් ජීවිත සමඟ සෙල්ලම් නොකරන්නැයි තමා රාජ්‍ය අංශයේ බලධාරීන්ගෙන් ඉල්ලා සිටින බව ද කියා සිටියේය.

මතභේදයට තුඩුදුන් ආනයනික පිරිපහදු නොකළ පොල්තෙල් තොගවල 'ඇෆ්ලටොක්සින්' නමැති පිළිකාකාරකය අඩංගු බව පාරම්පරික පොල්තෙල් නිෂ්පාදකයනුත් වෙළෙඳ ඇමැති බන්දුල ගුණවර්ධන මහතාත් මාධ්‍ය හමු දෙකක් තබා මීට පෙර කියා සිටි බව ද ඒ මහතා කියා සිටියේය.

ඉකුත් සතියේ සිට මේ දක්වාම ඉතා ආන්දෝලනාත්මක ප්‍රකාශයක් පැතිර ගොස් ඇති බව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණු රජයේ නායක නායිකාවන් පවා දන්නා සුලබ කරුණක් යැයි ද දැනටමත් රජයේ බලධාරීන් විවිධ ආයතන ප්‍රකාශ නිකුත් කරමින් සිටින්නේ යැයි මාධ්‍යවේදියෙකුගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් විජයවර්ධන මහතා පෙන්වා දුන්නේය.

අප රටේ ජාතික සම්පත් විනාශ කළ යුතු නැතැයි ද සිංහරාජයේ ගස් ටිකක් කැපුවත් විශාල ප්‍රමාණයක් කැපුවත් එම වරද වරදක් මිස කිසිම හොඳක් නොවන්නේ යැයි තවත් මාධ්‍යවේදියෙකුගේ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඒ මහතා සඳහන් කළේය.

1988 ජාතික උරුමයන් හා වනභූමි පනත උල්ලංඝනය කරමින් යම් කිසිවකු හෝ වෙනත් සංවිධානයක් කටයුතු කරන්නේ නම් එයට එරෙහිව ක්‍රියා කළ යුතු බවත් ඔහු පැවසීය.

එ.ජා.ප පාලන කාලවලදී සිංහරාජය පමණක් නොව රට තුළ විවිධ පළාත්වල පිහිටුවා තිබෙන වනසංරක්ෂණ කලාප පමණක් නොව සෑම කැලෑවක්ම ආරක්ෂා කළ බව සිහිපත් කළ එජාප නියෝජ්‍ය නායකවරයා, තම පක්ෂය මේ පිළිබඳව යුනෙස්කෝ ආයතනයට පවා දන්වා ඇතැයි ද කියා සිටියේය.

පසුගිය කාලයේ සිංහරාජය තුළ පිහිටුවා තිබූ අඩිපාර පිළිබඳව මාධ්‍යවේදියකු ප්‍රශ්න කළ අවස්ථාවේදී මේ වන විට එදා අඩිපාර නොහොත් කරත්ත පාර ගල්තාර සහිත මහපාරක් බවට පත්ව තිබෙන බව ඒ මහතා කීය.

මෙම මාධ්‍ය සාකාච්ඡාවේදී ආචාර්ය අජන්තා පෙරේරා මහත්මිය ද අදහස් දැක්වූවාය.

# දේශපාලන රැකවරණය පතා ජර්මනියේ සිටින දෙමළ ජනතාව පිටුවහල් නොකරන ලෙස ඉල්ලීම් කළා

## පා.ම. එස්. ශ්‍රීධරන්

**රසුල දිල්හාර ගමගේ**
**උතුරු පළාත් විශේෂ**

ජිනීවා මානවහිමිකම් කවුන්සිලයේදී සම අනුග්‍රාහකයකු වශයෙන් පෙනී සිටි ජර්මනිය මේ අවස්ථාවේදී දේශපාලන රැකවරණය පතා ජර්මනියේ රැඳී සිටින දෙමළ ජනයා පිටුවහල් කිරීම නතර කරන ලෙස දෙමළ ජාතික සන්ධානය ඉල්ලීමක් කොට ඇති බව පාර්ලිමේන්තු මන්ත්‍රී එස්. ශ්‍රීධරන් මහතා පෙරේදා (30) පැවසීය.

කිලිනොච්චිය මධ්‍ය විද්‍යාලයේ පැවති සාකච්ඡාවකදී කිලිනොච්චියේ දෙමළ වැසියන් පිරිසක් මන්ත්‍රීවරයාගෙන් විමසන ලද ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඔහු එසේ පැවසීය.

'මේ අවස්ථාවේදී ජර්මනිය දෙමළ ජනතාව ආපසු පිටත් කොට හැරීම අසාධාරණයක් බව දෙමළ ජාතික සන්ධානය



ලිඛිතව හා වාචිකව ජර්මන් රජයට දැනුම් දී තිබෙනවා. මේ දෙමළ ජනතාව ජර්මනියට ගොස් ඒ රටේ ජීවත් වීමේ අයිතිය ඉල්ලා සිටියේ ඔවුන්ගේ ආරක්ෂාව සඳහායි. සමහරු ජර්මනියේ අධිකරණවල මේ සම්බන්ධයෙන් නඩු පවරා තිබෙනවා.

මේ අවස්ථාවේදී සිදුව තිබෙන්නේ ශ්‍රී ලංකා රජය දෙමළ ඩයස්පෝරාවට සම්බන්ධ සංවිධාන ගණනාවකට හා පුද්ගලයන් පිරිසකට විරුද්ධව තහනම් නියෝග පැනවීමත් සමඟම ජර්මනිය ද කලබලයට පත්ව සිටීමයි.

ඒත් මේ තත්ත්වය ගැන යළි සලකා බලන ලෙස ජර්මන් රජයට දැනුම් දෙන ලෙස අපි මානවහිමිකම් සංවිධානවලින් ඉල්ලා තිබෙනවා. ජර්මන් රජයෙනුත් අපි ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් කොට තිබෙනවා.

කාලයක්ම ජර්මනියේ රැඳී සිටි දෙමළ වැසියන්ට එක්වරම ආපසු ශ්‍රී ලංකාවට පැමිණ මෙහි ජීවත් වීම අසීරු බව ජර්මන් රජය පිළිගන්නා බව අපි විශ්වාස කරනවා. තවත් දෙමළ දේශපාලන පක්ෂ කිහිපයක් හා දෙමළ සංවිධාන ගණනාවක් මේ ගැන ජර්මන් රජයට කරුණු පැහැදිලි කොට තිබීම නිසා ඉතා ඉක්මනින්ම එහි සිටින දෙමළ වැසියන්ට සහනයක් ලැබෙනු ඇතැයි අපි විශ්වාස කරනවා.

# පොල්තෙල් වංචාව ගැන හෙළි කළේ ආණ්ඩුවයි

## ඇමැති මහින්දානන්ද අලුත්ගමගේ



**නදී මාණික්කගේ**

පොල්තෙල් වංචාව පිළිබඳ හෙළි කළේ ආණ්ඩුව බවත් එම පොල්තෙල් වෙළෙඳපොළට නිකුත් වී ඇත්නම් ඒ පිළිබඳ නීතිය ක්‍රියාත්මක කරන බවත් අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා ඊයේ (31) පැවසුවේය.

මේ සම්බන්ධයෙන් ආණ්ඩුවට දොස් කියා වැඩක් නැති බව පැවසූ ඒ මහතා වැඩිදුරටත් මෙසේද කීවේය.

"පොල්තෙල් ගෙනල්ලා තියෙන්නේ ව්‍යාපාරිකයන් දෙදෙනෙක්. ඒ පොල්තෙල් ප්‍රතිඅපනයනය කළා. ඒ පොල්තෙල් වෙළෙඳපොළට නිකුත් කරලා තියෙනවා නම්, ඒ පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරනවා. අවුරුදු 05ක්ම මේ රටේ වංචාවන් හැංගිලා තිබුණේ. පළමු වැනි පාරට මේ වංචා ගැන අපි දැනගත්තේ. දැන් අපි ඒ වංචා අල්ලනවා. ඉතින් ආණ්ඩුවට ඇඟිල්ල දික්කරලා වැඩක් නෑ.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රටේ වංචාවල් අල්ලගෙන, හොයාගෙන දඬුවම් දීගෙන ජනතාව අපේක්ෂා කරපු දේවල් මේ කර ගෙන යන්නේ.

පෙරේදා සජිත් ප්‍රේමදාස මහත්තයා සීඅයිඩී එකට ගිහින් පැමිණිල්ලක් දාලා කියනවා පරීක්ෂණයක් කරන්න කියලා. ඒ පරීක්ෂණය කරන්න ඕන මේ වංචාව කරපු කෙනාට විරුද්ධව, නැතුව ආණ්ඩුවට විරුද්ධව නෙවෙයි. මෙතෙක් කල් හොරට ගෙනාව එක ආණ්ඩුව අල්ලලා තියෙනවා. එච්චරයි."

# කොළඹ වරාය නගරයට අදාළ නීති කෙටුම්පත සන්ධීය ක්‍රමයත් ඉක්මවා යනවා

## සජබ පා.ම. චම්පික රණවක

**සුභාෂිණී සේනානායක**

කොළඹ වරාය නගරයට අදාළ නීති සම්බන්ධයෙන් දැනට ප්‍රසිද්ධියට පත්ව ඇති කෙටුම්පත අනුව සන්ධීය ක්‍රමයත් ඉක්මවා ගිය කොන්ෆෙඩරල් තත්ත්වයක් ඉන් ඇති කර තිබෙන බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී චම්පික රණවක මහතා පවසයි.

කොළඹ වරාය නගරය සම්බන්ධ දැනට ඉදිරිපත්ව ඇති ලියවිල්ලෙන් පෙනී යන්නේ අමෙරිකා එක්සත් ජනපදය හා පුවෝටෝරිකාව අතර තිබෙනවා සේ පද්ධති දෙකක් වෙනම පවත්වා ගැනීමක් බවද ඒ මහතා පෙන්වා දෙයි.

ඒකීයභාවය ගැන පපුවට ගහගෙන කතා කරපු අය සන්ධීය ක්‍රමයත් ඉක්මවා



ගිය කොන්ෆෙඩරල් තත්ත්වයක් මේ තුළින් ඇති කර තිබෙව බව හැඟී යන බව කියා සිටි ඒ මහතා, බදු සහන දීමට අවශ්‍ය අනපනත් ඕනෑ තරම් මෙරට ඇතැයි ද කියා සිටියේය.

මේ රට ඇතුළෙම වෙනම රටක් හදන එක, ඒ කියන්නෙ අපේ රටෙත් කොල්ලකාගෙන ගෙනියපු සල්ලි සීෂෙල්ස්වල වර්ජින් අයිලන්ඩ්ස්වල හංගපු කට්ටියට දැන් ඒවා මේ වරාය නගරයේ හංගන්න පුළුවන් වෙන තත්ත්වයකුත් මේකෙ තියෙනවා වෙන්න පුළුවන්, එහෙම නැත්නම් විදේශවල කළු සල්ලි මෙහෙ ගෙන ඒමේ වෑයමක් වෙන්නත් පුළුවන් යැයි ද ඒ මහතා ප්‍රකාශ කළ අතර, ව්‍යවස්ථාවෙ 76 වැනි වගන්තියෙන් පාර්ලිමේන්තුවට පවරලා තියෙන නීති තැනීමේ බලය මෙම ගැසට් නිවේදනය මඟින් උල්ලංඝනය වෙනවා ද යන්න අධිකරණය තීරණය කළ යුතු යැයි ද සඳහන් කළේය.

චම්පික රණවක මහතා මේ බව පැවසුවේ කොළඹ වරාය නගරය සම්බන්ධයෙන් ඉදිරිපත්ව ඇති නීති කෙටුම්පත ගැන පෙරේදා (30) දිනයේදී මාධ්‍ය වෙත අදහස් දක්වමිනි.

# අපගේ අරමුණ මිනිසාට මිනිසා පීඩා නොකරන සමාජයක් ගොඩනැඟීමයි

## කේ.ඩී. ලාල්කාන්ත

**මාතලේ දිස්ත්‍රික් සමූහ**

"අද වන විට කොයි අතින් බැලුවත් දක්නට ඇත්තේ කුමන ආකාරයේ හෝ හිංසනයක්. මෙම හිංසාකාරී තත්වයන්ගෙන් මිදීමට යම්කිසි අරගලයක් කළ යුතු නමුත් වර්තමාන සමාජය තුළ කැපී පෙනේනේ පංති අරගලය පමණයි. මෙවැනි අරගලයන්ගෙන් කැපී පෙනෙන්නේ ජනතාව ගිලගෙන ඇති පීඩනයයි. එබැවින් මෙම පීඩාකාරි තත්ත්වයෙන් ජනතාව ගලවා ගත යුතුයි. අපට අවශ්‍ය දේශපාලන නායකයන් පැරදවීම නොව මිනිසා විසින් මිනිසාට පීඩා නොකරන සමාජයක් ගොඩනැඟීමයි. අපගේ අරගලයෙහි මූලික අරමුණ එය යැයි ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩල සභික කේ.ඩී. ලාල්කාන්ත මහතා දඹුල්ලේ පැවැති මාධ්‍ය සාකච්ඡාවකදී පැවසීය.

ඒ මහතා වැඩිදුරටත් මෙසේ ද පැවසීය.

මේ වන විට රාජ්‍ය සේවකයන් ලක්ෂ දොළහක් මෙන්ම පෞද්ගලික අංශයේද සේවකයන් ලක්ෂ හැටක් සිටිනවා. මොවුන් සියලු දෙනාම සිටින්නේ කුමන හෝ ආර්ථික පීඩනයකින්. එදා සිට අද වන තුරු ගොවියා වෙහෙස මහන්සි වී වැඩ කරනවා. නමුත් ඔවුන්ගේ වෙහෙසට අද ඉතිරිව ඇත්තේ දිළිඳුකම පමණයි. මෙම අසරණ ජනතාවගේ මහන්සියෙන් සැපසේ



සිටිමින් අධික ලාභ ලබන්නේ අතළොස්සක් පමණයි. මෙය බරපතළ අපරාධයක් මෙන්ම අසාධාරණයක්. නිදහස් ලංකාවේ වරින්වර බලයට පැමිණි පාලකයන් කළේ මේ අතළොස්ස ආරක්ෂා කිරීම පමණයි. ගොවියා ළඟ අද වන විට ඇත්තේ දුප්පත්කමේ පීඩාව පමණයි.

විවිධ සමාජ හිංසනයන් ගැන නොයෙක් විට පාලකයන් කථා කරනවා. එවැනි හිංසනයන් තුරන් කිරීමට ඔවුන් විවිධ සැලසුම් ද ඉදිරිපත් කරනවා. නමුත් මෙතෙක් කළ දෙයක් නම් නෑ. විශේෂයෙන් ළමා හිංසනය මෙන්ම කාන්තා හිංසනය මේ වන විට සමාජයේ ඉහවහා ගිහිල්ලා. එම හිංසනයන් විසඳන පාටක් නම් පේනතෙක් මානයේ නෑ. ලොව වෙනත් රටවල මෙවැනි හිංසනයන්ට එරෙහිව සටන් කළ නිසයි ඔවුන්ට අද වන විට මෙතරම් දුරක් පැමිණීමට හැකි වී තිබෙන්නේ.

වර්තමානයේ අලි - මිනිස් ගැටුම් උග්‍ර වෙලා. රටේ සෑම දිසාවේම අද වන විට ප්‍රසිද්ධ තැන්වල ඉඳගෙන ජනතාව මෙම වන අලි උවදුර නවත්වන ලෙස ආණ්ඩුවෙන් ඉල්ලා උද්ඝෝෂණය කරනවා. නමුත් රජයෙන් කිසිම විසඳුමක් ඒ සඳහා නෑ. එපමණක් නොව විවිධ අයිතීන් ලබා ගැනීමට රටේ සෑම තැනකම රජයට එරෙහිව උද්ඝෝෂණ කරන නමුත් රජය නිහඬයි.

පරිසරය විනාශ වන විට වන අලි ගම්වැදීම වළක්වන්න බෑ. අපි කෘෂි නිෂ්පාදනයන් කළ යුත්තේ පරිසරය ආරක්ෂා කරමිනුයි. මේ සියලු විනාශයන් සිදුවෙමින් පවතින්නේ බලය එක පුද්ගලයකුට කේන්ද්‍රගත වීම නිසයි. විධායක, ව්‍යවස්ථාදායක මෙන්ම අධිකරණය යන බලතල සියල්ල අද වන විට රැඳී ඇත්තේ රජාණන් අතේ. එබැවින් රටේ මේ බලය එක් පුද්ගලයෙකු වටා නොතබා ඉහළ සිට පහළට බෙදිය යුතුයි. සියලු බලතල පාර්ලිමේන්තුව සතු විය යුතුයි.

# රටටම බත සැපයූ ඩී. එස්. සේනානායක ප්‍රතිපත්තිය රට පුරා ක්‍රියාත්මක කළ යුතුයි

## එජාප හිටපු පා.ම. නාලක කොළොන්නේ

**පොළොන්නරුව දිස්ත්‍රික් සමූහ**
**ඇම්. පී. සරත්**

රටට බත දුන් මහාමාන්‍ය ඩී. එස්. සේනානායක ජාතියේ මහා පීතෘවරයෙක් බව එක්සත් ජාතික පක්ෂයේ පොළොන්නරුව දිස්ත්‍රික් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී නාලක කොළොන්නේ මහතා පැවසීය. ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ ඉකුත් 22 පොළොන්නරුව පරාක්‍රම සමුද්‍රය වැව් බැම්මේ ඉදිකර ඇති මහාමාන්‍ය ඩී. එස්. සේනානායක ශ්‍රීමතාණන්ගේ පිළිරුවට 69 වැනි ගුණ සමරුව නිමිත්තෙන් නාලක කොලොන්නේ මහතා මල් කලඹක් තබා පුෂ්පෝපහාර දැක්වීමෙන් පසුව මාධ්‍යවේදීන් අමතමිනි. මෙම අවස්ථාවට පොළොන්නරුව දිස්ත්‍රික්කයේ එජාප පක්ෂයේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් ඇතුළු පාක්ෂිකයෝ විශාල පිරිසක් එක් වූහ.

මාධ්‍යවේදීන් හමුවේ නාලක කොලොන්නේ මහතා මෙසේ ද කීය.

"රටට බත දුන් මහාමාන්‍ය ඩී. එස්. සේනානායක ජාතියේ මහා පීතෘවරයෙක්. එතුමා එදා නොසිටියා නම් ශ්‍රී ලංකාවේ අද ගොවි ජනපද නැහැ. අපිට බත් කන්න ලැබෙන්නේ නැහැ. එදා එතුමා මේ පළාත්වලට ඇවිත් පිට පළා-



ත්වලින් මේ පළාත්වලට පවුල් ගෙනත් නිවාස, ඉඩම්, කුඹුරු දී වගා අස්වනුවලට වී ඇතුළු අනිකුත් දේ දී අස්වනු ලැබෙන කල් උදවු කළා. මැලේරියාව, මදුරු, අලි, කොටි කරදර මැද එතුමාත් මේ පවුල් සමඟ සංවර්ධන ක්‍රියාවලියේ සිටියා. අද මේ ගොවිජනපදවල ජනතාව රටටම බත් කන්න හැකියාව ඇති කළා. අපි එතුමාට කළගුණ මෙන්ම ගෞරවය දැක්විය යුතුයි. මහාමාන්‍ය ඩී. එස්. සේනානායක අගමැතිතුමා ජනතාවගේ කුසගින්න නිවාලීමට කටයුතු කළ යුග නායකයෙක්. ජේ.ආර්.ජයවර්ධන යුගයේත් රටට ජාතියට විශාල සේවයක් වුණා. මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමා තමයි අපේ පැරණිම පක්ෂය වූ එක්සත් ජාතික පක්ෂය ඇති කළේ. එක්සත් ජාතික පාක්ෂිකයන් කළගුණ දන්නා අයයි. එක්සත් ජාතික පක්ෂය ප්‍රතිසංවිධානය කරලා පක්ෂය ශක්තිමත් කර ඕනෑම මැතිවරණයකට මුහුණ දී ජයගන්න හැකි තත්ත්වයක් දැන් ඇති කර තිබෙනවා. ඒ අනුව මෑතකදීම එක්සත් ජාතික පක්ෂ රජයක් පිහිටුවනවා යැයි කී නාලක කොලොන්නේ මහතා මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්න කිහිපයකට පිළිතුරු දෙමින් මෙසේ ද කීය.

"මේ රජය දැන් ෆේල් වෙලා ඉන්නේ වැඩ බැරි රජයක් වෙලා. එදා මේ රටේ මිනිස්සු පොහොට්ටුව දිනුවා කියලා නව රජයක් පිහිටුවා ගත්තා කියලා කිරිබත් කෑවා. ආයේ කිරිබත් කන්න වෙන්නේ රුපියල් එකසිය ගණන්වලට සහල් අරගෙන. හාල්, පොල් ඇතුළු සියලුම භාණ්ඩවල මිල දිනෙන් දින ඉහළ යනවා. කිසිම නිෂ්පාදනයක් රටේ නැහැ. රටේ දේපොළ රට රටවලට විකුණනවා. නැගෙනහිර ජැටිය දෙන්න ගියා. ජනතා විරෝධය, වෘත්තීය සමිති විරෝධය ආවා. පස්සේ හොරෙන්ම බටහිර ජැටිය දුන්නා. දැන් ලංකාවම දීගෙන දීගෙන යනවා" යැයිද ඒ මහතා පැවසීය.



# ශ්‍රී ලංකා ඉනිමට වර්ෂාවෙන් බාධා

## ලකුණු 189ට කඩුලු 5යි

ලහිරු තිරිමාන්න

නික්රුමා බෝනර්ගේ උඩ පන්දු රැකීම හමුවේ නායක දිමුත් කරුණාරත්න දැවී ගිය අයුරු.

කාඩින් කඩ ඇද හැලුණු වර්ෂාවෙන් තරගයට බාධා වීම නිසා කොදෙව් පිල සමග පැවැත්වෙන දෙවැනි සහ අවසන් ටෙස්ට් තරගයේ තෙවැනි දිනය වූ ඊයේ දිවා විවේකය වන විට ශ්‍රී ලංකා පිලට ක්‍රීඩා කළ හැකි වූයේ ඕවර 21.2කට පමණි.

ශ්‍රී ලංකා ඉනිමේ 74 ඕවරයේදීත් පසුව 83 වැනි ඕවරවෙයිදීත් පිටියට වැසි පතිත වූ අතර, ඒ හේතුවෙන් 83 වැනි ඕවර අතරතුර දිවා විවේකය සඳහා තරගය නතර කිරීමට විනිසුරුවෝ තීරණයක කළහ. කෙසේ වෙතත් ඊයේ තරගයේ මුල් කාර්තුවේදී ශ්‍රී ලංකා පිලේ ප්‍රබල පිතිකරුවන් දෙදෙනකු යළි ක්‍රීඩාගාරයට හරවා යැවීමට කොදෙව් පන්දු යවන්නන් සමත්ව තිබිණි.

ඒ අනුව ඇන්ටිගුවාහි ශ්‍රීමත් විවියන් රිචර්ඩ්ස් ක්‍රීඩාංගණයේ පැවැත්වෙන තරගයේ ඊයේ (31) දිවා විවේකය සඳහා ක්‍රීඩාව නතර කරන විට ශ්‍රී ලංකා කණ්ඩායම කඩුලු 5ක් දැවී ලකුණු 189ක් රැස් කර ගෙන සිටියේය.

කොදෙව් පිල පළමු ඉනිමට ලකුණු 354ක් රැස් කළ අතර, ඒ හේතුවෙන් කඩුලු 5ක් අතැතිව සිටින ශ්‍රී ලංකා පිල තවත් ලකුණු 165ක් පසුපසින් සිටී.

පැතුම් නිස්සංක ලකුණු 14ක් සහ නිරෝෂන් දික්වැල්ල ලකුණු 9ක් රැස් කරමින් නොදැවී කඩුල්ලේ රැඳී සිටිති.

දිනය ආරම්භයේදී ධනංජය ද සිල්වා (23) සමඟින් නොදැවී කඩුල්ලේ රැඳී සිටි දිනේෂ් චන්දිමාල් (34) දිනයේ පළමු කඩුල්ල ලෙස දවා ගැනීමට ෂැනොන් ග්‍රේබියෙල් සමත් වූයේ අතිරේක ක්‍රීඩක හේඩන් වොල්ෂ් උඩ පන්දුවක් රැක ගැනීමෙනි.

චන්දිමාල් ඊයේ එක් කර ගත හැකි වූයේ තවත් ලකුණු 10ක් පමණි. පළමු තරගයේදී ඉනිම දෙකේදීම ලකුණු 4 බැගින් රැස් කළ චන්දිමාල් ඉනිම මෙවර ලකුණු 44කින් නතර විය.

පෙරේදා තරගය නතර කරන විට සිව්වැනි කඩුල්ලට ගොඩනැගූ ලකුණු 59ක සබඳතාවට තවත් එක් වූයේ ලකුණු 16ක් පමණි.

ධනංජයටත් ඊයේ තවත් රැස් කරගත හැකි වූයේ ලකුණු 16ක් පමණි. ජෙරමයින් බ්ලැක්වුඩ්ගේ පන්දුවක් හමුවේ ඔහු (39) කඩුල්ල මුවා වීමේ වරදට හසු විය. ඒ වන විට මුළු ලකුණු සංඛ්‍යාව 177ක් විය.

මේ තරගාවලියේදී තෙවැනි වරටත් ලකුණු අතරට පිවිසීමට අවස්ථාවක් නොලැබුණු නායක දිමුත් කරුණාරත්න ඉනිමේ පළමු කඩුල්ල ලෙස දැවී ගියේ නක්රුමා බෝනර් තනි අතින් රැක ගත් විශිෂ්ට උඩ පන්දුව හේතුවෙනි. ඔහුට රැස් කළ හැකි වූයේ එක් ලකුණක් පමණි. මුළු ලකුණු 18දී දිමුත් දැවී යෑමෙන් අනතුරුව ආරම්භක පිතිකරු ලහිරු තිරිමාන්නට එක් වූ ඕෂධ ප්‍රනාන්දු මුළු ලකුණු සංඛ්‍යාව 64 දක්වා ඉදිරියට ගෙන ගිය අතර, කයිල් මේයර්ස්ගේ පන්දුවක් හමුවේ කඩුල්ල මුවා කිරීමේ වරදට හසුවීමෙන් ඔහුගේ ඉනිම ද නිමා විය. පන්දු 71කට මුහුණ දුන් ඕෂධ ලකුණු 18ක් රැස් කළේය. පන්දු 102කදී මේ තරගාවලියේ අඛණ්ඩ තෙවැනි අර්ධ ශතකය රැස් කිරීමට සමත් වූ තිරිමාන්න තවත් පන්දු 4කට මුහුණ දීමෙන් පසු පිටියෙන් ඉවත් කිරීමට කෙමර් රෝච් සමත් වූයේ පන්දුව කෙළින්ම කඩුල්ලේ වැදීමට සැලැස්වීමෙනි. 9 වැනි අර්ධ ශතකය රැස් කළ ඔහු හතරේ පහර 6ක් එල්ල කර තිබිණි.

අද තරගයේ සිව්වැනි දිනයයි.

***කොදෙව් පළමු ඉනිම - 354යි (සියලු දෙනා දැවී) ක්‍රෙග් බ්‍රැත්වේට් 126, රකීම් කෝන්වෙල් 73, කයිල් මේයර්ස් 49 (සුරංග ලක්මාල් 94/4, දුෂ්මන්ත චමීර 69/3, ධනංජය ද සිල්වා 26/1, විශ්ව ප්‍රනාන්දු 71/1, ලසිත් ඇඹුල්දෙණිය 88/1)***

***ශ්‍රී ලංකා පළමු ඉනිම - 189/5යි. (තෙවැනි දිනයේ දිවා විවේකය වන විට) ලහිරු තිරිමාන්න 55, දිනේෂ් චන්දිමාල් 44, ධනංජය ද සිල්වා 39 (ජෙරමයින් බ්ලැක්වුඩ් 10/1, කයිල් මේයර්ස් 10/1, ෂැනොන් ග්‍රේබියල් 33/1, අල්සාරි ජෝසප් 35/1, කෙමර් රෝච් 54/1)***

# බක්මහ පාපැදි - අර්ධ මැරතන් තරග 100ක්

ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය, ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහ ක්‍රීඩා දෙපාර්තමේන්තුව එක්ව සංවිධාන කරනු ලබන දීප ව්‍යාප්ත බක්මහ පාපැදි (ස්ටෑන්ඩර්ඩ්) හා අර්ධ මැරතන් ධාවන තරග රට පුරා ආවරණය වන පරිදි තරග 100ක් අප්‍රේල් මස 11 වැනි දින සිට 30දා දක්වා පැවැත්වීමට සූදානම් වෙයි.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ "සෞභාග්‍යයේ දැක්ම" යථාර්ථයක් කරනු වස් රට පුරා විසිරී සිටින තරුණ, දක්ෂ ක්‍රීඩක ක්‍රීඩිකාවන් හඳුනාගෙන ඔවුන් ජාතික හා අන්තර්ජාතික තලයට ඔසවා තැබීමේ අරමුණු පෙරදැරිව මෙය ක්‍රියාත්මක වේ.

රට තුළ ක්‍රීඩා සංස්කෘතියක් නිර්මාණය කිරීමේ අභිප්‍රායෙන් ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ සංකල්පයක් හා මඟ පෙන්වීම අනුව ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය තේනුක විදානගමගේ මහතාගේ මෙහෙයවීමෙන් සියලු දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඒකාබද්ධව සෑම දිස්ත්‍රික්කයකම මේ බක්මහ පාපැදි (ස්ටෑන්ඩඩ්) සහ අර්ධ මැරතන් තරගාවලිය පැවැත්වේ.

දිස්ත්‍රික් මට්ටමේ ප්‍රථම ස්ථානයට රුපියල් 50,000ක්, දෙවැනි ස්ථානයට රුපියල් 25,000ක් හා තෙවැනි ස්ථානයට රුපියල් 10,000ක් පිරිනැමේ. දිස්ත්‍රික් මට්ටමේ 10 වැනි ස්ථානය දක්වා සෙසු ත්‍යාග පිරිනැමීමට ද කටයුතු යොදා ඇත.

අයැදුම් පත් භාර ගන්නා අවසාන දිනය මේ මස 9 වැනි දින වන අතර, අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරි වෙත අයැදුම්පත් භාර දිය යුතු වේ.

# එස්එස්සී පිලට එරෙහිව මුවර්ස්ලාට විස්මිත ජයක්



මුවර්ස් පිලේ ශතකලාභියෝ මහේල සහ ෂමාස්

නායක මහේල උඩවත්තගේ සහ මොහොමඩ් ෂමාස්ගේ විශිෂ්ට ශතක හේතුවෙන් සිය ලකුණු පුවරුව ඉහළ නැංවූ මුවර්ස් ක්‍රීඩා සමාජය හමුවේ ලකුණු 5ක සියුම් පරාජයක් අත්විඳ ගැනීමට ප්‍රබල එස්එස්සී ක්‍රීඩා සමාජයට සිදුවිය.

අන්තර් සමාජ එක්දින තරගාවලිය යටතේ පසුගියදා එස්එස්සී පිටියේ පැවැති මේ තරගයේ කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහර දුන් මුවර්ස් පිලේ ලකුණු පුවරුව ඉහළ නැංවූ නායක උඩවත්ත ලකුණු 116ක් රැස් කිරීමට සමත් වූ අතර, ෂමාස් රැස් කළ ලකුණු සංඛ්‍යාව 111කි.

මුවර්ස් පිල ඕවර 50 අවසානයේ කඩුලු 7කට රැස් කළ ලකුණු 295 හඹා ගිය එස්එස්සී පිලට ඕවර 50 අවසානයේ රැස් කළ හැකි වූයේ ලකුණු 290ක් පමණි. ෂම්මු අෂාන් ලකුණු 102කින් ඉනිම වර්ණවත් කළ ද ජයග්‍රහණයට එය ප්‍රමාණවත් නොවීය.

මේ අතර බීආර්සී පිලට එරෙහිව ඔවුන්ගේ ක්‍රීඩා පිටියේ පැවැති තරගයකින් කඩුලු 6ක ජයක් වාර්තා කිරීමට සීසීසී පිල සමත් විය.

කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහර දුන් බීආර්සී පිල ඕවර 30.5කදී ලකුණු 119කට සීමා කිරීමට සමත් වූ සීසීසී පිල තරගය ජයගත්තේ ඕවර 17.3කදී කඩුලු 4ක් පමණක් බිඳ වැටීමෙන් පසුවය.

තියුණු සටනක නිරත වූ නාවික හමුදා ක්‍රීඩා සමාජය වැලිසර දී පැවැති තවත් තරගයකින් හලාවත මේරියන්ස් පිල කඩුලු 3කින් පරාජය කිරීමට සමත් විය. කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහර දුන් හලාවත මේරියන්ස් පිල ඕවර 50 අවසානයේ කඩුලු 8කට ලකුණු 240ක් රැස් කළ අතර, ඕවර 49.2කදී ඉලක්කය සපුරා ගැනීමට නාවිකයෝ සමත් වූහ.

මේ අතර සෙබස්තියනයිට්ස් පිලට එරෙහිව ලකුණු 98ක ජයක් වාර්තා කිරීමට සැරසන්ස් පිල සමත් වූ අතර, ගුවන් හමුදා ක්‍රීඩා සමාජයට එරෙහිව ලකුණු 34ක ජයක් අත් කර ගැනීමට බ්ලූම්ෆීල්ඩ් ක්‍රීඩා සමාජය සමත් විය.

## යුද හමුදාවත් කඳු තරණයට එක් වෙයි

# කුකුළේගඟ මෝටර් රථ හා යතුරුපැදි තරගාවලිය 10 - 11

ෆවුස් මොහොමඩ්




යුද හමුදා මෝටර් ක්‍රීඩා කමිටුවේ සභාපති, යුද හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් වසන්ත මාදොල මහතාට හච් ශ්‍රී ලංකා සමාගමේ ප්‍රධාන අලෙවි නිලධාරි රම්සිනා ලායි මහත්මිය තරගාවලියේ අනුග්‍රාහකත්වය පිරිනැමූ අයුරු. යුද හමුදා මෝටර් ක්‍රීඩා කමිටුවේ නියෝජ්‍ය සභාපති සහ විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ බළකාධිපති බ්‍රිගේඩියර් ඉන්දු සමරකෝන් මහතා ද සිටී.

ඡායාරූපය - රුක්මාල් ගමගේ

මෙරට ප්‍රමුඛතම සුපර් ක්‍රොස් ධාවන තරග රැසක් සංවිධාන කිරීමෙන් මෝටර් රථ සහ යතුරු පැදි ධාවන පිටියේ කීර්තිමත් නාමයක් දිනා සිටින යුද හමුදාව පළමුවරට කඳු තරණය ධාවන ක්ෂේත්‍රයට එක් වෙයි. මෝටර් රථ ක්‍රීඩා සංගමය (Motor Racing Association) සමඟ එක්ව ශ්‍රී ලංකා යුද හමුදා මෝටර් රථ හා යතුරුපැදි ක්‍රීඩා කමිටුව සංවිධාන කරන කුකුළේගඟ Speed Hill Climb කඳු තරණය මෝටර් රථ හා යතුරුපැදි තරගාවලිය මේ මස 10 සහ 11 දෙදින කුකුළේගඟ යුද හමුදා කඳවුරු භූමියේ අලුතින් ඉදිකළ මෝටර් රථ හා යතුරුපැදි ධාවන පථයේදී පැවැත්වේ.

අංශක 60ක බෑවුමකින් සමන්විත මීටර් 900ක දුර ප්‍රමාණයකින් යුතු මේ ධාවන පථය වංගු 7කින් සමන්විත වන අතර, ඊට ඉතා තියුණු වංගු දෙකක්ද ඇතුළත්ය. තරගකරුවන්ට දැඩි අභියෝගයක් ගෙනෙන මේ ධාවන පථයේ මාර්ගය තරණය කරමින් සිය හැකියාව උරගා බැලීමට යතුරුපැදි තරගකරුවන් 100කට ආසන්න සංඛ්‍යාවක් සහ මෝටර් රථ තරගකරුවන් 125කට ආසන්න සංඛ්‍යාවක් එක් වනු ඇත.

කුකුළේගඟ Speed Hill Climb කඳු තරණය මෝටර් රථ හා යතුරුපැදි තරගාවලියට යතුරු පැදි තරග ඉසව් 10කින් සහ මෝටර් රථ තරග ඉසව් 17කින් සමන්විත වන අතර, පැරණි මෝටර් රථ තරග ඉසව් 4ක් ද ඇතුළත් කර තිබේ.

තරගාවලියේ පළමු දිනය 10 වැනිදා යතුරුපැදි තරග ඉසව් පැවැත්වෙන අතර, 11 වැනිදා මෝටර් රථ හා පැරණි මෝටර් රථ තරග පැවැත්වීමට කටයුතු යොදා ඇතැයි තරගාවලිය පිළිබඳ ඊයේ (31) පස්වරු කොළඹ 2, විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තු මූලස්ථානයේ පැවැති මාධ්‍ය හමුවේදී යුද හමුදා මෝටර් ක්‍රීඩා කමිටුවේ සභාපති සහ යුද හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානි මේජර් ජෙනරාල් වසන්ත මාදොළ මහතා ප්‍රකාශ කළේය.

කොවිඩ් වසංගතයේ ව්‍යාප්තිය හේතුවෙන් වසරකට ආසන්න කාලයක් අඩපණ වූ මෙරට යතුරුපැදි හා මෝටර් රථ ක්‍රීඩා තරග බිමට නව අත්දැකීමක් එක් කරමින් යුද හමුදාව තරගාවලිය පවත්වනු ලබන්නේ සෞඛ්‍ය නීතිරෙගුලාසිවලට අනුකූලවය. ඒ අනුව මේ තරගාවලිය නැරඹීමේ අවස්ථාව ක්‍රීඩාලෝලීන්ට නොලැබෙනු ඇතැයි ද මේජර් ජෙනරාල්වරයා කීවේය.

කුකුළේගඟ Speed Hill Climb කඳු තරණය මෝටර් රථ හා යතුරුපැදි තරගාවලියට ප්‍රධාන අනුග්‍රාහකත්වය සපයන හච් ශ්‍රී ලංකා සමාගමේ ප්‍රධාන අලෙවි නිලධාරී රම්සිනා ලායි මහත්මිය සමග මෝටර් රථ ක්‍රීඩා සංගමයේ ලේකම් කලිම් ඉක්බාල්, යුද හමුදා මෝටර් ක්‍රීඩා කමිටුවේ නියෝජ්‍ය සභාපති සහ විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුවේ බළකාධිපති බ්‍රිගේඩියර් ඉන්දු සමරකෝන් සහ තරගාවලියේ විද්‍යුත් මාධ්‍ය අනුග්‍රාහක මහරාජා කැපිටල්ස් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සුසාර දිනාල් මහත්වරු ද මාධ්‍ය හමුවට එක් වූහ.

# හලාවත මේරියන්ස් ක්‍රීඩිකාවන්ට තවත් ජයක්

ෆවුස් මොහොමඩ්

ශිකරි ද සිල්වාගේ අර්ධ ශතකයෙන් ඉනිම ගොඩනැගූ හලාවත මේරියන්ස් කාන්තා පිල කෝල්ට්ස් ක්‍රීඩා සමාජය සමඟ පැවැති අන්තර් සමාජ පළමු කාණ්ඩයේ කාන්තා එක්දින තරගයෙන් ලකුණු 24ක ජයක් වාර්තා කිරීමට ඊයේ සමත් විය.

කෝල්ට්ස් පිටියේ පැවැති මේ තරගයේ කාසියේ වාසිය දිනූ කෝල්ට්ස් පිලේ ඇරියුමෙන් පළමුව පන්දුවට පහර දුන් හලාවත ක්‍රීඩිකාවෝ ඕවර 50 අවසානයේ කඩුලු 9ක් දැවී රැස් කළ ලකුණු 157 හඹා ගිය කෝල්ට්ස් පිල ඕවර 49.2කදී ලකුණු 133කට දැවී ගියේය.

හලාවත මේරියන්ස් පිල වෙනුවෙන් අගනා පිතිහරඹයක නිරත වූ ශිකරි ද සිල්වා ලකුණු 53ක් රැස් කිරීමට සමත් වූ අතර, ලකුණු අතරේ සිටින සුපිරි පිතිකාරිනිය චමරි අතපත්තු ලකුණු 43ක් රැස් කළාය.

මේ අතර ශ්‍රී ලංකා පිලේ යොවුන් තුන්ඉරියව් ක්‍රීඩිකා කවීෂා දිල්හාරිගේ අර්ධ ශතකයත්, කාව්‍යා කාවින්දිගේ විශිෂ්ට පන්දු යැවීමත් හේතුවෙන් ගුවන් හමුදා 'බී' කණ්ඩායමට එරෙහිව ලකුණු 79ක ජයක් වාර්තා කිරීමට සීනිගම ක්‍රීඩිකාවෝ සමත් වූහ.

කාසියේ වාසිය දිනා පළමුව පන්දුවට පහර දුන් සීනිගම පිල ඕවර 50 අවසානයේ කඩුලු 7කට ලකුණු 177ක් රැස් කළේය. කවීෂා දිල්හාරි ලකුණු 65ක් රැස් කළ අතර, ඉමේෂා දුලානි රැස් කළ ලකුණු සංඛ්‍යාව 39කි. පියුමි වත්සලා නොදැවී ලකුණු 30ක් ලබා ගත්තාය.

පිළිතුරු ඉනිම ක්‍රීඩා කළ ගුවන් හමුදා 'බී' කණ්ඩායම ඕවර 39.4කදී ලකුණු 98කට දැවී යද්දී කාව්‍යා කාවින්දි කඩුලු 4ක් දවාලීය.

යුද හමුදා 'බී' පිල සහ නාවික හමුදා පිල අතර ඊයේ පැවැති තවත් තරගයකින් කඩුලු 9ක ජයක් වාර්තා කිරීමට නාවික හමුදා ක්‍රීඩිකාවෝ සමත් වූහ.

කාසියේ වාසිය දිනූ නාවික හමුදා පිලේ ඇරියුමෙන් පළමුව පන්දුවට පහර දුන් යුද හමුදා 'බී' පිලේ ක්‍රීඩිකාවෝ ඕවර 38.5කදී ලකුණු 71කට දැවී ගියහ. විශිෂ්ට පන්දු යැවීමක නිරත වූ ශ්‍රී ලංකා කාන්තා පිලේ හිටපු නායිකා ශෂිකලා සිරිවර්ධන ලකුණු 11කට කඩුලු 4ක් දවාලීමට සමත් වූවාය. නාවික හමුදා පිල තරගය ජයගත්තේ ඕවර 18.5කදී එක් කඩුල්ලක් පමණක් දැවී යෑමෙන් පසුවය.

නිලක්ෂි ද සිල්වාගේ සටන්කාමී අර්ධ ශතකය අපතේ හරිමින් ගුවන් හමුදා 'ඒ' පිල හමුවේ ලකුණු 5ක සියුම් පරාජයක් අත්විඳ ගැනීමට ඊයේ යුද හමුදා 'ඒ' පිලට සිදු විය. පනාගොඩ යුද හමුදා පිටියේ ඊයේ පැවැති මේ තරගයේ කාසියේ වාසිය දිනූ යුද හමුදා පිලේ ඇරියුමෙන් පළමුව පන්දුවට පහර දුන් ගුවන් හමුදා 'ඒ' පිල ඕවර 47.1කදී ලකුණු 127ක් රැස් කළ අතර, යුද හමුදා පිල ඕවර 48.1කදී ලකුණු 122කට දැවී ගියේය.

නිලක්ෂි ද සිල්වා ලකුණු 57ක් රැස් කරමින් සිය කණ්ඩායමේ ජයග්‍රහණය වෙනුවෙන් දැඩි උත්සාහයක නිරත වූවත් ඉනූෂි ප්‍රනාන්දු කඩුලු 4ක් දවාලමින් යුද හමුදා ඉනිම දැඩි පීඩනයකට හසු කර දැමුවාය.



# මාගස්තොට කඳු තරණය 3 සහ 4 නුවරඑළියේදී

මෙරට මෝටර් රථ ක්‍රීඩාවේ ඉපැරණිතම මෝටර් රථ හා යතුරුපැදි තරගාවලිය ලෙස සැලකෙන මාගස්තොට කඳු තරණය මේ මස 3 සහ 4 නුවරඑළිය මාගස්තොට දී පැවැත්වේ.

87 වැනි වරටත් පැවැත්වෙන මේ තරගාවලියේ පළමු දිනයේදී යතුරු පැදි සහ පැරණි මෝටර් රථ ධාවන තරග පැවැත්වෙන අතර, 4 වැනිදා මෝටර් රථ ධාවන තරග සඳහා වෙන් කර තිබේ. ජයග්‍රාහකයන්ට අයත් කුසලාන සහ සහතිකපත් පිරිනැමීම අදාළ දිනයේදීම සිදු කෙරේ.

සිලෝන් මෝටර් රථ ක්‍රීඩා සමාජය (Ceylon Motor Sport Club-CMSC) සංවිධාන කරන මාගස්තොට කඳු තරණ තරගාවලියේ නිල අනුග්‍රාහකත්වය පිරිනැමීම පසුගියදා සිදු කෙරිණි. එම අවස්ථාවට මොබිටෙල් ප්‍රධාන විධායක නිලධාරී චන්දික විතාරණ සහ සිලෝන් මෝටර් ස්පෝට්ස් ක්‍රීඩා සමාජයේ සභාපති නිරෝෂන් පෙරේරා මහත්වරුන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.

වසර 1934 දී ආරම්භ වූ මේ තරගාවලිය කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පසුගිය වසරේදී නොපැවැත්විණි. මෙවර තරගාවලියට තුන්වැනි වරටත් අනුග්‍රාහකත්වය දීමට ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් සමාගම ඉදිරිපත් වී සිටියි.




මොබිටෙල් ප්‍රධාන විධායක නිලධාරී චන්දික විතාරණ මහතා සිලෝන් මෝටර් ස්පෝට්ස් ක්‍රීඩා සමාජයේ සභාපති නිරෝෂන් පෙරේරා මහතා වෙත අනුග්‍රාහක චෙක්පත පිරිනැමූ අයුරු. සිලෝන් මෝටර් ස්පෝට්ස් ක්‍රීඩා සමාජයේ උපසභාපති ෂෆ්රාස් ජුනයිඩ් මහතා ද මෙහි සිටී.



# සමාජ මාධ්‍ය අවිඥානිකයන්ට වෙරළ සංරක්ෂණයෙන් ප්‍රතිකාරයක්

ශ්‍රී ලංකාවේ සොබා සෞන්දර්යය විඳ ගැනීම සඳහා පැමිණෙන වැඩිමනක් විදෙස් සංචාරකයන්ගේ සිත් දිනා ගන්නා සුන්දර පරිසර පද්ධතියක් වන්නේ ස්වභාවික වෙරළ තීරයයි. බොහෝ විදේශිකයන් මෙරටට පැමිණි පසු අපගේ සුන්දර වෙරළ තීරයන් ඔවුනගේ නිවාඩු නිකේතනයන් බවට පත් වන්නේ නිතැතින්මය. රට වට බැඳි නිල් සයුර ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා නිහඬව සපයන දායකත්වය සුළු පටු නොවේ. එබැවින් මෙරට ජාතික ආර්ථිකය වෙනුවෙන් ස්වභාවික වෙරළ තීරය නොමසුරුව සපයන දායකත්වයට කෘතගුණ සැලකීමක් වශයෙන් වෙරළ පෝෂණය කිරීමට සහ රැක ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම වැදගත් වනු ඇත. ඒ අරමුණින් පසුගිය වසරේ ක්‍රියාත්මක කළ කෘත්‍රිම වැලි පෝෂණ ව්‍යාපෘතියේ වත්මන් තත්ත්වය පිළිබඳව යළි සාකච්ඡාවක් සිදු කළ යුතුව ඇත.

ගල්කිස්ස වෙරළ තීරය යනු කොළඹ නගරය කේන්ද්‍ර කර ගත් සංචාරක ආකර්ෂණය සහිත මුහුදු සීමාවකි. එහෙත් වරින් වර වසර ගණනාවක් තිස්සේ වෙරළ ඛාදනයට ද ලක් වූ වෙරළ තීරයක් ද වේ. නිරිතදිග මෝසම් වර්ෂාවේ සෘජු බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ දකුණු හා බටහිර වෙරළබඩ ප්‍රදේශවලට බරපතළ හානි සිදු වීම කවුරුත් දන්නා කරුණකි. දකුණු කොළඹ වැලි පෝෂණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ගල්කිස්ස-අඟුලාන වෙරළ තීරය ඛාදනය වීම වැළැක්වීම සඳහා වැලි කියුබික් මීටර එක් ලක්ෂ පනස් දහසක් පොම්ප කිරීම සිදු වූයේ එකී හානිය අවම කිරීමේ අරමුණ ඇතිවය. වෙරළක් ඛාදනය වන්නේ වෙරළට වැලි සැපයුම නොමැතිකම මැද ඉහත කී දේශගුණික විපර්යාසයන් හේතුවෙනි. ඊට සාර්ථක පිළියමක් යෙදීමට නම් දේශගුණික විපර්යාසයන් මෙන්ම පාරිසරික අවියෝජනීයයන් පිළිබඳව ද මනා අධ්‍යයනයක් කළ යුතු වේ. කෙසේ වෙතත් බරපතළ ලෙස වෙරළ ඛාදනයට ලක් වන අනගි මුහුදු තීරයක් විනාශ වී යන්නට දී බලා නොසිට කෘත්‍රිම අන්දමට හෝ වැලි පෝෂණය කිරීම සුදුසු පිළිවෙතකි. ලෝකයේ බොහෝ රටවල් වෙරළ ඛාදනය අවම කර ගැනීම උදෙසා ක්‍රියාත්මක කරන කෘත්‍රිම වැලි පර ගොඩ නැංවීමේ ක්‍රම මෙරට මුහුදු තීරයේ යහපැවැත්ම පිණිස ආදේශ කර ගැනීම මනාය.



වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සුගත් යාලේගම මහතා

මෙකී ව්‍යාපෘතියේ මූලික කටයුතු ආරම්භ වූයේ 2017 වසරේදීය. අදාළ තොරතුරු වාර්තා සහ ශක්‍යතා වාර්තා ඉදිරිපත් කොට මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකි වූයේ පසුගිය වසරේ පෙබරවාරි මාසයේ අගභාගයේ දීය. මෙම ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා අවැසි තාක්ෂණික ඥානය ලංකාව තුළ නොතිබූ නිසා අන්තර්ජාතික මිල ගණන් කැඳවා ඩෙන්මාර්කයේ 'Rodhe Neilsen'ආයතනය වෙත ව්‍යාපෘතිය ප්‍රදානය කර තිබුණි. වෙරළ ඛාදනය වැළැක්වීමේ මෘදු විසඳුමක් ලෙස ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 110ක් වැය කර තිබේ. මෝසම් සමයේදී වෙරළේ පළල අඩු වී පසුව නැවත යථා තත්ත්වයට පත් වීම සාමාන්‍ය ස්වභාවික සංසිද්ධියකි. ඒ ස්වභාවික වාසිය ප්‍රයෝජනයට ගනිමින් ව්‍යාපෘතිය ආරම්භයේදී මීටර 25,000 ක භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි නිදහසේ වැලි පැතිරවීමට ඉඩ හැර තිබේ. ව්‍යාපෘති යෝජකයා වන වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ සඳහා දිගු කාලීන හා කෙටි කාලීන ක්‍රම පිළිබඳව අධ්‍යයනය කිරීම තුළින් අත්කර ගත් දැනුම අනුව මෙය ක්‍රියාත්මක කිරීමට පහසුවක් වී තිබේ. දිගු කාලීන ක්‍රම ක්‍රියාත්මක කිරීමට ප්‍රථම දුම්රිය මාර්ගය වැනි ස්ථාන ආරක්ෂා කිරීම සඳහා ගල් යොදමින් කෙටි කාලීන විසඳුම් දී ඇත.

මේ සියලු කාරණා එසේ ක්‍රියාත්මක වුව ද වෙරළ ඛාදනය පසෙකලා දේශපාලනික වශයෙන් ඛාදනය කිරීමට උත්සාහ දැරූ පසුබිමක ව්‍යාපෘතියේ සුළු අඩුපාඩුකම් පවා සුවිසල් අන්දමට පෙන්වා දීමට ඇතැම් පිරිස් කටයුතු කළහ. පරිසරවේදීන් පෙන්වා දුන් සත්‍ය කරුණු පවා හාත්පසින් වෙනස් කොට ව්‍යාපෘතියේ සැබෑ ප්‍රතිඵල පෙන්නුම් කිරීමටත් පෙර සමාජ මාධ්‍ය ඔස්සේ එදා නන් දෙඩූ පිරිස් අද දිනයේ ඇහුම්කන් දිය යුතු කතාව පිළිබඳ වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සුගත් යාලේගම මහතා මෙසේ හඬ අවදි කළේ ය.

"මේ ව්‍යාපෘතිය නිසි ආකාරයෙන්ම සාර්ථක වුණා ද? නැද්ද? යන කාරණය ගැන ඒ කාලේ ඉඳන්ම ලොකු අවධානයකින් හිටියේ. සමහර කණ්ඩායම් මේකට ජනාධිපතිතුමාවත් ගාව ගත්තා. මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න ඒ අවස්ථාවේදී රටේ අපහසු තත්ත්වයක් තිබුණා වුණත් ජනාධිපතිතුමාත් ඇවිත් මේ ස්ථාන නරඹා මේකේ තිබෙන අවශ්‍යතාවය තේරුම් අරගෙන අපිට සම්පූර්ණ සහයෝගය දුන්නා. ඒ නිසා තමයි මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න ලැබුණේ. මේ ව්‍යාපෘතියේ සාර්ථක වූ තැන් මෙන්ම අසාර්ථක වූ තැන් අප හඳුනා ගෙන තියෙනවා. මේ වෙරළ කලාපය බොහොම ගතික ස්ථානයක්. මෙහි වැලි ප්‍රමාණය වැඩි කිරීම තුළින් වෙරළේ සංවර්ධනයක් තමයි සිදු වුණේ. සමාජ මාධ්‍ය ඔස්සේ හඬක් නැගුවා මේකට පරිසර අධ්‍යයන වාර්තාවක් නැහැ කියලා. අපගේ දෙපාර්තමේන්තුවට තමයි වෙරළ කලාපයේ පාරිසරික වශයෙන් බලය තියෙන්නේ. මේ කරපු ක්‍රමයේ වරදක් කියන්න බැහැ. නමුත් මහජනතාවට සහ අනෙකුත් කණ්ඩායම්වලට මේක පැහැදිලි වන අයුරින් කරන්න මෙතනින් එහාට අපි බලාපොරොත්තු වෙනවා."

වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වත්මන් අධ්‍යක්ෂ ජනරාල්වරයා එලෙස අදහස් දක්වමින් පැහැදිලි කළ කරුණු පිළිබඳව වැඩි යමක් සහ මෙකී ව්‍යාපෘතිය දියත් වූ ආකාරය සම්බන්ධයෙන් එම දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ආර්.ඒ. එස් රණවක මහතා පැවසුවේ මෙවැන්නකි.

"වෙරළ කලාප කළමනාකරණ සැලැස්මට අනුව මෙම ස්ථානය වෙරළ ඛාදනය සිදු වන තැනක් බව නිරීක්ෂණය වුණා. ඒ අනුව අපි තීරණය කළා මේ ස්ථානයට දිගු කාලීන විසඳුමක් දීමට. දැනට තිබෙන හොඳම විසඳුම රළ ප්‍රතිපෝෂණය කිරීමයි. වෙරළ ඛාදනය වැළැක්වීම සඳහා දෘඩ විසඳුම් නැතහොත් ගල් යෙදීම පහසු කාර්යයක්. නමුත් ඒ දෘඩ විසඳුම් දුන් පසු වෙරළ පාවිච්චි කරන අය අපහසුතාවට පත් වෙනවා. විශේෂයෙන් සංචාරක කර්මාන්තයට හා ධීවර කර්මාන්තයේ නියැළෙන අයට. ඒ අයගේත් ඉල්ලීම් සලකා බලා වෙරළ ඛාදනයට ලබා දිය හැකි හොඳම විසඳුම වශයෙන් තමයි මෙය කිරීමට තීරණය කළේ. බටහිර වෙරළේ වැලි ගමන් කරන බව අපි දන්නවා. දකුණේ සිට උතුරට ගමන් කරන වැලි සහ කෘත්‍රිමව යෙදූ වැලි සොබා දහමට අවශ්‍ය ප්‍රමාණයට ක්‍රමයෙන් උතුරු ප්‍රදේශයට ප්‍රතිපෝෂණය කිරීමට අපි බලාපොරොත්තු වුණා. අපි අත්දකින්නේ ඒ කටයුත්ත සිදු වී ඇති ආකාරයයි. මේ වන විට මීටර 35-40 දක්වා වර්ධනය වෙලා තියෙනවා. ඉදිරියේදී බලපාන නිරිත දිග මෝසම විශේෂයෙන් බටහිර වෙරළ තීරයට තමයි හානි කරන්නේ. මේ වගේ මෝසම්වලට ඔරොත්තු දෙන ආකාරයටයි වැලි ප්‍රමාණය තීරණය කරන්නේ."

පසුගිය වසරේ මේ කාල වකවානුව වන විට දියත් කරමින් තිබූ කෘත්‍රිම වැලි පෝෂණ ව්‍යාපෘතියේ සාර්ථකත්වය පෙන්නුම් කරමින් ස්වභාවිකව මුහුදු රළ ඔස්සේ අවශ්‍ය ස්ථානවලට වැලි පිරවී ඇති ආකාරය එහි සංචාරය කරන ඕනෑම අයකුට දැක බලා ගත හැකිව තිබේ. ව්‍යාපෘති යෝජක වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් ව්‍යාපෘතිය නිම කරන ලද දිනයේ පටන් මේ දක්වාම අඛණ්ඩ අධීක්ෂණයක නිරතව සිටින්නේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නඟන ගුණ දොස්වලට ප්‍රායෝගිකවම සැබෑ තතු ජනතාවට හෙළි කිරීමේ වුවමනාව ද සහිතවය.



වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු ආර්.ඒ.එස්. රණවක මහතා

මෙම ව්‍යාපෘතියේ පසුවිපරම සම්බන්ධයෙන් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරු නිලානි රුහුණගේ මහත්මිය මෙසේ පැවැසුවාය.

"ගල්කිස්ස වෙරළ තීරයේ වැලි ගමන් කරන්නේ දකුණේ සිට උතුරු දිශාවට. ඒක සැලකිල්ලට ගෙන අපි මේ ව්‍යාපෘතිය පටන් ගත්තේ අන්තර් මෝසම් කාලයේදී. මේ ව්‍යාපෘතිය කොයි තරම් සාර්ථක ද බලන්න අපි අධීක්ෂණ කටයුතු ආරම්භ කරලා ස්ථාන පහකින් පැති කඩ මනින්න පටන් ගත්තා. අපි ඡායාරූපවලින් වගේම හරස් කඩ මැනීමෙන් එය සිදු කළා. ඒ වගේම මුහුදු පතුළේ ගැඹුර අධ්‍යයනය කළා. මෝසම් කාල දෙකක් සඳහා තමයි අරමුණු කර ගත්තේ. මේ වෙද්දි එක මෝසම් සමයක් අවසානයි.

"වැලි පුරවා අවසන් වූ විගසම අපි අධීක්ෂණ කටයුතු ආරම්භ කළා. මේ පිළිබඳව අප සතු දත්ත අනුව වැලි ප්‍රමාණයේ අඩු වීමක් වෙලා නැහැ. මේ වන විට මීටර විස්සකට ආසන්න ප්‍රමාණයක් සඳහා වැලි ස්වභාවිකව පිරවී තිබෙනවා. මෙහි සම්පූර්ණ සාර්ථකත්වය දකින්න නම් මෝසම් චක්‍රයක් නිමා වන තෙක්ම ඉන්න ඕනෑ. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර මීටර දහයක්වත් තිබුණේ නැහැ. වෙරළ තීරයේ තිබෙන හැඩය අනුව මෙය වෙනස් වෙනවා. ඇත්තටම දැන් මේ ව්‍යාපෘතියේ සාර්ථකභාවය පෙන්නුම් කරමින් තිබෙනවා."

ගල්කිස්ස මවුන්ට් ලැවීනියා වෙරළ තීරය කේන්ද්‍ර කර ගත් කෘත්‍රිම වැලි පෝෂණ ව්‍යාපෘතිය වෙරළ සංරක්ෂණයේ සාර්ථක ආරම්භයක් වී ඇති බව ගල්කිස්ස මහ හෝටලයේ ප්‍රවීණ සූපවේදී පබ්ලිස් සිල්වා මහතා පසුගියදා 'යූ ටියුබ්' නාළිකාවකට එක් වෙමින් පවසා තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කළ අවදියේදී එය මහත් අපරාධයක් යැයි හැඟී යන තරමට විවේචනයක් එල්ල කළ ඒ මහතා මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් දරන්නේ සුබවාදි අදහසකි. ඒ අදහස ඔහු ඉදිරිපත් කරනුයේ ගල්කිස්ස මහ හෝටලයේ ප්‍රධාන සූපවේදීයා ලෙස මාන්නයකින් නොව මවුන්ට් ලැවීනියා ඇත දියඹේ සිට එන සිහිල් සුළඟ විඳිමින් වසර ගණනාවක් පුරා එහි සේවය කරන මහත්මයකුගේ ගුණය පෙන්වමිනි. සොබා දහම විනාශ වේ දැයි යන බිය නිසා එදා යම් විවේචනයක් කළ ඔහු අද මේ ව්‍යාපෘතියේ ඇසින් දුටු සාක්ෂිකරුවකු වශයෙන් සාධනීය ප්‍රකාශයක් කර සිටී. එය සවිඥානික ජනතාව උදෙසා විය යුතුය.

ගල්කිස්ස වෙරළ තීරය සුරක්ෂිත කර ගැනීම සඳහා සෑන්ඩ් එන්ජින් මෙතඩ් (Sand Engine Method) තාක්ෂණය යොදා ගනිමින් සිදු කරනු ලැබූ ව්‍යාපෘතියේ සැබෑ ප්‍රතිඵල දැක ගත හැක්කේ ඊළඟ වසරේ මෝසම් කාලය ගත වූ පසුවය. ඒ වන විට මෙරටට බලපෑ හැකි දේශගුණික විපර්යාසයන් සමඟ වෙරළ තීරයේ බොහෝ වෙනස්කම් සිදු වීමට ඉඩ ඇත. ඒ සඳහා යාවත්කාලීන වෙමින් තමන් සතු තාක්ෂණික හා ශිල්පීය දැනුම නිසි අයුරින් යෙදවීමට ව්‍යාපෘති යෝජක පාර්ශ්වය ද වගබලා ගත යුතුය. එසේම මෙම ව්‍යාපෘතිය සම්බන්ධව හෝ ගල්කිස්ස හා අවට වෙරළ තීරය සම්බන්ධයෙන් පළ වන මාධ්‍ය වාර්තා මෙන්ම පරිසර ක්‍රියාකාරීන් පෙන්වා දෙනු ලබන කරුණු ඇත්නම් ඒවා එකහෙළාම බැහැර නොකොට සිය අධීක්ෂණ වාර්තාවන්ට සහසම්බන්ධ කර ගත යුතුය. එවිට දකුණු කොළඹ වැලි පෝෂණය කිරීමේ ව්‍යාපෘතියේ සැබෑ සාර්ථකත්වයක් ළඟා කර ගත හැකි වනු ඇත. එවිට හුදෙක්ම සිය ලාභ පරමාර්ථයට සමාජ මාධ්‍ය හසුරුවන අවිඥානකයන්ට වැල්ලේ තැනිය හැකි සිහින මාලිගාවල් ද නැති වනු ඇත.

**පහන් විජේසේකර**

**ඡායාරූප - කැළුම් ලියනගේ**



එදා සහ අද තත්ත්වය

# කොළඹටම තෙල් බෙදන හිත හොඳ කරත්ත මාමා



මිනිස්සු

රෝදීවන් මිණිගෙඩි, ඉන් හැඬවෙන්නේ සිලිං සිලිං සද්දයක්. ඊට නොදෙවෙනි තාලයට ගිනියම් තාර පොළොවේ ගැටෙන කුර හඬ. ඒ දෙසට තවත් කරපොවද්දී දෑස්මානයේ ඇඳෙන්නේ සුදෝ සුදු ගවයෙක් බර අදිනා අපූරු කරත්තයක්.

රතුම රතු සිලින්ඩරයක් වැනි ටැංකිය ඒ ගැල මත රැන්දූ අන්දම හරි අපූරුයි. කොළඹ ගෙන්දගම් පොළොවේ අද වගේ නෙවෙයි. මෙයින් දශක කිහිපයකට කලින් නිතර දෙවේලේ දකින්නම තිබුණත් දැන් දැන් ගොන් කරත්ත දකින්නත් අමාරුයි. දර කරත්ත, පොල් තෙල් කරත්ත ආදී බරට බරේ බර අදිනා ඒ කරත්ත චාරිකාව අද කාලේ හුග දෙනකුට නුහුරු නුපුරුදු එකක්.

ඔයින් මෙයින් කාලයේ තාලයට වෙනස් වුණු කොළඹ අග නගරයේ ගමනාගමනයේ වෙනස්ම පැතිකඩක් හරහායි අපි දැන් සෙමෙන් සෙමෙන් ගමන් කරන්නේ.

කොළොම්තොටට පිවිසෙනා මුවදොරින් මෙතැනට එතරම් දුරක් නැහැ. පෑලියගොඩ දෙසින් පැමිණි අපි දැන් ඔරුගොඩවත්ත මංසන්ධියෙන් දකුණට, කොස්ගස්හන්දිය දෙසටයි හැරෙන්නේ. ඒ ගමනේ මඳ දුරක් යත්ම කඳු ගැටයක් අද්දරින් දකුණට හැරී ඇළ මාර්ගයක් දිගේ පටු මඟකට වැටෙන අපේ ගමන නවතින්නේ එකට එකක් යාබද නිවාස පෙළකින්.

ඒ අද්දරට වී දවසේ විඩාව නිවා ගනිමින් උන්නේ අද අපේ කතාවේ ප්‍රධානම චරිතයක්. ඒ සත්ත්වයෙක් වුණත් මිනිසුන්ට නැතිවම බැරි කෙනෙක්. අපි එතැනින් නවතින්නේ යුගයක් එළි කළ අපූරු වාහනයක වගතුග සමීපයේයි.

'ගැල් රේස්', 'ගැල් තවලම්', 'අශ්ව කරත්ත' ආදියත් සමඟින් බැඳුණු 'ගැල' ප්‍රධානම ප්‍රවාහන මාධ්‍යය වූ යුගයක භූමිතෙල් කරත්තයට එහෙමත් නැතිනම් භූමිතෙල් ගැලටත් තිබුණේ ඉතා ඉහළ පිළිගැනීමක්.

අපි මේ අත්විඳින්නේ එවැනි මොහොතක්. ඒ ගැලක්, ගැල්කරුවෙක් සහ භූමිතෙල් කරත්තයක් සමඟිනි. දැන් අපි හැරෙමු ඒ දිහාවට. අද අපේ කතානායකයා වන ගැල්කරුවා ඒ අත්දැකීම් වචනයට පෙරළන්නට මඟ බලා හිඳින්නේ නොඉවසිල්ලෙන්.

"මං රාජේන්ද්‍රන් සුබ්‍රමනියම්. උපන්දා ඉඳන් වාසේ කොළොම්පුරේ. නාගලගම්වීදියේ තමයි දැනට පදිංචි. මං කරත්ත රක්ෂාවට ආවේ තිස් අවුරුද්දකට කලින්. ඒ වෙද්දීත් මගේ අයියා කරත්තයට ගොඩ වැදිලා. මටත් අයියා 'පුතයා' වගේ කරත්තෙන් එහා මෙහා යද්දි ආසා හිතුණා මේ රක්ෂාවට.

ඉස්කෝලේ ගමනට 'ආයුබෝං' කියූ හැටියේ මගේ හිත්ලෑවේ කරත්තයට මට ඕනෑ වුණේ හොඳම ජාතියේ වස්සෙක්. ඉස්තරම්ම වර්ගයේ නොවුණත් කොල්ලෙකුට කරත්තයේ බඳින්න ගැළපෙන හොඳට හයිහත්තිය තියෙන වස්සෙක් හොයාගෙනමයි මං පස්ස බැලුවේ.

ඊළඟට ඕනෑ වුණේ හොඳ කරත්තයක්. ඒ කාලේ සේදවත්තේ තමයි කරත්ත හදන්න නමගිය උන්නැහේලා හිටියේ. ඒ කාලේ හැටියටත් මං සෑහෙන සල්ලියක් යට කරලයි කරත්තයක් කෙළින් හිටෙව්වේ.

ඒ කාලේ කරත්තයක් තියෙනවා නම් හොඳට වැඩ තිබුණා. මිනිස්සු ගෙදරටම හොයාගෙන ඇවිදින් වැඩ පැවරුවේ. එයින් කාසි පනම් අඩුපාඩුවක් නැතිව පිරුණා අපේ මඩිස්සලේට. ඒ කාලේ ඔරුගොඩවත්ත එකම ගැල් පුරයක් නේ.

එහෙමයි ඒ කාලේ වගතුග. ඉතින් මුලින්ම හිටිය රතු වස්සාගෙන් පස්සේ ඊටත් වඩා හොඳ එකෙක් හොයා ගන්නයි මං අහල පහළ හැමතැනම විපරම් කළේ. එහෙමයි විසි අවුරුද්දකට කලින් කොළොම්පුරේ ගැල් ගමනේ වග තුග.

ඒ ඉස්සර. දැන් එහෙම නෙවෙයි. ඉස්සර භූමිතෙල් ලීටරේ ශත 9යි. දැන් රුපියල් 70යි. අවුරුදු පහළොවකට විස්සකට විතර කලින් වුණත් කරත්ත දහ දොළහක් කොච්චරවත් ඔරුගොඩවත්ත හරහා එහා මෙහා දිව්වා නේ.

දැන් එහෙම නෙවෙයි. එක කරත්ත රෝදයක් හදා ගන්නත් රුපියල් විසිදාහක්වත් නැතිව බැහැ. බර අදින කරත්තයේ බඳින ගොනෙකුට ලාඩන් එකකට විතරක් මාසයකට රුපියල් පන්සියය ගානේ වෙන් කරන්න ඕනෑ. ඒ විතරක් නම් මදැයි. කෝ දැන් කොළඹ තණ පිට්ටනි. අපි හුගක් ඈතට ගිහින් තමයි තණකොළ කපාගෙන එන්නේ. කරත්ත රෝද හදාගන්න රාගම, වැලිසරට යන්න ඕනෑ.

එයින් ඉවර නැහැ. ගරාදි රෝදය, අලවංගුව, අච්චු කණුව ඔය ඔක්කෝම එක්කාසු වුණාම නේ කරත්තයක් වෙන්නේ.

මං කළත් මගේ දරු තුන්දෙනා මේ රක්ෂාවට හිතක් නැහැ. ඉතින් මගෙන් පස්සේ කොළඹ භූමිතෙල් කරත්ත ගමනාගමනය හමාර වෙයි. 'කින්නියා' අවුරුදු විසි ගණනක් තිස්සේ අපේ පවුල රැකබලා ගත්තා. ඒ සතාගේ ජීවිත කාලෙත් මාත් එක්කම ඉවර වෙනවා නම් ඒක මට ලොකු සතුටක්. ඒ නැතත් මං නැති කාලෙක වුණත් කින්නියාට අවැඩක් වෙන්න නම් මගේ සහෝදරියවත් දරුවන්වත් ඉඩ නොතියන වග මට හොඳටෝම විශ්වාසයි.

දැන් තිස් අවුරුද්දකටත් වඩා අපිව ජීවත් කළේ කින්නියා. මං හැමදාම උදේ 6 වෙද්දී නැගිටිනවා. කින්නියා නාවලා පිරිසුදු කරන එකයි මං ඊළඟට කරන්නේ. උදේට කෑම ගන්න පුරුද්දක් කින්නියාට නැහැ. හැමදාම රෑට මං ඒකාට බඩකට පුරා කන්න දෙනවා නේ.

ඉන් පස්සේ තමයි තොටළඟටත් එතැනින් ආපිට මාලිගාවත්ත පාරෙන් නවගම්පුරේ එන්නේ. භූමිතෙල් ලීටර් හයසියයක් පුරවාගෙනයි හැමදාමත් කින්නියා අපේ ජීවන බර අදින්නේ.

ඒ කොයිහැටි වෙතත් කරත්තේ බර කින්නියාට බර වැඩි නැහැ. මගේ බරත් ඊට එක් වුණත් කරත්තේ ලෙවල් නිසා කින්නියාට අමාරුවක් නැහැ.

'තේරු' උත්සවවලටත් කින්නියා හෙට්ටිවීදිය, මාලිගාවත්ත, තොටළඟ අවටම යනවා. ඒ රවුම භූමිතෙල් කරත්තයෙන් ගිහින් හොඳට හුරු නිසා කින්නියාට ඒ ගමනේ අමුත්තක් නැහැ.

තේරු උත්සව කාලයට නැතිනම් දීපාවලි උත්සව සමයට කින්නියාට රජ සැලකිලි.

ඔහොමයි ගෙන්දගම් පොළොවේ ගොන් කරත්තයේ ගමන. දැන් දැන් හැම ඉන්ධන හලෙන්ම භූමිතෙල් ලැබෙන්නේ නැහැ. සමහර බස්වලට ඩීසල්වලට කලවම් කරන නිසා හුගක් ෂෙඩ්වල භූමිතෙල් නැහැ.

MKTC කරුණාරත්න ෂෙඩ් එකෙන් තමයි අපි ඉස්සර ඉඳන් භූමිතෙල් ගන්නේ. දැන් කොළඹ අවට වෙනත් ෂෙඩ්වලින් භූමිතෙල් විකුණන්නේ නැහැ. ඒ ඩීසල් එක්ක කලවමට බස්වලට යොදන නිසයි.

ඉස්සරෝම සුදට හුරු පාටකින් භූමිතෙල් ආවේ. ඉන් පස්සේ නිල් පාටට ආවා. දැන් රතුයි නේ. අපිට පොඩි කොමිස් එකක් ඇතිවයි භූමිතෙල් ලැබෙන්නේ. අපිත් පුංචි කොමිස් එකක් ඇතිවයි විකුණන්නේ.

දැන් අපි දවසට එක වතාවයි භූමිතෙල් ගේන්නේ. ඉස්සර කිහිප වතාවක් ටැංකිය පුරවාගෙන ගෙනැත් ඒ ඔක්කෝම විකුණා ගන්නත් පුළුවන්කම තිබුණා.

දැන් වගේ නෙවෙයි. ඒ කාලේ අපි කෝට් සූට් ඇන්දේ. පෙට්‍රල් ෂෙඩ්වලින් ඉස්සර අපිට ඇඳුම් දුන්නා.

කින්නියා කියන්නේ එක වර්ගයක්. බංගලි වට්ටාරි වගේ විවිධ වර්ගවල ගොනුන් ඉන්නවා.

ඉතින් පිටකොටුවට මේ ළඟදී කට්ටියක් අපිව ගෙන්නුවා. ඒ කොළඹ පරණම බස්, ට්‍රෑම් කාර් ප්‍රදර්ශනයට, කොහොමටත් මං පාරේ යද්දි බලන්න හුග දෙනෙක් කැමැතියි. කැමරා අරන් ඇවිදින් ෆොටෝ ගහනවා හුග දෙනෙක්. ඒ වගේම රතු පාටින් කලර් ලයිට් වැටිලා තියෙද්දිත් පාර මාරුවෙන්න මට ලොකු බාධාවක් නැහැ. පොලිසියත් නිතරම මට උදවු කරනවා. කාගෙන්වත් කරදරයක් කොහොමටත් මට නැහැ.

කවදත් වගේ කවුරු කොහොම මොන මොනවාගෙන් ඉගිළෙන්න ගියත් මගේ වේගය පැයට සැතපුමකටත් වඩා අඩුයි. තොටළඟට ගිහින් ආපිට කොස්ගස්හන්දියට ගිහින් එන්නත් මට වරුවක් ගත වෙනවා නේ..."

ඒ අමුතු තාලේ ගමනක අනෙක් හැමෝටම වඩා හෙමි හෙමින් යෙදෙනා අපේ කාලයේ ගැල්කරුවකුගේ කතාව. කොළොම්තොට ළා හිරු එබෙන විටදීයි එක රොත්තට ලොකු පොඩි වාහන තෙරපෙන මහ පාරට අද අපේ කතානායකයා වන සුබ්‍රමනියම් 'කින්නියා' බැඳ ගත් කරත්තෙන් පිවිසුණේ.

තොටළඟටත් ඉන් මෙපිට ග්‍රෑන්ඩ්පාස් ඉසව්වටත් එකෙල මෙකෙල වූ ඒ ගමනේ නිමාව රාස්සිගේ අව්ව කොළොම්තොට අරක් ගන්නා විටදීත් එක සේම මහ මග කුර ගැටෙන හඬින් සුබ්‍රමනියම් තවම දවසේ මෙහෙවර නිමා නොවුණු වග ඉන් කියාපායි.

**නුවන් මහේෂ් ජයවික්‍රම**
**ඡායාරූප - කැළුම් ලියනගේ**
**සාලිය රූපසිංහ**








# දිසත
දස අත ම එක තැන



දින-දින වැජඹෙන අතුරලිය මහ විදුහල පිටුව 16



ලුණුගම්වෙහෙර පවුල් 500ක් බොන්නේ මඩ වතුර පිටුව 17



උඩ ගිහින් පුපුරන මල් වෙඩි තරම් මේ ජීවිත ලස්සන නෑ පිටුව 18

රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

## වරණියෙන් පැරණි ළිඳක නටබුන් හමුවෙලා





පුරාවිද්‍යා නිලධාරීන් පිරිසක් විසින් යාපනයේ වරණි ප්‍රදේශයේ සිදු කරනා ලද කැණීම්වලදී ඉපැරණි ළිඳක හා ජල සැපයුම් මාර්ගයක නටබුන් හමු වී තිබේ. එම නිලධාරීන් සඳහන් කළේ මේ පුරාවස්තු හා මේ ස්ථානය 18 වැනි සියවසේ අග භාගයට අයත් ලෙස සලකනා බවයි.

මේ ස්ථානයේ සිට කිසියම් ප්‍රදේශයකට ජලය රැගෙන යන ජල නළ පද්ධතියක් හා සැපයීම් මාර්ගයක් තිබූ බවට සැක කළ හැකි සාධක කීපයක්ද මේ ස්ථානයෙන් හමු වී තිබේ. මේ ස්ථානය පිළිබඳ හා හමු වූ පුරාවස්තු පිළිබඳ පුරාවිද්‍යා විශේෂඥයන් පැමිණ විමර්ශනයක් සිදු කරනාතුරු බදාම යොදා පුරාවස්තු සේදී යැමෙන් වළක්වා ගැනීමට පුරාවිද්‍යා නිලධාරීන් පියවර ගෙන තිබේ.

ඩී. එස්. ගුණතිලක - ඌව වෙල්ලස්ස විශේෂ

## 8 හැවිරිදි දරුවාට පහර දුන් පියා අත්අඩංගුවට

කුඩාඔය පොලිස් වසමේ මහආරගම පාසලේ තුන් වැනි වසරේ ඉගෙනුම ලබනා 8 හැවිරිදි පිරිමි ළමයකුට අමානුෂික ලෙස පහරදීමක් සම්බන්ධයෙන් එම ළමයාගේ පියා කුඩාඔය පොලිසිය මඟින් පෙරේදා (30) අත්අඩංගුවට ගෙන ඇත. පාසලේ ගුරුවරියක විසින් කරන ලද පැමිණිල්ලක් අනුව දරුවාට පහරදුන් පියා මෙලෙස අත්අඩංගුවට ගෙන තිබේ.

පාසලට පැමිණි ළමයා අපහසුවෙන් ඇවිද යන අයුරු දැක ඇති පන්ති භාර ගුරුතුමිය ළමයාගෙන් ප්‍රශ්න කිරීමේදී පියා බීමත්ව පැමිණ දිනපතාම අතින් පයින් සහ කෝටුවලින් පහරදෙන බව ගුරුතුමියට පවසා ඇත.

ළමයාගේ පාදවල සහ පිටේ පහර දීමෙන් සිදුවූ තුවාල ද දක්නට ඇතැයි පොලිසිය ප්‍රකාශ කළේය.

සැකකරු ඊයේ (31) වැල්ලවාය මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තබිණි.

වැල්ලවාය පොලිස් ස්ථානාධිපති ටී. එම්. රත්නායක මහතා ඇතුළු නිලධාරීහු පරීක්ෂණ පවත්වති.

පී. ජී. ගුණතිලක - ගලේවෙල මධ්‍යම සමූහ

## පරිසරය වැනසූ 4කට රුපියල් 122,000ක් දඩ

මාතලේ දිස්ත්‍රික්කයේ නාඋල අඩවියේ දඹුල්ල බීට්ටුවන නිලධාරී බල ප්‍රදේශය තුළ පසුගියදා (11) සිට 20 වැනි දින දක්වා කාලයේදී සිදු කළ වැටලීම්වලින් නීති විරෝධී ක්‍රියා සිදු කළ සැකකරුවන් 04 දෙනෙක් සමඟ වාහන 03ක් අත්අඩංගුවට ගත් බව බීට්ටුවන නිලධාරී අයි. එම්. දයානන්ද බණ්ඩා මහතා පැවසීය. ඒ අනුව මේ සැකකරුවන් පසුගියදා (24) දඹුල්ල මහෙස්ත්‍රාත් අයි. එම්. එස්. බී. ඉලංගසිංහ මහතා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ට්‍රැක්ටරයකින් දැව ප්‍රවාහනය කළ සැකකරුට රුපියල් 70,000ක දඩයක් නියම කරන ලදි.

මේ ට්‍රැක්ටරයෙන් ප්‍රවාහනය කර ඇත්තේ බුරුත, තේක්ක හා දමුණු යන දැව වර්ගයි. රුපියල් ලක්ෂ දෙකහමාරක් පමණ වටිනා දැව රාජසන්තක කිරීමට මහෙස්ත්‍රාත්වරයා නියෝග කර තිබේ. රක්ෂිත වනයක ට්‍රැක්ටරයකින් වැලි ඉවත් කිරීම සම්බන්ධයෙන් වරද පිළිගත් පුද්ගලයකුට රුපියල් 40,000ක දඩයක්ද නියම වූ අතර වැලි රාජසන්තක කිරීමට ද නියෝග කර තිබේ. ජංගම දැව ඉරුම් යන්ත්‍රයකින් දැව ඉරීම සම්බණ්ධයෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයන් දෙදෙනාට රුපියල් 12,000ක දඩයක් නියම විය.

මේ වැටලීම්වලට නාඋල අඩෙවි වන නිලධාරී බී. සී. ඩී. ජී. ප්‍රියන්ත මහතාගේ උපදෙස් මත බීට්ටුවන නිලධාරී අයි. එම්. දයානන්ද බණ්ඩා, ව.සහකාර ඒ. පී. දසනායක, ඩී. එම්. ටී. එම්. දිසානායක, ආර්. එම්. සෙනෙවිරත්න, ඒ. ජී. ඩී. විජේවර්ධන යන මහත්වරු එක් වූහ.

ජේ. ගෝමස් - ගල්කිස්ස අධිකරණ

## කැසිනෝ ගැසූ චීන ජාතිකයෝ 4ක් අත්අඩංගුවට

නීති විරෝධී ලෙස බලපත්‍ර නැතිව කැසිනෝ ක්‍රීඩාවේ යෙදී සිටි චීන ජාතික කාන්තාවක් ඇතුළු චීන ජාතිකයන් තිදෙනෙක් පෙරේදා (30) රාත්‍රියේ සිදු කළ විශේෂ මෙහෙයුමකින් අත්අඩංගුවට ගැනීමට හැකි වූ බව කොල්ලුපිටිය පොලිසිය ප්‍රකාශ කළේය.

මොවුන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී කැසිනෝ ක්‍රීඩාවෙන් උපයා ගන්නා ලද බව කියනා රුපියල් දහසය ලක්ෂ පනස් එක්දහසක මුදලක් ද පොලිසිය භාරයට ගෙන ඇත.

කොල්ලුපිටිය පොලිසියට ලද තොරතුරකට අනුව කොල්ලුපිටිය ශාන්ත අන්තෝනි මාවතේ පිහිටි මහල් නිවාස සංකීර්ණයක් තුළ මේ නීති විරෝධීව පවත්වාගෙන ගිය සූදු පොළේ තිබී කැසිනෝ ක්‍රීඩාව සඳහා යොදා ගන්නා ඉලෙක්ට්‍රොනික මේසයක් ඇතුළු කැසිනෝ ක්‍රීඩාව සඳහා යොදා ගන්නා කැට 240ක් සොයා ගැනීමට හැකි වී තිබේ. අත්අඩංගුවට ගත් සැකකාර චීන ජාතික කාන්තාව 31 හැවිරිදි බවත් අනෙක් චීන ජාතිකයන් දෙදෙනා 47 සහ 43 හැවිරිදි බවත් පොලිසිය ප්‍රකාශ කළේය. සැකකරුවන් තිදෙනා කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතව තිබිණි.

කොල්ලුපිටිය පොලිසියේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක ගුණරත්න මහාතාගේ අධීක්ෂණයෙන් දූෂණ මර්දන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක ලක්ෂාන් මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් සැරයන්වරුන් වන (16140) හේරත්, (46433) නිවටන් ඇතුළු නිලධාරීහු වැටලීමට එක් වූහ.

අනුරාධ ප්‍රියදර්ශන - කරන්දෙණිය සමූහ

## කම්බි අදින්න ගිය විදුලි සේවකයාගේ මරණය ගැන සැකයක්



විදුලිබල මණ්ඩලයට අයත් අම්බලන්ගොඩ සීනිගොඩ පිහිටි නඩත්තු ඒකකයේ සේවය කළ පුද්ගලයකු විදුලි කම්බි ඇදීමට මැනුම් කටයුතු සඳහා උරගස්මංහන්දිය පොලිස් වසමට අයත් යටගල වල් ඉඟුරු කැටිය ප්‍රදේශයට ගොස් සිටියදී ඔහුගේ බඩ ප්‍රදේශය තුවාල වීම හේතුවෙන් බලපිටිය මූලික රෝහලට පෙරේදා (30) ඇතුළත් කර ඇත. එහිදී විදුලි සේවකයන් පවසා ඇත්තේ යකඩ කූරක් ඇනීම හේතුවෙන් තම සහෝදර සේවකයා තුවාල ලබා ඇති බවයි.

තුවාලකරුගේ එක් තුවාලයක් පමණක් තිබී ඇති අතර එය පරීක්ෂා කර බැලූ වෛද්‍යවරුන් ඉක්මනින්ම ඔහු ශල්‍යකර්මයකට භාජන කර ඇති අතර ඉන් අනතුරුව පැය කිහිපයකට පසුව ඔහු මියගොස් ඇත. මියගිය අයගේ තුවාලය සම්බන්ධයෙන් වෛද්‍යවරුන්ට සැකයක් ඇති වී ඇති අතර එය වෙඩි තැබීමකින් වූ තුවාලයක් බවට සැක මතුව තිබේ.

මේ පිළිබඳව උරගස්මංහන්දිය පොලිසියට දැනුවත් කිරීමෙන් අනතුරුව පරීක්ෂණ ආරම්භ කර ඇත. ඇල්පිටිය පොලිස් සෝකෝ අංශය මේ පිළිබඳව ස්ථානීය පරීක්ෂණ ආරම්භ කර ඇති අතර එයට පොලිස් සුනඛයන්ද යොදා ගන්නා ලදි. නමුත් සිද්ධියට සම්බන්ධ කිසිම තොරතුරක් අනාවරණය කර ගැනීමට නොහැකි වූ අතර මිය ගිය පුද්ගලයාගේ දේහය පීසීආර් පරීක්ෂණයක් සඳහා බලපිටිය මූලික රෝහලේ මෘත ශරීරාගාරයේ තබා ඇත. පීසීආර් පරීක්ෂණයෙන් අනතුරුව පශ්චාත් මරණ පරීක්ෂණයක් ද සිදු කිරීමට නියමිතය.

තවමත් මේ සිද්ධියට සම්බන්ධ කිසිවක් සොයා ගැනීමට නොහැකි වී ඇති අතර උරගස්මංහන්දිය පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි. මෙසේ මියගොස් ඇත්තේ අම්බලන්ගොඩ සීනිගොඩ ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කළ 24 හැවිරිදි ප්‍රියදර්ශන පුෂ්පකුමාර නමැති අවිවාහක කළුතර දොඩංගොඩ ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකි.

සුනිල් ගමගේ - අක්මීමණ විශේෂ

## අධිවේගී යතුරුපැදියක් වෙනත් අංක තහඩුවකින් පැදලා

600CC වර්ගයේ ශ්‍රී ලංකාව තුළ මාර්ගවල ධාවනයට අවසර නැති අධිවේගී යතුරුපැදියක් යක්කලමුල්ල පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ඇත. මේ යතුරුපැදිය යක්කලමුල්ල කරාගොඩ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇති අතර පොලිස්පතිවරයාගේ විශේෂ රථ වාහන පරීක්ෂණ මෙහෙයුම යටතේ කළ මෙහෙයුමකදී යතුරුපැදිය සොයාගෙන ඇත.

ලක්ෂ 6ට මේ යතුරුපැදිය ගැනුම්කරු මිල දී ගෙන ඇති අතර එහි වටිනාකම පොලිසිය සඳහන් කරන අයුරින් ලක්ෂ 30ක් පමණ වන බව ද සඳහන් වේ. යතුරුපැදිය සන්තකයේ තබාගත් පුද්ගලයා 19 හැවිරිදි අයෙක් වන අතර යක්කලමුල්ල කරාගොඩ ගල්ල කන්ද ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. මාතර ප්‍රදේශයේ පදිංචි අයකුගේ යතුරුපැදියක අංකයක් සවි කරගෙන මෙකී යතුරුපැදිය ධාවනය කර ඇති බව යක්කලමුල්ල පොලිසිය වැඩිදුරටත් සඳහන් කරයි. රජයට හිමි විය යුතු බදු නොගෙවා ලංකාවට ආනයනය කරනා ලද කොටස් එකලස් කර සකස් කරනා ලද යතුරුපැදියක් සන්තකයේ යන චෝදනාව යටතේ සැකකරු ගාල්ල මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

නුවන් ජයසේකර - සූරියවැව විශේෂ

## විෂ සමනලයකුගෙන් ජනතාවට පීඩා



විෂ සහිත ආගන්තුක සමනලයෙක් හේතුවෙන් තිස්සමහාරාම හා ලුණුගම්වෙහෙර ජනතාව ආසාත්මිකතාවන්ට ලක් වී තිබේ. මේ සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ සිදු කරගෙන යන බව තිස්සමහාරාම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ප්‍රකාශ කළේය. තිස්සමහාරාම හා ලුණුගම්වෙහෙර ප්‍රදේශවල රාත්‍රී කාලයේ ආලෝකයන් පවතිනා ස්ථානවලට පැමිණෙන විෂ සහිත බූවක් ඇති කහ පැහැති සමනලුන් විශේෂයක් ඇඟෙහි ස්පර්ෂ වීමෙන් ඇඟ කැසීම්, පළු දැමීම් ඇතුළු විවිධ ආසාත්මිකතාවලට ලක්වන බව ජනතාව පවසති.

එමෙන්ම මීට පෙරත් අවස්ථා කිහිපයකදීම මේ හා සමාන මෙවැනි විෂ සහිත සමනලුන් වර්ග තිස්සමහාරාම හා ලුණුගම්වෙහෙර ප්‍රදේශවලින් වාර්තා වුණු බව ඔවුහු පෙන්වා දෙති. මේ සමනලුන් විශේෂය ඇඟෙහි ස්පර්ෂ වීමෙන් විවිධ ආසාත්මිකතාවන්ට ලක් වූ ප්‍රදේශවාසීන් විශාල පිරිසක් දෙබරවැව, ලුණුගම්වෙහෙර රෝහල්වලින් ප්‍රතිකාර ගෙන තිබේ.

මේ සම්බන්ධයෙන් අප තිස්සමහාරාම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය ප්‍රභාත් ලියනාරච්චි මහතාගෙන්ද විමසීමක් කළ අතර එහිදී ඔහු මෙලෙස පවසා සිටියේය.

"මේ සම්බන්ධයෙන් පසුගිය සිකුරාදා දින අපට කරුණු වාර්තා වී තියෙනවා. ඒ අනුව මා කාවන්තිස්සපුර ප්‍රදේශයේ නිවෙස් 30ක් පමණ මා විසින් පරීක්ෂා කළා. ඒ අනුව මේ සමනලුන් වර්ගය හඳුනා ගැනීමකට ලක් කරා. මේ ගැන වාර්තාවක් ලබා ගැනීමට හම්බන්තොට ප්‍රධාන සෞඛ්‍ය අධිකාරි කාර්යාලයෙන් පරපෝෂිත සතුන් පිළිබඳ කරුණු දන්නා නිලධාරියකු හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සම්බන්ධ කරගෙන අදාළ ප්‍රදේශයන්හි වාර්තා ගෙන කරාපිටිය පරපෝෂිත සත්ව අංශය කරා යවා තිබෙනවා. එහි ප්‍රතිඵල හා සෞඛ්‍ය රෙගුලාසි අනුව හැකි ඉක්මනින් කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා."

ඒ. සුමනසේන - කොළොන්නාව සමූහ

## කොළොන්නාව නගරය මැද මුල්ගල් පැළ වෙලා





කොළොන්නාව ආසනයට අංගසම්පූර්ණ සංස්කෘතික මධ්‍යස්ථානයක් ඉදි කිරීමේ බලාපොරොත්තුවෙන් මීට වසර 21කට පෙර එවකට මහාමාර්ග නියෝජ්‍ය ඇමතිවරයා වශයෙන් සිටි නාවලගේ බැනට් කුරේ මහතාගේ ආරාධනය පරිදි සංස්කෘතික ඇමැති ලක්ෂ්මන් ජයකොඩි හා එකල නාගරික සංවර්ධන ඇමැති ඉන්දික ගුණවර්ධන යන මහත්වරු විසින් කොළොන්නාව නගර මධ්‍යයේ පිහිටි ඉඩමක තබනා ලද මුල්ගල් තවමත් ඒ අන්දමින්ම පවතිනා බවට ප්‍රදේශවාසීහු පෙන්වා දෙති.

එවකට කොළොන්නාව රජයේ කර්මාන්ත ශාලාව සතුව පැවැති සේවක නිවාස කඩා ඉවත්කොට මේ ඉඩම රජයට පවරාගනු ලැබුවේ අදාළ සංස්කෘතික මධ්‍යස්ථානය සහිතව සංස්කෘතික නගරය හා මහල් නිවාස සංකීර්ණයක් ද ඉදිකොට පැවැති නිවාස 125 වෙනුවට සේවක නිවාස වශයෙන් රජයේ කර්මාන්ත ශාලාවට නිවාස 125ක් දීමේද පොරොන්දුවක් මත බවට ඔවුහු පෙන්වා දෙති. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය ජනාධිපතිවරිය වශයෙන් කටයුතු කළ සමයේ සිටි අදාළ ඇමැතිවරුන් දෙදෙනා මේ මුල්ගල් සහිත සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීමේ පුවරුව ඉදිකොට නිරාවරණය කර ඇති අතර, මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මේ ඉඩමේ මහල් නිවාස සංකීර්ණ ඉදි කිරීම් හා ඒවායේ ජනතාව පදිංචි කිරීම් පවා සිදු කළත් සංස්කෘතික නගරය සඳහා වෙන් කරනා ලද භූමිය පස් ගොඩවල් හා වැලි ගොඩවල් වලින් පිරී වල්වැදී ප්‍රයෝජනයකට නොගෙන තිබීමට බලධාරීන් ඉඩහැර ඇති අතර මෙය මුළු කොළොන්නාව නගරයම කිසිදු සංවර්ධනයකින් තොර නගරයක් බවට පත්වීමට හේතුවක් මෙන්ම මෙය දේශපාලනමය හා සමාජයීය වශයෙන් එම නාගරික ජනතාවට සිදු කෙරෙනා ද්‍රෝහීකමක් හා හානියක් බවට ද ප්‍රදේශවාසීහු කියා සිටි

# දින-දින වැජඹෙන අතුරලිය මහ විදුහල


විදුහල පරිශ්‍රය


ආචාර්ය මණ්ඩලය


රුක් රෝපණ වැඩසටහනක්


විදුහල්පතිනි - ශාන්ති අබේසුන්දර මහත්මිය


නැටුම් කණ්ඩායම


ශිෂ්‍ය නායක නායිකාවන්


නියෝජ්‍ය විදුහල්පතිවරුන් දෙදෙනා


ප්‍රාථමික අංශයේ ප්‍රදර්ශනයක්


2021 වසරේ 1 වසරට ඇතුළු වූ සිසුන් පිරිසක්


විද්‍යා ප්‍රදර්ශනයට සූදානම්වන අයුරු


මෙවර ශිෂ්‍යත්වයෙන් ඉහළම ලකුණු ලැබූ සිසුන් පිරිස


මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරයේ පරිගණක අධ්‍යාපනය ලබන සිසුන් පිරිස


ඔසු උයන


අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් දෛනික සේවයේ

අකුරැස්ස මැතිවරණ බල ප්‍රදේශයේ, අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මාර/ අතුරලිය මහා විද්‍යාලය අතුරලිය ප්‍රදේශයට ලැබුණ වටිනා සම්පතකි. 1834 වසරේදී එක් කුඩා ගොඩනැඟිල්ලක සුබ මොහොතින් ආරම්භ කරන ලද මේ පාසල මේ වනවිට වසර 187ක දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියනු ලැබේ. ඓතිහාසික ගොංගල කඳු මුදුනෙන් ආරම්භ වී මාතර මෝය කටෙන් මහ මුහුදට ගලා බසින නිල්වලා ගඟ ඉදිරිපස අතුරලිය ගම් පියසේ මනරම් පරිසරයක ස්ථාපිතව ඇති විදුහල වසරින් වසර ඉදිරියට පා තබමින් එක් කුඩා ගොඩනැඟිල්ලක් පමණක් තිබූ විදුහල් පියස අද වන විට ගොඩනැඟිලි 11කින් සමන්විත වේ. විශේෂයෙන්ම සඳහන් කළ යුත්තක් වන්නේ දිවයින පුරා විදුහල්වලට ලබාදුන් මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාර අතරින් අතුරලිය කොට්ඨාසය ලද එකම තාක්ෂණික විද්‍යාගාරය මෙම විදුහල සතුව තිබීමයි. අතුරලිය මහා විද්‍යාලය අද අකුරැස්ස අධ්‍යාපන කලාපයේ 1 AB පාසලක් ලෙස උසස්වීම් ලැබ (ජාතික පාසැල් මට්ටම) අකුරැස්ස අධ්‍යාපන කලාපයේ පමණක් නොව මාතර දිස්ත්‍රික්කයේ කීර්තිමත් විදුහලක් ලෙස කැපී පෙනෙයි. අද වන විට සිසු සිසුවියන් 600ක් සහ ආචාර්ය මණ්ඩලය 42ක් විදුහලට සවිය ගෙන දෙති. සුදු අධිරාජ්‍යවාදයට එරෙහිව සටන් වැදි ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ නියමුවකු මෙන්ම 1931 වසරේදී ස්ථාපිත වූ ලංකාවේ ප්‍රථම රාජ්‍ය මන්ත්‍රණ සභාවේ (ප්‍රථම පාර්ලිමේන්තුව) අකුරැස්ස මැතිවරණ කොට්ඨසය නියෝජනය කළ මන්ත්‍රීවරයා වූ දොස්තර සූගීෂ්වර අබේවර්ධන වික්‍රමසිංහ මහතා මූලික අධ්‍යාපනයට පා තැබූ විදුහලද අතුරලිය මහා විද්‍යාලයයි.ඔහුගේ නිජ භූමිය වන නස්නාරංකැටිය වලව්ව පිහිටා ඇත්තේද විදුහලේ සිට මීටර් කිහිපයක් නුදුරිනි. විදුහල් ඉතිහාසය පෙන්වා දෙන අයුරින් විවිධ ආකාරයෙන් දිවයිනේ විවිධ ක්ෂේත්‍රයන් හී නම් දරා සිටි සහ සිටින කිහිප දෙනෙකුම මූලික අධ්‍යා පනය ලබා ඇත්තේද මෙම විදුහලෙනි. 1834 දී පාසල ආරම්භ වී ඇති නමුත්, ලිපි ලේඛණ සාක්ෂි අනුව විදුහලේ ඉතිහාස සටහන් පෙන්වා දෙන්නේ 1942 පෙබරවාරි 09 වෙනි දින සිටයි. එදින සිට මේ දක්වා වර්තමාන විදුහල්පතිනියද ඇතුළුව විදුහල්පතිවරුන් 24 දෙනෙකු මෙහි සේවය කර ඇති බව ඉපැරණි පොත පත පෙන්වා දෙයි. මාර/ අතුරලිය කණිෂ්ඨ විද්‍යාලය - මාර/ අතුරලිය මිශ්‍ර පාසල , මාර/අතුරලිය මහා විද්‍යාලය ලෙස නාමයන් ලැබ ක්‍රම ක්‍රමයෙන් උසස් වී මේ තාක් දුරට පැමිණ ඇත. 2014 වර්ෂයේදී ද්විතීයක පාසලක් ලෙස උසස් කරනු ලැබ ඇති අතර උසස් පෙළ සඳහා විෂය ධාර 05ම ආරම්භ කර ඇත. ඉන් අනතුරුව 1- C වර්ගයේ පාසලක් ලෙස උසස් වී අද වන විට 1 - AB පාසලක් (ජාතික පාසල් මට්ටම) ලෙස ශ්‍රේණිගත වී ඇත. 2013 වසරේ සිට මේ දක්වා විදුහල්පතිනිය ලෙස සේවය කරනු ලබන ශාන්ති අබේසුන්දර මහත්මියගේ නිවෙස ස්ථාපිතව ඇත්තේ විදු පියසට මීටර කිහිපයක් නුදුරිනි.ඇය විදුහලේ පළමුවන වසර (එකල හෝඩිය පන්තිය) සිට බංකුවෙන් බංකුව ඉහළට ගොස් විද්‍යාලයේ ඉහළම පුටුව ජයගත්තේ වර්තමාන විදුහල්පතිනිය වශයෙනි. අබේසුන්දර මහත්මිය අප හා දොඩමළුවූයේ මෙසේය. මම මේ විදුහලේ ආදි ශිෂ්‍යාවක්. හා...හා... පුරා කියල අ - ආ යන්න කියා අත් පොත් තබමින් බාලාංශ පන්තියේ සිට ඉහළට ඉගෙන ගත්තේ මේ ස්කෝලේ. ගුරුවරියක ලෙස ගුරු සේවයට එක්වී විවිධ පාසල්වල සේවය කරල දැන් මගේ ස්කෝලෙට ආවා. මම අකුරු කළ විදුහලේ මුල් පුටුවට එන්න ලැබීම වගේම මම ඉගෙන ගත් පාසලට සේවයක් කරන්නට ලැබීම මගේ ජීවිතයේ ලබපු විශාලතම සතුටක්. අපේ විදුහලේ සිසු සිසුවියන් කලාපයෙන්, දිස්ත්‍රිකයෙන් හෝ දකුණු පළාතෙන් පමණක් නොවේ දිවයිනේම ඉහළ තලයට ගෙනයෑම තමයි මගේ ඒකායන අරමුණ.මේක මගේ ස්කෝලෙ. මම ආදරය කරන ස්කෝලෙ. වර්තමාන ආචාර්ය මණ්ඩලය, ඉතාමත් සහයෝගයෙන් අධ්‍යාපනික කටයුතු කරගෙන යනවා. ඒක තමයි අපිට තියෙන ශක්තිය. සිසු සිසුවියන්ද විනය ගරුකව තම තමන්ගේ අධ්‍යාපනික කටයුතු මෙන්ම බාහිර ක්‍රියාකාරකම්ද ජයගනිමින් ඉදිරියට යනවා. ඒකයි අපේ විද්‍යාලයේ දියුණුවේ රහස. විද්‍යාලයේ දියුණුව ගැන විදුහල්පතිනිය විදියට පමණක් නෙවි අසල්වාසී ගම්වැසියෙක් විදියට විශාල ආඩම්බරයක්. විදුහල්පතිනිය අප හමුවේ ඉතිහාසය සැකවින් විස්තර කරමින් අප හමුවේ හඩ අවදි කළ අපූරුවයි ඒ. වර්තමාන විදුහල්පතිනියද පාසල් අවධියේදී කථික තරග ජයග්‍රහණයන් මෙන්ම ක්‍රීඩා කුසලතාවන්ද පෙන්වා ඇත. තවද විදුහලේ ශිෂ්‍ය නායිකාවක හා නිවාස නායිකාවකද වී සිටි බව සටහන් ආශ්‍රයෙන් පෙන්වා දෙයි. මේ හේතු පාදක කරගනිමින් ඇය විදුහලේ දියුණුවට ඉමහත් සේවාවක් ඉටුකරනු ලබන බව පාසල් සංවර්ධන සමිතියේ නිලධාරීන් සහ මවුපියන් කිහිප දෙනෙකුම පෙන්වා දුන්හ.

විද්‍යාලයේම ආදි ශිෂ්‍යාවක වූ පී.එම්. අබේකෝන් මහත්මිය සහ එම්. සුසන්ත මහතා නියෝජ්‍ය විදුහල්පති පදවි දරමින් පරිපාලන කටයුතුවලට විශාල රුකුලක් ලබා දෙති.

විදුහල ගැන කතා කරන කොට 70 දශකයේදී අකුරැස්ස කලාපයේ (එකල අකුරැස්ස මණ්ඩලය) අන්තර් විද්‍යාල මලල ක්‍රීඩා තරගයන් පැවැත්වූයේද අතුරලිය විදුහල් ක්‍රීඩා පිටියේය. එකල ඒ තරමටම විදුහල ජනප්‍රිය තලයක පැවතියේය. මහින්දෝදය තාක්ෂණික විද්‍යාගාරය එකවර සිසු සිසුවියන් 40 දෙනෙකුට පරිහරණය කිරීම සඳහා පරිගණක 40ක් සහ අනෙකුත් සියලුම තාක්ෂණික මෙවලම් ඇත. විද්‍යාගාර පහසුකම්ද නොඅඩුව දරුවන්ට අධ්‍යාපන කටයුතුවලට සවියක්ව ඇත. සංගීතය විෂයය හදාරන සිසු සිසුවියන් සෑම වසරකම සමස්ත ලංකා ජයග්‍රහණයන් ලැබීමට වරම් ලැබ ගනිමින් සිටිති. පසුගිය වසරේදී සමස්ත ලංකා හාමෝනියම් තරගයෙන් ප්‍රථම ස්ථානය දිනා ගැනීමටද අතුරලිය විදුහල සමත් වී තිබුණි.

විද්‍යාලයීය පරිශ්‍රයේ පවත්වාගෙන යනු ලබන ඔසු උයන කාලෝචිත පියවරක් වන අතර ගුරු භවතුන්ගේ අධීක්ෂණය යටතේ නිරන්තරයෙන් සිසු සිසුවියන් තම ශක්ති ප්‍රමාණයෙන් ඔසු උයන නඩත්තු කරගෙන යනු ලබයි. සමස්ත ලංකා නැටුම් තරගවලින්ද විවිධ ජයග්‍රහණයන් ලැබීමට එකී විෂය හදාරන දරුවන් සමත්ව ඇති බව සටහන් වී ඇත. ජයග්‍රහණ ලැබූ බවට විදුහල්පති කුටියේ ඇති කුසලානවලින් පිරී ඉතිරී ගිය අල්මාරිය සාක්ෂි දරනු ලැබේ. කථික තරගවලින්ද දරුවන් බොහෝ ජයග්‍රහණයන් ලබා තිබීමද සඳහන් කළ යුතුව ඇත. නව රජය මඟින් මාතර දිස්ත්‍රිකයේ ස්ථාපිත කිරීමට යෝජිත ජාතික පාසල් ගොන්නට අප අද කතා කරන මාර/අතුරලිය මහා විද්‍යායලයද ලැයිස්තුගතව ඇත. තව නොබෝ දිනකින් එම උසස්වීමද ලබමින් ජාතික තලයට ඇතුළත් වීමට වරම් ලබා ඇත්තේ අකුරැස්ස කලාපයේ කීර්තිමත් විද්‍යාලයක් බවට අතුරලිය මහා විද්‍යාලය සුපතලව ඇති බැවිනි. විද්‍යාලයේ අනාගතය දීප්තිමත් වේවායි දිනමිණ ප්‍රාර්ථනය කර සිටී.

**සටහන හා ඡායාරූප**
**විජිත සල්ගාදු**
**අකුරැස්ස මධ්‍යම විශේෂ**


පුස්තකාල පරිහරණය කරන සිසු පිරිසක්


උසස් පෙළ නවක සිසුන් පැරණි සිසුන් විසින් පිළිගන්නා අයුරු


තූර්ය වාදක කණ්ඩායම

දසත
දස අත ම එක තැන

එන්. නවරත්න මීගහකිවුල සමූහ

# මිනිපේ වී අස්වැන්නට වැස්සෙන් කරදර







මිනිපේ මහ ගොවි ජනපදයේ අස්වනු නෙළීමේ කටයුතුවලට මේ දිනවල කඩින් කඩ ඇද හැළෙන වර්ෂාව විශාල බාධාවක්ව ඇතැයි එම ගොවි ජනපදවාසීහු පවසති. අස්වනු නෙළීමට ආසන්න ව ඇති කුඹුරු ලියඳිවලට වැසි වතුර එක්වී කඩා වැටුණු ගොයම් ගස් වැසි ජලයෙන් යටවීම හේතුවෙන් යන්ත්‍ර සූත්‍ර භාවිතා කරමින් ගොයම් නෙළීම කළ නොහැකි තත්ත්වයකට පත්ව ඇතැයිද ඔවුහු පවසති.

එසේම වර්ෂාවට හසුවීමත් සමගම තෙත බරිත වන බැත වෙලා ගැනීම විශාල බාධාවක් වී ඇති අතර බොහොමයක් වී අස්වනු නිසි ප්‍රමිතියකට අනුව සකස් කර ගත නො නොහැකි තත්ත්වයක්ද මතුව ඇත.

මෙම තත්ත්වය මත වී අස්වනු අලෙවි කරගන්නට යෑමේදී ගැටලු රැසකට මුහුණ දීමට තමුන්ට සිදුව ඇතැයිද ගොවීහු පෙන්වා දෙති.



ප්‍රියන්ත සුමනසේන උකුවෙල සංවාරක

## පිහි ඇනුමකින් පුද්ගලයකු මියයෑම:

# සැකපිට 9ක් අත්අඩංගුවට

මහවෙල පොලිස් වසමේ සැලගම වත්තේ පිරිසක් අතරේ පැවැති ආරාවුලකදි ඇතිවු පිහි ඇනුමකින් තුවාල ලත් පුද්ගලයකු 29 වන දින රාත්‍රි මාතලේ රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇති බව මහවෙල පොලීසිය පවසයි. මෙලෙස මියගොස් ඇත්තේ සැලගම වත්තේ පදිංචි තිදරු පියෙකු වන පලනි මගලේස්වර් (40) නමැති අයෙක් වන අතර මෙම පුද්ගලයාගේ මරණය සම්බන්ධයෙන් සැකකරුවන් 9 දෙනකු අත් අඩංගුවට ගෙන ඇත. සිද්ධිය පිළිබඳ මාතලේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි අනුරුද්ධ බංඩාරනායක මහතා හා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි මාතලේ 1 බාර අජිත් වංශනාථ මහතාගේ උපදෙස් මත මහවෙල පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක චන්ද්‍රසිරි නවගමුවේ මහතාගේ මෙහෙයවීමෙන් පොලිස් පරීක්ෂක දිවාකර, පොලිස් පරීක්ෂක දිසානායක, උප පොලිස් පරීක්ෂක විජේසිරි මහතා ඇතුළු කණ්ඩායමක් පරීක්ෂණ පවත්වති.

රසුල දිල්හාර ගමගේ උතුරු පළාත් විශේෂ

# ඉපැරැණි කුඹුක් ගස කැපුවාට කෝවිල් භාරකරුට නඩු

වසර සීයකටත් වඩා ඉපැරණි කුඹුක් ගසක් කැපීම සම්බන්ධයෙන් වවුනියාව වෛරවපුලියන්කුලම ආදී ගනේෂ්වර කෝවිලේ බාරකරුට එරෙහිව වවුනියාව පොලීසිය නඩු පවරා තිබේ. කෝවිල් උත්සවයේදී රථය ඇදීමට අවහිර බව කියමින් කෝවිලේ ප්‍රධාන කුරුක්කල්වරයා විසින් ඔහුගේ අභිමතය මත මෙම ඉපැරණි විශාල ගස කපා දැමීමෙන් පසුව ගම්වාසීන් ඒ පිළිබඳ පළාතේ ග්‍රාම නිලධාරීවරයාට පැමිණිලි කොට තිබේ. ග්‍රාම නිලධාරීවරයා සිද්ධිය පිළිබඳ වවුනියාව පොලීසියට දැනුම් දීමෙන් පසුව පොලීසිය කුරුක්කල්වරයාගෙන් ප්‍රකාශයක් සටහන් කරගෙන ඔහුට එරෙහිව නඩු පවරා තිබේ.

පී.පී.ජී.සුගතදාස-තිහගොඩ සමූහ

# කාබනික පොහොර පමණක් භාවිතයෙන් දකුණෙන් වගා වැඩසටහන්

රසායනික පොහොර භාවිතයෙන් තොරව කාබනික පොහොර වර්ග පමණක් යොදා ගෙන බෝග වගා වැඩසටහන් ආරම්භ කිරීමට දකුණු පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය පියවර ගනී. දැනට මුඩුබිම් බවට පත්ව තිබෙන කුඹුරු ඉඩම්වල එම බෝග වර්ග වගා කරන අතර, එකී වගා වැඩසටහන්වලදී බඩඉරිඟු, කව්පී හා මුං වගාවන් සඳහා පුමුඛත්වය ලබාදී තිබෙන බව අමාත්‍යාංශය සඳහන් කරයි.ඊට අමතරව වැටකොලු, පතෝල, වට්ටක්කා, මාලුමිරිස්, බණ්ඩක්කා, අමු මිරිස්, මෑ, පලා වර්ග ඇතුළු එළවළු හා පලතුරු වගා ව්‍යාපෘති ද ආරම්භ කර තිබෙව බව ව්‍යාපෘති නිලධාරීහු පවසති. මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එකී වගා වැඩසටහන් ක්‍රියාත්මකය. දැනටමත් කිරින්දපුහුල්වැල්ල, හක්මන සහ දෙවිනුවර ප්‍රාදේශිය මහ ලේකම් කොට්ඨාසය, මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කිහිපයක්ද ඒ සඳහා තෝරාගෙන තිබේ. දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසවල ද මෙම වගා වැඩසටහන් ව්‍යාප්ත කිරීම අමාත්‍යාංශයේ අපේක්ෂාව වේ. වගා ව්‍යාපෘති සාර්ථක කර ගැනීම පිණිස අවශ්‍ය ආධාර, ගුණාත්මක වර්ගයේ රෝපණ ද්‍රව්‍ය, නව තාක්ෂණික දැනුම හා වගා උපදෙස් දකුණ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංය අදාළ ප්‍රතිලාභීන්ට සපයයි.

සී.එම්. ආරියපාල තඹුත්තේගම

# තඹුත්තේගම රක්ෂිත ඉඩමක ඉදිකළ ජංගම කඩය ඉවතට



තඹුත්තේගම කොත්මල්පුර වම් ඉවුර ඇළ කණ්ඩියේ රක්ෂිත ඉඩමේ අනවසරයෙන් ඉදිකර තිබූ තල්ලු කළ හැකි වෙළෙඳ සල මහවැලි අධිකාරියෙන් අත්අඩංගුවට ගෙන රැගෙන ගොස් තිබේ. නල්ලච්චිය ගොවි සංවිධානයෙන් කරන ලද පැමිණිල්ලක් අනුව තඹුත්තේගම කොට්ඨාස කළමනාකාර නිල්මිණි ශ්‍රියාලතා මහත්මිය ඒකක කළමනාකාර ලක්ෂ්මන් මහතාද සමඟ තඹුත්තේගම පොලිස් ස්ථානයේ නිලධාරින් සමඟ අදාළ ස්ථානයට පැමිණ අනවසරයෙන් ඉදිකළ වෙළෙඳසල මහවැලි බාරයට ගෙන මහවැලි කාර්යාලයට රැගෙන ගොස් ඇත. මෙම ඉඩම් කොටස මහවැලි අධිකාරියේ රක්ෂිත ඉඩමක් බව කොට්ඨාස කළමනාකාරිණිය වන නිල්මිණි ශ්‍රියාලතා මහත්මිය පැවසුවාය. මෙම ඉඩමේ වෙළෙඳසල ඉදිකර තිබුණේ තඹුත්තේගම තිස්පනේපුර කාන්තාවක් සහ ඇගේ පුරුෂයා විසිනි.

නුවන් ජයසේකර සූරියවැව විශේෂ

# ලුණුගම්වෙහෙර පවුල් 500ක් බොන්නේ මඩ වතුර



ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් ග්‍රාම සේවා වසම් දෙකක පවුල් 500කට අධික ප්‍රමාණයකට පිරිසුදු පානීය ජලය නොලැබීමෙන් දැඩි අසරණ තත්ත්වයට පත්ව ඇතැයි ගම්වාසිහු පවසති.

පිරිසුදු පානීය ජලය නොමැති වීමෙන් මෙලෙස අසරණ තත්ත්වයට පත්ව ඇත්තේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් බෝගහවැව හා දෙවිරම්වෙහෙර ග්‍රාම නිලධාරී වසම් දෙකෙහි පදිංචි ජනතාවයි. මෙතෙක් කලක් මෙම ජනතාව සඳහා පානීය ජල අවශ්‍යතාව සපුරා ඇත්තේ ප්‍රදේශයේ ප්‍රජා මුල ජල ව්‍යාපෘතිය මඟින් වන අතර ඉන් ලැබෙන ජලය මඩ පැහැති බවත් ඒ හේතුවෙන් එම ජලය බීමට ගත නොහැකි බවටත් ප්‍රදේශවාසීහු චෝදනා කරති.පසුගිය යහපාලන රජය සමයේ රුපියල් ලක්ෂ 45ක මුදලක් වියදම් කරමින් මෙම ජල ව්‍යාපෘතිය ආරම්භ කර ඇති නමුත් අද වන විට එය ප්‍රයෝජනයට ගත නොහැකිය.

**කේ.එල්.සුමනාවතී මහත්මිය-** බොන්න පිරිසුදු වතුර ටිකක් නැතිව අපි දැන් අවුරුදු ගාණක ඉඳන් දුක් විඳිනවා.මේ දුක් ගැනවිල්ල ගැන අපි පාර්ලිමේන්තුවටත් දැනුම් දුන්නා.එහි ප්‍රතිඵලයක් ලෙස හිටපු නිවාස ඇමති සජිත් ප්‍රේමදාස මහත්තයා මෙම ව්‍යාපෘතිය ගමට දුන්නා.නමුත් අද වෙනකොට එම ජල ව්‍යාපෘතිය නිසි පරිදි නඩත්තුවක් නොමැති කමින් හෝ වෙන යම් ගැටලුවක් හේතුවෙන් ලැබෙන ජලය මඩ පැහැතියි. අපි බලධාරීන්ගෙන් ඉල්ලන්නේ අපිට බොන්න පිරිසුදු වතුර ටිකක් දෙන්න කියලා.

**බී.නිශාන්ත මහතා -** අපි මේ වතුර ගැටළුව පිළිබඳ කියන්න තියෙන හැමෝටම කිව්වා.තවම පේන මානයකවත් මේ සඳහා පිළිතුරක් නෑ.සමහර නිලධාරින්ගෙන් මේ ගැන ඇහුවම කියනවා තව අවුරුදු දෙක තුනකින් මේ සඳහා පිළියමක් දෙනවා කියලා.අපිට තියෙන ප්‍රශ්ණය එතකම් අපි මඩ වතුරද බොන්න ඕනේ කියන එකයි.

**කේ.රොෂාන් මහතා -**මේ ජල ව්‍යාපෘතිය ආරම්භ කළ මුල් කාලයේ හොඳට තිබුණා. නමුත් අද වෙනකොට මෙහි පවතින ජල ෆිල්ටර් පද්ධතියේ පවතින යම් අඩුපාඩුවක් නිසා තමයි මේ තත්ත්වය උදාවෙලා තියෙන්නේ.මේ පිළිබඳ සොයා බලන්න නිසි වගකිවයුත්තෙක් නැති කමයි ගැටළුව.මේ ප්‍රශ්ණය නිසා අද වෙනකොට අසරණ වෙලා ඉන්නේ ගම්වල ඉන්න අපි.

මේ සම්බන්ධයෙන් අප ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ සභාපති රසික දිනේෂ් මහතාගෙන් විමසිමක් කළ අතර එහිදි ඒ මහතා මෙසේ පැවසිය.

මෙම ජල යෝජනා ක්‍රමයේ පවතින ගැටළුව පිළිබඳ මා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදි කතා කළා.ඒ අනුව ඉදිරියේදි ජලසම්පාදන මංඩලය හරහා මෙම ජනතාවට ජලය ලබා දීමට සැලසුම් ක්‍රියාත්මක කර තිබෙනවා.එතෙක් මෙම ගම්මානවලට ජල බවුසර් මඟින් පානිය ජලය ලබා දීමට මා පියවර අරගෙන තියෙනවා.යම් අයෙකුට නිසි පරිදි ජලය නොලැබෙන්නේ නම් ඒ පිළිබඳව මා වෙත යම් දැනුම් දීමක් කළොත් ඒ අය සඳහා ජලය නොපමාව යැවීමට මා කටයුතු කරනවා.



බී.නිශාන්ත



කේ.එල්.සුමනාවතී



කේ.රොෂාන්

කේ. විජේසිරි නිශ්ශංක කරල්ලියද්ද සමූහ

# අනවසර දැව ලොරියක් දිගන දී අල්ලයි

## සැකකරුට ලක්ෂ 5ක ශරීර ඇප

හසලක සිට අකුරණ ප්‍රදේශයට ආවරණය කළ ලොරි රථයකින් ප්‍රවාහනය කළ දැව තොගයක් සමග සැකකරුවෙක් දිගන නගරයේදී තෙල්දෙණිය පොලීසියේ දූෂණ විමර්ශන කාර්යාංශයේ නිලධාරින් විසින් අත්අඩංගුවට ගෙන තිබේ. මෙම සැකකරු තෙල්දෙණිය මහේස්ත්‍රාත් දිසා විනිසුරු ශානක කලන්සූරිය මහතා වෙත ඉදිරිපත් කිරිමෙන් පසු රුපියල් ලක්ෂ පහක ශරිර ඇපයක් මත මුදා හරිමින් මෙම දැව පිළිබඳ වන නිලධාරීන්ගෙන් ලබාගත් වර්තාවක් අධිකරණයට ඉදිරිපත් කරන ලෙස ද නියෝග කෙළේය.

මෙම ලොරි රථයේ තහනම් දැව වන කොලොන්, අරඹ, හා දම් යන කපන ලද දැව කෑලි තුන්සිය පහළොවක් තිබුණ අතර බලපත්‍රයට වැඩියෙන් දැව කෑලි තිස් නවයක්ද ප්‍රවහනය කර තිබිණි.

මෙම දැව ලොරිය තෙල්දෙණිය පොලීසියේ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂක එස්. පාලමකුඹුර මහතා සමග පොලිස් සැරයන් එදිරිසිංහ ( 2481 කුමාර ( 9364 සේනානායක හා යාපා යන නිලධාරින් මෙම වැටලීම සිදු කළහ. තෙල්දෙණිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ජගත් සේරම් මහතාගේ උපදෙස් පරිදි මෙම වැටලීම සිදුකර සැකකරු සමඟ දැව ලොරිය අත්අඩංගුවට ගෙන ඇත.

ප්‍රදීප් කුමාර ධර්මරත්න අරණායක

# අරණායක රහලගල රක්ෂිතයේ මහ දැව ජාවාරමක්



අරණායක රහලගල රක්ෂිත වනාන්තරයේ කාලයක් තිස්සේ සිදු කරගෙන ගිය දැව ජාවාරමක් වටලා එක් සැකකරුවකු අත්අඩංගුවට ගැනීමට අරණායක පොලීසියට සමත් වී තිබේ. අත්අඩංගුවට ගත් සැකකරු 79 හැවිරිදි රහල ප්‍රදේශයේ පදිංචි අයෙකි. මෙම සැකකරු කාලයක් තිස්සේ නීති විරෝධී ලෙස රහලගල රක්ෂිතයේ ඇති වටිනා ගස් කපා ප්‍රදේශයේ ලී මෝල් වෙත අලෙවි කරන බවට පොලීසියට ලැබුණු තොරතුරක් මත අරණායක පොලීසියේ රථවාහන අංශයේ උප පොලිස් පරීක්ෂක ජේ.එම්.එස්.එස්. ජයසුන්දර මහතා සහ පොලිස් කොස්තාපල් 74822 සමීර මහතා රහලගල රක්ෂිතයට නැග සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ. සැකකරු විසින් රක්ෂිතයෙන් කපා දමන ලද වටිනා දැව කඳන් රැසක් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි භාරයට පත්කොට තිබේ. අරණායක පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක බුද්ධික පනාවෙල මහතාගේ උපදෙස් මත රථවාහන අංශයේ උප පොලිස් පරීක්ෂක ජේ.එම්.එස්.එස්. ජයසුන්දර සහ පොලිස් කොස්තාපල් 74822 සමීර යන මහත්වරුන් වැටලීම සිදු කොට සැකකරු අත්අඩංගුවට ගන්නා ලදි.

නාඋල සමූහ

# නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තොරතුරු පිටුව අන්තර්ජාලයට



තොරතුරු තාක්ෂණය ග්‍රාමීය ජනතාවට යථාර්ථයක් කරමින් නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහජනතාවට තොරතුරු ලබාගැනිමේ පහසුකම පසුගිය 30වැනිදා සිට සයිබ අවකාශයට මුදාහරින ලදි. 'ANSWER STORE NAULA ' ලෙස නම්කර ඇති මෙම සේවා ඔස්සේ වට්ස්ඇප්,මැසෙන්ජර්, ටෙලිග්‍රම්, ෆේස්බුක්, වයිබර්, භාවිත කරන ඕනෑම පුද්ගලයකුට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් ලබාගත යුතු සේවා සඳහා අවශ්‍ය ලියකියවිලි පිළිබඳ සියලු තොරතුරු කල් වේලා ඇතිව දැන ගත හැකිය. මීට අමතරව නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉතිහාස ගත තොරතුරු ඇතුළු මහජනතාවට වැදගත් තොරතුරු රැසක් ස්වයංක්‍රීයව පැය 24 පුරා මෙම සේවාව හරහා ලබාදීම සිදුකරනු ලබයි. 071-4507082 අංකය ඔස්සේ ඕනෑම දුරකතන ජාලයක් මගින් මෙම සේවා ලබාගත හැකිය. මෙම අවස්ථාව සඳහා මාතලේ අතිරේක දිසාපති නිශාන්ත කරුණාතිලක, නාඋල ප්‍රාදේශීය ලේකම් චින්තක ඉලංගසිංහ,නාඋල ප්‍රාදේශීය සභා සභාපති සනත් දසනායක,නාඋල මහජන බැංකුව,ශ්‍රී ලංකා මොබිටෙල් ආයතනය, නාඋල පොලිස් ස්ථානය,නාඋල වෙළෙඳ සංගමය ඇතුළු ආයතන රැසක නියෝජිත මහත්වරු එක්ව සිටියහ.

අම්බලන්ගොඩ සමූහ ආර්. ඥාණදාස

# උඩ ගිහින් පුපුරන මල් වෙඩි තරම් මේ ජීවිත ලස්සන නැහැ



## දකුණේ මල්වෙඩි නිෂ්පාදකයන්ගේ කතාව

සිංහල අලුත් අවුරුදු උදාවත් සමග ම අපට දස දෙසින් ඇසෙන්නේ රතිඤ්ඤා හඬය. එය එදා මෙන් අදත් එසේමය. එහෙත් එදා අපේ සවන් පිනවූ රබන් හඬ අද වන විට ඇසෙන්නේ ඉතාමත් කලාතුරකිනි. කෙසේ වෙතත් අවුරුදු සමයේ ලොකු කුඩා සැවොම දල්වන රතිඤ්ඤා නිෂ්පාදන කෙරෙන්නේ කෙසේද යන්න සොයා බැලීමට අපට සිත් විය. දකුණු පළාතේ මේ කර්මාන්තය දැනට පවත්වා ගෙන යනු ලබන්නේ අම්බලන්ගොඩ, දඩල්ල සහ වැලිගම යන ප්‍රදේශවල පමණි. රතිඤ්ඤා හැදෙන්නේ කොහොමද යන්න සොයා බැලීමට මා යන්නේ අම්බලන්ගොඩ, වේනමුල්ල, දිඹුල්දූවේ පිහිටි සීබ්‍රා ගිනිකෙළි කර්මාන්තය වෙතය. එහි අයිතිකරු වන්නේ ගුනෙත්ති සේපාල දයාවංශ නැමති මහතෙකි. මා ඒ මහතාගෙන් මෙම ගිනිකෙළි කර්මාන්තය පිළිබඳ විස්තර විමසීමේ දී ඒ මහතා මෙසේ පැවසුවේය.

මේ ගිනිකෙළි කර්මාන්තය මෙහි ආරම්භ කළේ මගේ සීයා. සීයාගේ ඇවෑමෙන් මගේ පියා මේ කර්මාන්තය කරගෙන ගියා. ඒ කාලයේ මමත් ඊට සම්බන්ධ වී මේ කර්මාන්තය පිළිබද පුහුණුවක් ලබා ගත්තා. පියා මිය යාමෙන් පසුව මේ කර්මාන්තයට අත ගසා එය වඩා දියුණු තත්ත්වයට පත් කිරීමට මට හැකි වුණා. ගිනිකෙළි කර්මාන්තයට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය මෙන්ම වෙඩි බෙහෙත් රජය විසින් ආණයනය කරන්නේ ඉංදියාවෙන්. නමුත් මේ කර්මාන්තය ඉතා දියුණු තත්ත්වයෙන් පවත්වා ගෙන යන්නෙ චීන රටේ පමණයි. ඉංදියාවේ නිපදවන මල් වෙඩිවලට නොදෙවෙනි තත්ත්යට අපිත් මල් වෙඩි නිපදවනවා. නමුත් ගැටලුවක්ව පවතින්නේ උඩ ගිහින් පුපුරන මල් වෙඩිවලින් නිකුත් වන විවිධ වර්ණ සකස් කර ගැනීමට අවශ්‍ය වන රසායනික ද්‍රව්‍ය ලංකාවට ගෙන්වන්නේ නැති එකයි. ඒ සඳහා අපි වෙඩි බෙහෙත් සහ වෙනත් දෑ මිශ්‍ර කොට ඊට අවශ්‍ය දෑ අපම සකස් කර ගන්නවා. අපි රතිඤ්ඤාවලට අමතරව අහස්කූරු , බඹර චක්‍ර සහ වෙනත් සිත්ගන්නා සුළු ගිණිකෙළි නිෂ්පාදනය කරනවා. අවුරුද්දේ මාස දහයක් පමණ අපි එක දිගට මේ ගිණිකෙළි නිශ්පාදනය කරනවා. මේ සඳහා මා ලග දස දෙනෙක් සේවය කරනවා. ඊට අමතරව කඩදාසි බම්බු සකස් කිරීමේ හා ඒවාට මැඩි කට්ට ගැසීමේ වැඩ අපේ කර්මාන්ත ශාලාව අවට නිවැසියන් ලවා කරවා ගන්නවා. ඒ අයට කෑලි ක්‍රමයට ගෙවීම් කරනවා. ඉංදියාවෙන් ගෙන්වන වෙඩි බෙහෙත් සහ රසායනික ද්‍රව්‍යවල මිළ ගණන් විශාල වශයෙන් ඉහළ ගොස් ඇති නිසා මේ කර්මාන්තය කරගෙන යන්නේ ඉතා අපහසුතා මධ්‍යයේ බව කිව යුතුයි. අනෙක මේ කර්මාන්තය ඉතා අනතුරුදායකයි. ඉතා කල්පනාවෙන් හා ඉවසීමෙන් යුතුය මේ වැඩ කරන්න වෙනවා. මමත් දෙවතාවක් පිලිස්සුම් තුවාල ලැබුවා. මාස හයක පමණ කාලයක් කොළඹ මහ රෝහලේ නේවාසිකය ප්‍රතිකාර ලබා ගන්න මට සිදු වුණා. අපේ නිෂ්පාදන අපි රට වටේම අලෙවි කරනවා. නිපදනවන තරමක් අලෙවි කර ගන්න පුළුවන්. අපට වැඩියෙන්ම වැඩ තියෙන්නේ අවුරුදු සමයේ සහ වෙනත් ජාතීන්ගේ ජාතික උත්සව පවත්වන කාලයේදී සහ විදේශ සංචාරකයන් මෙරටට පැමිණෙන කාල වකවානුවලදී තමයි. ඊට අමතරව විහාරස්ථානවල ආගමික උත්සව සහ මංගල උත්සව අවස්ථාවලදීත් පාරිභෝගිකයන් අපි සොයා පැමිණෙනවා.

වැලිමඩ සමූහ ආර්. රාජමන්ත්‍රී


## අඹේවෙල මහ නාහිමි තෙමස් පූර්ණ ගුණ සමරුව



අපවත් වී වදාළ ඌවේ ස්‍යාමවංශික නිකායේ මහානායක ධුරන්ධර, කැප්පෙටිපොල පාලුගම ශ්‍රී සුබද්‍රාරාම මහා විහාරය, ඓතිහාසික තැන්න ශ්‍රී සෝමානන්ද බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, පිළියන්දල, සුවාරපොල, බුද්ධාලෝක මහා විහාරය යන විහාරත්‍රයාධිපති, ශ්‍රී සෝමානන්ද මහ පිරිවෙනේ කෘත්‍යධිකාරි, අග්ගමහා මහෝපාධ්‍යාය, ශාස්ත්‍රවේදි පණ්ඩිත අඹේවෙල පඤ්ඤාසාරාභිධාන මහානායක මාහිමිපාණන් වහන්සේගේ තෙමස් පූර්ණය කොට ගෙන 2021. 04. 04 වන දින දහවල් මහා සංඝගත දක්ෂිණාවක් කැප්පෙටිපොල ශ්‍රී සුබද්‍රාරාම මහා විහාරස්ථානයේ දී පැවැත් වේ.

මෙම දානමය පින්කම භික්ෂුන් වහන්සේ 150 නමක් සහභාගීත්වයෙන් පැවැත්වෙයි.

## උප ප්‍රධාන සංඝනායක ධුරයෙන් පිදුම් ලබන නාවින්නේ සුගුණධම්ම හිමියෝ



පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙනේ උප පරිවේණාධිපති කැලණිය, ගෝනවල ශ්‍රී වර්ධනාරාම විහාරාධිපති අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකයේ විශ්‍රාමික ගණිත ගුරු උපදේශක නාවින්නේ සුගුණධම්ම හිමිපාණෝ 2021.04.02 වැනි දින මහනුවර මල්වතු විහාරයේ දී කොළඹ හලාවත දෙදිසාවේ උප ප්‍රධාන සංඝනායක ධුරයෙන් පිදුම් ලබති.

සල්පිටි කෝරලයේ නාවින්නේ දී 1949 ජූලි මස 06 වැනි දින විජේසිංහ ආරච්චිගේ පීටර් විජේසිංහ සහ පලිහවඩන ආරච්චිගේ නන්දා පලිහවඩන දම්පතීන්ගේ කනිටු පුත් රුවන ලෙස ජන්ම ලාභය ලබන මෙත්තානන්ද විජේසිංහ දරුවා කැලණිය ගුරුකුල විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා 1964 මැයි මස 21 වන දින නාවින්නේ සුගුණධම්ම හිමි ලෙසින් සසුන් ගත වන්නේය. ඒ කිරිවත්තුඩුවේ ප්‍රඥාසාරාභිධාන මාහිමිපාණන් වහන්සේගේ සහ යක්කඩුවේ ශ්‍රී ප්‍රඥාරාම මාහිමිපාණන් වහන්සේගේ ශිෂ්‍යවරයකු වශයෙනි.

විද්‍යාලංකාර පිරිවෙනේ වර්තමාන පරිවේණාධිපති ආචාර්ය වැලිමිටියාවේ කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේගේ පැවිදි සහෝදර ශිෂ්‍ය හිමිනමක් වන නාවින්නේ සුගුණධම්ම හිමි අධිශීල ශික්ෂා සංඛ්‍යාත උපසම්පදා ලබන්නේ පේරාදෙණිය උපාධි අපේක්ෂකයකුව සිටිය දී 1971 වසරේදීය.

වර්ෂ 1974 දී ශාස්ත්‍රවේදී උපාධිධරයකු ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් පිටවන්නේ සිංහල, පාලි, සංස්කෘත ආදී විෂයයන් පමණක් නොව ඊටත් එහා යමින් ගණිතය සහ සංඛ්‍යානය යන විෂයන්ගෙන් ලද නිපුණතාව ද සහිතවය. විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසුව ගුරු වෘත්තියට පිවිසෙන උන්වහන්සේ පන්නිපිටිය විද්‍යාලංකාර පිරිවෙනේ ආචාර්යවරයකු ලෙස සේවය කර 1976 දී රජයේ අධ්‍යාපන ගුරුවරයකු ලෙස නුවරඑළිය දිස්ත්‍රික්කයේ හැදුණුවැව මධ්‍ය මහා විද්‍යාලයේ සේවය කළහ. පසුව කොළඹ නාලන්දා සහ ඩී. එස්. සේනානායක විදුහල්වල සේවය කරන ලද අතර මේ කාලවලදී උන්වහන්සේගෙන් දැනුම ලබා රටට ලෝකයට බිහි වූ ප්‍රකට ආචාර්ය මහාචාර්යවරු, ව්‍යාපාරිකයෝ, දේශපාලකයෝ, නීතිඥයෝ, වෛද්‍යවරු, පරිපාලන හා අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීහු ඇතුළු විවිධ ක්ෂේත්‍රවලින් රට ලෝකය බබලවන සිය ගණන් ගෝලයෝ වෙති. කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ පශ්චාද් උපාධි ගුරු ඩිප්ලෝමාධාරියකු වන නාවින්නේ සුගුණධම්ම හිමියෝ 1990 සිට 2004 දක්වා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකයේ ගණිත ගුරු උපදේශක ලෙස ද කටයුතු කරනු ලැබූහ.

ඉන්දියාව, තායිලන්තය, චීනය, ජපානය වැනි ආසියාතික රටවල ද ඇමරිකාව, එංගලන්තය, ප්‍රංශය වැනි රටවල ද යනාදී ලෙස දේශ දේශාන්තරයන්හි සංචාරය කර ඇති උන්වහන්සේ එයින් ලද සිය අත්දැකීම් සම්භාරය ධර්මදානය සඳහාත් ජනතා සුබසිද්ධිය සඳහාත් ඉවහල් කරගෙන ඇත.

සිය වෘත්තීය ගුරු ජීවිතයට සමු දීමෙන් අනතුරුව උන්වහන්සේ පැලියගොඩ විද්‍යාලංකාර මහා පිරිවෙනෙහි උප පරිවේණාධිපති ලෙස ද කැලණිය, ගෝනවල ශ්‍රී වර්ධනාරාමයේ විහාරාධිපති ලෙස ද මුළු මහත් ප්‍රදේශය පුරා ආගමික ශාසනික මෙහෙවරෙහි නිරත වී සිටිති. විශේෂයෙන් ශ්‍රී වර්ධනාරාමයේ දියුණුව සඳහා සුවිසල් මෙහෙයක් ඉකුත් යුගයේ දී සිදු කර ඇති අතර විහාර මන්දිරය අලංකාර ලෙස නිමවා ශාසනික සංසිද්ධීන් කැටයම් කිරීම, සැතපෙන බුද්ධ ප්‍රතිමා වහන්සේ නමක් නෙළීම, චෛත්‍ය රාජයාණන් වහන්සේ, ධර්ම ශාලාව, දාන ශාලාව, පුස්තකාලය සමග නව දෙමහල් සංඝාවාසය සහ වාහල්කඩ ඉදි කිරීම උන්වහන්සේගේ අනුස්මරණීය ශාසනික සේවාවන්ට අයත් ය. දෛනික ආගමික කටයුතුවලට අමතරව පොදු පින්කම් පැවැත්වීම වාර්ෂික කඨින පුණ්‍යෝත්සව අලංකාර ලෙස සිදු කිරීම ඒ අතර ප්‍රධාන වේ. සිය දිවි ගමනේ දිගු කලක් පුරා ජාතික ආගමික ශාස්ත්‍රීය සේවාවන්හි නිරත වෙමින් ජනහිතකාමී සමාජ මෙහෙවරක යෙදෙන නාවින්නේ සුගුණධම්ම හිමියන්ට නිදුක් නීරෝගී චිර ජීවනය ප්‍රාර්ථනා කරමු.

*දීප්ත සුදේශ් රණසිංහ*
*සහකාර විදුහල්පති*
*එච්. කේ. ධර්මදාස ම. වි.- පැලියගොඩ*

දිනමිණ දිසත දස අත ම එක තැන

අම්බලන්තොට සමූහ - වීරකැටිය සමූහ

## අඟුණුකොළපැලැස්ස ටිපර් අනතුරින් එක් අයකු මියගිහින් 16කට තුවාලයි



අඟුණුකොළපැලැස්ස මුරවැසිහේන ප්‍රදේශයේ දී ඊයේ (31) පෙරවරු 9.30 පමණ ටිපර් රථ දෙකක් එකිනෙක ගැටීමෙන් සිදුවූ රිය අනතුරකින් එක් ටිපර් රථයක ගමන් ගත් පුද්ගලයන් 16 දෙනෙකු තුවාල ලබා එහි රියදුරු මියගොස් තිබේ.

මෙම අනතුරෙන් මියගොස් ඇත්තේ අම්බලන්තොට වාඳුරුප්ප පාරේ පදිංචි රාජගුරුගේ ලලිත් කුමාර රාජපක්ෂ (45) නැමති අයෙකි. තුවාලකරුවන් අඟුණකොළපැලැස්ස දිසා රෝහලට සහ තංගල්ල මූලික රෝහලට ඇතුළත් කර තිබේ. මියගිය අයගේ මරණය සම්බන්ධ හදිසි මරණ පරීක්ෂණය ඊයේ (31දා) දහවල් තවාලුවිල කොට්ඨාසයේ හදිසි මරණ පරීක්ෂක වෛද්‍ය ආර්. ජී. එම්. ගුණවර්ධන මහතා විසින් පවත්වන ලදී. අනතුරට ලක්ව ඇත්තේ අඟුණුකොළපැලැස්ස ප්‍රදේශයේ සිට වැටිය ප්‍රදේශය දක්වා ගමන් ගත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් සේවකයන් ප්‍රවාහනය කරමින් තිබු ටිපර් රථයක් හා වැටිය ප්‍රදේශයේ සිට අඟුණුකොළපැලැස්ස දක්වා ගමන්ගත් වැලි ප්‍රවාහනය කරමින් තිබු ටිපර් රථයක් වේ. අනතුර සම්බන්ධයෙන් ටිපර් රථයේ රියදුරු අඟුණුකොළපැලැස්ස පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන පරීක්ෂණ පවත්වනු ලැබේ.

*ඡායා-රාහුල් සමන්ත*

පී. මද්දුමගේ මාවරල සමූහ

## දානෙ ගෙදරකට ගිය 10කට කොරෝනා

මාතර දෙයියන්දර ගල්ඇටුඹ ගමේ දානෙ ගෙදරකට සහභාගී වූ දහ දෙනෙකු කොරෝනා ආසාදිත බවට පසු ගිය 30 වන දින හඳුනාගත් බව, මුලටියන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්‍යාලයේ පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක ජේ. එල්. නන්දසිරි මහතා පැවැසීය.

තණමල්විල ප්‍රදේශයේ සිට දානෙ ගෙදරට පැමිණ ඇති පුද්ගලයන් දෙදෙනෙකු ආපසු ගිය පසු තණමල්විලදී කරන ලද පීසීආර් පරීක්ෂණ මඟින් කොරෝනා ආසාදිත බවට වාර්තා වී ඇතැයි ද හෙතෙම පැවැසීය.

## වයස 39 දී පැවිදි බිමට



මීරිගම මක්කානිගොඩ පදිංචිව සිටි ජී. ආර්. හේමන්ත පුෂ්පසිරි මහතා පසුගිය 21 වැනිදා හාපිටිගම ජයසුමනාරාම මූල මහා විහාරස්ථානයේදී පැවිදි බිමට පිළිපන්නේය.

නැසීගිය ජී. ආර්. සෝමසිරි මහතාගේ සහ එන්. කේ. නාලනී හේමලතා මහත්මියගේ ජ්‍යෙෂ්ඨ පුත්‍ර රත්නය වූ ඒ මහතා, බටලීය කනිෂ්ඨ විද්‍යාලයෙන් සහ පස්යාල මහා විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා විද්‍යාලයේ දීප්තිමත් ශිෂ්‍යයකු වශයෙන් කැපී පෙනුණි. පාසල් අධ්‍යාපනය හැදෑරීමෙන් පසුව සසුන්ගත වෙන තුරු ඒ මහතා නවලෝක රෝහලේ සේවය කළේය. ඔහු ජීවිතය පිළිබඳ මනා අවබෝධයක් ලැබීමෙන් පසුව පැවිදි බිමට පා තැබූයේ වයස අවුරුදු තිස් නවයේදී ය.

පැවිදි වීමට පෙර සිටම හාපිටිගම ජයසුමනාරාම මූල මහා විහාරස්ථානාධිපති, රාමඤ්ඤ මහා නිකායේ පටිපත්ති සංවර්ධන සභාවේ ලේඛකාධිකාරී මක්කනිගොඩ අස්සජි ස්වාමීන්වහන්සේගේ මෙන් ම ප්‍රදේශයේ වෙනත් විහාරස්ථානවල ඇසුර ලබමින් සියලු ආගමික, සමාජීය කටයුතුවලදී මුල් තැනක් ගෙන කටයුතු කරමින් සිය යුතුකම් ඉටු කිරීමට ඔහු ඇප කැප විය. එමෙන් ම හාපිටිගම ජයසුමනාරාම මූල මහා විහාරස්ථානයේ ෆොන්සේකා දහම් පාසලේ ආචාර්යවරයකු වශයෙන් ප්‍රදේශයේ සිසු දරු දැරියන්ට දහම් අධ්‍යාපනය ලබාදීමට කටයුතු කළේය.

සිය නිවසේ සිට දර්ශනීය පෙරහරකින් ඔහුව හාපිටිගම ජයසුමනාරාම මූල මහා විහාරස්ථානය වෙත කැඳවාගෙන විත්, පැවිදි වීමට පෙර සියලු වත්පිළිවෙත් ඉෂ්ට සිද්ධ කිරීමෙන් අනතුරුව පසුගිය 21 වැනිදා පෙ.ව. 8.30 ට එළඹුණු සුබ මොහොතින් ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක, අග්ගමහා පණ්ඩිත මකුලෑවේ ධර්ම කීර්ති ශ්‍රී සරණංකර විමල නාහිමිපාණන්ගෙන් පැවිද්ද ලබා ගනිමින්, මක්කනිගොඩ හේමකිත්ති සාමනේරයන් නමින් සසුන්ගත විය.

වත්තල විශේෂ ජෝශප් පයස්

## කොස් පැළ දස ලක්ෂයක් හෙළ දෙරණට



දස ලක්ෂයක් කොස් ගස් හෙළ දෙරණට දායාද කරන, සමාජ සවිබල ගැන්වීමට ගසක් වවා එය හොඳින් රැකබලා ගැනීමට දායක වන්නන් හඳුනාගෙන ලියාපදිංචි කොට පාසල්, ආගමික ස්ථාන හා සිවිල් සංවිධානවල අනුග්‍රහය හා මැදිහත් වීම තුළ යථාර්ථයක් බවට පත් කෙරෙන වෙනස්ම ආරක පැළ ව්‍යාපෘයක සමාරම්භක පියවර පසුගිය සෙනසුරාදා පෙරවරුවේ වත්තල දී සිදු කෙරුණි. ලංකා සමාජ සවිබල ගැන්වීම සංවිධානය මගින් මෙහෙයවනු ලබන කොස් ගස් දස ලක්ෂයක් සිටුවීමේ ව්‍යාපෘතිය සමාරම්භක පියවර නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍ය, ආචාර්ය නාලක ගොඩහේවා මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති අතර වෙළෙඳ ව්‍යාපාරික, චානක රුද්‍රිගු මහතා විසින් ප්‍රදානය කළ කොස් ගස් පැළ එක් ලක්ෂය සංකේතාත්මකව භාර ගැනීම එහිදී සිදු කෙරුණි. ලංකා සමාජ සවිබල ගැන්වීම සංවිධානයේ සභාපති, චින්තන එස් කාලිංග මහතාගෙන් කරන ලද විමසීමක දී මිනිසාට ආහාරයට ගත හැකි හොඳින් එලදරන ගසක් සිටුවීම ජන සමාජයේ පැවැත්ම තිරසාර කරන රට දිනවන වැඩපිළිවෙළක් බවත්, නුදුරේදී ඇතිවිය හැකි ආහාර හිගයන්ගෙන් මිදීමට ඇති එකම මග ආහාර වලින් ස්වයංපෝෂිත වීම බවත්,ඒ සඳහා සෑම බිම් අඟලක්ම වගා කිරීමට වගා සංග්‍රාමයක් ආරම්භ කිරීමට කාලය එළඹ ඇති බවත් පෙන්වා දෙනු ලැබීය.

ප්‍රසාද් පූර්ණමාල් පුත්තලම දිසා සමූහ

## කල්පිටිය ශාසනාරක්ෂක බලමණ්ඩලය නීත්‍යානුකූල නැතැයි උපවාසයක්



කල්පිටිය ශාසනාරක්ෂක බලමණ්ඩලය පැවැත්වීම සඳහා නීත්‍යානුකූල නොවන අයුරින් කටයුතු සිදුකරන බව පවසමින් කල්පිටිය අර්ධද්වීපයේ විහාරස්ථාන කිහිපයක ස්වාමීන්වහන්සේ සිවු නමක් පෙරේදා 30 කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිරිපිට මාරාන්තික උපවාසයක් ආරම්භ කර තිබේ. මේ සඳහා ප්‍රදේශයේ වෙනත් ආගමික නායකයන් පිරිසක් හා ප්‍රදේශයේ ජනතාවද සහාය පළ කර තිබිණි.

මේ මාරාන්තික උපවාසය සඳහා නායකත්වය ගෙන ඇත්තේ කල්පිටිය කන්දකුලිය ශ්‍රී සමුද්‍රාසන්න විහාරස්ථානාධිපති බැදිවැව දියසේන හිමියන් වන අතර උන්වහන්සේ වදාළේ කල්පිටිය අර්ධද්වීපයේ ජිවත් වන බෞද්ධයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීමට හා ආගමික සමගිය තහවුරු කර ගැනීම සඳහා තමන් ඇතුළු ස්වාමින්වහන්සේ මේ මාරාන්තික උපවාසය ආරම්භ කළ බවයි. උන්වහන්සේ මෙසේද වදාළහ.අපේ විහාරස්ථාන තුනක් පසුගිය කාලේ ලියාපදිංචි කළේ නැහැ.මේ විහාරස්ථාන ආරම්භ කරලා වසර ගණනාවක් වෙනවා.මේ නිසයි අපි කියන්නේ මේ කටයුතු නීත්‍යානුකුල නැහැ කියලා. රජයට මේ ගැන කිව්වත් වැඩක් නැහැ. මේ වන විට කල්පිටිය ශාසනාරක්ෂක බල මණ්ඩලය දෙවරක් පැවැත්වීමට උත්සහා කළත් ඒවා අසාර්ථක වුයේ පැවති විරෝධතා හේතුවෙන්.

එච්.එම්. නන්දාවතී පතිරාජ වාරියපොළ මධ්‍යම සමූහ

## විලාකටුපොත කෝප්සිටි වෙළෙඳසල ජනසතු කරයි

වාරියපොළ විවිධ සේවා සමුපකාරය සමිතිය මඟින් රු.15000000.00ක් වැය කර විලාකටුපොත ප්‍රදේශයේ ඉදි කරන ලද නව කෝප්සිටි වෙළෙඳ සල පසුගියදා පශු සම්පත් ගොවිපළ ප්‍රවර්ධන කිරි, බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය එච්.එම්. ඩී.බී. හේරත් මහතා විසින් විවෘත කරන ලදි.

අවම පහසුකම් මැද කුලී පදනම මත පවත්වා ගෙන ගිය කෝප්සිටි වෙළෙඳසල වෙනුවට හොඳ පහසුකම් ඇති කෝප්සිටියක් ඉදිකිරීමෙන් එළැඹෙන සිංහල අලුත් අවුරුදු සමයේ පාරිභෝගික ජනතාවට ඉතා පහසුවෙන් අඩු මිල ගණන් යටතේ අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබා ගැනීමට කටයුතු සලසා ඇති බව රාජ්‍ය අමාත්‍යවරයා පැවසීය. මෙම අවස්ථාවට කුරුණෑගල දිස්ත්‍රික් සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් එච්.පී.ආර්. චන්ද්‍රසේන,වාරියපොළ ප්‍රදේශීය ලේකම් ඩී.පී.සී. උදය කුමාර, වාරියපොළ ප්‍රදේශීය සභාවේ සභාපති ඩී.එම්.තිලකරත්න බණ්ඩාර මහතා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය, වාරියපොළ සමුපකාර සමිතියේ සභාපතී ආනන්ද මඩවටුව මහතා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය සහ කාර් මණ්ඩලය, විලාකටුපොත ප්‍රදේශීය සභාවේ කාරක සභිකයන්, රාජ්‍ය නිලධාරීන් සහ ප්‍රදේශවාසීන් පිරිසක් සහභාගී වූහ.



# විදේශයේ සැඟව සිටින මත් ජාවාරමුන් වන සම්පත් හා අසංක අල්ලන්න අන්තර්ජාතික පොලිසියේ සහාය

**සිරන්ජනි කුමාරි**

මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවකු හා සංවිධානාත්මක අපරධ කල්ලි සාමාජිකයන් වන උදාර් සම්පත් හා බඩෝවිට ලොකු හෙවත් රජිත අසංක යන සැකකරුවන් දෙදෙනා මේ වන විට පලාගොස් විදේශ ගතව සැගව සිටින බවත් ඔවුන් අත්අඩංගුවට ගැනීම සඳහා වරෙන්තු ලබාගෙන ජාත්‍යන්තර පොලිසිය සමඟ එක්ව කටයුතු කරන බවට දැනුම් දුන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් බුද්ධික ශ්‍රී රාගල මහතා ට කරුණු වාර්තා කෙළේය.


මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ නිලධාරීන් විසින් මත්ද්‍රව්‍ය ජාවාරම් කළැයි කියන සිද්ධිය සම්බන්ධයෙන් මේ වන තෙක් සිදු කරන ලද විමර්ශන වලදී ඊට සම්බන්ධ පොලිස් නිලධාරීන් විසි දෙනෙකු හා සිවිල් පුද්ගලයන් දහ හතර දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණය හමුවේ සඳහන් කළේය.

එම සැකකරුවන්ගෙන් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශයේ පොලිස් පරීක්ෂකවරුන් දෙදෙනෙකු , උප පොලිස් පරීක්ෂකවරුන් දෙදෙනෙකු ඇතුළු නිලධාරීන් පහළොස් දෙනෙකු මෙන්ම සිවිල් පුද්ගලයන් පස් දෙනෙකු සැකකරුවන් ලෙස නම් කර අධිකරණය හමුවේ ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරගත කර ඇති බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කරුණු දක්වා තිබිණි.

එසේම පොලිස් විශේෂ කාර්ය බළකායේ පොලිස් පරීක්ෂකවරයකු හා මත්රව්‍ය නාශක කාර්යාංශයේ උප පොලිස් පරීක්ෂකවරයකු ඇතුළු නිලධාරීන් පස් දෙනෙකු හා සිවිල් පුද්ගලයන් නව දෙනෙකු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රැඳවුම් නියෝග ලබා ගෙන අපරධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ රදවාගෙන තව දුරටත් විමර්ශන කරන බව අපරාධ පරීක්ෂණ දෙපර්තමේන්තුව වැඩි දුරටත් අධිකරණය හමුවේ කරුණු වාර්තා කර තිබිණි.

# ආගමික සහජීවනය අගයමින් පන්සල් රැසකට උදව් කළ ද්‍රවිඩ ව්‍යාපාරිකයා

***එස්.ටී. සින්නදොරේ සූරීන්ගේ 41 වැනි සමරුව වෙනුවෙනි.***



සිංහල - දෙමළ මිත්‍රත්වය ගොඩනැගීම උදෙසා අතීතයේ මහ මෙහෙයක් කළ අපේ රටේ ආගමික සහජීවනය අගය කළ එස්. ටී. සින්නදොරේ මහතා ශ්‍රී ලංකාව එක්සත් දේශයක් ලෙස පවත්වා ගන්නට නිහඬ සේවයක් කළ පුද්ගලයෙකි.

මහව ශ්‍රී මංගලාරාමය ඇතුළු මෙරට බෞද්ධ සිද්ධස්ථාන 100 කට පමණ උදව් උපකාර කළ සින්නදොරේ මහතා සිය දරු පරපුර ද බෞද්ධ සිද්ධස්ථානවල කටයුතුවලට යොමු කළේය.

20 වැනි සියවසේ අගභාගයේදී එනම් 1903 උතුරේ යාපනය අර්ධද්වීපයේ කන්කසන්තුරේදී උපත ලැබූ සින්නදොරේ යොවුන් වියේදී කොළඹට පැමිණ ව්‍යාපාරික කටයුතුවල යෙදෙන අතරේ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමි, සාගර පලන්සූරිය, පී.වී. ලැනරෝල්, මීමන ප්‍රේමතිලක, පියදාස පලන්සූරිය, ඇල්. පී. දේශබන්දු, චන්ද්‍රරත්න මානවසිංහ සහ කුමාරතුංග මුනිදාස වැනි සිංහල සාහිත්‍යධරයන් සමඟ එකට එක්ව සිංහලයකු මෙන් ශ්‍රී ලංකාවේ නිදහස් අරගලයට දායක විය.

පසුකාලීනව 1980 මාර්තු 22 වැනි දින ඔහු මියයන තෙක් අවුරුදු 60 ක් පමණ වූ කාල පරාසය තුළ මෙතුමා සිදු කළ ජාතික, ආගමික, සාමාජයීය කටයුතු අතිවිශාලය.

ශ්‍රී ලංකාවේ උතුරින් දකුණට සංක්‍රමණය වූ මොහු කොළඹ පිටකොටුවේ බෝගහ හන්දියේ ලීලා ස්ටෝස් නමින් වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කළේය. බුදු පියාණන් වහන්සේට සම්මා සම්බුද්ධත්වය ලබාගන්නට සෙවණ සලසා දුන් බෝධීන් වහන්සේගේ සිසිලස විඳිමින් තම ව්‍යාපාරය පවත්වාගෙන යෑමට ලැබීම මහත් වාසනාවක් බව මේ හින්දු බැතිමතා සැලකූහ. එකල අනාරක්ෂිතව පැවැති මේ බෝධි වෘක්ෂය ඉංග්‍රීසි ආණ්ඩුව මඟින් අවස්ථා දෙකකදීම කපා ඉවත් කිරීමට සූදානම් වූ අතර මේ හින්දු බැතිමතා සහ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ඊට විරෝධය ප්‍රකාශ කිරීම නිසා එය වළක්වා ගත හැකි විය. සෑම දිනකම උදෑසන මේ බෝධීන් වහන්සේට පුද පූජා පැවැත්වීමට පුරුදුව සිටි සින්නදොරේ බෝධිය වටා ආරක්ෂිත වැටක් ඉදිකොට ගේට්ටුවක් ද දැමීය. පසුව බුදු කුටියක් ඉදිකොට බුද්ධ ප්‍රතිමාව තැන්පත් කරන ලදී. එසේම ඔහුගේ බලවත් උත්සාහය නිසා එක්සත් බෝධිරාජ සමිතිය ආරම්භ කොට පිටකොටුවේ සෙසු ව්‍යාපාරික ප්‍රජාවගේ සහාය ද ලබාගෙන විහාර මන්දිරයක්, චෛත්‍ය රාජයාණන් වහන්සේ සහ දේවාල ආදී සියලු අංගෝපාංගයන්ගෙන් සමන්විතව බෝධිරාජ විහාරය සංවර්ධනය කරන ලදී.

උපතින් හින්දු බැතිමතෙකු වුවත් බෞද්ධ සිද්ධස්ථාන සංවර්ධනය කරන්නට විශාල පරිශ්‍රමයක් දැරූ මෙතුමා වැල්ලවත්තේ ශ්‍රී ධර්මෝදය පිරිවෙන, මහව පළමුගෙදර ශ්‍රී මංගලාරාමය, අනුරාධපුර කුරුන්දන්කුලම සද්ධර්ම විවේකාශ්‍රමය සහ ඇහැලියගොඩ සාම මහා විහාරය ආදී විහාරස්ථාන රැසක දියුණුව උදෙසා සින්නදොරේ පවුලේ ඍජු දායකත්වය ලබාදී ඇත. සිංහරාජ වන පෙදෙස් සුමංගල ජන විජය චෛත්‍ය ඇතුළු ශ්‍රී ලංකාව පුරා තවත් විහාරස්ථාන 100 කට අධික ගණනකට සංවර්ධනය උදෙසා ද මොහු අනුග්‍රහය ලබාදී ඇත.

එසේම ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල සිතුවම සහිත දින දර්ශනය වන ලීලා පංචාඞ්ග දින දර්ශනය මොහුගේ සුවිශේෂතම සේවාවකි. තවද ශ්‍රී ලංකාවේ විද්වතුන්ට, ලේඛකයන්ට සහ කවියන්ට තම නිර්මාණ සහ ග්‍රන්ථ ඉතා පහසු මුදලකට මුද්‍රණය කර එළිදැක්වීමට අනුග්‍රහය දැක්වීමෙන් ද සිංහල භාෂාව හා සාහිත්‍යයට මොහු කළ සේවාව අගය කළ යුතු ය.

ඒ මහතාගේ 41 වැනි සමරුව වෙනුවෙන් පසුගිය 21 වැනිදා මහව පළමුගෙදර මංගලාරාම විහාරස්ථානයේදී පින්කම් මාලාවක් පැවැත්විණි.

**නිහාල් පී. අබේසිංහ**

# ‘අස්පර්ශ උරුම’ ප්‍රථම රාජ්‍ය සම්මාන ප්‍රදානෝත්සවය මහ ඉහළින්



**උපාලි කරුණාරත්න**

මෙරට ‘අස්පර්ශ උරුම’ ප්‍රථම රාජ්‍ය සම්මාන ප්‍රදානෝත්සවය ඉකුත්දා (29) පස්වරුවේ කොළඹ බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ පිහිටි ලෝටස් ශාලාවේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ.

මෙහිදී ජීවිතයේ එක් වරක් පමණක් ලැබිය හැකි කාව්‍ය කලා කීර්ති ගෞරව සම්මානයෙන් කිරළගහවෙල මාටින් ජයවර්ධන, පියසේන රතුවිතාන, පාතකඩ කුලතිලක මහත්වරුන් ද රූකඩ නාට්‍ය කලා කීර්ති සම්මානයෙන් මැක්ස්වල් කෘෘස් , ගම්වාරී ප්‍රේමින්, නලීන් ගම්වාරී මහත්වරුන් පිදුම් ලැබූහ.

මෙම සම්මානයන් ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතා විසින් අදාළ කලාකරුවන් වෙත ලබා දුන් අතර අස්පර්ශණීය උරුම සංස්කෘතික අංග ගණනාවකින් කවි මඩුවකින් මේ උළෙල වර්ණවත් විය. මෙහිදී සමරු කලාපය හා ශාස්ත්‍රීය සංග්‍රහය නායක හිමිවරුන් ඇතුළු මහා සංඝරත්නයට හා විදුර වික්‍රමනායක රාජ්‍ය ඇමැතිවරයාට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පිළිගන්වනු ලැබූහ.

**මෙහිදී අදහස් දැක්වූ රාජ්‍ය ඇමැති විදුර වික්‍රමනායක මහතා -**

කලාවේ උන්නතිය වෙනුවෙන් සිය ජීවිතය කැප කළ කලාකරුවන් රැසක් අද දිනයේ සම්මානයෙන් පිදුම් ලබනවා. ඔවුන් කලාව පෝෂණය කරන්න කටයුතු කළා.අද දිනයේ රූකඩ සංදර්ශන අප දුටුවා. හැබැයි රට හදන ස්ථානයේද අප රූකඩ දකිනවා.

කලාවේ තිබෙන සුන්දරත්වය, ගැඹුරු බව අප දකිනවා. අපගේ අස්පර්ශනීය උරුමය, කලාව අපෙන් ඈත් කරන්න බැහැ.ඇතැම් පුද්ගලයන් මේවා මරා දමන්න උත්සාහ කරනවා. හැබැයි මේවා අපෙන් ඈත් කරන්න කාටවත් බැහැ. අපට කලා කටයුතු ශක්තිමත් කරන්න රජයෙන් විශාල ශක්තියක් ලබා දී තිබෙනවා. අස්පර්ශනීය උරුමය අපට ඉතා වැදගත් කොටසක් ලෙස හැඳින්විය හැකියි.

මෙරට පවතින උරුමයන් රැක ගන්න තිබෙන අභියෝග බිඳගෙන ඉදිරියට යා යුතුයි. කලා කටයුතු සඳහා වඩ වඩාත් රාජ්‍ය අනුග්‍රහය ලබාදිය යුතුයි කියන මතයේ අප සිටින්න ඕනෙ. ජෝන් ද සිල්වා සමරු රඟහලේ, නෙළුම් පොකුණේ අස්පර්ශනීය උරුමයන්ට තැනක් ලබා දෙන්න ඕනෙ. කවියට, රූකඩයට නෙළුම් පොකුණ රඟහල ඇකැප නොවිය යුතුයි. ඔවුන්ගේ කටයුතු සඳහා රඟහලවල්වල අවස්ථාව ලබාදෙන්න ඕනෙ.

රට වහගෙන කටයුතු කරන්න බැහැ. කලාවේ උන්නතිය වෙනුවෙන් අප අලුත් වැඩ පිළිවෙළකට යනවා. අස්පර්ශනීය උරුමය පිළිබඳව අප තව තවත් සෙවිය යුතුයි. අපගේ උරුමය පිළිබඳව තව තවත් පර්යේෂණ කරන්න ඕනෙ. අපේ රටේ ජනතාව මනුෂ්‍යත්වය අතින් ඉහළයි. අපට අභිමානයක් තිබෙනවා.

**සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ තරණි අනෝජා ගමගේ මහත්මිය -**

අපේ රටේ පාරම්පරික ඥානය, කලාව පරපුරෙන් පරපුරට රැගෙන ආවා. මෙරට කලාව රැකගැනීම සඳහා කටයුතු කරන අපව දිරිමත් කරන අගමැති මහින්ද රාජපක්ෂ මහතා මේ අවස්ථාවේදී අප ඉතා ගෞරවයෙන් අප සිහිපත් කරනවා. විදුර වික්‍රමනායක රාජ්‍ය ඇමැතිවරයා කලා කටයුතු පෙරට ගෙන යාම සඳහා විශාල අනුග්‍රහයක් ලබා දෙනවා.


**රාජ්‍ය අස්පර්ශනීය උරුම සංරක්ෂණ උපදේශක සභාවේ සභාපති මහාචාර්ය කමල් වලේබොඩ මහතා-**

ඉතා කෙටිකාලයකින් මේ සම්මාන ප්‍රදානෝත්සවය සංවිධානය කිරීමට අපට සිදුවුණා. අගමැතිතුමා අපට බලපෑමකින් තොරව කටයුතු කරගෙන යාමට අවස්ථාව සලසා දී තිබෙනවා. අස්පර්ශනීය උරුමය පිළිබඳව ග්‍රන්ථ මුද්‍රණය පිළිබඳව අවබෝධතා ගිවිසුමකටද අප අත්සන් කළා. මෙරට අස්පර්ශනීය උරුමය පිළිබඳ දිනයක් පිළිබඳව යෝජනා කරනවා. කවිය මිය ගිහින් නැහැ. මාධ්‍ය නොසලකා හැරියත් කවිය මරා දමන්න කාටවත් බැහැ.

**ඡායාරූප රංජිත් අසංක**

## එස්ටීඑෆ් ගාමිණී රණවිරුවාගේ 25 වැනි ගුණානුස්මරණය 5දා

**සුභාෂිණී සේනානායක**



විශේෂ කාර්ය බළකායේ ගාමිණී සමරසිංහ රණවිරුවාගේ 25 වැනි ගුණානුස්මරණය අප්‍රේල් මස 05 වැනිදාට යෙදී තිබේ.

1971.03.06 වැනිදා උපන් ගාමිණී සමරසිංහ විරුවා ර/ කැල්ල මහා විද්‍යාලයෙන්ද ද්විතියික අධ්‍යාපනය ර/ කොලොන්න මහා විද්‍යාලයෙන්ද ලබා ඇති අතර පාසල් අධ්‍යාපනයෙන් පසුව දේශය වෙලා ගත් යුද සාපයෙන් මව්බිම මුදා ගැනීමට ආධුනික පොලිස් කොස්තාපල් වරයෙක් වශයෙන් 1994.01.30 පොලිස් සේවයට එක් වී තිබේ.1996.06.06 දින පොලිස් විශේෂ කාර්ය බළකායට එක්ව ඇති ඔහු එහි 25 වැනි මූලික පුහුණු පාඨමාලාව හදාරා ඇත.

පොලිස් විශේෂ කාර්ය බළකායේ 39 වැනි කොළණිය කඳවුරට අනුයුක්තව සේවය කරමින් සිටින අතරතුර 1996.04.05 වැනිදා තවත් සහෝදර නිලධාරින් 19 දෙනකුද සමගින් අම්පාර මහනුවර මාර්ගයේ මාර්ග සෝදිසි රාජකාරි සිදු කරමින් සිටියදි ත්‍රස්ත ප්‍රහාරයකින් අවසන් සුසුම් හෙලා ඇත.

ඔහුට පින්පතා උප පොලිස් පරීක්ෂක ගාමිණී පිටගම්පල, පොලිස් සැරයන් සුගත් හේමචන්ද්‍ර ඇතුළු පිරිසක් පින්කම් රැසක් සංවිධාන කර තිබේ.

# රටේ ප්‍රධාන ප්‍රශ්න දෙකට තිබෙන එකම විකල්පය සමූපකාර ව්‍යාපාරයයි

## සමූපකාර මණ්ඩලයේ උප සභාපති සුසිල් වීරසේකර



**තමරසිරි විජේසේකර**
**දෙයියන්දර සමූහ**

අද අපේ රටේ තිබෙන්නේ ප්‍රධාන ප්‍රශ්න දෙකයි. එකක් විරැකියා ප්‍රශ්නය. ඒ හැරුණු විට දිනෙන් දින අහස උසට ඉහළ යන භාණ්ඩ මිල පාලනය කිරීමට විශේෂ ක්‍රමවේදයක් නොමැති වීමත් අද ප්‍රශ්නයක් වී තිබෙනවා. මේ ප්‍රධාන ප්‍රශ්න දෙකටම තිබෙන එකම විකල්පය වන්නේ සමූපකාර ව්‍යාපාරය බව, ජාතික සමූපකාර මණ්ඩලයේ උප සභාපති සුසිල් වීරසේකර මහතා පැවසීය.

මාතර,ඌරුබොක්ක ප්‍රදේශයේ පැවති සමුපකාර උත්සව අවස්ථාවකට එක්වීමෙන් අනතුරුව සමුපකාර සේවක මණ්ඩලය අමතමින් ඒ මහතා මේ බව ප්‍රකාශ කළේය.

එහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ හෙතෙම මෙසේ ද පැවසීය.

අද වන විට පාරිභෝගික භාණ්ඩවල මිල ඉතා ශීඝ්‍රයෙන් ඉහළ යමින් තිබෙනවා. විශේෂයෙන් සහල් මිල මේ දිනවල දවසින් දවස ඉහළ යන බවක් තමයි පෙනෙන්නට තිබෙන්නේ. රජයක් විදිහට සහල් මිල පහත හෙළන්න අවශ්‍ය පියවර මේ වන විටත් ක්‍රියාත්මක කර තිබෙනවා. සහල් ඇතුළු සෙසු පාරිභෝගික භාණ්ඩ ජනතාවට සහන මිලට ලබා දෙන්න හැකියාව තිබෙන්නේ සමුපකාරයට පමණයි. ඒ නිසා සමුපකාරය ශක්තිමත් කළ යුතුයි.සමුපකාර ව්‍යාපාරය විවිධ බාධක හමුවේ විවිධ අය, විවිධ ශක්තීන් එකතු කර තිබෙන නිසා අද හොඳ ගමනක් ඇවිල්ලා තිබෙනවා. අද ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට සහන මිලට භාණ්ඩ අලෙවි කරන්නේ සමුපකාරය විතරයි.දිවයිනේ බොහෝ සමුපකාර සමිති ජනතාව වෙනුවෙන් සේවා අංශ රැසක් ක්‍රියාත්මක කර තිබෙනවා.රජයක් විදිහට සමුපකාරය දියුණු කරන්න තව තවත් ශක්තීන් ලබා දෙන්න කියා අප රජයෙන් ඉල්ලනවා.එහෙම වුනොත් ජනතාවට මීට වඩා ගුණාත්මක සේවාවක් ලබා දෙන්න හැකියාව තිබෙන බවත් ඒ මහතා වැඩි දුරටත් කීය.

# ‘කැකුළු තුරු උදාන’ වැඩසටහන බේරුවලදී

2021 වර්ෂය වෙනුවෙන් පෙර පාසල් ආරම්භ කිරීමට සමගාමීව කැකුළු තුරු උදාන රුක් රෝපණ වැඩසටහන කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් බේරුවල, පාදාගොඩදී ඉකුත්දා (29) ආරම්භ විය.

බේරුවල, මාලේවන්බද්ද, පාදාගොඩ පෙර පාසලේ අභිනවයෙන් ඉදිකෙරුණු පන්ති කාමරය විවෘත කිරීම සහ නව වසරට දරුවන් ලියාපදිංචි කිරීම ද එහිදී සිදුවිය. එසේම, සෞඛ්‍යාරක්ෂිතව පෙර පාසල් පවත්වා ගෙන යාමට අවශ්‍ය අත් සෝදන ජල බඳුන් ප්‍රදානය කිරීම ද සිදුවිය.

මෙවර දිවයින පුරා පෙර පාසල් සඳහා ඇතුළත් වන සියලුම දූදරුවන් වෙනුවෙන් තුන් ලක්ෂ තිස්පන් දහසකට ආසන්න පැළ ප්‍රමාණයක් කැකුළු තුරු උදාන ව්‍යාපෘතිය හරහා බෙදාදෙනු ලැබේ. කෘෂිකර්ම රාජ්‍ය ඇමැති ශෂීන්ද්‍ර රාජපක්ෂ මහතාගේ සංකල්පයක් මත මේ වැඩසටහන ක්‍රියාත්මක වේ.



බේරුවල ප්‍රදේශීය සභාව ක්‍රියාත්මක කරන පෙර පාසල්වල දූදරුවන් වෙනුවෙන් පැළ බෙදාදීම හා පැළයක් සිටුවීම රාජ්‍ය ඇමැති පියල් නිශාන්ත ද සිල්වා මහතා සහ කැකුළු තුරු උදාන ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ හා කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම් රජීව පෙරේරා, ව්‍යාපෘති උපදේශක ජනක හේරත් මහත්වරුන් අතින් සිදුවූහ.

බේරුවල ප්‍රදේශීය සභාවේ සභාපති මේනක විමලරත්න මහතා ද, ප්‍රදේශීය සභා මන්ත්‍රීවරු හා රාජ්‍ය නිලධාරීහු පිරිසක් ද මේ අවස්ථාවට එක්ව සිටියහ.

# නිවාස ඉල්ලා පුදුකුඩීඉරිප්පු ජනතාව වීදි බසිති



**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

මුලතිව් පුදුකුඩීඉරිප්පු ප්‍රදේශයේ වැසියන් විශාල පිරිසක් 2019 වසරේදී තමන්ට ලබා දෙන බවට පොරොන්දු වූ නිවාස ඉල්ලමින් 29 දා පුදුකුඩීඉරිප්පු නගරයේ පෙළපාලි ගොස් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වටලනු ලැබූහ.

එවකට නිවාස ඇමැතිවරයාව සිටි සජිත් ප්‍රේමදාස මන්ත්‍රීවරයා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හරහා නිවාස ඉදිකර ගැනීම සඳහා එක් අයකුට රුපියල් ලක්ෂය බැගින් ණය මුදල් ලබා දී ඇතත් ඔවුන්ට ඒ මුදල් වලින් නිවසක් ඉදිකර ගැනීමට නොහැකි වූ බව උද්ඝෝෂණයට සහභාගී වූවෝ කියා සිටියහ.

ඔවුන්ට නිවාස ඉදිකර ගැනීම සඳහා ඉතිරි මුදල් නිවාස සංවර්ධන අධිකාරියෙන් ලබා නොදී මුලින් ලබා දෙන ලද රුපියල් ලක්ෂයට පොළියද සමඟ මුදල් ගෙවන ලෙස ඉල්ලීම් කරමින් නිලධාරීන් නිවාසවලට පැමිණෙන නිසා තමන්ට යම් සාධාරණයක් ඉටු කරන ලෙස ද ඔවුන් කෑකෝ ගසමින් ඉල්ලා සිටියහ.

මේ වන විට මුලතිව් ප්‍රදේශයේ පවුල් 6000 ක් පමණ මේ ණය උගුලට හසුව සිටියත් ඔවුන්ට නිවසක් නොලැබී නිකරුණේ ණයකරුවන් පිරිසක් බවට පත්ව සිටින බවද ඔවුන් පුදුකුඩීඉරිප්පු ප්‍රාදේශීය ලේකම්වරයට කියා සිටියහ.

ප්‍රාදේශීය ලේකම්වරයා උද්ඝෝෂණකරුවන් විසින් රැගෙන එන ලද ලිපිය වත්මන් නිවාස ඇමැතිවරයා වෙත යොමු කොට යම් සහනයක් ලබා දීමට උත්සහ කරන බවට පොරොන්දු වීමෙන් පසුව උද්ඝෝෂණකරුවෝ විසිර ගියහ.

# නිරෝධායන නීති කැඩූ කොම්පඤ්ඤවීදියේ 12කට 2000 බැගින් දඩ

**සුභාෂිණී සේනානායක**

නිරෝධායන නීති උල්ලංඝණය කළ මුස්ලිම් ජාතිකයන් 11 ක් සහ සිංහල ජාතික පුද්ගලයෙක්ට රුපියල් 2000 බැගින් දඩ මුදල් ගෙවන ලෙස කොටුව මහේස්ත්‍රාත් ප්‍රියන්ත ලියනගේ මහතා පෙරේදා 29 නියෝග කළේය.

වරද පිළිගැනීම මත සැකකරුවන් 12 දෙනාට රුපියල් 24000ක දඩ මුදලක් මේ අනුව නියම කෙරිණි.

කොවිඩ් 19 වෛරසය ව්‍යාප්ත වන අයුරින් කටයුතු කිරීම හේතුවෙන් කොම්පඤ්ඤවීදිය පොලිසිය විසින් සැකකරුවන් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර තිබිණි.

# විස පොල්තෙල් මන්නාරමේ ඇතැයි සැකයට වෙළෙඳසල් කීපයකින් සාම්පල ගනී

**උතුරු පළාත් විශේෂ රසුල දිල්හාර ගමගේ**

විස සහිත පොල්තෙල් තොග මන්නාරමේ ඇති බවට ලද තොරතුරක් මත පාරිභෝගික ආරක්ෂණ අධිකාරියේ නිලධාරීන් මන්නාරමේ තෝරාගත් වෙළඳසල් කීපයක පොල්තෙල් සාම්පල ලබා ගැනීම 29 දා ආරම්භ කොට තිබේ.

එම නිලධාරීන් මන්නාරමේ තොග වශයෙන් හා සිල්ලරට පොල්තෙල් අලෙවි කරන ස්ථාන කීපයකින්ම පොල්තෙල් සාම්පල එකතු කරගෙන ඇති අතර ඒවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඊළඟ පියවර ගැනීමට කටයුතු යොදා තිබේ.

මන්නාරමට පොල්තෙල් තොග ලැබෙන්නේ කොළඹින් හා දඹුල්ලෙන් බවත් එම පොල්තෙල්වල කුමක් අඩංගු දැයි තමන් නොදන්නා බවත් මන්නාරමේ වෙළෙන්දන් නිලධාරීන්ට ප්‍රකාශ කොට තිබේ.

ඒ අනුව නිලධාරීන් මන්නාරමේ වෙළෙන්දන්ට පොල්තෙල් සපයනු ලබන තොග වෙළෙන්දන්ගේ විස්තරද ලබා ගෙන ඇත.

sports.dinamina@lakehouse.lk





# බේරුවලට රුපියල් ලක්ෂ 150ක ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයක්

**අනුරාධ ප්‍රියදර්ශන කරන්දෙණිය සමූහ**

බේරුවල, එගොඩවත්ත ප්‍රදේශයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් වෙනුවෙන් රුපියල් ලක්ෂ 150ක වියදමින් ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයක් ඉදි කෙරේ. 'පෝට් කෝට්' නමින් හඳුන්වනු ලබන මේ ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය පාර්ලිමේන්තු මන්ත්‍රී මර්ජාන් ෆලීල් මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා විවෘත කෙරිණි.

බේරුවල පදිංචි මැණික් ව්‍යාපාරික සුහයිල් සුබෙයිර් හා මර්සූක් අශ්රෆ් මහත්වරුන්ගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් මේ ක්‍රීඩාගාරය ඉදි කර තිබේ.

බේරුවල හා ඒ අවට නගර සඳහා ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයක අඩුපාඩුව කාලයක් තිස්සේ පැවැති අතර, ප්‍රදේශයේ සිංහල, මුස්ලිම් බැඩ්මින්ටන් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ඉල්ලීමක් සපුරාලමින් සුහයිල් සුබෙයිර් හා මර්සූක් අශ්රෆ් මහත්වරුන් මේ ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයට අනුග්‍රාහකත්වය දුන් බවත් එහි කළමනාකරු රියාද් මසූර් මහතා පැවසීය.

අන්තර්ජාතික ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයකට නොදෙවැනි අයුරින් ඉදි කර ඇති මෙය බේරුවල හා ඒ අවට සිංහල, මුස්ලිම් ඇතුළු අනෙකුත් සෑම ජන වර්ගයකම පාසල් බැඩ්මින්ටන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ලබාදීමට කටයුතු කරන බව ද මසූර් මහතා වැඩි දුරටත් කීවේය. මේ ගෘහස්ථ ක්‍රීඩාගාර පරිශ්‍රයේ බිලියඩ් ක්‍රීඩාව සඳහා ද වෙනම අංශයක් සකස් කර තිබේ.

'පෝට් කෝට්' ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරය පාර්ලිමේන්තු මන්ත්‍රී මර්ජාන් ෆලීල්, මැණික් ව්‍යාපාරික සුහයිල් සුබෙයිර්, මර්සූක් අශ්රෆ් මහත්වරුන් විසින් විවෘත කරනු ලැබීය.



ඡායාරූප - කරන්දෙණිය සමූහ



## රිච්මන්ඩ් විදුහලට කඩුලු 3ක ජයක්

**ලංකින්ද නානායක්කාර - ඉමදුව සමූහ**

අවුරුදු 19 පහළ පළමු කොටසේ එක්දින ක්‍රිකට් තරගාවලිය යටතේ පැවැති තරගයෙන් කොළඹ නාලන්දා විද්‍යාලය පරාජය කරමින් කඩුලු 3ක ජයක් වාර්තා කිරීමට ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය සමත් විය. ගාල්ල අන්තර්ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගණයේ පසුගියදා පැවැති මේ තරගයේ කාසිය වාසිය දිනා පළමුව පන්දුවට පහර දුන් නාලන්දා විදුහල් පිල ලකුණු 181ක් රැස් කළ අතර, නියමිත ඉලක්කය ඕවර 43.4කදී කඩුලු 7ක් දැවී සපුරා ගැනීමට රිච්මන්ඩ් විදුහල් පිලට හැකි විය.

නාලන්දා විදුහල් පිල - 181 (ඕවර 48.3) විනුජ රන්පුල් 63, ලිසුර සිගේරා 23 (නාලක ජයවර්ධන 28/3 , කල්ප නෙත්සර 18/2)

රිච්මන්ඩ් විදුහල් පිල- 185/7 (ඕවර 43.4) අම්ෂි ද සිල්වා නොදැවී 65, හංසමාන ද සිල්වා 42, කවිදු නිර්මාණ 21 (ලිසරු සිගේරා 19/3)

## වොලිබෝල් - නෙට්බෝල් පුහුණු කඳවුරක් කළුගහකඳුරේදී







**මීගහකිවුල සමූහ - එන්. නවරත්න**

ඌව පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව මඟින් සංවිධාන කළ වොලිබෝල් සහ නෙට්බෝල් පුහුණු කඳවුරක් පසුගියදා කළුගහකඳුර විද්‍යාලයීය ක්‍රීඩාංගණයේදී පැවැත්විණි.

මේ පුහුණු කඳවුර සඳහා වියලුව ආසනය තුළ පිහිටි අතිශය දුෂ්කර පාසල් දෙකක් වන කළුගහකඳුර සහ වෙන්දේසිය විද්‍යාලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 50 දෙනෙක් සහභාගි වූහ.

පහසුකම් සහිත ක්‍රීඩාංගණයක්, ක්‍රීඩා උපකරණ හෝ නිසි පුහුණුවක් නැති වුවද ජාතික මට්ටමේ දක්ෂතා පෙන්වන මේ විද්‍යාල දෙකෙහි ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට නිසි ක්‍රීඩා පුහුණුවක් දෙන ලෙස මීගහකිවුල ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී නිශාදි ශීරන්තිකා විජේසුන්දර මහත්මිය කළ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් රාජ්‍ය අමාත්‍ය තේනුක විදානගමගේ මහතාගේ උපදෙස් මත මේ පුහුණු කඳවුර සංවිධාන කෙරිණි.

මේ අවස්ථාව සඳහා ඌව පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ ආර්. එම්. ලක්සිරි බණ්ඩාර රත්නායක, දැල්පන්දු පුහුණුකාරිණි නයනා කරුණාරත්න මහත්ම මහත්මීන් ඇතුළු ඌව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ පුහුණුකරුවෝ රැසක් එක්ව සිටියහ.

පුහුණු කඳවුරේදී වොලිබෝල් සහ නෙට්බෝල් පුහුණු සැසි කිහිපයක් පැවැති අතර ශරීර සුවතා වැඩසටහනක්ද සංවිධාන කර තිබිණි.

කඳවුර අවසානයේ විද්‍යාල දෙකේ දරුවන් සඳහා අවශ්‍ය ක්‍රීඩා උපකරණ පරිත්‍යාග කිරීමට ද ඌව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය පියවර ගෙන තිබිණි.

ඡායාරූප - මීගහකිවුල සමූහ, දමන සමූහ

## දෙණියාය මැදි විදුහලට ක්‍රිකට් භාණ්ඩ

**ජයසිරි පේදුරුආරච්චි - ගන්දර සමූහ**

දෙණියාය මධ්‍ය විද්‍යාලයේ බෝධි ප්‍රාකාරයේ රන් වැට විවෘත කිරීම, කාපට් අතුරා සංවර්ධනය කරන ලද නව පිවිසුම් මාර්ගය විවෘත කිරීම හා ක්‍රීඩා පිටියේ සංවර්ධන කටයුතු ආරම්භ කිරීම ක්‍රීඩා ඇමැති නාමල් රාජපක්ෂ මහතාගේ සහ මාතර දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ සම සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී නිපුණ රණවක මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගියදා සිදු කෙරිණි.

ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු කරන ලද මුදල රුපියල් ලක්ෂ තිස් දෙකකි.

මෙයට සමගාමීව 'Foundation of Goodness' පදනම මගින් නිල්වලා නෙළුම ප්‍රජා සංවර්ධන පදනම වෙත දුන් රුපියල් ලක්ෂ දෙකකට ආසන්න වටිනාකමකින් යුත් ක්‍රිකට් උපකරණ දෙනියාය මධ්‍ය විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායම වෙත බෙදා දීම ද මෙහිදී සිදු කෙරිණි.

මේ අවස්ථාවට ප්‍රදේශයේ මහා සංඝ රත්නය, මාතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී වීරසුමන වීරසිංහ මහතා, ප්‍රදේශයේ ජනතා නියෝජිතයෝ, විදුහල්පති ප්‍රමුඛ ගුරු භවතුන් හා සිසු දරු දැරියෝ එක්ව සිටියහ.

ඡායාරූපය - ගන්දර සමූහ



ක්‍රීඩා හා තරුණ කටයුතු ඇමැති නාමල් රාජපක්ෂ මහතා අතින් ක්‍රීඩකයන්ට ක්‍රිකට් භාණ්ඩ පිරිනැමූ අයුරු.

## නුවරඑළිය ක්‍රීඩා සමාජවලට උපකරණ



ඇමැති සී.බී. රත්නායක මහතා ක්‍රීඩා උපකරණ බෙදා දෙන අයුරු

**නුවරඑළිය සමූහ - සී. මහගම**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ක්‍රීඩා සංගම් හා පාසල් ක්‍රීඩා කණ්ඩායම් සඳහා ක්‍රිකට් ක්‍රීඩා භාණ්ඩ බෙදා දීමේ වැඩසටහනක් පසුගියදා සිදු කෙරිණි.

වනජීවී හා වන සංරක්ෂණ ඇමැති, නුවරඑළිය දිස්ත්‍රික් ක්‍රිකට් සංගමයේ සභාපති සී.බී. රත්නායක මහතාගේ ප්‍රධානත්වයෙන් මේ වැඩසටහන නුවරඑළිය සිනිසිටා ක්‍රීඩාංගණයේදී පැවැත්විණි. නුවරඑළිය දිස්ත්‍රික්කයේ තෝරා ගත් ක්‍රීඩා සංගම් කීපයකට හා පාසල් ක්‍රීඩා කණ්ඩායම් කීපයකයට ක්‍රිකට් ක්‍රීඩාව සඳහා අවශ්‍ය කරන ක්‍රීඩා භාණ්ඩ තොගයක් මෙසේ බෙදා දෙන ලදි.

නුවරඑළිය මහ නගර සභාවේ පුරපති චන්දන ලාල් කරුණාරත්න මහතා හා ක්‍රීඩා සංගම් හා පාසල් ක්‍රීඩා කණ්ඩායම්වල නිලධාරීහු හා ක්‍රීඩකයෝ පිරිසක් මේ අවස්ථාවට එක්ව සිටියහ.

ඡායාරූපය - නුවරඑළිය සමූහ

## දිගාමඬුලු ක්‍රිකට් 9 දා සිට

**දමන සමූහ - කේ.ඒ. මෛත්‍රීපාල**

අම්පාර දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය සංවිධාන කරන දිගාමඬුලු ප්‍රිමියර් ලීග් විස්සයි20 ක්‍රිකට් තරගාවලිය මේ මස 9 වැනිදා සිට 25 වැනිදා දක්වා පැවැත්වේ.

තරගාවලියේ තරග කාලසටහන සැකසීම පසුගියදා අම්පාර දිස්ත්‍රික් ක්‍රිකට් සංගම් කාර්යාලයේදී සංගමයේ සභාපති ඉන්දික නලින් ජයවික්‍රම මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි. එම අවස්ථාවට ක්‍රිකට් කණ්ඩායම් 19ක නියෝජිතයෝ සහභාගි වූහ. මේ අවස්ථාවට සංගමයේ ලේකම් සිදත් ලියනආරච්චි සහ භාණ්ඩාගාරික ප්‍රේමලාල්, තරගාවලි කමිටු සභාපති නලීම් මහත්වරුන් ඇතුළු සංගමයේ නිලධාරීහු පිරිසක් එක්ව සිටියහ.

## පැලියගොඩ තොග මිල

**පැලියගොඩ එළවළු මිල**

| | (කිලෝවක තොග මිල) |
|---|---|
| ගෝවා | 80 |
| බෝංචි | 150 |
| තක්කාලි | 80 |
| ලීක්ස් | 70 |
| කැරට් | 120 |
| වම්බටු | 140 |
| පිපිඤ්ඤා | 20 |
| අමුමිරිස් | 150 |
| මාළුමිරිස් | 200 |
| බණ්ඩක්කා | 70 |
| තළනබටු | 60 |
| දෙහි | 60 |
| වට්ටක්කා | 50 |
| පතෝල | 80 |
| බීට් | 60 |
| දේශය අර්තාපල් | 110 |
| ලූනු | 50-60 |

**පැලියගොඩ පලතුරු මිල**

| | (කිලෝවක තොග මිල) |
|---|---|
| අඹ අල්පොන්සෝ | 410-420 |
| කෝලිකුට්ටු | 180-190 |
| ඇඹුල් කෙසෙල් | 50-60 |
| සීනි කෙසෙල් | 60-70 |
| දොඩං | 140-150-160 |
| කොමඩු | 60-70 |
| අන්නාසි | 100-110 |
| කිලෝපේර | 130-140 |
| ගස්ලබු | 140 |

**පැලියගොඩ මත්ස්‍ය වෙළෙඳපොළ දෛනික මසුන් මිල**

| | කිලෝ ග්‍රෑම් එකක මිල |
|---|---|
| තෝරා බිළී | 1000 |
| කහපරව් | 570 |
| කබර පරව් | 550 |
| ඇටනඟුල් පරව් | 600 |
| ඇන්ජිලා නයිලෝන් | 900 |
| බලයා ලොකු | 280-360 |
| කෙළවල්ලා ලොකු | 420 |
| කෙන්දා බොකු සහිත | 530 |
| තලපත් ලොකු | 650-680 |
| කොප්පරා | 50-780 |
| මෝරු ශුද්ධ | 630 |
| ගල්මාළු ලොකු | 550 |
| ඇටිස්සා ලොකු | 600 |
| ඇටිස්සා කුඩා | 650 |
| හබරලි රවුම් | 530-550 |
| පිලා ලොකු | 350 |
| පිලා මධ්‍යම | 530 |
| ඇටවල්ලා ලොකු | 450 |
| හුරුල්ලා | 480 |
| සාලයා මට්ට | 180 |
| සප්පරා | 500 |
| දැල්ලා බිළී | 650 |
| දැල්ලා කුඩා | 680 |
| ඉස්සා ලොකු | 1150 |
| ඉස්සා කුඩා | 400 |
| සවරා | 750 |
| මොරුල්ලා | 350 |
| ලින්නා ලොකු | 380-390 |
| ලින්නා කුඩා | 330 |
| සුද්දා | 500 |
| මුහුදු කකුළුවා | 650 |
| ගීනට්පරව් | 500 |
| කටුවල්ලා | 200 |
| අගයා | 420 |
| සූඩයා | 140-150 |
| තිලාපියා | 400 |

## පිළියන්දල මැදි විදුහල් පිලට ලකුණු 92ක ජයක්

**ඩිල්වින් මෙන්ඩිස් - මොරටුව ක්‍රීඩා**

ශ්‍රී ලංකා ක්‍රිකට් පාසල් සංගමය මෙහෙයවන අවුරුදු 19 න් පහල අන්තර් පාසල් ක්‍රිකට් තරගාවලිය යටතේ පිළියන්දල මැදි විදුහල් පිල සහ මීගමුව සාන්ත පීතර විදුහල් පිල අතර පැවැති තරගයෙන් ලකුණු 92ක ජයක් අත් කර ගැනීමට පිළියන්දල මැදි විදුහල් පිල සමත් විය.

පසුගියදා ගොඩිගමුවේ පැවති මේ තරගයේ පළමුව පන්දුවට මුහුණ දුන් පිළියන්දල මැදි විදුහල් පිල ඕවර 50 අවසානයේ කඩුලු 9ක් දැවී ලකුණු 199ක් රැස් කළ අතර, මීගමුව සාන්ත පීතර විදුහල් පිල ඕවර 28කදී ලකුණු 107කට දැවී ගියේය.

පිළියන්දල මැදි විදුහල් පිල - 199/9 (ඕවර 50) නෙත්මා රොඩ්රිගෝ 75, සිතුම් නිමල්ක 53 (නවීන් අතිශ්ට 30/3, දිනෙත් තත්සර 34/3)

සාන්ත පීතර විදුහල් පිල - 107 (ඕවර 28) දිනෙත් තත්සර 27, රන්දික ප්‍රනාන්දු 26, චමත් මල්ශාන් 21 (ජයංග මදුශාන් 36/3, හේසර දිල්කිත් 16/2)





33 වැනි ජාතික යෞවන ක්‍රීඩා උලෙළෙට සමගාමීව වැව්ගම්පත්තුව උතුර උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වොලිබෝල් තරග පසුගියදා උහන තිස්සපුර පාසල් වොලිබෝල් පිටියේදී පැවැත්විණි. එහිදී කාන්තා ශූරතාව උහන තිස්සපුර ක්‍රීඩා සමාජය හිමි කර ගත් අතර, පිරිමි ශූරතාව උදයපුර උදය ක්‍රීඩා සමාජය අත් කර ගත්තේය.

ඡායාරූප - දමන සමූහ කේ.ඒ.මෛත්‍රීපාල

## දවසේ රාහු කාලය

දහවල් 12.15 සිට 01.47 දක්වා අලුයම 12.15 සිට 01.44 දක්වා



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී **අජිත් ධර්මසිරි**

## දින තත්ත්වය

මීන රවි 18 භාග මැදින් අව ජලවක තිථිය ලත් ගුරු දින ඉර උදාව 06.09 ට ඉර බැසීම 06.20ට විසා නැකත උදේ 07.24න් ගෙවී අනුර නැකත ලබයි. මැදින් අව ජලවක තිථිය දහවල් 11.04න් ගෙවී විසේනිය තිථිය ලබයි. වජ්‍ර යෝගය උදේ 06.15න් ගෙවී සිද්ධි යෝගය ලබා පවතී. බවකරණය අලුයම 12.34න් නිමා වී බාලවකරණය ලබා එය දහවල් 11.04න් ගෙවී කොලවකරණය ලබා එය රාත්‍රී 09.39 න් ගෙවී තෛතිලකරණය උදා වේ.

## දවසේ හෝරාව ලබා ගෙවී යන අයුරු

**උදේ**

06.09 - 07.09 දක්වා - ගුරු හෝරාව
07.09 - 08.09 දක්වා - කුජ හෝරාව
08.09 - 09.09 දක්වා - රවි හෝරාව
09.09 - 10.09 දක්වා - සිකුරු හෝරාව
10.09 - 11.09 දක්වා - බුධ හෝරාව
11.09 - 12. 09 දක්වා - සඳු හෝරාව

**සවස**

12.09 - 01.09 දක්වා - සෙනසුරු හෝරාව
01.09 - 02.09 දක්වා - ගුරු හෝරාව
02.09 - 03.09 දක්වා - කුජ හෝරාව
03.09 - 04.09 දක්වා - රවි හෝරාව
04.09 - 05.09 දක්වා - සිකුරු හෝරාව
05.09 - 06.09 දක්වා - බුධ හෝරාව

**රාත්‍රී**

06.09 - 07.09 දක්වා - සඳු හෝරාව
07.09 - 08.09 දක්වා - සෙනසුරු හෝරාව
08.09 - 09.09 දක්වා - ගුරු හෝරාව
09.09 - 10.09 දක්වා - කුජ හෝරාව
10.09 - 11.09 දක්වා - රවි හෝරාව
11.09 - 12. 09 දක්වා - සිකුරු හෝරාව

**අලුයම**

12.09 - 01.09 දක්වා - බුධ හෝරාව
01.09 - 02.09 දක්වා - සඳු හෝරාව
02.09 - 03.09 දක්වා - සෙනසුරු හෝරාව
03.09 - 04.09 දක්වා - ගුරු හෝරාව
04.09 - 05.09 දක්වා - කුජ හෝරාව
05.09 - 06.09 දක්වා - රවි හෝරාව

**බබාට නමක්**

උදේ 09.48 දක්වා යෙදී පවතින්නේ සා නැකත නිසා නම් තැබීමට සුබ අකුරු වන්නේ රු - රෙ - රො - න අක්ෂර වෙයි. ඉන්පසු විසා නැකත උදාවන නිසා ත්‍රි - තු - තෙ - තො අකුරු ද දිනට අනුව ට - ඩ - ණි අකුරු ද මුල්කොට බබාට නමක් යෙදීම සුබයි.



## දවසේ ලග්න පලාපල

### මේෂ ලග්නය - මඟතොටදී හදිසි අනතුරු

මේෂ ලග්නයට අනුව අද ඔබට ප්‍රවේසම් විය යුත්තේ විවාහ ස්ථානගත ගැටලු මතු කරන නිසාය. බොහෝ විට ආර්ථික වශයෙන් සුබවාදී වුව ද වියදම් තත්ත්වය ඉහළ යන නිසා සකසුරුවම් බව වැදගත් වෙයි. මඟතොට ගමන්වලදී හදිසි අනතුරු අපල ඒරාෂ්ඨක බලපාන නිසා ප්‍රවේසම වැදගත්ය. සෙනසුරු - කුජ - රාහු - කේතු මහ දසා අතුරු දසා ගෙවන අයට අගුණ පළවේ.

### වෘෂභ ලග්නය - රැකියාවේ සුබවාදී තත්ත්වයක්

වෘෂභ ලග්නයට අනුව අද ඔබට සුබවාදී දිනයකි. ආර්ථික අභිවෘද්ධිය අන් අයගේ සහාය තම රාජකාරි කටයුතුවලදී ලැබෙනු ඇත. ප්‍රධානීන්ගේ ඇප උපකාර මෙන්ම රැකියා ස්ථානගත සතුටුදායක සිදුවීම් වෙයි. හැරගිය අය යළි පැමිණේ. තම අභිලාසය අනුව අනාගතයට යහපත් සැලසුම් ක්‍රියාත්මක වේ. මුත්‍රා දෝෂ, යටි බඩේ රෝග ඇති වේ. උපරිම වතුර පානය සුදුසු වෙයි.

### මිථුන ලග්නය - පිටරට ගමනකට වාසනාව

මිථුන ලග්නයට අනුව අද ඔබට විශේෂයෙන් සුබ අසුබ සම සේ භුක්ති විඳීමට සිදු වේ. තමා සැලසුම් කර සිටි කටයුත්තක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවස්ථාව උදා වේ. පිටරට ගමන්වලට තිබූ බාධා ඉවත්ව ඒ සඳහා සතුටුදායක පණිවුඩ ලැබෙනු ඇත. ආදායමට වඩා වියදම ඉහළ යයි. දූ දරුවන් වෙනුවෙන් කැපවීම් කළ යුතු දිනකි.

### කටක ලග්නය - අවිවේකී දිනක්

කටක ලග්නයට අනුව තම එදිනෙදා කටයුතු බහුල වේ. අවිවේකය දවස පුරාම දක්නට ලැබෙන අතර, බෙල්ලේ අමාරු, උරහිසේ ආපදා පෙන්වයි. සීතල ආහාරපාන අවම කරන්න. කුස ආශ්‍රිත රෝග, විෂබීජ ශරීරගත වීමකට වුවද ඉඩ ඇත. තම පවුලේ අයකුට තම සමීපයෙන් දුරස්ව යාමකට හේතු විය හැකි නිසා කනස්සල්ල - කනගාටුව සිතට දැනෙනු ඇත.

### සිංහ ලග්නය - දේපළ සම්බන්ධ ගැටලු

සිංහ ලග්නයට අනුව අද ඔබට තම දේපළක් සම්බන්ධව ගැටලුවකට මුහුණදීමට සිදු වේ. ඒ නිසාම රැකියාවට යාමට තිබූ අවස්ථාව මඟහැරීම බොහෝ ප්‍රධානීන්ගේ දෝෂදර්ශනයට ලක් වීමට හේතු වෙයි. ආදායම් උසස් වේ. වියදම අවම වුවද සොර සතුරු බාධකයන් නිසා පීඩාවක් විය හැක. පපුවේ සෙම, හතිය උග්‍ර වනු ඇත.

### කන්‍යා ලග්නය - අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට සිදු වේ.

කන්‍යා ලග්නයට අනුව අද ඔබට සුබයි. පුතකු නිසා ආත්ම අභිමානය ගොඩනැගේ. තම අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිට ජය ගන්නවා ඇත. පරණ දේවල් අලුත්වැඩියා කිරීමට කටයුතු සැලසේ. ඔබ නිවසේ තබා තිබූ ස්වර්ණාභරණයක් හෝ එබඳුම වටිනා භාණ්ඩයකට උවදුරු පැමිණේ. ඒ නිසා ඒ වෙනුවෙන් පොලිසි, උසාවි ගානේ වුවද රස්තියාදු වීමට පවා සිදු වේ.

### තුලා ලග්නය - ආදායම් මාර්ගයක් නව මුහුණුවරකින්

තුලා ලග්නයට අනුව අද ඔබට සමබර ජීවන රටාවකට මඟ පෑදේ. ආදායම් අතින් ද සුබ වන අතර වියදම ද එසේ සමබර වනු ඇත. ඉතිරි කිරීමට හුරුපුරුදු ඇතිවේ. තම මවට සිදුවිය හැකි අනතුරක් පිළිබඳව සලකුණු මතු වේ. තමාට ද උගුරේ උරහිසේ ආපදා පෙන්වයි. ව්‍යාපාර පල ඇත. තමා නතර කර තිබූ ආදායම් මාර්ගයක් යළි ක්‍රියාවට නැංවේ.

### වෘශ්චික ලග්නය - දී තිබූ මුදලක් යළි ඔබ අතට

වෘශ්චික ලග්නයට අනුව චන්ද්‍රයා ලග්නගතව අසුබව යෙදෙන නිසා සිතේ කළකිරීම ඇතිවේ. හිසට - මුහුණට ආපදා පැමිණේ. පාරේ තොටේ ගමන් කිරීමේදී කල්පනාකාරී වන්න. මුළුතැන්ගෙයි කටයුතුවලදී ප්‍රවේසම් වන්න. ගෑස් උදුන් හා විදුලි උපකරණ භාවිතයේදී අනතුරු සහිතයි. තමා කෙනෙකුට දී තිබූ මුදලක් යළි ඔබ අතට පත් වේ.

### ධනු ලග්නය - ගමන් බිමන් බහුල කෙරේ

ධනු ලග්නයට අනුව අද ඔබට තම එදිනෙදා කටයුතුවලදී මහත් පරිශ්‍රමයක් යෙදීමට සිදු වේ. ඒ නිසාම ගමන් බිමන් ද බහුල කෙරේ. තම ආර්ථික පාඩු ද ඒ අතර වෙයි. වියදම අතින් දැඩි අපහසුතාවලට මුහුණ දීමට සිදු වේ. තමා අතින් සිදු වූ වරදකට වැඩිහිටි පාර්ශ්වයෙන් සමාව අයැදීමට ඔබට සිදු වේ. තම අදහස් උදහස් අනුව අනාගතය සුබවාදී කරගැනීමට සිතයි.

### මකර ලග්නය - අන් අයගේ පිළිගැනීමට ලක් වේ

මකර ලග්නයට අනුව අද ඔබට ආර්ථික වාසියක් සමඟ සිතට දිරිය දෙන කටයුත්තකට හේතු වෙයි. තම අදහස් උදහස් අන් අයගේ පිළිගැනීමට ලක් වේ. තමා විසින් කරන සමාජ සේවා කටයුත්තක් අන් අය අතර ප්‍රසාදයට පත් වේ. තම ගමන් බිමන් පොදු කටයුතු වෙනුවෙන් නිසා ගෘහ ජීවිතයේ යම් යම් ගැටලුවලට ද හේතු විය හැක. දණහිසට අපලයි. ප්‍රවේසම් විය යුත්තේ උඩ නැඟීම් හා බිම පැනීම් ආදියේදීය.

### කුම්භ ලග්නය - සතුරු බලවේග ක්‍රියාත්මක වේ

කුම්භ ලග්නයට අනුව අද දින ඔබගේ කේන්ද්‍රයේ විශේෂතාවට අනුව රැකියා අභිවෘද්ධිය, නව ක්‍රම ක්‍රියාත්මක වීම හා ප්‍රධානීන්ගේ ගෞරව බුහුමානයට ලක්වීම ඒ අතර වෙයි. එහෙත් ඒනිසාම සතුරු බලවේග ක්‍රියාත්මක වේ. තමාට තම හිතවතුන් කීපදෙනෙකු විසින් කරන කුමන්ත්‍රණකාරී කටයුත්තක් නිසා ප්‍රසාදයෙන් පසු වූ ප්‍රධානීන්ගේ විශ්වාසය පළුදු විය හැක. ප්‍රවේසමෙන් අවධානමෙන් කටයුතු කරන්න.

### මීන ලග්නය - ආගමික කටයුත්තකට මුල් තැන

මීන ලග්නයට අනුව අද ඔබට ඉතා සුබ දිනකි. ආගමික සහජීවනයට හේතු වේ. විශේෂ පුණ්‍යකර්මයක් සිදුකෙරෙන දිනකි. නෑති බෑරි අයගේ දුක සැප උදෙසා දානමය ක්‍රියාදාමයකට කටයුතු සැලසේ. තවද තමාට හිමිවීමට තිබී යටපත් වූ දේපළක්, මුදලක් හෝ නිවසක අයිතිය ඔබට ලැබේ. ධනය අතින් ද සතුටුදායක ලැබීම් පෙන්වයි. උරහිසට අගුණ පළවේ. ප්‍රවේසම් වන්න

# කොවිඩ් එන්නත ළමයින්ටත් දිය යුතු කාලය ඇවිත්

## ටයිම්ස් ඔෆ් ඉන්දියා කියයි



ළමයින්ට කොවිඩ් එන්නත දීමට කාලය පැමිණ ඇතැයි ටයිම්ස් ඔෆ් ඉන්දියා වාර්තා කරයි.

මේ වාර්තාව පෙන්වා දෙන පරිදි කොවිඩ් -19 රෝගීන් තිරසාරව තුරන් කර අවසානයේ වසංගතය අවසන් කිරීමට අපට අවශ්‍ය නම් වැඩිහිටි එන්නත දිගටම කරගෙන යා යුතුය. වර්තමානයේ වැඩිහිටියන් අතර, එන්නත් ඉල්ලුම සැපයුම ඉක්මවා යයි. එහෙත් ළමයින් සුදුසුකම් ලැබූ පසු, ඔවුන් සඳහා එන්නත් කිරීමේ අනුපාතය මුලින් බෙහෙවින් අඩු වනු ඇති අතර, වැඩිහිටියන් අතර දක්නට ලැබෙන ප්‍රමාණයට වඩා සෙමින් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර තිබේ. ළමයින්ට ඉක්මනින් එන්නත ලබා දීමට එක් හේතුවක් නම්, ළමයින් අතර බරපතළ කෝවිඩ් රෝගීන් සුළු සංඛ්‍යාවක් පවා සිටියත් ඔවුන් එන්නත් කිරීම වටිනා නිසා යැයි එම පුවත් සේවය පෙන්වා දෙයි. ළමයින් තුළ දිගුකාලීන කෝවිඩ් බලපෑම්වල බර අපැහැදිලිය. විශේෂයෙන් බොහෝ දෙනකුට අසමමිතික ආසාදන ඇති බැවින්, ඒවා හඳුනා නොගනී. එහෙත් වඩාත්ම වැදගත් හා අවම වශයෙන් හඳුනාගෙන ඇති හේතුව නම්, වයිරසය ළමයින්ට සහ වැඩිහිටියන්ට හානි කළ හැකි ඒවා ඇතුළුව වඩාත් භයානක ප්‍රභේදයන් දක්වා ව්‍යාප්ත වීමට හා විකෘති වීමට ඇති හැකියාවයි. ළමයින් තුළ වඩාත් දරුණු රෝගාබාධ ඇති කරන අනාගත ප්‍රභේදයන් ළමයින්ගෙන්ම මතු වීමට ඉඩ ඇත. විශේෂයෙන් වැඩිහිටියන්ට එන්නත් වැඩි වන විට ආසාදනය සඳහා නැමියාව අඩු වේ. ළමයින් සඳහා එන්නත් ආරක්ෂිත බව ඔප්පු කිරීම සඳහා සායනික පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. එහෙත් ළමයින් තුළ එන්නතක් ඵලදායීද යන්න සොයා බැලීම සඳහා, පරීක්ෂාවන්හි ප්‍රධාන ප්‍රතිඵලය ළමයින් අතර එන්නතක් මඟින් සැබෑ වෙනසක් සිදු වේද යන්න තීරණය කිරීම සඳහා ප්‍රමාණවත් විය යුතුය. වාසනාවකට මෙන්, මේ මොහොතේ ළමයින් අතර බරපතළ රෝග (සහ මරණ) ඉතාම අල්පය. ඒ වෙනුවට, ළමයින් සඳහා එන්නත් අත්හදා බැලීම් මූලික වශයෙන් අවධානය යොමු කරනුයේ ආරක්ෂාව සහ එන්නත් මඟින් ප්‍රතිශක්තිකරණ ප්‍රතිචාරයක් ලබා දෙන්නේද යන්නයි.




# ඉන්දියාවෙන් නව සංචාරක ප්‍රතිපත්තියක්



ලෝක සංචාරක ක්ෂේත්‍රයේ ශ්‍රේණිගත කිරීම්වල ප්‍රගතියක් අත්කර ගැනීම සඳහා ඉන්දීය රජය නව සංචාරක ප්‍රතිපත්තියක් සකස් කරමින් සිටී.

නව ප්‍රතිපත්තිය සංචාරක කර්මාන්තයෙන් ඉලක්කගත අරමුණ කරා යෑමට හැකිවනු ඇතැයි එරට සංචාරක ඇමැති ප්‍රහලාඩ් සිං පටේල් මහතා විශ්වාසය පළ කරයි. වසර 2014දී එම ශ්‍රේණිගත කිරීම්වල 65 වැනි ස්ථානයේ පසු වූ ඉන්දියාව වසර 5ක් ඇතුළත 34 වැනි ස්ථානය දක්වා ඉදිරියට ගොස් ඇතැයි ද ඔහු කීවේය. ටජ් මහල් වැනි සංචාරකයන් අතර ජනප්‍රිය ස්ථාන වෙනුවට නව ගමනාන්ත සහ සංචාරකයන් අතර ජනප්‍රිය කළ හැකි ස්ථාන දියුණු කිරීමේ අවශ්‍යතාව ද නව සංචාරක ප්‍රතිපත්තිමාලාවට කෙටුම්පත් කර තිබේ. ලෝක සංචාරක ක්ෂේත්‍රයේ ශ්‍රේණිගත කිරීම්වල පළමු ස්ථානය අත්කර ගැනීම අරමුණින් පසුවූවත් කොවිඩ් වසංගතයේ බලපෑමත් සමඟ එම අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වූ බවත්, වසර 2024 දී ඉලක්කය කරා යන බවත් ඉන්දීය සංචාරක ඇමැති ප්‍රහලාඩ් සිං පටේල් මහතා පැවැසීය.

# කොවිඩ් එන්නත දීම ඉන්දියාව තවත් පුළුල් කරයි



ඉන්දියාව තුළ කොවිඩ් එන්නත දීම තව දුරටත් ව්‍යාප්ත කර ඇති බවත්, එහි සාර්ථකත්වය පිළිබඳ කිසිවකු සැක සංකා ඇතිකර ගත යුතු නැති බවත් ඉන්දීය රජය අවධාරණය කර සිටී.

දැනටමත් ඉන්දීය ජනතාවගෙන් කෝටි 3.5ක් සහ කෝටි 4ක් අතර ප්‍රමාණයකට කොවිඩ් එන්නත ලබා දී ඇතැයි ද, එහි අතුරු ආබාධ වාර්තා වන්නේ 0.000432% ක ප්‍රතිශතයක් පමණක් බවද ඉන්දීය සෞඛ්‍ය ඇමැති හර්ෂ් වර්දන් මහතා ප්‍රකාශ කර ඇත. ඉන්දියාවේ සෞඛ්‍ය අංශයේ කාර්ය මණ්ඩල, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ අවුරුදු 45ත් 59ත් අතර පුද්ගලයන් වශයෙන් ප්‍රමුඛතා ලැයිස්තු මත මේ එන්නත් විදීම සිදු කෙරෙන අතර, ඉදිරියේදී විශේෂඥ අදහස්වලට අනුව එම වැඩසටහන තව දුරටත් ව්‍යාප්ත කරන බව එරට සෞඛ්‍ය ඇමැති පවසයි. මේ සඳහා ලෝක සෞඛ්‍ය සංවිධාන මාර්ගෝපදේශ ද සැලකිල්ලට ගත් බව ඔහු කීවේය.



# වැඩි යමක් නොකිරීම ගැන මා මගෙන්ම සමාව ගන්නවා

## ජෝර්ජ් ෆ්ලොයිඩ්ගේ මරණයේ විරෝධතා අවුළුවාලූ තරුණිය කියයි

ජෝර්ජ් ෆ්ලොයිඩ්ගේ මරණය පිළිබඳ සිද්ධියේ දී ගෝලීය විරෝධතා අවුළුවාලූ තරුණිය පැවසුවේ "වැඩි යමක් නොකිරීම" ගැන තමාගෙන් සමාව අයදින බවයි. දැන් 18 හැවිරිදි ඩාර්නෙලා ෆ්‍රේසියර් මෙම නඩු විභාගයේ දෙවන දිනයේ සාක්ෂි දුන් ඔහු තරුණ සාක්ෂිකරුවන් හතර දෙනාගෙන් කෙනෙකි. ඇය උසාවියට කියා සිටියේ ෆ්ලොයිඩ් මහතා "ඔහුගේ ජීවිතය ඉල්ලා යදින ලද බවත්" බවත්, ඔහුගේ පියා, සහෝදරයා, ඥාති සහෝදරියන් සහ මාමලා සමඟ සංසන්දනය කරමින් "ඒ ඔවුන් සියල්ලෝම කළ නිසා" බවත්ය. වාර්ගික සමානාත්මතාවය සහ පොලිස්කරණය පිළිබඳ ගැටළු මෙම නඩුවේ කේන්ද්‍රයේ පවතී. නඩු විභාගයේ ආරම්භක සැසියේදී, හිටපු පොලිස් නිලධාරියකු වන චාවින් මහතා 2020 මැයි මාසයේදී මිනියාපොලිස්හිදී අත්අඩංගුවට ගන්නා අතරතුර මිනිත්තු නවයකට අධික කාලයක් ෆ්ලොයිඩ් මහතාගේ ගෙලෙහි දණ ගසා ඇති බව ඇසුණි. පැමිණිලිකරුවන් පවසන්නේ මෙය ඔහුගේ මරණයට "ප්‍රධාන හේතුවක්" වූ බවයි. 46 හැවිරිදි ෆ්ලොයිඩ් මහතා අධික ලෙස මත්පැන් පානය කිරීම නිසා මිය ගිය බවට තර්ක කරන බව විත්තියේ නීතිඥයින් පෙන්වා දී තිබේ. 45 හැවිරිදි චාවින් මහතා මිනීමැරුම් සහ මිනීමැරුම් චෝදනා ප්‍රතික්ෂේප කරයි. පැමිණ සිටි තවත් නිලධාරීන් තිදෙනකු වන ටූ තාඕ, ජේ ඇලෙක්සැන්ඩර් කියුං සහ තෝමස් ලේන් යන දෙදෙනා වසර අවසානයේදී නඩු විභාගයට ගනු ඇත.

# ඔස්ට්‍රේලියාවේ කෝවිඩ් එන්නත් වැඩසටහනේ ඇල්මැරුණු ගතියක්




මාර්තු 31 වන විට ඔස්ට්‍රේලියාව කෝවිඩ් එන්නත් මිලියන 4ක් ලබා දීමේ ඉලක්කයට වඩා තිබෙන ප්‍රමාණය මාත්‍රා මිලියන 3.4කින් පහත වැටී ඇත. 85% ක මේ හිඟය ඇති වන්නේ බ්‍රිස්බේන් කුඩා පිපිරීමක් මැඩපැවැත්වීම සඳහා තවත් හදිසි අගුළු දැමීමකට කටයුතු යොදා දින දෙකකට පසුවය. පසුගිය සතියේ රජය කියා සිටියේ ඔස්ට්‍රේලියාවේ අඩු ආසාදන අනුපාතයක් ඇති නිසා එන්නත් සිදු කිරීම හදිසි අවශ්‍යතාවයක් නොවන බවයි. වසංගතය ආරම්භ වූ දා සිට රට තුළ මරණ 909ක් හා රෝගීන් 29,300ක් වාර්තා වී ඇත. එහෙත් මෑත මාසවලදී නගරවල අගුළු දැමීම් භයකට හේතු වී තිබේ. විචාරකයන් පවසන්නේ බ්‍රිස්බේන්හි රෝගය පැතිරීම වැනි තත්වයන් පෙන්නුම් කරන්නේ ඉක්මන් එන්නත් වැඩසටහනක් තවමත් අවශ්‍ය වන්නේ මන්ද යන්නයි. බ්‍රිස්බේන්හි පොකුරු දෙකට එකම රෝහලක කොවිඩ් වාට්ටුවකින් වයිරසය වැලඳුණු හෙදියක් සහ වෛද්‍යවරයකු සමඟ සම්බන්ධ වී ඇත. එම සෞඛ්‍ය සේවකයන්ට තවමත් එන්නත ලබා නොදීමට හේතුව පැහැදිලි නැත.

# මිය ගිය ජපන් රියැලිටි තරුව අන්තර්ජාල අපයෝජනය ලක් කළ තැනැත්තාට යෙන් 9,000ක දඩයක්



පසුගිය වසරේ සිය දිවි නසාගත් ජපන් රියැලිටි තරුවකට එල්ල කළ අන්තර්ජාල අපයෝජනය සම්බන්ධයෙන් පුද්ගලයකුට යෙන් 9,000ක (ඩොලර් 80ක) දඩයක් නියම කර ඇති බව නීතිඥවරු පවසති.

22 හැවිරිදි හනා කිමුරා මිය යාමට පෙර ඇය සයිබර් හිරිහැරයට ලක්ව ඇති බව අඟවමින් සමාජ මාධ්‍ය පෝස්ට් මාලාවක් ලියා තිබුණි. ඇයට "භයානක පෞරුෂයක්" ඇති බව පවසමින් එම පුද්ගලයා ඇගේ සමාජ මාධ්‍ය ගිණුමේ පණිවිඩ පළ කර ඇති අතර "ඔබ කවදා මිය යනු ඇත්ද?" යනුවෙන් සඳහන් කර තිබේ. ටෙරස් හවුස් නම් රියැලිටි වැඩසටහන මැයි මාසයේ ඇගේ මරණයෙන් පසු අවලංගු කෙරිණි. ජපානයේ ෆුජි ටීවී නිෂ්පාදනය කළ සහ නෙට්ෆ්ලික්ස් බෙදා හැරි ටෙරස් හවුස්, එය අවලංගු කිරීමට පෙර ගෝලීය ප්‍රේක්ෂකයන් අතර ජනප්‍රිය විය. ජපානයේ එක් නිවසක එකට ජීවත්වන නමුත් සාමාන්‍යයෙන් ඔවුන්ගේ දෛනික ජීවිතය ගත කරන තරුණ තරුණියන් හයදෙනකු එම රියැලිටි වැඩසටහන සිදු කරයි. මෑත වසරවලදී එය නළු සාමාජිකයන් අතර ඇති අව්‍යාජ අන්තර්ක්‍රියා සහ නාට්‍යයේ සාපේක්ෂ ප්‍රවනතාවට විශාල අනුගාමිකත්වයක් ලබා ගෙන ඇත.



# තාක්ෂණවේදයට මුල්තැන දෙන ගම්පහ සුමේධ විදුහල





විදුහල්පතිතුමා, නියෝජ්‍ය විදුහල්පතිවරු සහ සහකාර විදුහල්පතිවරු


සයුරි භාග්‍යා විජේසිංහ
අධ්‍යක්ෂිකා


වෛද්‍ය විල්ෆ්‍රඩ් විජේසිංහ
සභාපතිතුමා





ද්විතීයික අංශයේ ගුරු මණ්ඩලය


පූජ්‍ය ආචාර්ය
සුමන හිමි

**1995** වසරේදී ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාගාරයකින් ඇරඹුණු ගම්පහ තරුණ සංවර්ධන මධ්‍යස්ථානය වර්තමානය වන විට එවැනි බැඩ්මින්ටන් ක්‍රීඩා පිටි 7කින් සමන්විත තරුණ තරුණියන්ගේ හැකියා මෙන්ම ආකල්ප වර්ධනය කරනා මධ්‍යස්ථානයක් බවට පත් වී අවසන්ය. ගම්පහ තරුණ සංවර්ධන මධ්‍යස්ථානයේ නිර්මාතෘ විශේෂඥ වෛද්‍ය විල්ෆ්‍රඩ් විජේසිංහ මහතා, නවලෝක සමූහ ව්‍යාපාරයේ අධිපති දේශබන්දු දේශමාන්‍ය එච්. කේ. ධර්මදාස මහතා සමඟ එක්ව එවකට ගම්පහ ප්‍රදේශයට අඩුපාඩුවක්ව පැවති පිහිනුම් තටාකයක අවශ්‍යතාව ද සපුරන ලදි. ඉන් අනතුරුව 1997 වසරේදී දරුවන් දස දෙනකුගෙන් ඇරඹි විශාකා ජාත්‍යන්තර පෙරපාසල කුඩා දරුවන්ට නැණ පහන් දල්වනා ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රමුඛ පෙළේ පෙරපාසලක් බවට කෙටි කාලයකදී පත්වන්නේය.

පෙරපාසලට අමතරව පාසලකට පළමු පියවර තැබෙන්නේ 2002 වසරේදීය. ඒ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පූර්ණ අනුමැතිය සහිතව මීරිගම ප්‍රදේශයේ පැවති පාසලක් වූ ශ්‍රී සුමේධ මහා විද්‍යාලයේ නාමය ගෙන 2003 වසරේදී සුමේධ විද්‍යාලය නමින් පාසලක් ආරම්භ කරමිනි. දරුවන් දාහතරදෙනකුගෙන් සහ ගුරුවරුන් තිදෙනකුගෙන් යුතුව විවිධ බාධක, දුෂ්කරතා මැද ආරම්භ කළ සුමේධ විද්‍යාලය වර්තමානයේ ගුරුවරුන් 250කගේ මඟපෙන්වීමෙන් දරුවන් 4000කට වැඩි සංඛ්‍යාවකට නව ලොවට අවශ්‍ය පරිපූර්ණ අධ්‍යාපනයක් සපයනා පාසලක් බවට පත් වී ඇත.

පළමුවැනි ශ්‍රේණියේ සිට 13 වැනි ශ්‍රේණිය දක්වාම පන්ති පවතිනා සුමේධ විදුහල රජයේ අනුමත පෞද්ගලික පාසලක් වන අතර 2019 වසරේදී විශේෂ සංධිස්ථානයක් සණිටුහන් කරමින් රජයේ ආධාර ලබනා අර්ධ රාජ්‍ය පාසලක් බවට උසස් කරන ලදි. ඉතා කෙටි කලකදී ගම්පහ දිස්ත්‍රික්කයටම ආදර්ශවත් විදුබිමක නමක් දිනා ගැනීමට සභාපතිතුමා, අධ්‍යක්ෂ මණ්ඩලය, විදුහල්පතිතුමා, නියෝජ්‍ය විදුහල්පතිවරු, සහකාර විදුහල්පතිවරු මෙන්ම ගුරුවරුන් ද සමත් වී ඇත.

තරුණ සංවර්ධන මධ්‍යස්ථානයට අනුබද්ධ සුමේධ විද්‍යාලය හා විශාකා ජාත්‍යන්තර පෙරපාසලෙහි සභාපති විශේෂඥ වෛද්‍ය විල්ෆ්‍රඩ් විජේසිංහ මහතා, මේ ආයතනයේ මුදුන් මුල වැනිය. උප සභාපති විශේෂඥ වෛද්‍ය හරිඳු විජේසිංහ මහතා සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂිකා සයුරි භාග්‍යා විජේසිංහ මහත්මිය ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිතුමාගේ දැක්ම ඉදිරියට ගෙන යෑම සඳහා කටයුතු කරති. සුමේධ විදුහලේ විදුහල්පති වශයෙන් සමන්ත පෙරේරා මහතා ද ප්‍රාථමික අංශයේ උප විදුහල්පති සරත් ප්‍රේමවර්ධන මහතා සහ ද්විතීයික අංශයේ උප විදුහල්පතිනිය වශයෙන් රුවිනි රණසිංහ මහත්මිය ද සහකාර විදුහල්පති (පරිපාලන) කුමාරි හපුආරච්චි මහත්මිය ද ඇතුළු ද්විතීයික අංශයේ සහකාර විදුහල්පතිවරු වශයෙන් අරවින්දි සමරතුංග, මයුර ජයසේකර, දීපිකා රන්මලී, ප්‍රභානි ප්‍රේමරත්න යන මහත්ම මහත්මීන්ගෙන් පාසලට ඉටුවන්නේ අනුපමේය මෙහෙවරකි.

සෞන්දර්ය අංශ ප්‍රධානි වශයෙන් ටානියා ප්‍රීතිමාලි මෙණෙවිය ද 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා අංශ ප්‍රධානින් වශයෙන් තිලිණි පෙරේරා, කෝසලා ජීවන්ති, කසුන් චාමර, බුද්ධිකා රත්නවීර, දර්ශනී ගල්පායගේ හා කේෂිණී වික්‍රමආරච්චි යන මහත්ම මහත්මීහු කටයුතු කරති.

සුමේධ විදුහල මඟින් ප්‍රාථමික සිසු සිසුවියන් සෑම පැතිකඩකින්ම උසස් අධ්‍යාපනයට යොමු කරනා අතර 6 වැනි ශ්‍රේණියේ සිට 11 වැනි ශ්‍රේණිය දක්වාම ද්විභාෂා විෂය නිර්දේශ යටතේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම් සිදු කරයි. මෙලෙස විද්‍යා සහ ඉංග්‍රීසි අංශයන්ට වැඩි නැඹුරුතාවක් දක්වමින් පසුගිය වසර කිහිපය තුළ සාමාන්‍ය පෙළ විභාගයෙන් විශිෂ්ට ජයග්‍රහණ රැසක් පාසලට හිමි කර දීමට සිසු සිසුවියන් සමත් වී ඇත. පොතපතට පමණක් සීමා නොවූ ගෘහ ආර්ථික විද්‍යා දැනුම, ආහාර පිසීම, ගෙදරක නඩත්තු කටයුතු, මැහුම් ආදි ශිෂ්‍යාවන්ට පමණක් නොව සිසුන්ට ද අවශ්‍ය ප්‍රායෝගික දැනුම සැපයීමට ද මේ පාසල මඟින් වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවා තිබේ.

අ.පො.ස. උසස් පෙළ විද්‍යා, ගණිත යන අංශයන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම ආරම්භ කර ඇත්තේ 2016 වසරේදීය. කොතරම් විශ්වවිද්‍යාලවලින් උපාධිධාරීන් බිහිවුවද වෘත්තිකයන්ගේ පවතිනා හිඟතාව හේතුවෙන් හඳුන්වා දී ඇති තාක්ෂණවේදය විෂය ධාරාව සුමේධ විද්‍යාලයේ ඉගැන්වීම ආරම්භ කරන ලද්දේ 2018 වසරේදීය. මේ තාක්ෂණවේදය විෂය සිංහල මාධ්‍යයෙන් දැනට ඉගැන්වීම් සිදු කරයි. තාක්ෂණවේදය විෂයන් සිසුන්ට අධ්‍යයනය කිරීමට පහසු වන පරිදි නවීන විද්‍යාගාර පහසුකම්වලින් සමන්විත වෙනමම අංශයක් පාසල තුළ ස්ථාපිත කිරීමට ගුරු මණ්ඩලය විශාල වශයෙන් කැපවීම් සිදු කර තිබේ. ඒ අනුව යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාගාරයක්, සිවිල් ඉංජිනේරු විද්‍යාගාරයක්, විදුලි හා ඉලෙක්ට්‍රොනික විද්‍යාගාරයක් හා මෝටර් රථ ඉංජිනේරු විද්‍යාගාරයක් පාසල තුළ ස්ථාපිත කර ඇත.

සිසුන්ට ජෛව පද්ධති තාක්ෂණවේදය හැදෑරීමට පහසු වන අයුරින් අපජල පවිත්‍රාගාරයක්, ජීව වායු උත්පාදන මධ්‍යස්ථානයක් හා විශාල ඉඩ ප්‍රමාණයක පවතිනා ගොවිපළ අධ්‍යයන කටයුතුවලට බෙහෙවින් උපකාරි වේ. මේ අපජල පවිත්‍රාගාරය මඟින් පාසලේ අපජලය සම්පූර්ණයෙන්ම පිරිසුදු කිරීමකට ලක් කරනා අතර එම පිරිසුදු කළ ජලය ගොවිපළ වෙත ද භාවිත කිරීම සිදු කරයි. දැනට විද්‍යා, ගණිත, තාක්ෂණවේදය සහ වාණිජ අංශයන්ගෙන් උසස් පෙළ ඉංග්‍රීසි සහ සිංහල මාධ්‍යයෙන් ඉගැන්වීමට පහසුකම් සපයා ඇති අතර විවිධ භාෂා ඉදිරි වර්ෂයේදී ඇතුළත් කිරීමට ද කටයුතු සූදානම් කර තිබේ.

තාක්ෂණය දිනෙන් දින දියුණුවත්ම විවිධ රටවල කුඩා දරුවන් පවා නව නිෂ්පාදන සිදු කිරීමට පෙළඹී සිටී. අනාගත තාක්ෂණවේදයේ හැරවුම් ලක්ෂ්‍යයන් වෙතැයි සැලකෙනා රොබෝ තාක්ෂණවේදය, ගගන ඉංජිනේරු තාක්ෂණවේදය, නැනෝ තාක්ෂණවේදය හා දෘඩාංග ඉංජිනේරු තාක්ෂණවේදය යන අංශයන්ගෙන් දක්ෂතා දක්වන සිසු සිසුවියන් වෙත අවශ්‍ය සියලු පහසුකම්වලින් සමන්විත පරීක්ෂණාගාර සපයා තිබීම විශේෂත්වයකි. ලොකු කුඩා භේදයකින් තොරව තමන් දක්වන දක්ෂතා වැඩි දියුණු කර ගැනීමට මේ පරීක්ෂණාගාර භාරව සිටිනා ගුරුවරුන් ද ලබා දෙන්නේ මනා සහයෝගයකි.

සිසු සිසුවියන්ගේ අධ්‍යාපනික දැනුම, බාහිර දැනුම මෙන්ම ඔවුන් දක්වන විශේෂ දක්ෂතා ඔප්නංවා ගැනීමට සුමේධ විදුහලෙන් විශාල සහයෝගයක් ලැබෙනා අතර දරුවන්ගේ ක්‍රීඩා අංශයන් පිළිබඳවද වැඩි සැලකිල්ලක් දක්වයි. සුමේධ විදුහලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පටන් ගුරුදෙගුරුන් දක්වා සියල්ලකගේම එකම පැතුම පොතපතට පමණක් සීමා නොවූ රටට වැඩදායී ගුණ යහපත් දරුවන් පිරිසක් බිහි කරලීමයි.

**සටහන - ගයාන් සංජය**
**ඡායාරූප - චතුරංග ලියනආරච්චි**


විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ විද්‍යාගාරය


මෝටර් රථ තාක්ෂණ විද්‍යාගාරය


උසස් තාක්ෂණ විද්‍යාගාරය


ගොවිපළ


මෝටර් රථ තාක්ෂණ විද්‍යාගාරය


යාන්ත්‍රික ඉන්ජිනේරු විද්‍යාගාරය


අපජල පවිත්‍රාගාරය

# AIA ඉන්ෂුවරන්ස් කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය හඳුන්වා දෙයි




ඩිජිටල්කරණය වෙත මාරුවීමේ ප්‍රයත්නයේදී AIA ඉන්ෂුවරන්ස් විසින් ශ්‍රී ලංකාවේ රක්ෂණ ක්ෂේත්‍රය වෙත ප්‍රථම වරට ව්‍යවසාය ශ්‍රේණියේ විසඳුමක් වන cloud පදනම් කර ගත් කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය නොබෝදා හඳුන්වාදෙන ලදි. AIA හි වඩාත් වැදගත් කාර්ය ප්‍රවාහයන් ස්වයංක්‍රීයකරණය කිරීම තහවුරු කිරීම සඳහා Microsoft Azure Logic App තෝරාගෙන ඇත.

AIAහි මෙහෙයුම් අංශයේ මෙන්ම සමාගම පුරාවට ඇති විවිධ අංශයන් වෙත මේ ස්වයංක්‍රීයකරණ වැඩසටහන දියත් කෙරෙමින් පවතින අතර, මේ ඔස්සේ සමාගම වෙත ලැබෙන නව ව්‍යාපාරවල රක්ෂණ ඔප්පු සැකසීමේ සිට සාමාන්‍යයෙන් සාම්ප්‍රදායිකව කාර්ය මණ්ඩල සාමාජිකයකුගේ අතින් කරන ලද පාරිභෝගික සේවා ක්‍රියාවලීන් බොහොමයක් ඉදිරියේදී ඩිජිටල්කරණ තාක්ෂණය ඔස්සේ කිරීමට කටයුතු සැකසේ. මෙසේ තාක්ෂණික ස්වයංක්‍රීයකරණය මඟින් ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරලීම මෙන්ම රක්ෂණ ඔප්පු නිකුත් කිරීමේ සහ රක්ෂණ හිමිකම් පෑමේ ක්‍රියාවලින් වඩාත් නිරවද්‍යතාවයෙන් ද කෙරෙනු ඇත.

මේ පිළිබඳ අදහස් දක්වමින් AIAහි ප්‍රධාන විධායක නිලධාරී නිකිල් අද්වානි කියා සිටියේ " AIAහි අප අපගේ සේවාලාභීන් වෙත වඩාත් විශිෂ්ට සේවාවක් දීම සඳහා ඩිජිටල්කරණය වෙත අපගේ සියලු ක්‍රියාවලීන් මාරු කිරීම වෙනුවෙන් කැපවී කටයුතු කරමින් සිටින අතර, එය අපගේ අත්‍යවශ්‍ය ප්‍රමුඛතාවක්. ශ්‍රී ලංකාව තුළ මේ කර්තව්‍ය සඳහා පුරෝගාමී සමාගම බවට පත්වීමට ලැබීම ද අපට මහත් අභිමානයක්. cloud පදනම් කර ගත් කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය ශ්‍රී ලංකාව තුළ ඩිජිටල්කරණ පරිවර්තනය සහ ස්වයංක්‍රීයකරණය නව මානයක් කරා රැගෙන යන අතර, එම කර්තව්‍ය සඳහා පුරෝගාමී සමාගම බවට පත්වීම අපට ආඩම්බරයක්. "

AIA ඉන්ෂුවරන්ස්හි ප්‍රධාන තාක්ෂණ නිලධාරී උමේෂිද ෆොන්සේකා සිය අදහස් දක්වමින් "කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය භාවිතයෙන් සමාගම තුළ අභ්‍යන්තර ක්‍රියාවලීන් වඩාත් වේගවත් සහ කාර්යක්ෂමව මෙන්ම කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ අවම මැදිහත්වීම සහ සහභාගීත්වය ඇතුව සිදු කෙරෙනු ඇති. මේ විසඳුම සේවාලාභීන්හට වඩාත් පහසුවක් වනු ඇති අතර, අන්තර්ජාල පහසුකම් ඇති ඕනෑම උපාංගයක් භාවිතයෙන් ලොව ඕනෑම තැනක සිට ඊට පිවිසිය හැකිය. මේ cloud සේවාව සමාගම පුරාවට ඇති විවිධ සේවාවන්ට සහ බහුවිධ පද්ධතිවලට අනුකූලව ක්‍රියා කරනු ඇති අතර, එමඟින් ඉතා පහසු, සුමට සේවා අත්දැකීමක් එය භාවිත කරන්නන් හට අත්පත් කර ගත හැකි වනු ඇත.

AIA ඉන්ෂුවරන්ස්හි අධ්‍යක්ෂිකා සහ ප්‍රධාන නිලධාරී නීති සහ මෙහෙයුම්, චතුරි මුණවීර මහත්මිය සිය අදහස් දක්වමින් "AIA හි අප, සේවාලාභීන්හට අසම සම පහසුකම් සහ සේවා ළඟා කර දිය හැකි වන අයුරින් අපගේ අභ්‍යන්තර ක්‍රියාවලීන් නිරතුරුව වැඩි දියුණු කරමින් සිටිමු. මේ නව cloud පදනම් කර ගත් කාර්ය ප්‍රවාහ ස්වයංක්‍රීයකරණය, ව්‍යාපාරය පුරාවට ක්‍රියාවලීන් සහ මෙහෙයුම්වල ගුණාත්මක බව වැඩි දියුණු කිරීමට ඉවහල් වනු ඇති අතර, එමඟින් සේවාලාභී අත්දැකීම වඩාත් සතුටුදායක තත්ත්වයක් දක්වා කළමනාකාරණය කරවීම එමඟින් සිදුවෙනු ඇත.

# චරිත් ගෲප් සභාපති ආචාර්ය ක්ලැරන්ස් කුමාරට සම්මානයක්



චරිත් සමූහ ව්‍යාපාරයේ සභාපති ආචාර්ය සර් ක්ලැරන්ස් කුමාරගේ මහතාට මානව හිමිකම් සංවිධානයක් විසින් විශිෂ්ටතා සම්මානයක් පිරිනමා ඇත. කොවිඩ් 19 වසංගත සමයේ රැකියා ස්ථානවලින් ඉවත් කරනු ලබන සේවකයන්ට සහන දීමේ කටයුත්තට දායක වී ඔවුන්ට අවශ්‍ය මූල්‍යමය සහ වියළි සලාක දී සවිබල ගැන්වීම ඔහු කළ එක් කටයුත්තකි. ඉන් අනතුරුව ඔවුන්ගේ සේවා ස්ථාන සමඟ සාකච්ඡා කර ඔවුන් නැවත සේවයේ පිහිටු වීමට කටයුතු කිරීම තවත් පියවරකි. ඉන් නොනැවතුණු ඔහු රුපියල් ලක්ෂ 17ක මුදලක් ප්‍රදේශවල සිර වී සිටි ජනතාවට අවශ්‍ය වියළි සලාක, වෛද්‍ය සැපයුම් සහ ආරක්ෂක උපකරණ දීමටත් වැය කළේය.

ආචාර්ය ක්ලැරන්ස් මහතාට 56 වැනි ලෝක ඒකාබද්ධ ඖෂධ පිළිබඳ සම්මේලනයේදී නයිට් ධුරයක් හිමි වූ අතර, එක්සත් රාජධානියේදී ඖෂධ විකල්ප සහ විවෘත අන්තර්ජාතික විශ්වවිද්‍යාලයෙන් ගෞරව ආචාර්ය උපාධියක් ද පිරි නැමිණි. ඒ මහතා ශ්‍රී ලංකාවේ සහ පැසිෆික් ආසියාවේ එකම නයිට් නාමධාරියාය. මීට පෙර දේශමාන්‍ය, දේශබන්දු, කීර්ති ශ්‍රී ලංකා අභිමානි, ව්‍යාපාර විභූෂණ සම්මානවලින් පිදුම් ලබා ඇති ඔහුට 2018 වසරේ ශ්‍රී ලංකාවේ හොඳම ව්‍යාපාරිකයාට හිමි සම්මානය ද හිමි විය.

# ජේ. එෆ්. ඇන්ඩ් අයි. පැකේජින් සමාගම අපනයන විශිෂ්ටතා සම්මාන දිනයි




දකුණු ආසියාවේ විශාලම ඇසුරුම් සමාගමක් වන සී/ස ජේ. එෆ්. ඇන්ඩ් අයි. පැකේජින් NCE අපනයන විශිෂ්ටතා සම්මාන උළෙලේ ඇසුරුම් කර්මාන්ත අංශයේ මහා පරිමාණ කාණ්ඩයේ එකම සම්මානලාභියා වෙමින් ලෝකඩ සම්මානය දිනා ගත්තේය. ජාතික අපනයන මණ්ඩලය සංවිධාන කළ සම්මාන රාත්‍රිය කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේදී උත්කර්ෂවත් ලෙස පැවැත්විණි. වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මහතා 1978දී ඇරඹූ ජේ. එෆ්. ඇන්ඩ් අයි. පැකේජින් සමාගම ඕෆ්සෙට්, ෆ්ලෙක්සිබල්, පූර්ව මුද්‍රිත, ඩිජිටල් හා ප්ලාස්ටික් යනාදී ඇසුරුම් කර්මාන්තයේ සියලු අංශ ආවරණය කරමින් පූර්ණ විසඳුම් සපයන, ඩොලර් මිලියන ගණනක වත්කම් ඇති, කෙන්යාවේ හා ඩුබායිහි ශාඛා පිහිටි, බංග්ලාදේශයේ හා වියට්නාමයේ ශාඛා පිහිටුවීමට නියමිත දකුණු ආසියාවේ දැවැන්තම ඇසුරුම් සමාගමකි.

සමාගමේ අධි තාක්ෂණික දේශීය කර්මාන්තශාලා කිහිපයක් කොළඹ අවට පිහිටා ඇති අතර ටොමී හිල්ෆිගර්, කැල්වින් ක්ලීන්, පූමා, වික්ටෝරියාස් සීක්‍රට්, එම්. කේ. ආදි අන්තර්ජාතික කීර්තියට පත් සන්නාම රැසක් සමාගමේ සේවාදායකයන් අතර වෙයි. එමෙන්ම යුනිලීවර්, නෙස්ලේ, අහමඩ් ටී, ඇන්සල් ආදී බහු ජාතික සමාගම් ද ඒ අතර ඇත. ලෝකයේ දැවැන්ත සමාගම් වන ජර්මනියේ හීඩල්බර්ග්, ස්විට්සර්ලන්තයේ බොබ්ස්ට්, ප්‍රංශයේ ඩී.සී. එම්., ඉතාලියේ ස්කාවි, ජපානයේ සුමිමොටෝ සහ බෙල්ජියමේ එස්කෝ යන සමාගම් සමඟ බද්ධ ව්‍යාපාර පවත්වා ගැනීම ද ජේ. එෆ්. ඇන්ඩ් අයි. පැකේජින් සමාගමේ විශේෂත්වයකි. ගෝලීය ඇසුරුම් කර්මාන්තයෙන් විශාල කොටසක් අයත් කර ගැනීමේ දැක්මක් ඇති සමාගමේ සභාපති නයෝමාල් ප්‍රනාන්දු මහතා මේ ජයග්‍රහණය වෙනුවෙන් වෙහෙස නොබලා කැප වූ සිය කාර්ය මණ්ඩලයට කෘතඥතාව පුද කළේය. සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සජිත් නානායක්කාර මහතා පැවසුවේ කොවිඩ් 19 වසංගත සමයේදී පවා සමාගම 15%ක වර්ධනයක් වාර්තා කළ බවත් සමාගමේ මධ්‍යය, සැපයුම් දාමය, වේගය, තිරසාරත්වය හා මානව සම්පත මනාව පවත්වා ගැනීමට දරන උත්සාහය ඊට හේතුවූ බවත්ය.

# MARKET PRICE

## රට වටා මිල ගණන්



| | නාරාහේන්පිට ආ. ම. | රත්මලාන ආ. ම. | වැලිසර. ආ. ම. | මීගොඩ ආ. ම. | තඹුත්තේගම ආ. ම. | දඹුල්ල ආ. ම. | නුවරඑළිය ආ. ම. | මිල රුපියල් |
|---|---|---|---|---|---|---|---|---|
| පහත රට එළවළු | සිල්ලර මිල රු. | සිල්ලර මිල රු. | තොග මිල රු. | තොග මිල රු. | තොග මිල රු. | තොග මිල රු | | තොග මිල රු. |
| වට්ටක්කා | 100 | 120 | 70 | 60-65 | 80-60 | 58-60 | ගෝවා | |
| අළු කෙසෙල් | 140 | 120 | 70 | 60-70 | 40 | 55-40 | කැරට් | 130 |
| පිපිඤ්ඤා | 100 | 90 | 40 | 30-40 | 15 | 15 | ලීක්ස් | 80 |
| වැටකොළු | 100 | 160 | 80 | 90-100 | 80-100 | 80-90 | රාබු | 55 |
| බණ්ඩක්කා | 160 | 120 | 80 | 70-80 | 60-70 | 50-60 | බීට්රූට් | 60 |
| කරවිල | 200 | 190 | 130 | 120 | 18-130 | 100-110 | අර්තාපල් | 135 |
| පතෝල | 160 | 160 | 100 | 90-120 | 70-80 | | අර්තාපල් රතු | 120 |
| මාළු මිරිස් | 320 | 290 | 190 | 180-200 | 200 | 150-180 | නෝකෝල් | 70 |
| බටානා | | | | 90 | 90-100 | | බෙල්පෙපර් රතු | 700 |
| මුරුංගා | 600 | | | | | | කහ | 700 |
| එළබටු | 160 | | 50 | 80-90 | 60-70 | 75-80 | කොළ | 550 |
| කැකිරි | 100 | 80 | 80 | 40 | 20 | 35-40 | බැසිල් | 330 |
| නෝකෝල් | 160 | 120 | 80 | 60-80 | 70 | 45-50 | චයිනීස් කැබේජ් | 170 |
| මඤ්ඤොක්කා | 100 | 80 | 50 | | 50 | 35-40 | රෙඩ් කැබේජ් | 800 |
| බතල | | | 50 | | 50 | 35 | සැල්දිරි | 240 |
| දඹල | 180 | 160 | 110 | 90-100 | 55-60 | 75-80 | කොත්තමල්ලි කොළ | 220 |
| මැකරල් | 200 | 120 | 80 | 60-70 | 70-80 | 60-70 | අයිස්බර්ග් | 220 |
| **උඩරට එළවළු** | | | | | | | සලාද | 60 |
| බෝංචි | 240 | 240 | 190 | 180-200 | 220 | 165-170 | රතුසලාද | 550 |
| ගෝවා ගෙඩි | 160 | 160 | 130 | | | 75-80 | මිංචි | 170 |
| කැරට් | 200 | 160 | 140 | 130-150 | | 90-100 | පාස්ලි | 450 |
| ලීක්ස් | 140 | 120 | 100 | 80-95 | | | රූබා | 60 |
| රාබු | 160 | 100 | 40 | 20-30 | 35 | 15-20 | රෝස්මරි | 100 |
| තක්කාලි | 160 | 120 | 90 | 70-80 | | 60-65 | බ්‍රොකෝලි | 1100 |
| බීට්රූට් | 140 | 130 | 90 | 70-80 | 90 | 75-80 | මල්ගෝවා | 850 |
| සලාද | | 200 | 200 | | 145-150 | | රතුරාබු | 450 |
| ගෝවා කොළ | | | 110 | 20-30 | 20 | | පැවර්ලි | 120 |
| **පලතුරු** | | | | | | | සුකිනි | 170 |
| අන්නාසි | 130 | 170 | 130 | 110 | 120 | 110-115 | කහ සුකිනි | 270 |
| ඇඹුල් කෙසෙල් | 130 | 130 | 90 | 70 | 30-60 | | දිගරාබු | 100 |
| කෝලිකුට්ටු | 230 | 200 | 200 | 160 | 140-180 | 160-180 | තක්කාලි | 220 |
| සීනි කෙසෙල් | 140 | 150 | 90 | 80 | 30-65 | 65-70 | මාළුමිරිස් | 270 |
| ඇඹිබුන් | 200 | 190 | 140 | | | | | |
| ගස් ලබු (රෙඩ්ලේඩි) | 140 | 110 | 140 | | | 65-80 | | |
| ගස් ලබු | 200 | 120 | 140 | 150 | 105-110 | | | |
| ඇපල් (ආනයනික) | 60-80 | 210 | 70 | | | | | |
| මිදි (දේශීය) | | | | | | | | |
| මිදි (ආනයනික රතු) | 1100 | 1250 | 950 | | | | | |
| මිදි (ආනයනික කොළ) | 1000 | 1250 | 950 | | | | | - |
| **මස්** | | | | | | | | |
| කුකුළු මස් - අලුත් (සම රහිත) | 600 | 650 | 660 | | | | | - |
| කුකුළු මස් - ශීත කළ (සම සහිත) | 430-520 | 430 | 600 | | | | | - |
| **අනෙකුත්** | | | | | | | | |
| අමු මිරිස් | 300 | 260 | 90 | 180 | 200-220 | | | |
| දෙහි | 140 | 190 | 200 | 70-80 | 30-60 | 60-70 | | |
| අමු ඉඟුරු | | 280 | 200 | | | 150-160 | | |
| **සහල්** | | | | | | | | |
| රතු නාඩු | 110 | 110 | 100 | 100 | | 95-96 | | |
| සුදු නාඩු | 110 | 105 | 100 | 96-99 | | - | | |
| රතු කැකුළු | 100 | 98 | 96 | 90-92 | | - | | |
| සුදු කැකුළු | 100 | 100 | 98 | 92-93 | 91-93 | - | | |
| සුදු කැකුළු සම්බා | | 135 | 120 | 115-116 | 130 | - | | |
| තම්බපු කැකුළු සම්බා | | | 125 | | 130 | - | | |
| කීරි සම්බා | 180 | 170 | 180 | | | - | | |



### දැනගෙන ගන්න රන් මිල

| |
|---|
| කැරට් 21 - 91000 |
| කැරට් 22- 95,333 |
| කැරට් 24- 104000 |

# ජාතික සෞඛ්‍ය විද්‍යායතනය - කළුතර
# ලංසු සඳහා ආරාධනයයි

**කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා ලංසු කැඳවනු ලැබේ**

| අනු අංකය | කොන්ත්‍රාත් විස්තරය | ICTAD අවම ශ්‍රේණිය | මූලික පිරිවැය රුපියල් මිලියන | ලංසු සුරැකුම් වටිනාකම රුපියල් | කොන්ත්‍රාත් කාලය දින | නැවත නොගෙවන ලංසු ලියවිලි ගාස්තු රුපියල් |
|---|---|---|---|---|---|---|
| 01 | ක.සෞ.වි. පුස්තකාලය වැඩිදියුණු කිරීම | C8 or above | 4.95 Million | 99,000.00 | 28 Days | 2,800.00 |
| 02 | PHLT රසායනාගාරය සහ දේශන ශාලාව වායුසමීකරණය කිරීම. | C9 or above | 1.47 Million | 29,500.00 | 28 Days | 2,500.00 |

ඉහත කොන්ත්‍රාත්තු පිළිබඳ සියලු විස්තර ලංසු ලිපි ලේඛන සමග ලබා ගත හැකිය.

2021-04-01 වන දින සිට 2021-04-21 දින දක්වා කාර්යාල වේලාවන් තුළදී (පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා) කළුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනයේ කාර්යාලය වෙතින් ලංසු ලිය කියවිලි ලබාගත හැකිය. 2021-04-22 දින පෙ.ව. 10.30 ට ලංසු විවෘත කරනු ලැබේ.

දුරකතන අංක : 034-2222264/034-2222001 පාලන අංශයේ දිගුව 237/333

**සභාපති,**
**ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව, ජාතික සෞඛ්‍ය විද්‍යායතනය, කළුතර.**

# ටෙන්ඩර් කැඳවීමයි
## වවුනියා නගර සභාව, වවුනියාව

වවුනියාව, වවුනියා නගර සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත උපලේඛනයේ සඳහන් ප්‍රසම්පාදන සඳහා යෝග්‍යතාපූර්ණ කොන්ත්‍රාත්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | වැඩ විස්තරය | ඇස්තමේන්තු ගත වටිනාකම (රු.) | කොන්ත්‍රාත් කාලය | අවශ්‍ය ශ්‍රේණිය | අවශ්‍ය ටෙන්ඩර් ඇපකරය | |
|---|---|---|---|---|---|---|
| | | | | | ඇපකරයේ වටිනාකම | වලංගු කාලය |
| | **කාණ්ඩය-01-2021** | | | | | |
| NP/14/43(2)/ 06/ WD/ CF/07/2021 | වැඩිහිටි පරිශ්‍රය පාරේ නගර සභා තානායම බොරළු දමා තාරදැමීම.<br>වෛරපුලියන්කුලම් දුම්රියපල පාරේ 4 වන පටුමග කොන්ක්‍රීට් කිරීම | මිලියන 2.02 | මාස 03 යි | සී 8 හෝ ඉහළ | 20,500.00 | 2021.07.15 |
| | **කාණ්ඩය 02 -2021** | | | | | |
| NP/14/43(2)/ 06/ WD/ CF/08/2021 | ජෝශප් වාස් පාර ගල් අතුරා තාර දැමීම.<br>සින්නප්පුදුක්කුලම් කුලප්පල්ල වීදියේ ජලාපවහනය | මිලියන 2.95 | මාස 03 යි | සී 8 හෝ ඉහළ | 30,000.00 | 2021.07.15 |
| | **කාණ්ඩය 03-2021** | | | | | |
| NP/14/43(2)/ 06/ WD/ CF/09/2021 | කෝවිල් පුදුක්කුලම් 2 වන පටුමගේ අතුරු මාර්ගය ගල් අතුරා තාර දැමීම.<br>කෝවිල්කුලම් 3 වන පටුමග ගල් අතුරා තාර දැමීම | මිලියන 3.28 | මාස 04 යි | සී 7 හෝ ඉහළ | 33,000.00 | 2021.08.14 |
| | **කාණ්ඩය 04-2021** | | | | | |
| NP/14/43(2)/ 06/ WD/ CF/10/2021 | වේප්පාකුලම් 6 වන පටුමග, 2 වන පටුමගේ (අරබා වීදිය) බෝක්කුව ඉදිකිරීම, තාර දැමීම<br>තිරුච්චෙන්දූර් මෝල පාර, ගල් අතුරා තාර දැමීම | මිලියන 3.59 | මාස 04 යි | සී 7 හෝ ඉහළ | 36,000.00 | 2021.08.14 |
| | **කාණ්ඩය 05-2021** | | | | | |
| NP/14/43(2)/ 06/ WD/ CF/11/2021 | කැට්කුලි 1 වන හරස් පාරේ ඉතිරි වැඩ ගල් අතුරා තාර දැමීම, කාණු ඉදිකිරීම.<br>මූන්රුමුරිප්පු 3 වන පටුමග, ගල් අතුරා තාර දැමීම | මිලියන 2.18 | මාස 03 යි | සී 8 හෝ ඉහළ | 22,000.00 | 2021.07.15 |
| NP/14/43(2)/ 06/ WD/ PSDG/12/2021 | ප්ලාස්ටික් එකතු කරන ගබඩාව ඉදිකිරීම. | මිලියන 2.21 | මාස 03 | සී 8 හෝ ඉහළ | 22,500.00 | 2021.07.15 |

01. මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවේ අංක 04/2016(ii) චක්‍රලේඛය ප්‍රකාරව ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙතින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.
02. ටෙන්ඩර් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ටෙන්ඩර්කරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, උපලේඛනයේ සඳහන් පරිදි නියමිත ශ්‍රේණිය සඳහා මාර්ග හා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය යටතේ ඉක්ටෑඩ් (ICTAD / CIDA) ලියාපදිංචිය ලබා තිබිය යුතුය.
03. සුදුසුකම් අවශ්‍යතා ටෙන්ඩර් ලිපිලේඛනයේ 4 වන කොටසේ සඳහන් කොට ඇත. අමතර තොරතුරු දත්ත උපලේඛනය (Schedule)/ ටෙන්ඩර් ලිපි ලේඛනයේ 5 වන කොටසේ ලබාදී ඇත.
04. මේ සඳහා උනන්දුවක් දක්වන ටෙන්ඩර්කරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ටෙන්ඩර් ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් ආපසු ගෙවනු නොලබන **1,500.00 ක ගාස්තුවක්** (බදු හැර) ගෙවීමෙන් අනතුරුව **2021.03.31 වෙනි දින සිට 2021.04.12** වෙනි දින දක්වා **09.00 පැය හා 15.00 පැය අතර**, වවුනියා නගර සභා කාර්යාලය වෙතින් ලබාගත හැකිය. ගෙවීම් සිදු කළ යුත්තේ මුදලිනි.
05. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුතුව සකස් කොට "**සභාපති, වවුනියා නගර සභාව, වවුනියාව**" යන ලිපිනය වෙත **2021.04.15 වෙනි දින පෙ.ව. 10.30 ට** පෙර ලැබෙන පරිදි එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීමේ වේලාව අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.
06. ටෙන්ඩර් භාරගැනීමේ අවසාන දිනයේ සිට දින 63 ක් (හැට තුනක් 2021.06.17 වෙනි දින දක්වා) ටෙන්ඩර් වලංගු විය යුතුය.
07. ටෙන්ඩර් ඇපකරය ඉහත උපලේඛනයේ සඳහන් පරිදි වේ.
08. පූර්ව ටෙන්ඩර් රැස්වීම **2021.04.07 වෙනි දින ප.ව. 2.30 ට** වවුනියා නගර සභා කාර්යාලයේදී පැවැත්වේ. ඒ පිළිබඳ උනන්දුවක් දක්වන ටෙන්ඩර්කරුවන්ට සහභාගි විය හැක. ඒ සඳහා කිසිදු ගෙවීමක් සිදු කරනු නොලැබේ.
09. වැඩිදුර තොරතුරු කාර්යාල වේලාව තුළදී පැමිණ හෝ දුරකථන අංක : 024-2222275, ෆැක්ස් අංක: 024-2222736 ඔස්සේ සම්බන්ධ වී ලබාගත හැකිය.

**සභාපති, වවුනියාව නගර සභාව, වවුනියාව.**
2021.03.31

# ප්‍රසම්පාදන දැන්වීමයි
## පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව
## උතුරු මැද පළාත

01. උතුරු මැද පළාතේ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මැදවච්චිය ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීම දෙවන අදියර ව්‍යාපෘතිය සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අනු අංකය | විස්තරය | ඇස්තමේන්තු ගත මුදල රුපියල් මිලියන | ලංසු ඇපකරය (රු.) | ලංසු ඇපකරය වලංගු කාලය (දින) | ඉදිකිරීම් කාලය (දින) | ලියාපදිංචි ශ්‍රේණිය |
|---|---|---|---|---|---|---|
| 01 | මැදවච්චිය ඉංජිනේරු කාර්යාලය ඉදිකිරීම දෙවන අදියර | 9.17 | 140,000.00 | 105 | 210 | සී 6 හෝ සී 7 |

02. ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ.

    මෙම ප්‍රසම්පාදනයේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 50 ට වඩා අඩු වන විට, ප්‍රාදේශීය ප්‍රමුඛතාවය සහ CIDA ශ්‍රේණි ප්‍රමුඛතාවය පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක : 2016/13(ii) අනුව අදාළ කරගනු ලැබේ. එසේම 2020/10 සහ 2020/10(i) පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛන ද අදාළ වේ.
03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, ඉහත සඳහා වන වලංගු CIDA ලියාපදිංචිය සපුරා තිබිය යුතුය.
04. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු සහ ලංසු ලිපි ලේඛන අනුරාධපුර, මෛත්‍රිපාල සේනානායක මාවතේ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ගොඩනැගිලි) වෙතින් ලබාගත හැකිය. (දුරකථන අංකය : 025-2225916 / 2226157)
05. එක් එක් ව්‍යාපෘතිය සඳහා ආපසු ගෙවනු නොලබන රු. 3,500.00 ක ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව ප්‍රධාන ගණකාධිකාරී විසින් නිකුත් කරනු ලබන ලදුපත ඉදිරිපත් කිරීමෙන් 2021.04.01 වෙනි දින සිට 2021.04.22 වෙනි දින දක්වා රාජකාරී දිනයන්හි 09.00 පැය හා 15.00 පැය අතර අනුරාධපුරය, හරිස්චන්ද්‍ර මාවතේ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් සිදුකළ යුතුය.
06. ලංසු 2021.04.23 වෙනි දින පෙ.ව.10.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු), පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව, පළාත් පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය, දෙවන මහල, හරිස්චන්ද්‍ර මාවත, අනුරාධපුරය** යන ලිපිනයට ගෙනැවිත් භාරදීමට හෝ එම ලිපිනයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීමට හැකිය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන්වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
07. ලංසු ලිපි ලේඛනයේ සඳහන් දිනය දක්වා ලංසු වලංගු විය යුතුය.
08. සියලුම ලංසු සමග ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් හෝ ඉදිකිරීම් ආරක්ෂණ අරමුදලින් නිකුත් කරන ලද ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය.
09. ඇගයීමේ සහ තෝරාගැනීමේ ක්‍රමය : ලංසු ප්‍රදානය සඳහා ප්‍රමාණවත් ලෙස ප්‍රතිචාර දක්වා ඇතැයි පිළිගත හැකි අවම ලංසුව ලෙස ඇගයීමට ලක්වන ලංසුකරු තෝරාගනු ලැබේ. ප්‍රසම්පාදන කමිටුව විසින් ගනු ලබන තීරණය අවසාන තීරණය වේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව,**
**පළාත් පරිපාලන ගොඩනැගිලි සංකීර්ණය,**
**2 වන මහල,**
**හරිස්චන්ද්‍ර මාවත, අනුරාධපුර.**

# පරිසර අමාත්‍යාංශය
# මධ්‍යම පරිසර අධිකාරිය

පරිසර අධිකාරියේ මාතර , වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය සහ ඌව පළාත් කාර්යාලය සඳහා බදු පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීම සඳහා ලංසු මිල ගණන් කැඳවීම.

මධ්‍යම පරිසර අධිකාරියේ මාතර, වවුනියාව දිස්ත්‍රික් කාර්යාල සහ ඌව පළාත් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා පහත දක්වෙන අවශ්‍යතාවයන්ගෙන් යුතු සුදුසු ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබාදීමට කැමති පුද්ගලයන් /ආයතන වලින් මුද්‍රා තැබූ ලංසු මිල ගණන් මෙයින් කැඳවනු ලැබේ .

| පළාත් / දිස්ත්‍රික් කාර්යාලය | ටෙන්ඩර් අංකය | වර්ග අඩි ප්‍රමාණය | ගොඩනැගිල්ල පිහිටි ස්ථානය | වාහන ගාල් කිරීමේ පහසුකම් | වැසිකිළි සහ නාන කාමර ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| මාතර දිස්ත්‍රික් කාර්යාලය | CEA/Ad/Proc/ RE/107/ 2019 | 4000 ට හෝ ඊට වැඩි<br>**සැ.යු. -** උපරිම මහල් දෙකකින් වර්ග අඩි ප්‍රමාණය සමන්විත විය යුතුය. | මාතර නගරයේ හෝ නගර මධ්‍යයේ සිට කි.මී. 5කට අඩු දුරකින් | වාහන 06ක් ගාල් කළ හැකි විය යුතුය. | 03 ක් හෝ ඊට වැඩි |
| වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය | CEA/Ad/Proc/ RE/25/ 2021 | 1500 ට හෝ ඊට වැඩි | වවුනියාව නගරයේ හෝ නගර මධ්‍යයේ සිට කි.මී. 5කට අඩු දුරකින් | වාහන 02ක් ගාල් කළ හැකි විය යුතුය. | 02 ක් හෝ ඊට වැඩි |
| ඌව පළාත් කාර්යාලය | CEA/Ad/Proc/ RE/26/ 2021 | 5500 ට හෝ ඊට වැඩි | බදුල්ල නගරයේ හෝ නගර මධ්‍යයේ සිට කි.මී. 5කට අඩු දුරකින් | වාහන 06ක් ගාල් කළ හැකි විය යුතුය. | 03 ක් හෝ ඊට වැඩි |

**එකී ගොඩනැගිල්ලේ,**

- ➢ මහජනතාවට හා කාර්යමණ්ඩලයට පහසුවෙන් ළඟාවිය හැකි ස්ථානයක පිහිටා තිබිය යුතුය.
- ➢ ඉඩමේ ඔප්පුව (ඉඩමේ ඔප්පුව අයිතිකරු නමින් පමණක් විය යුතු අතර, ඒ පිළිබඳව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් නිකුත් කරන ලද දින 30ක් ඉක්ම නොවූ පත්‍රිරු මගින් සනාථ කර ඉදිරිපත් කළ යුතුවේ.) හා පිඹුරේ පිටපතක් සහ ඉඩමට ළඟාවිය හැකි මාර්ගයේ දළ සටහනක් ඉදිරිපත්කළ යුතුය.
- ➢ ඉඩමේ ඔප්පුවෙහි සහ ඉඩමේ සැලැස්මෙහි සහතික කරන ලද පිටපත් ලබාදිය යුතුය.
- ➢ ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය ලෙස සටහන් කළ යුත්තේ තරප්පු පේළි, වැසිකිළි සහ නාන කාමරවල වර්ග අඩි ප්‍රමාණය හැර ඉතිරි වර්ග අඩි ප්‍රමාණයයි.
- ➢ අවශ්‍යතාවය මත රජයේ තක්සේරු මිල ලබාගැනීමට එකඟ විය යුතු වේ.
- ➢ වසර 03ක කාලයකට ගොඩනැගිල්ල බදු වශයෙන් ලබාදීමට හැකිවිය යුතු අතර, ප්‍රදානයෙන් පසුව දෙපාර්ශවය විසින් ගිවිසුමකට එළඹිය යුතුවේ.

ඉහත සඳහන් ලියවිලි සහ අවශ්‍යතාවයන් සපුරාලන ගොඩනැගිලි හිමිකරුවන්ට පමණක් අයදුම් කළ හැකි බව දන්වන අතර, අවශ්‍යතාවයන් සහ ලියවිලි ඉදිරිපත් කළ නොහැකි ටෙන්ඩර්පත් ඇගයීම් ක්‍රියාවලියෙන් ඉවත් කරන බවද දන්වනු ලැබේ.

මුද්‍රා තබන ලද ටෙන්ඩර් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව අදාළ ටෙන්ඩර් අංකය හා **"මධ්‍යම පරිසර අධිකාරියේ මාතර, වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය සහ ඌව පළාත් කාර්යාලය සඳහා බදු පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීම"** ලෙස සටහන් කර **ඉල්ලුම්කරුගේ නම, යෝජිත ගොඩනැගිල්ලේ ලිපිනය, දුරකථන අංකය, මිල ගණන් සහ නියමිත පිරිවිතරයන් පිළිබඳ විස්තර** (වර්ග අඩි ප්‍රමාණය, වැසිකිළි ප්‍රමාණය, වාහන ගාල් කළ හැකි ප්‍රමාණය) ඇතුළත් ඉල්ලුම්පත්‍රයක් ඉහත ඉල්ලා ඇති විස්තර සමඟ පහත ලිපිනයට 2021.04.21 දින ප.ව.2.00 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් මධ්‍යම පරිසර අධිකාරියේ පරිපාලන ඒකකයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතුය. ටෙන්ඩර් භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම එදිනම ප.ව. 2.00 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුට හෝ නියෝජිතයකුට එම අවස්ථාවට සහභාගි විය හැක. ප්‍රමාදවී ලැබෙන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ පිළිබඳ වැඩි විස්තර වැ.බ. අධ්‍යක්ෂ (පරිපාලන) වෙතින් ලබා ගත හැකිය. ( දුරකථන අංක 011-7877277 සිට 280 දක්වා)

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව, මධ්‍යම පරිසර අධිකාරිය,**
**අංක 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

සිළුමිණ The Silumina
වට පිට
පල දරන්න - පළ කරන්න
මංගල යෝජනා
දශක ගණනාවක විශ්වසනීය සේවාව...
දැන් වචන 15ක් රු. 560ක් පමණයි...

## පුත්තලම විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### මදුරන්කුලිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021 අප්‍රේල් 24 — 09.00-16.00

තල්ගස්කන්ද, පොත්තුවිල්ලුව, සුපර් ඇක්වාටික් ඉස්සන් ගොවිපල, නාගවිල්ලු පරණ, දේව් ඇක්වා, නාගවිල්ලු නව සී කඳවුර, පොත්තුවිල්ලුව, ආමකුලිය, ප්‍රසාද් කම්පැණි, කැමිලස් වෙන්ඩලන්ඩ් ගොවිපල, කරිකට්ටියාවි, ආර්.එම්.ඒ. ඇක්වා ෆාම්, ඇක්වාටික් එක්ස්පෝර්ට්, දන්ඩවත්ගල මාර්කටින් (ප්‍රයිවට්) ලිමිටඩ්, වීරපුර ප්‍රදේශය, වජිරවත්ත සෙම්බැට්ට, ළමා නිවාසය, මදුරන්කුලිය නව සෙම්බැට්ට, නව සාප්පු සංකීර්ණය, මදුරන්කුලිය, වයඹ ලංකා, ක්‍රිස්ටල් ඇක්වා ෆාම්, ඩී.එස්.පී., තුම්සිම් ෆාම්, වෙල්කම් කල්චර්, තල්ලන්දළුව ජල ව්‍යාපෘතිය, එම්.ඒ.ඒ. හමීල් කොකෝ ලංකා, කඩයාමොට්ටායි නව, කනමුල්ල, කනමුල්ල නව, මිහිරාජපුර, සමීරගම, කඩයාමොට්ටායි කොහු මෝල, කඩයාමොට්ටායි කොහු මෝල නව, පාලසෝලෙ 04, කච්චිමඩුව, පාලසෝලෙ පෙර පාසල 1, පාලසෝලෙ 2 නිමල් වෙළඳපොල, සජානා ස්ටෝර්ස් අසල, පාලසෝලෙ 03 රෙඩ්බානා, මුදලිආර් පුලදිවායල් පාසල, කීලමඩුචේන නව, කීලමඩුචේන, කීලමඩුචේන ජල පොම්පය, මරීනා එස්ටේට්, සඩ්ල් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්, මුක්කුතොඩුවාව, දළුව කජුවත්ත, කජුවත්ත නව, ජල පොම්පය, සිලෝන් ක්‍රැබ් කෘෂිකර්ම.

### නොරොච්චෝලේ පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021අප්‍රේල් 10 — 09.00-16.30

කොයියාවාඩි අර්ෆා නගර්, සමාධිපුර.

2021අප්‍රේල් 19 — 08.30-16.30

අම්මාතෝට්ටම් පල්ලිවාසල්තුරේ, මුසල්පිටිය, පල්ලිවසල්තුරේ -වෙලන්කරේ, පල්ලිවාසල්තුරේ රෙඩ්බානා, පෙරියකඩසන්දි ජල සැපයුම, අක්කර 10, මුසල්පිටිය කෘෂිකර්ම ඉඩම 11, සම්මට්ටාවාඩි නව, කෝෆා නගර්, පතිරාජ ස්ටෝර්ස්, පල්ලිවාසල්තුරේ වෙලන්කරේ 111, පල්ලිවාසල්තුරේ නව, පල්ලිවාසල්තුරේ 1.

2021 අප්‍රේල් 23 — 08.30-16.30

මුදලප්පාලි, මුදලප්පාලි ජල සැපයුම 1, අක්කර 90, අක්කර 90 ජල සැපයුම, අක්කර 90 නව

2021අප්‍රේල් 27 — 08.30-16.30

කුරිඤ්ඤම්පිටිය හන්දිය, කුරිඤ්ඤම්පිටිය කෘෂිකර්ම ගම්මානය, කුඩාව පාර, කමියුනිටි සෙන්ටර්, තේත්තුපිටිය - තිලාඩිය, කන්දකුලිය පල්ලිය, කන්දකුලිය, ඊච්චන්කඩුව ධීවර ගම්මානය, කන්දකුලිය ජල පොම්පය, සීගාඩ් ට්‍රේඩිං කන්දකුලිය, කන්දකුලිය කුඩාව, ඊටෙල් ලංකා ඉම්පෝර්ට් ඇන්ඩ් එක්ස්පෝර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්, සේතුවාඩිය, පුදුකුඩිරිප්පුව ප්‍රදේශය, නවලඩි රෙසිඩන්සීස (ප්‍රයිවට්) ලිමිටඩ්, කන්දකුලිය කුඩාව පාර, කයිට් බීච් විලාස්, කල්පිටිය, ඊච්චන්කාඩු තෝට්ටම් කන්දකුලිය, ද වින්ඩ් බීච් රිසෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2021 අප්‍රේල් 27 — 08.30-16.30

පුලච්චේන, ඉලන්තඩිය බීච්, පුලච්චේන කොලණි, ඉලන්තඩිය ධීවර ගම්මානය, පුලච්චේන පාසල, ඉලන්තඩිය iv

## නාරම්මල විදුලි ඉංජිනේරු බල ප්‍රදේශය

### නාරම්මල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021අප්‍රේල් 01 — 09.00-17.00

ඉහළ කඩදුන්න, කලුදෙනිය, රත්වලගෙදර, පනාගමුව, කුරක්කන්හේනෙගෙදර, වල්ගමුව - පානගමුව, කොටදෙනියාව කොළණි, ස්වර්ණවිමන වෙන්දේසි ඉඩම, මැදගම අලුදේනය, සෙරේකෝ ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්

2021අප්‍රේල් 07 — 09.00-17.00

කීලවලාන දේවාලහන්දිය, බෝගමුල්ල, උඩගෙදර, බෝගමුල්ල බෝගහපිටිය.

2021 අප්‍රේල් 22 — 09.00-17.00

රම්මුතුගල, ඔලියදෙනිය ලී මෝල.

### අලව්ව පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021අප්‍රේල් 03, 11 — 09.00-17.00

හෙනහුන්දෙනිය.

2021අප්‍රේල් 05 — 08.30-16.30

උඩපොලවත්ත හොන්දෙනිය වැව, මාවත්ත, වීරගොල්ල.

2021අප්‍රේල් 06 — 08.30-16.30

ගනේකන්ද, කැබැල්ලවිට, මාබෝපිටිය නව, මාබෝපිටිය, ට්‍රයිස්ටාර් ඇපරල් ගාර්මන්ට් 2, ලංකා එඩියුකේෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්, හුම්බුළුවාව, මාබෝපිටිය, කම්පැක් මොරිසන්ස්, මැල්ලැහැව හුම්බුළුව, පාතයාගල - කොස්හින්න, වැලිහිඳ, හෙණ්ඩුවාව වත්ත, හෙන්ඩුවැව, බෝයවලාන, පැපොල්ගස්හින්න, ඩෙල්මො චිකන ඇග්රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්, ගලදෙනිය, බෝගහවත්ත - ගලදෙනිය, තිරුවන්පොල - ඕතර, තුඹුල්ල, නවතල්වත්ත හන්දිය, හුන්නෙලෙම්බුව, හෙනහුන්දෙනිය, උඩගන්කන්ද, යත්තල්ගොඩ - බෝවල, රත්තෙහෙරුව, බුජ්ජොමුව, කැන්දහේන, මාවත්ත, නල්ලූරේ, ලක්ෂිකා ගල් මෝල, වැරැල්ලාගම, කවිඳු ගල් මෝල, ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝරියම් - ගලදෙනිය, හුම්බුළුව නව, බෝයවලාන - කඩිගමුව.

2021අප්‍රේල් 08,20 — 09.00-17.00

ගල්ගමුව.

2021අප්‍රේල් 21 — 08.30-16.30

වෙන්නොරුව, දම්මැහැර, මොරවලපිටිය, විල්ගමුව වත්ත, වෙන්නොරුව නව, ඉහළ වැත්තැව.

2021අප්‍රේල් 27 — 09.00-17.00

කන්දෙගෙදර, කොස්ගහමඩ, වැලිකරේ, ගල්ගමුව, ගල්ගමුව මැටියගනේ.

### ගිරිඋල්ල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021අප්‍රේල් 06 — 09.00-17.00

පොල් සංවර්ධන මණ්ඩලය, ජේ.බී. ගල් මෝල,බලවල මහගල්කන්ද ගල් මෝල, එලිබිච්චිය දේවාලය, එලිබිච්චිය, පල්ලේගම, ජේ.බී. පෝල්ට්රිල (ප්‍රයිවට්) ලිමිටඩ්,නැහිනිගම්මන, බලවල පන්සල, නිව් ඩෙල්මෝ ෆාම්, නිව්ජෙන් ලංකා හෙල්ත් කෙයාර්, මිරාමා කෝටර්ස් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්, වීරදියාව වත්ත.

2021අප්‍රේල් 06, 24 — 09.00-17.00

දෙගම්මැද්ද, ගල්ගම්මුල්ල, පොත්තේවෙල, කඩහපොලමුල්ල, ගල්ගම්මුල්ල නව, පොත්තේවෙල නව.

2021අප්‍රේල් 29 — 09.00-17.00

බෝපිටිය නව

### නාරම්මල / අලව්ව පාරිභෝගික සේවා මධ්‍යස්ථානය

2021අප්‍රේල් 06 — 08.30-16.30

හාල්වැල්ල, දම්පැලැස්ස හාල් මෝල, කිවුලේගෙදර, රාජපක්ෂ වෙන්දේසි ඉඩම, ගිරාතකන්ද - මැදගමුව, හාල්වැල්ල පන්සල, වීරක්කොඩි බයෝ ෆුවල් (ප්‍රයිවට්) ලිමිටඩ් - දම්පැලැස්ස, දර්ශන ග්‍රැනයිට් ඇන්ඩ් මාර්බල් (ප්‍රයිවට්) ලිමිටඩ්, ගොඩාකුරුව, තලගොල්ල හන්දිය, විල්ගමුව.

2021 අප්‍රේල් 25 — 09.00-17.00

දම්පැලැස්ස හාල් මෝල, කිවුලේගෙදර, රාජපක්ෂ වෙන්දේසි ඉඩම, ගිරාතකන්ද - මැදගමුව, දර්ශන ග්‍රැනයිට් ඇන්ඩ් මාර්බල් (ප්‍රයිවට්) ලිමිටඩ්, වීරක්කොඩි බයෝ ෆුවල් (ප්‍රයිවට්) ලිමිටඩ් - දම්පැලැස්ස, තලගොල්ල හන්දිය, ගොඩාකුරුව, විල්ගමුව.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වයඹ පළාත)**
**ලංකා විදුලිබල මණ්ඩලය,**
**නාරම්මල පාර, අස්වැද්දුම,**
**කුලියාපිටිය.**

*විදුලි බලයෙන් සසිරිමත් දිවියක්*

**ඔබගේ මාසික විදුලි බිල www.ceb.lk වෙබ් අඩවිය මගින් ගෙවිය හැක**

---

## ධීවර අමාත්‍යාංශය
## පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය

## නඩත්තු නිලධාරී සහ ජලනළ කාර්මික තනතුරු සඳහා බඳවා ගැනීම

ධීවර අමාත්‍යාංශය යටතේ කළමනාකරණ භාරයක් මගින් පාලනය වන පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ පුරප්පාඩුව පවතින "**කණිෂ්ඨ කළමනාකාර**" (JM 1-2) සේවා ගණයේ තනතුරක් වන "**නඩත්තු නිලධාරී**" තනතුර සහ ප්‍රාථමික - ශිල්පීය (PL-3) සේවා ගණයේ තනතුරක් වන "ජලනළ කාර්මික" තනතුරු සඳහා බඳවා ගැනීමට මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. "නඩත්තු නිලධාරී" (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 01)

**සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2 හෝ 3 හෝ 4)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු (සිවිල්) උපාධියක් ලබා තිබීම.

හෝ

02. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් සිවිල් / යාන්ත්‍රික / විද්‍යුත් ඉංජිනේරු යන විෂයන් ඇතුළත්ව ලබාගන්නා ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හත්වැනි (07) මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

03. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගන්නා ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) හයවැනි (06) මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහ (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

04. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් ලබාගන්නා ලද ජාතික වෘත්තීය කුසලතාවන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහය (10) ක පළපුරුද්දක් ලබා තිබීම.

**වයස**

අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ දීමනා**

JM 1-2 රු. (43,355-10x755-18x1,135 = 71,335)

### 02. ජලනළ කාර්මික (පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 01)

**අධ්‍යාපන සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයයන් හය (06) කින් සමත් වීම.

සහ

ජලනළ කාර්මික ශිල්පය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (4) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම හා ජලනළ කාර්මික ශිල්පය පිළිබඳ වසර 03 ක සේවා පළපුරුද්දක් තිබීම.

**වයස**

අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි අය විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් පරිමාණය සහ දීමනා**

PL 3 රු. (26,290-10x270-10x300-10x330-12x350 = 39,490/-)

### 03. අයදුම්පත් එවිය යුතු ආකාරය

අයදුම්කරුවන් විසින් සකස් කර ගන්නා ලද අදාළ සියලු තොරතුරු ඇතුළත් අයදුම්පත් 2021.04.27 දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**සභාපති,**
**පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරය,**
**පරිපාලන කාර්යාලය,**
**මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය,**
**පෑලියගොඩ.**

අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරෙහි "**පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණයේ නඩත්තු නිලධාරී තනතුරට / ජලනළ කාර්මික තනතුරට (අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය) බඳවා ගැනීම**" යනුවෙන් සඳහන් කළ යුතු වේ.

නියමිත දින පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. මෙම තනතුරු ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක විය යුතුය. වසර තුනක පරිවාස කාලයකින් පසු ස්ථිර කරනු ලැබේ. ඉහත පුරප්පාඩුව සම්පූර්ණයෙන් පිරවීම හෝ නොපිරවීම පිළිබඳ පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරයේ තීරණය අවසන් තීරණය වේ.

**සභාපති,**
**පෑලියගොඩ මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණ කළමනාකරණ භාරය,**
**පරිපාලන කාර්යාලය,**
**මධ්‍යම මත්ස්‍ය වෙළඳ සංකීර්ණය, පෑලියගොඩ.**
**2021.04.01**

---

## ලංසු සඳහා ආරාධනය - 2021/7

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව, උතුරු පළාත

01. උතුරු පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙනුවෙන්, **දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති** විසින් පහත වගුවේ විස්තර කොට ඇති ඉදිකිරීම් කාර්ය ඉටුකිරීම සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ.
02. **ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය** (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.
03. කොන්ත්‍රාත් ප්‍රදනයට සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසුකරුවා අපලේඛනගතවූ අයකු නොවිය යුතු අතර, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (සීඩා), පහත වගුවේ සඳහන් ශ්‍රේණියේ, ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ලියාපදිංචි වී සිටිය යුතුය.
04. අදාළ සුදුසුකම් අවශ්‍යතා ලංසු ලේඛනයන්හි 4 කොටසේත්, අමතර විස්තර **ලංසු දත්තයන්හි හා කොන්ත්‍රාත් දත්තයන්හිත්** (5 කොටස) සඳහන්ව ඇත.
05. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර **පහත අංක 6 හි සඳහන් ලිපිනයෙන්** ලබාගත හැකි අතර, එම ස්ථානයේදීම, ඕනෑම රාජකාරී දිනයකදී, පෙරවරු 9.00 හා පස්වරු 4.00 අතර කාලය තුළ, ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.
06. පහත වගුවේ සඳහන් ආපසු නොගෙවන ගාස්තු ගෙවීමෙන් හා **නල්ලූර්හි, චෙම්මනි පාරේ උතුරු පළාතේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් **(දුරකථනය - 0212242806 / 0212222219, ෆැක්ස් - 0212241383 / 0212222219)** වගුවේ සඳහන් කාලය තුළ, **පෙරවරු 9.00 සිට පස්වරු 3.00** දක්වා, උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම්, මුදලින්ම කළ යුතුවේ.
07. ලංසු, මුල් පිටපත හා අනුපිටපත ලෙස පිටපත් දෙකක් වශයෙන්, ගෙනැවිත් භාරදීමෙන් හෝ **සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, උතුරු පළාත, චෙම්මනි පාර, නල්ලූර්** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන්, වගුවේ සඳහන් දිනයේ **පෙරවරු** 10.30 ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ ලංසු අංකය සඳහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදාළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.
08. මේ සම්බන්ධ පෙර - ලංසු හමුවක්, **වගුවේ සඳහන් කොට ඇති දිනයේ පෙරවරු** 10.30 ට, **නල්ලූර්හි, චෙම්මනි පාරේ, උතුරු පළාතේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී** පැවැත්වීමට නියමිතය.
09. සියලුම ලංසු සමග වගුවේ සඳහන් කොට ඇති තොරතුරු ප්‍රකාරව ලංසු ඇපකරය බැගින් තිබිය යුතුය.

| වර්ගීකරණය 1 | | |
|---|---|---|
| | ලේඛන නිකුත් කරනු ලබන / මිලදී ගතයුතු කාලය | 2021.04.01 දින සිට 2021.04.15 දින දක්වා |
| | පෙර - ලංසු හමුව | 2021.04.07 දින පෙරවරු 10.30 |
| | ලංසු භාර ගැනීම අවසන් කිරීම හා ලංසු විවෘත කිරීම | 2021.04.16 දින පෙරවරු 10.30 |

| ලංසු අංකය | කාර්ය විස්තරය | ඇස්තමේන්තු ගත පිරිවැය - රුපියල් මිලියන - | කොන්ත්‍රාත් කාලය - දින - | අවශ්‍ය ශ්‍රේණිය | ආපසු නොගෙවන ගාස්තු - රුපියල් - | අවශ්‍ය ලංසු ඇපකරය: ඇපකර මුදල - රුපියල් - | අවශ්‍ය ලංසු ඇපකරය: වලංගු කාලය |
|---|---|---|---|---|---|---|---|
| NP/B/JA/09 (2021) | යා/ඉදෙයිකුරිච්චි ශ්‍රී සුබ්‍රමනියම් විද්‍යාලය - 70x25x2 පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම | 18.30 | 175 | C 6 **හෝ** C 5 (ගොඩනැගිලි) | 5,000.00 | 183,000.00 | 2021.07.29 දින දක්වා |
| NP/B/MU/08 (2021) | මු/තන්නේරුටු HBTMS- 50x25x2 පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම | 12.56 | 147 | C 6 **හෝ** C 5 (ගොඩනැගිලි) | 5,000.00 | 126,000.00 | 2021.07.29 දින දක්වා |
| NP/B/MU/09 (2021) | මු/කරිප්පඩ්ඩමුරිප්පු G.T.M.S.- 70x25x2 පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම | 18.30 | 175 | C 6 **හෝ** C 5 (ගොඩනැගිලි) | 5,000.00 | 183,000.00 | 2021.07.29 දින දක්වා |
| NP/B/MU/10 (2021) | මු/ඉයන්කන්කුලම මහා විද්‍යාලය - 70x25x2 පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම | 18.30 | 175 | C 6 **හෝ** C 5 (ගොඩනැගිලි) | 5,000.00 | 183,000.00 | 2021.07.29 දින දක්වා |
| NP/B/MN/04 (2021) | මඩු කලාපයේ විධායක නිල නිවාස ඉදිකිරීම | 12.04 | 147 | C 6 **හෝ** C 5 (ගොඩනැගිලි) | 5,000.00 | 121,000.00 | 2021.07.29 දින දක්වා |
| NP/PDE/CBG/ 2021/16 | යාපනය නල්ලූර් හි ළමාරක්ෂක මධ්‍යස්ථානය හා පෙර පාසල ඉදිකිරීම | 10.65 | 120 | C 6 **හෝ** C 5 (ගොඩනැගිලි) | 5,000.00 | 107,000.00 | 2021.07.29 දින දක්වා |

| වර්ගීකරණය 2 | | |
|---|---|---|
| | ලේඛන නිකුත් කරනු ලබන / මිලදී ගතයුතු කාලය | 2021.04.01 දින සිට 2021.04.21 දින දක්වා |
| | පෙර - ලංසු හමුව | 2021.04.12 දින පෙරවරු 10.30 |
| | ලංසු භාර ගැනීම අවසන් කිරීම හා ලංසු විවෘත කිරීම | 2021.04.22 දින පෙරවරු 10.30 |

| ලංසු අංකය | කාර්ය විස්තරය | ඇස්තමේන්තු ගත පිරිවැය - රුපියල් මිලියන - | කොන්ත්‍රාත් කාලය - දින - | අවශ්‍ය ශ්‍රේණිය | ආපසු නොගෙවන ගාස්තු - රුපියල් - | අවශ්‍ය ලංසු ඇපකරය: ඇපකර මුදල - රුපියල් - | අවශ්‍ය ලංසු ඇපකරය: වලංගු කාලය |
|---|---|---|---|---|---|---|---|
| NP/B/JA/10 (2021) | යා/තම්බසිඩ්ඩි MMTMS - 85x30x2 පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම | 23.00 | 203 | C 6 **හෝ** C 5 (ගොඩනැගිලි) | 5,000.00 | 230,000.00 | 2021.08.04 දින දක්වා |
| NP/B/JA/11 (2021) | යා/කරනවායි තමෝදර විද්‍යාලය - 110x30x2 පංති කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම | 28.20 | 217 | C 6 **හෝ** C 5 (ගොඩනැගිලි) | 10,000.00 | 282,000.00 | 2021.08.18 දින දක්වා |

ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය (NCB) තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ. ඉටුකළ යුතු මෙම කාර්යයේ ඇස්තමේන්තුගත වටිනාකම (වැට් හා අනෙකුත් බදු හැර) රුපියල් මිලියන 50 කට අඩු හෙයින්, රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක 04/2016(iii) හි නිර්දිෂ්ට ප්‍රාදේශීය ප්‍රමුඛතාව හා සීඩා ශ්‍රේණි ප්‍රමුඛතාව අදාළ වේ. එසේම, 2020.10.09 හා 2021.01.11 දිනැති රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ පිළිවෙළින් අංක 03/2020 හා අංක 03/2020 (i) යොදා ගනු ඇත.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,**
**උතුරු පළාත.**

# ලංසු කැඳවීම

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD

| 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|
| අංශය | ලංසු යොමු අංකය / අයිතම විස්තරය හා ප්‍රමාණය | ලංසු භාර ගන්නා අවසාන දිනය හා වේලාව | ලංසු පොත් මිලදී ගත හැකි කාර්යාලය සහ අදාළ අංකය | ලංසු පොතෙහි මිල (රුපි.) | ලංසු වර්ගය ICB/ NCB |
| **අමුද්‍රව්‍ය** | | | | | |
| ජනන (ලක්විජය විදුලි බලාගාරය) | LV/T/2021/0052<br>ඉංජිනේරුවන්, මධ්‍යම මට්ටමේ කාර්මික කාර්ය මණ්ඩලය සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා ආරක්ෂිත රෙදි මිලදී ගැනීම හා සැපයීම. | 28/04/2021 14.00 පැය | ප්‍රසම්පාදන අංශය, 4 වන මහල, පරිපාලන ගොඩනැගිල්ල, ලක්විජය විදුලි බලාගාරය , ලංකා විදුලිබල මණ්ඩලය, නාරක්කල්ලිය, නොරොච්චලෙයි 61342. TP : 032 226 8972 Fax: 032 226 8975 | 7,000.00 | NCB |
| සම්ප්‍රේෂණ (ව. ක. හා ත. අ.) | TR/AM&CM/NCB/2021/09/D<br>සම්ප්‍රේෂණ අංශයට අයත් භාවිතයට ගනු නොලබන අබලි ද්‍රව්‍ය මිලදී ගෙන ඉවත් කර ගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම - සම්ප්‍රේෂණ (මෙහෙයුම් සහ නඩත්තු) දක්ෂිණ ඒකකය | 05/05/2021 10.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වත්කම් කළමනාකරණ හා තත්ව අධීක්ෂණ (සම්ප්‍රේෂණ) කාර්යාලය, ලං.වි.ම., කෙත්ට් පාර, කොළඹ 09. (අබලි ද්‍රව්‍ය බැලීම සහ වැඩි විස්තර සඳහා අමතන්න) දු.ක: 011-2663723, 011- 2669738 ෆැක්ස්: 011-2669738 | 1,000.00 | NCB |
| බෙ.අ. 01 (වයඹ -02) | CEB/NWP2/NCB/G/21/0032<br>ඩෙස්ක්ටොප් පරිගණක 25 ක් සැපයීම සහ ප්‍රවාහනය | 22/04/2021 10.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය (වයඹ -02), ලංකා විදුලිබල මණ්ඩලය, නො.25, රජපිහිල්ල පාර, කුරුණෑගල. දු.ක: 037- 2065498 ෆැක්ස්: 037- 2065497 | 1,000.00 | දේශීය |
| බෙ.අ. 01 (කොළඹ නගරය) | DGM(CC)/EE(MM)/PPC/2021/019<br>Supply & Delivery of Heat Shrinkable Cable End Cap, Cast Resin Branch Type Jointing Kit, End Termination Kit, Straight Through Jointing Kit, Transition Jointing Kit & Cable Outer repair Kit | 21/04/2021 10.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගරය) කාර්යාලය, සිව්වන මහල, ලක්ෂ්මන් ගොඩනැගිල්ල 340, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03 මගින් 2021-04-20 දිනට පෙර දුරකථන : 011-2575930 | 3,500.00 | දේශීය |
| බෙ.අ. 01 (කොළඹ නගරය) | DGM(CC)/EE(MM)/PPC/2021/022<br>Supply & Delivery of Cables | 21/04/2021 10.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 01 (කොළඹ නගරය) | DGM(CC)/EE(MM)/PPC/2021/023<br>Supply & Delivery of PVC Pipes | 21/04/2021 10.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 01 (කොළඹ නගරය) | DGM(CC)/CE(C&CS)/PPC/2021/005<br>Supply, Delivery & Installation of 07 No. of Cash Counting Machines to Colombo City | 21/04/2021 10.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (නැගෙනහිර) | DGM [E]/QPPC/21/106<br>වාලච්චේන ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය සඳහා කාර්යාලීය ගෘහ භාණ්ඩ (පුටු, අල්මාරි, මේස) සැපයීම හා ස්ථාපනය කිරීම. | 28/04/2021 14.00 පැය | ප්‍රාදේශීය ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය (මඩකලපුව), 065-2222639 හෝ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර කාර්යාලය), ත්‍රිකුණාමලය. 026-2222666 026-2221030 | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (මධ්‍යම)1 | CP1/CE(COM)/PPC/2021/036<br>මධ්‍යම පළාත 1 ඒකකය සඳහා මනුරු වානේ පෙට්ටි තෙකලා (Steel Boxes for Housing Direct Connected 3 Phase Meters)-1250ක් සපයා දීම. | 21/04/2021 14.00 පැය | ප්‍ර.ඉ. (වාණිජ) කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, අංක 04, අස්ගිරිය පාර, මහනුවර. දු.අ. 081-2234324 | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (මධ්‍යම)1 | CP1/CE(COM)/PPC/2021/060<br>මධ්‍යම පළාත 1 ඒකකය සඳහා Line Matrix Printers 03 ක් සපයා දීම. | 21/04/2021 14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ. 04 (බපද - 1) | ඩබ්පීඑස්-1/පීපීසී/ටී/2021/40<br>මනුරු වානේ පෙට්ටි - බෙදාහැරීම් උපපොළ (Meter Enclosure Steel - Distribution Substation) සපයා, ගෙනවිත් භාරදීම 400 එකු | 22/04/2021 10.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී ( බස්නාහිර පළාත දකුණ-1) කාර්යාලය, බෙදාහැරීම් අංශ - 4 මූලස්ථානය, 3වන මහල, ලංකා විදුලිබල මණ්ඩලය, අංක: 25, නගරසභා පටුමග, දෙහිවල. 011-2638852 | 1,500.00 | NCB |
| **ඉදිකිරීම්** | | | | | |
| බෙ.අ. 02 (නැගෙනහිර) | DGM [E]/QPPC/21/107<br>යෝජිත වාලච්චේන ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය තුළ ඇලුමිනියම් මගින් කොටස් වෙන්කර ගැනීම (Partition Works). | 21/04/2021 14.00 පැය | ප්‍රාදේශීය ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය (මඩකලපුව), 065-2222639 හෝ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර කාර්යාලය), ත්‍රිකුණාමලය. 026-2222666 026-2221030 | 1000.00 | NCB |
| **සේවා** | | | | | |
| ජනක (තාපබල සංකීර්ණය) | TC/KPS/LOCAL/ME (GT-07)/2021-22<br>කැළණිතිස්ස විදුලි බලාගාරය සඳහා අවුරුද්දක කාලයකට ඉංජිනේරු නිල නිවසක් (විවාහක) කුලී පදනම මත ලබා ගැනීම. | 15/04/2021 10.00 පැය | ප්‍රධාන ඉංජිනේරු, කැළණිතිස්ස විදුලි බලාගාරය, නව කැළණි පාලම පාර, 10600, කොළොන්නාව. දු.ක.: 0112433397 | අදාළ නැත | දේශීය |
| බෙ.අ. 01 (වයඹ -02) | CEB/NWP2/NCB/LB/21/0025<br>ගිරිඋල්ල විදුලි පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සඳහා කුලී පදනම මත ගොඩනැගිල්ලක් ලබා ගැනීම | 22/04/2021 10.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය (වයඹ -02), ලංකා විදුලිබල මණ්ඩලය, නො.25, රජපිහිල්ල පාර, කුරුණෑගල. දු.ක: 037- 2065498 ෆැක්ස්: 037- 2065497 | 1,000.00 | දේශීය |
| බෙ.අ. 01 (වයඹ -02) | CEB/NWP2/NCB/LB/21/0026<br>කුරුණෑගල නගරයේ විදුලි අධිකාරී නිල නිවස සඳහා ගොඩනැගිල්ලක් සහිත ඉඩමක් කුලී පදනම මත ලබා ගැනීම | 22/04/2021 10.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 01 (වයඹ -02) | CEB/NWP2/NCB/HV/21/0027<br>නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය (වයඹ -2) සඳහා කොන්ත්‍රාත් පදනම මත ආරක්ෂක සේවාව ලබා ගැනීම | 22/04/2021 10.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 01 (වයඹ -02) | CEB/NWP2/NCB/HV/21/0028<br>ගිරිඋල්ල විදුලි පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සඳහා කුලී පදනම මත ත්‍රී රෝද රථයක් ලබා ගැනීම | 22/04/2021 10.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 01 (වයඹ -02) | CEB/NWP2/NCB/HV/21/0029<br>නාරම්මල විදුලි පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සඳහා කුලී පදනම මත ත්‍රී රෝද රථයක් ලබා ගැනීම | 22/04/2021 10.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 01 (වයඹ -02) | CEB/NWP2/NCB/HV/21/0030<br>මල්ලවපිටිය විදුලි පාරිභෝගික සේවා මධ්‍යස්ථානය සඳහා කුලී පදනම මත ත්‍රී රෝද රථයක් ලබා ගැනීම | 22/04/2021 10.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 01 (කොළඹ නගරය) | DGM(CC)/CE(C&CS)/PPC/2021/012<br>කොළඹ නගර කාර්යාලයේ නැතිම් ඒකකයහි යටි බහන් එලීම සඳහා ABC හා ගල්කුඩු ලබා ගැනීම (වසර 02 ක් සඳහා) | 21/04/2021 10.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගරය) කාර්යාලය, සිව්වන මහල, ලක්ෂ්මන් ගොඩනැගිල්ල 340, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03 මගින් 2021-04-20 දිනට පෙර දුරකථන : 011-2575930 | 1,000.00 | දේශීය |
| බෙ. අ. 01 (ව්‍යා. හා බැ. න.) | CE(P&HM)DD1/T/LB/2020/03<br>වැඩබිම් කාර්යාලයක් සඳහා කුරුණෑගල, නගරය අවට්ත් ගොඩනැගිල්ලක් වසර දෙකක කාලයකට බද්දට ගැනීම.<br>(ගොඩනැගිලි විස්තරය : වර්ග අඩි 2000, ලොරි දෙකක් නැවතීමේ පහසුකම්, අවම නිදන කාමර තුනක්, අඩි 15 පලළ පිවිසුම් මාර්ගය ) | 22/04/2021 14.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති හා බැර නඩත්තු) බෙ. අ. 1, ලංකා විදුලිබල මණ්ඩලය, නො.288, නුවර පාර, කුරුණෑගල. 037- 222 9151 | 500.00 | දේශීය |
| බෙ. අ. 01 (SESRIP) | PD(SESRIP)DD1/T/LB/2021/01<br>SESRIP කළමණාකරණ ඒකක කාර්යාලය සඳහා කුරුණෑගල අවට්ත් ගොඩනැගිල්ලක් බද්දට ගැනීම | 15/04/2021 14.00 පැය | SESRIP ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, ලංකා විදුලිබල මණ්ඩලය, නො.218, අලුත් මල්කඩුවාව, බමුණාවල, කුරුණෑගල. දු.ක.: 037- 2227595 ෆැක්ස් 037- 2227595 | | |
| බෙ.අ. 02 (මධ්‍යම 2) | CP2/CE(COM)/PPC/2021/041<br>ගණකාධිකාරී (වියදම්) -මධ්‍යම පළාත 2 සඳහා වසර දෙකක කාලයකට කුලී පදනම යටතේ මෝටර් කාර් රථයක් ලබා ගැනීම | 21/04/2021 14.00 පැය | ප්‍ර.ඉ. (වාණිජ) - මප 02 කාර්යාලය, ලංකා විදුලිබල මණ්ඩලය, ගල්වල පාර, ඊරියගම, පේරාදෙණිය. දු.අ. 081-4949160 | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (මධ්‍යම 2) | CP2/CE(COM)/PPC/2021/042<br>ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු පේරාදෙණිය බල ප්‍රදේශයට අයත් පා.සේ.ම. ගලහා සඳහා වසර දෙකක කාලයකට(4WD) ඩබල් කැබ් රථයක් ලබා ගැනීම | 21/04/2021 14.00 පැය | එම | 1,000.00 | NCB |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/SEC-NEG/2021/146<br>පෞද්ගලික ආරක්ෂක සේවය සපයා ගැනීම. ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය - මීගමුව | 16/04/2021 14.00 පැය | නි.සා. (බපට) කාර්යාලය, ලං.වි.ම., නො. 280, නුවර පාර, කිරිබත්ගොඩ. දු.ක. 011-2911071/72 | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/SEC-VEY/2021/147<br>පෞද්ගලික ආරක්ෂක සේවය සපයා ගැනීම. ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය - වේයන්ගොඩ | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/D-V86/2021/22<br>කුලී පදනම මත කෲ කැබ් රථයක් ලබා ගැනීම. ප්‍රාදේශීය නඩත්තු ඒකකය- විදුලි ඉංජිනේරු (දිවුලපිටිය) | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/K-V135/2021/43<br>කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම. ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය - කැලණිය | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/N-V160/2021/44<br>කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම. ප්‍රාදේශීය නඩත්තු ඒකකය- ප්‍රධාන ඉංජිනේරු (මීගමුව) | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/Con-V21/2021/47<br>කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම. නිට්ටඹුව වැඩ බිම- ප්‍රධාන ඉංජිනේරු (නැතිම්) | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/DM-V25/2021/60<br>කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම. වේයන්ගොඩ වැඩබිම -ප්‍රධාන ඉංජිනේරු (බෙදාහැරීම් නඩත්තු) ඒකකය | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/J-V129/2021/62<br>කුලී පදනම මත කෲ කැබ් රථයක් ලබා ගැනීම. ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය (ජාඇල) | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/DGM-V10/2021/63<br>කුලී පදනම මත කාර් රථයක් ලබා ගැනීම. ප්‍රධාන විදුලි ඉංජිනේරු කාර්යාලය (බලශක්ති කළමණාකරණ) | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/DGM –V01/2021/73<br>කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම.ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/J –V130/2021/91<br>කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම. ප්‍රාදේශීය නඩත්තු ඒකකය- ප්‍රධාන ඉංජිනේරු (ජාඇල) | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/V –V108/2021/98<br>කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම. පාරිභෝගික සේවා මධ්‍යස්ථානය (වේයන්ගොඩ) | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/J –V147/2021/117<br>කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම. පාරිභෝගික සේවා මධ්‍යස්ථානය (රාගම) | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/P&D –V55/2021/148<br>කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම. ප්‍රධාන ඉංජිනේරු (සැලසුම් හා සංවර්ධන) කාර්යාලය | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 02 (බපට) | WPN/NCB/P&D –V78/2021/149<br>කුලී පදනම මත වෑන් රථයක් ලබා ගැනීම. බෙදාහැරීම් පාලන මධ්‍යස්ථානය- ප්‍රධාන ඉංජිනේරු (සැලසුම් හා සංවර්ධන) ඒකකය | 16/04/2021 14.00 පැය | එම | 1,000.00 | දේශීය |
| බෙ.අ. 03 (ඌව) | DGM(UVA)/CE(COM)/DEO1/HV-78/DGM-17/2K21/14<br>ප්‍රධාන ඉංජිනේරු (සැලසුම් හා සංවර්ධන - ඌව) ඒකකයේ විදුලි ඉංජිනේරු (සැලසුම්) සඳහා කුලී පදනම මත වසර දෙකක් සඳහා මෝටර් රථයක් ලබාගැනීම | 21/04/2021 15.00 පැය | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඌව) ශාඛාව, ප්‍රධාන ඉංජිනේරු (වාණිජ) ඒකකය ලංකා විදුලිබල මණ්ඩලය, අංක . 04, ස්ප්‍රිංවැලි පාර, හිඳගොඩ, බදුල්ල. දු.ක : 0552222474 | 500.00 | දේශීය |
| බෙ.අ. 03 (ඌව) | DGM(UVA)/CE(COM)/DEO1/HV-127/BD-21/2K21/15<br>ප්‍රධාන ඉංජිනේරු (බදුල්ල) ඒකකයේ විදුලි අධිකාරී (හාලිඇල පා.සේ.ම.) සඳහා කුලී පදනම මත වසර දෙකක් සඳහා 4 Wheel ඩබල්කැබ් රථයක් ලබාගැනීම | 21/04/2021 15.00 පැය | එම | 500.00 | දේශීය |

# ලංසු සඳහා ආරාධනයයි (2021/01)

## පළාත් පාලන අමාත්‍යාංශය
## උතුරු පළාත

01. උතුරු පළාතේ පළාත් පාලන අමාත්‍යාංශය වෙනුවෙන් පළාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත වගුවේ විස්තර කොට ඇති ඉදිකිරීම් කර්මාන්ත සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. ජාතික තරඟකාරී ලංසුකරණ පරිපාටිය මඟින් ලංසු මෙහෙයවනු ලැබේ.

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛනගත නොවී සිටිය යුතු අතර, පහත වගුවේ සඳහන් ශ්‍රේණි සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

04. සුදුසුකම් අවශ්‍යතා ලංසු ලිපි ලේඛනයේ 4 වන කොටසේ සඳහන් කොට ඇත. අතිරේක විස්තර ලංසු දත්ත සහ කොන්ත්‍රාත් දත්තවල (5 වන කොටසේ) ලබා දී ඇත.

05. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු පහත 6 සඳහන් ලිපිනය වෙතින් ලබා ගත හැකි අතර, එම ස්ථානයේදී ඕනෑම රාජකාරී දිනක **පෙ.ව. 9.00 සහ ප.ව. 4.00 අතර** ලංසු ලිපි ලේඛන පරීක්ෂා කර බැලිය හැක.

06. පහත වගුවේ සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව මුදලින් පහත වගුවේ සඳහන් කාලසීමාව තුළ **පෙ.ව. 9.00 සහ ප.ව. 3.00** අතර කයිතඩි, ඒ 9 පාර, උතුරු පළාත, පළාත් පාලන අමාත්‍යාංශය (දු.ක. 021-2057114, ෆැක්ස් 021-2057120) වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැක.

07. ලංසු **(මුල් පිටපත හා අනුපිටපත)**, පහත වගුවේ සඳහන් දිනයේ පෙ.ව. 10.30 ට හෝ ඊට පෙර ලැබෙන පරිදි "**සභාපති, පළාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, පළාත් පාලන අමාත්‍යාංශය, උතුරු පළාත, ඒ 9 පාර. කයිතඩි**" යන ලිපිනය වෙත ගෙනැවිත් භාර දීමට හෝ ලියාපදිංචි තැපැල් මඟින් එවීමට හැකිය. ලංසු අංකය කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

08. පූර්ව ලංසු රැස්වීමක් පහත වගුවේ සඳහන් දිනයේ පෙ.ව. 10.30 ට කයිතඩි, ඒ 9 පාර, උතුරු පළාත, පළාත් පාලන අමාත්‍යාංශයේදී පැවැත්වේ.

09. ලංසු සමග පහත වගුවේ ලබාදී ඇති තොරතුරු ප්‍රකාර වූ ලංසු ඇපකරයක් අමුණා එවිය යුතුය.

| කාණ්ඩය | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ලංසු ලිපිලේඛන නිකුත් කරන / මිලදීගත හැකි කාලසීමාව | | | 2021.03.31 වෙනි දින සිට 2021.04.20 වෙනි දින දක්වා | | | |
| | පූර්ව ලංසු රැස්වීම | | | 2021.04.12 වෙනි දින පෙ.ව. 10.30 ට | | | |
| | ලංසු භාරගැනීමේ අවසානය / විවෘත කිරීම | | | 2021.04.21 වෙනි දින පෙ.ව. 10.30 ට | | | |
| ලංසු අංකය | වැඩ විස්තරය | ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන | කොන්ත්‍රාත් කාලය | අවශ්‍ය ශ්‍රේණිය | ආපසු ගෙවනු නොලබන ගාස්තුව | අවශ්‍ය ලංසු ඇපකරය: ඇපකරයේ වටිනාකම | අවශ්‍ය ලංසු ඇපකරය: වලංගු කාලය |
| NP/B/KI/10 (2021) | කිලිනොච්චියේ උතුරු පළාත් මගී ප්‍රවාහන අධිකාරිය සඳහා දෙමහල් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 44.90 | දින 231 යි | සී 5 හෝ සී 4 (ගොඩනැගිලි) | 10,000.00 | 449,000.00 | 2021.08.17 වෙනි දින දක්වා |

"ජාතික තරගකාරී ලංසුකරණ පරිපාටිය මගින් ලංසු මෙහෙයවනු ලැබේ. මෙම ප්‍රසම්පාදනය යටතේ ඉටුකරනු ලබන කර්මාන්තයේ ඇස්තමේන්තුගත වටිනාකම (වැට් හා අනෙකුත් බදු හැර) රු. මිලියන 50 ට අඩු බැවින් අංක 04/2016(iii) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය සහ පිළිවෙළින් 2020.10.09 සහ 2021.01.11 දතම අංක 03/2020 සහ අංක 03/2020(i) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රාදේශීය ප්‍රමුඛතාවය සහ CIDA ශ්‍රේණි ප්‍රමුඛතාවය අදාළ වනු ඇත.

**සභාපති, පළාත් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**පළාත් පාලන අමාත්‍යාංශය,**
**උතුරු පළාත.**

NLB
NATIONAL LOTTERIES

## ජාතික ලොතරැයි මණ්ඩලය
### මුදල් අමාත්‍යාංශය
## ලංසු සඳහා ආරාධනයයි

### ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා පිඟන් කට්ටල (ඩිනර් සෙට්) 40 ක් සහ තේ කෝප්ප කට්ටල (ටී සෙට්) 150 ක් සැපයීම සඳහා වන ප්‍රසම්පාදනය

දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC) වෙනුවෙන් එහි සභාපති විසින් ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා පිඟන් කට්ටල (ඩිනර් සෙට්) 40 ක් සහ තේ කෝප්ප කට්ටල (ටී සෙට්) 150 ක් සැපයීම සඳහා යෝග්‍යතා පූර්ණ සහ සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අයිතමයේ නම | ලංසු අංකය | ප්‍රමාණය | ලංසු ඇපකරයේ වටිනාකම (රු.) | ලේඛන ගාස්තුව (රු) (ආපසු ගෙවනු නොලබන) (වැට් සහිතව) |
|---|---|---|---|---|
| ඩිනර් සෙට් | NLB/SUP/15/Set of Plates-2020/09/02 | 40 | 30,000.00 | 1,000.00 |
| ටී සෙට් | NLB/SUP/15/Tea Set - 2020/09/03 | 150 | 45,000.00 | 1,500.00 |

ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය යටතේ ලංසු මෙහෙයවනු ලැබේ.

මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන් හට අවශ්‍ය වැඩිදුර තොරතුරු කොළඹ 01, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, අංක 32 පිහිටි ජාතික ලොතරැයි මණ්ඩලයේ, 01 වන මහලේ ප්‍රසම්පාදන අංශයේ සහකාර සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන) වෙතින් (දුරකථන : 0114607020) ලබාගත හැකි අතර, පහත සඳහන් කර ඇති කාල සීමාව තුළ ඕනෑම රාජකාරී දිනයකදී පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ පහත සඳහන් ලිපිනයේ දී ලංසු ලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

ඉහත සඳහන් ආපසු ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව 2021.04.01 දින සිට 2021.04.21 දින දක්වා ඕනෑම රාජකාරී දිනයක පෙ.ව. 9.00 හා ප.ව. 3.00 අතර කාලය තුළ පහත සඳහන් ලිපිනය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම් මුදලින් සිදු කළ යුතුය.

මුද්‍රා තබන ලද ලංසු, 2021.04.22 වෙනි දින ප.ව. 2.30 ට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත යොමු කළ යුතු වේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ කොළඹ 01, ජාතික ලොතරැයි මණ්ඩලයේ 5 වන මහලේ පරිපාලන අංශයේදී ලංසු විවෘත කරනු ලැබේ. ලංසු සමග ඉහත සඳහන් කර ඇති පරිදි ලංසු ඇපකරයක් අමුණා එවිය යුතු අතර, ලංසු ඇපකරය 2021.07.22 දින දක්වා වලංගු විය යුතුය.

ලංසු මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම් පස ඉහළ කෙළවරේ "(අයිතමයේ නම) සැපයීම සඳහා වූ ලංසුව (ලංසු අංකය) සඳහන් කර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල මගින් එවීමට හෝ අතින් ගෙනැවිත් භාරදීමට හැකිය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ජාතික ලොතරැයි මණ්ඩලය,**
**අංක 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.**


දැන්වීම් කාර්යාල

සියලුම ලේක්හවුස් ප්‍රකාශන සඳහා දැන්වීම් බාරගැනීම, පුවත්පත් ඇනවුම් බාරගැනීම සහ කතරගම විශ්‍රාම ශාලාව වෙන්කරවා ගැනීමට.

මහනුවර ශාඛා කාර්යාලය
මහනුවර
නො 22, දළදා වීදිය, මහනුවර
081 223 4200

අනුරාධපුර ශාඛා කාර්යාලය
අනුරාධපුර
හරිස්චන්ද්‍ර මාවත, බැංකු පෙදෙස
025 222 2370

මාතර ශාඛා කාර්යාලය
මාතර
නො 29, ප්‍රධාන බස් නැවතුම් පොළ උඩුමහල
041 223 5412

නුගේගොඩ ශාඛා කාර්යාලය
නුගේගොඩ
සච්සිරි වෙළඳ සංකීර්ණය 4 වන මහල, හයිලෙවල් පාර, නුගේගොඩ
011 282 8114

යාපනය ශාඛා කාර්යාලය
යාපනය
නො 06, සිරම්බියඩි මාවත, ස්ටැන්ලි පාර
021 222 5361

මරදාන ශාඛා කාර්යාලය
මරදාන
නො 383, ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
011 242 9336

කතරගම ශාඛා කාර්යාලය
කතරගම
ප්‍රධාන බස් නැවතුම්පොළ ඉදිරිපිට ටූස්සදේව මාවත, කතරගම
047 223 5291

LAKE HOUSE
සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, ඩී ආර් විජේවර්ධන මාවත, කොළඹ 10
1949, 011 242 9342, 011 242 9333


## කර්මාන්ත අමාත්‍යාංශය
## ලංකා මිනරල් සෑන්ඩ්ස් ලිමිටඩ් (LMSL)

### LMSL වෙත, බ්‍රෑන්ඩ් නිව් ඩබල් කැබ් රථ 03 ක් සහ බ්‍රෑන්ඩ් නිව් වෑන් රථයක් - බ්‍රෑන්ඩ් නිව් මෝටර් රථයක් සැපයීම හා ගෙනැවිත් භාරදීම

01. රාජගිරිය, සරණ මාවත, 341/21, ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් LMSL වෙත බ්‍රෑන්ඩ්නිව් ඩබල් කැබ් රථ 03 ක්, බ්‍රෑන්ඩ් නිව් වෑන්රථයක් සහ බ්‍රෑන්ඩ් නිව් මෝටර් රථයක් සැපයීම හා ගෙනැවිත් භාරදීම සඳහා මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

| අයිතම අංකය | භාණ්ඩ පිළිබඳ විස්තර | අවශ්‍ය ලංසු සුරක්ෂණය (රු.) |
|---|---|---|
| 01 | බ්‍රෑන්ඩ් නිව් ඩබල් කැබ් රථ තුනක් | 300,000.00 |
| 02 | බ්‍රෑන්ඩ් නිව් හයිරූෆ් වෑන් රථ | 100,000.00 |
| 03 | බ්‍රෑන්ඩ් නිව් මෝටර් රථයක් | 80,000.00 |

02. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය මගින් මෙහෙය වනු ලැබේ.

03. යෝග්‍යතාපූර්ණ අභිලාෂී ලංසුකරුවන්ට රාජගිරිය, සරණ මාවත, 341/21, ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් හි සැපයුම් කළමනාකරු වෙතින් වැඩිමනත් තොරතුරු ලබාගැනීමටත් 2021-04-01 දින සිට 2021-04-20 දින තෙක් ඕනෑම වැඩ කරන දිනයකදී 09.00 පැය සිට 15.00 පැය දක්වා එම ලිපිනයේදීම ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලීමටත් පිළිවන.

ඇමතුම් අංක : 011-2882025/2883951/2883952

04. රාජගිරිය, සරණ මාවත, 341/21, ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්හි සැපයුම් කළමනාකරුගේ කාර්යාලය වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ආපසු නොගෙවන රුපියල් පන්දහසක (රු. 5000/-) ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව 2021-04-01 දින සිට 2021-04-20 දින දක්වා 09.00 පැය සිට 15.00 පැය දක්වා ඉංග්‍රීසි බසින් වන ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් අභිලාෂී ලංසුකරුවන්ට මිල දී ගත හැකිය.

05. අනු පිටපතකින් යුත් මුද්‍රා තැබූ ලංසු 2021-04-21 දින 14.30 පැයට හෝ ඊට පෙර, රාජගිරිය, සරණ මාවත, 341/21, ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් බාරේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති වෙත ගෙනැවිත් භාරදිය යුතුය. නැතහොත් එම කාර්යය සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගිවීමට කැමැති, ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු භාර ගැනීමේ අවසාන වේලාව ඉකුත් වූ වහාම ලංසු විවෘත කෙරේ.

06. මිලගණන්/ ලංසු දින 91 කට වලංගු විය යුතුය.

07. සියලුම ලංසු සමග ඉහත සඳහන් කර ඇති පරිදි 2021-04-21 දින සිට 2021-08-04 දින දක්වා වලංගු ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් සභාපති නමට නිකුත් කළ ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කළ යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්.**

## දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව
## ලංසු ආරාධනය

### ආරක්ෂක සේවා සැපයීම - 2021/2023

දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවට අයත් සේවා ස්ථාන සඳහා ආරක්ෂාව සැපයීම පිණිස පළපුරුදු ආරක්ෂක සේවා සපයන ආයතනවලින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

**මිල ගණන් ඉදිරිපත් කරන ආයතන සතුව පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය.**

1. සේවයේ යොදවනු ලබන ආරක්ෂක නිලධාරීන්,
   - i. වයස **අවුරුදු 18 ට වැඩි 70 ට අඩු** ආරක්ෂක සේවකයින් විය යුතුය.
   - ii. ආබාධිත නොවිය යුතු අතර, **මනා සෞඛ්‍ය තත්ත්වයකින්** සමන්විත විය යුතුය.
   - iii. අවශ්‍යතාවය දැන්වුවහොත් **ගිනි අවි ඇතුළු ආරක්ෂක උපකරණ** භාවිත කිරීමේ හැකියාව ඇති ආරක්ෂක නිලධාරීන් යෙදවීමේ හැකියාව තිබිය යුතුය.
   - iv. **තට්ටු ගොඩනැගිලි** සඳහා ආරක්ෂාව සැපයීම පිළිබඳ පළපුරුද්ද තිබිය යුතුය.
2. රාජ්‍ය හෝ අර්ධරාජ්‍ය ආයතනවලට **අවුරුදු 05 කට නොඅඩු කාලයක් පෞද්ගලික ආරක්ෂක සේවා සපයා පළපුරුද්ද** තිබිය යුතුය.
3. අවම වශයෙන් ඉහත කී එක් ආයතනයකට **ආරක්ෂක නිලධාරීන් 30 ක් වත්** සේවයේ යොදවා එකවර එවැනි ආයතන 03 කටවත් සේවා සපයා තිබිය යුතුය.
4. **රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය** යටතේ සහ සංස්ථාවක්/ මණ්ඩලයක්, සමාගමක් ලෙස ලියාපදිංචි වී තිබිය යුතුය.
5. ඉදිරිපත් කරන මිල ගණන් **පඩිපාලක සහා ආඥා පනත යටතේ වන අවම මාසික වේතන කොන්දේසිවලට** යටත්විය යුතුය.
6. **සේවක අර්ථ සාධක අරමුදලට** සහ **සේවක භාරකාර අරමුදලට** දායක මුදල් ගෙවන බව සනාථ විය යුතුය.
7. මිල ගණන් විවෘත කරන දිනට පූර්වාසන්න **වර්ෂ 3 ක ආදායම් බදු ගෙවා ඇති බවට** සනාථ විය යුතුය.
8. **ගිනි අවි භාවිතා කිරීම** සඳහා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද බලපත්‍රය ලබා තිබිය යුතු අතර, එය මිල ගණන් විවෘත කරන දිනට වලංගුව පැවතිය යුතුය.
9. තෝරාගනු ලබන ආයතනය විසින් **රුපියල් ලක්ෂ 05 ක (රු. 500,000/=)** බැංකු ඇපකරයක් තැබිය යුතුය.
10. සේවයේ යොදවනු ලබන ආරක්ෂක නිලධාරීන් පිළිබඳ පහත තොරතුරු සනාථ කරන ලද ලේඛනයක් ගිවිසුම්ගත වීමට පෙර මෙම සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. **(ගිවිසුම්ගත වීමෙන් පසු ඇති වන සංශෝධන ඒ ඒ අවස්ථාවන්හිදී දැනුම් දිය යුතුය.)**
    - i. **සේවකයාගේ නම**
    - ii. **උපන් දිනය**
    - iii. **ජාතික හැඳුනුම්පත් අංකය**
    - iv. **ස්ථිර පදිංචි ලිපිනය**
    - v. **මනා චරිතයකින් සමන්විත බවට සනාථ කරන පොලිස් සහතිකය**

මෙම මිල ගණන් 2021.04.19 දින ප.ව. 2.00 පෙර "**නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව, දෙහිවල**" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ නාගරික කොමසාරිස් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම සිදු කළ යුතුය. මිල ගණන් භාර ගෙන අවසන් වූ විගස ඒවා විවෘත කරන අතර, එම අවස්ථාවට ඉල්ලුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

මෙම ලංසු ආරාධනය සම්බන්ධයෙන් වන ලංසු අයදුම්පත් සතියේ දිනවල පෙ.ව. 9.00 ත් ප.ව. 4.00 ත් අතර දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ 3 වන මහලේ පිහිටි ආයතන අංශයෙන් ලබාගත හැකිය.

මිල ගණන් ඉදිරිපත් කරනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ "**පෞද්ගලික ආරක්ෂක සේවා සැපයීම - 2021/2023**" යනුවෙන් සඳහන් කළ යුතුවේ.

මේ සම්බන්ධයෙන් වැඩිමනත් තොරතුරු අවශ්‍ය වේ නම් දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව වෙත පැමිණ හෝ දුරකථන අංක 011-2723538 යටතේ පරිපාලන නිලධාරී (ආයතන) විමසා අවශ්‍ය තොරතුරු දැන ගැනීමට හැකියාව ඇත.

**එම්. එම්. සී. කේ. කේ. මාන්නප්පෙරුම,**
**නාගරික කොමසාරිස්,**
**දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව.**

**2021.04.01**
**දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේදීය.**


BE BETTER INFORMED!
News you can trust now free on your mobile phone.
දිනමිණ Daily News தினகரன்
Dinamina Daily News Thinakaran
AVAILABLE AT
Visit - apps.lakehouse.lk
DOWNLOAD TODAY!
LAKE HOUSE


2021 අප්‍රේල් 01 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# කතාරම

## ස්වර්ණභූමියේ අතීතාවලෝකනය

බුදු හිමියන් සත් සති ගෙවා සමවතින් නැගී සිටි දිනයේ අරුණෝදයේ දඹදිව උක්තලා නුවර සිට මධ්‍ය දේශයට වෙළෙඳාමේ යමින් සිටි තපස්සු - භල්ලුක දෙසොහොයුරන්ට බුදුන් වහන්සේ දකින්නට ලැබී ඇතැයි පතපොතේ සඳහන් වේ. ඔවුන් සතුව තිබූ විළඳ හා මී පැණි බුදුන් වහන්සේට පිළිගැන්වූ බවත් පළමුවරට තෙරුවන් සරණ ගිය උපාසකයන් බවට පත්වූ ඔවුන්ගේ ඉල්ලීම මත බුදුන් වහන්සේ සිරස පිරිමැද කේශ ධාතු මිටක් ඔවුනට දුන් බවත් සඳහන් වේ.


එහෙත් තපස්සු - භල්ලුක දෙදෙනා ලක්දිවට විත් එම කේශ ධාතු නිදන් කර ගිරිහඬු කන්දේ වෙහෙරක් සෑදූ පුවත මහාවංශයෙහි නොදැක්වේ. එනමුත් මේ පුවත දඹදෙණි යුගයේ වැඩවිසූ මයුරපාද පිරිවෙන්පති බුද්ධපුත්ත හිමියෝ පූජාවලියෙහි සඳහන් කළහ. මහානාම රජ දවස (ක්‍රි.ව. 406 – 428) අටුවාචාරී බුද්ධඝෝෂ හිමියන් කුරුඳු වෙහෙර වැඩ සිටියදී ලියූ විසුද්ධිමග්ගයෙහි මේ 'ගිරිකණ්ඩක' විහාරය ගැන සඳහන් කරති. අනුරාධපුර යුගයේදී මේ ගිරිහඬු වෙහෙර යතිවරයන් විශාල සංඛ්‍යාවක් වැඩ සිටි පුණ්‍ය භූමියක්ව තිබූ බව උන්වහන්සේ එහි සඳහන් කර තිබේ. කේශ ධාතු සහිත ගිරිකණ්ඩක මහ වෙහෙර වනසා දැමුවේ චෝල රජුන්ගේ සෙබළුන් බවත් අනතුරුව මේ පින් බිම වනගත වූ බවත් ඉතිහාසයේ සඳහන්ය.


පොළොන්නරු යුගයේ මහා විජයබා රජු (ක්‍රි.ව. 1055 – 1110) ගිරිහඬු වෙහෙර යළි පිළිසකර කළද නැවත පසුකලෙක වල් වැදුණු ගිරිහඬු පුණ්‍ය භූමිය සියවස් ගණනාවක්ම මිනිස් ඇසින් වසන්ව පැවතිණි. 1951 ඔක්තෝබරයේ අගමැති ඩී.ඇස්. සේනානායක මහතා විසින් කළ දැනුම්දීමක් මත සෙනරත් පරණවිතාන මහතා එහි ගොස් පා තබන තුරුම ගිරිහඬු සෑය පිළිබඳ මතකය රැඳී තිබුණේ පූජාවලියේ පිටු කිහිපය මත පමණකි. එදා සිරියායක් වූ ගිරිකණ්ඩක සිව රජුගේ මහ කෙත වූ සිරියාය දෙමළ බස් වහරට අනුව යමින් තවදුරටත් අපි තිරියාය මැයෙන් වර්තමානයේදී හඳුන්වන්නෙමු.


ගිරිහඬු සෑයේ මුරගලක්

## බුදුන් වහන්සේගේ කේශ ධාතු නිදන් කර ඇත්තේ

# ගිරිහඬු සෑයේ ද? බුරුමයේ ද?


ගිරිහඬු සෑයේ වටදාගෙය


බුරුමයේ (මියන්මාර්) ස්වේදගොන් චෛත්‍යය

**වෙළෙඳ ගමනක යෙදෙද්දී තපස්සු - භල්ලුක වෙළෙඳ සොහොයුරන් දෙදෙනා වරක් ලක්දිවට ගොඩබැස්ස බව ද ඔවුන් රැගෙන ආ බුදුන් වහන්සේගේ කේශ ධාතුන් වහන්සේ නිදන් කර තිරියායේ ගිරිහඬු වෙහෙර සෑදූ බව ද බෞද්ධ පත පොතේ සඳහන් වේ. බෞද්ධ බැතිමතුන් වසර සිය ගණනක් තිස්සේ ගිරිහඬු සෑයට බුහුමන් දැක්වූයේ ද, දක්වන්නේ ද ඒ විශ්වාසය හේතුවෙනි. එනමුත් බුරුමයේ ස්වේදගොන් චෛත්‍යයේ ද ගෞතම බුදුන් වහන්සේගේ කේශ ධාතු නිදන් කර ඇතැයි කියැවේ.**

තිරියාය පිහිටා ඇත්තේ ත්‍රිකුණාමලයට සැතපුම් 29ක් දුරින් උතුරිනි. තිරියාය ගිරිහඬු පුදබිම පිහිටියේ එහි කුඩා කඳු ගැටයක් මතය. කන්ද මුදුනට නැගි අයකුට අවටින් දිස්වන්නේ මනස්කාන්ත දර්ශනයකි. නැගෙනහිර දෙසින් පෙනෙන්නේ බෙංගාල බොක්කේ නිල්වන් ජල තලයයි. සෙසු පැතිවලින් පෙනෙන්නේ කොළ පැහැ වනාන්තරයයි.

කන්දේ නැගෙනහිර බෑවුමේ තැනිතලා බිම් තීරුවල ඉපැරණි නටබුන් දිස්වේ. ක්‍රිස්තු පූර්ව යුගයේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා මේ පුදබිමේ සිටි බව තිරියාය ගල්ලෙනක කටාරමට යටින් කොටා ඇති පාඨයක දැක්වෙයි.

පුරාලේඛන ශාස්ත්‍රයට අනුව 8 වැනි සියවසට අයත් ශිලා පුවරුවක සඳහන්ව ඇත්තේ මෙය 'ගිරිකණ්ඩි' චෛත්‍යය බවය. එම සංස්කෘත අක්ෂර ශිලා පුවරුවේ වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ ත්‍රපුෂ සහ භල්ලික දෙදෙනාගේ නායකත්වයෙන් වූ වෙළෙඳ කණ්ඩායමක් මඟින් මේ චෛත්‍යය ඉදි කරවනු ලැබූ බවය.

පාළි භාෂාවෙන් ත්‍රපුෂ සහ භල්ලික යනු (බුදුන් සමයේ සිටි) තපස්සු - භල්ලුකය. බෞද්ධ පතපොතේ සඳහන් වන්නේ තපස්සු - භල්ලුක වෙළෙඳ දෙබෑයන්, බුදුන් වහන්සේ බුද්ධත්වයට පත් වූ පසු දානය පිළිගැන්වූ ප්‍රථමයන් බවය. ඒ අනුව බුදුන් වහන්සේ සිය හිස අතගා කේශ ධාතුන් ස්වල්පයක් ඔවුනට පිරිනැමූ බවය.

පූජාවලිය සඳහන් කරන්නේ තපස්සු - භල්ලුක වෙළෙඳ දෙබෑයන් එම කේශ ධාතු කරඬුවක බහා ඔවුන් යන යන තැන රැගෙන ගිය බවය. ඔවුන්ගේ එක් වෙළෙඳ ගමනක් යෙදී තිබුණේ ලක්දිව නැගෙනහිර වෙළෙඹඩ හරහාය.

ඒ ගමනේදී ඔවුන් නැගෙනහිර වෙරළට ගොඩ බැස තිරියාය කඳු මුදුනේ ආරක්ෂිත ස්ථානයක කේශධාතු සහිත කරඬුව තැන්පත් කර තිබේ. ආහාර පාන ගෙන විවේකයෙන් පසු ඔවුන් යළි ගමනාරම්භ කිරීම සඳහා කරඬුව රැගෙන යාමට උත්සාහ කළද එය තිබූ තැනින් ඔසවා ගැනීමට නොහැකි වී ඇත. මේ ප්‍රාතිහාර්යයේ අරමුණ වටහාගත් වෙළෙඳ දෙබෑයෝ බුදුන්ගේ කේශ ධාතු කරඬුව එලෙසම තැන්පත් කොට ඒ වටා කුඩා දාගැබක් තනවා පිටත්ව ගිය බව පූජාවලියේ සඳහන්ය. එලෙස එම දාගැබ තැනවූ ස්ථානය ගිරිහඬු බව පිළිගැනේ.

එදා ගිරිහඬු වූ මේ චෛත්‍යය පසු කාලයේදී 'ගිරිකණ්ඩි' වී වර්තමානය වන විට 'තිරියාය' වී ඇතැයි පැවසේ. බුදුන් වහන්සේ ජීවමානව සිටියදී දුන් ප්‍රථම ධාතුන් වහන්සේලා නිදන් කර බුද්ධ කාලයේදීම ගිරිහඬු සෑය නිම කර තිබූ බැවින් 7 වැනි සියවස දක්වාම මේ පුදබිම බෞද්ධයන්ගේ ප්‍රකටම වන්දනීය ස්ථානයක්ව තිබූ බව ද පොතපතේ සඳහන් වේ.

12 වැනි සියවසෙන් පසු ක්‍රමයෙන් නැගෙනහිර ප්‍රදේශයෙන් බෞද්ධයන් රට තුළට සංක්‍රමණය වීමත් සමගම ඉපැරණි ගිරිකණ්ඩි චෛත්‍යය මෙන්ම ඊට සම්බන්ධ විහාර සංකීර්ණයද හුදෙකලා වී පසුව වනවැදී අනතුරුව ගරා වැටෙන්නට පටන්ගෙන ඇත.

මහනුවර යුගයේදී ලියන ලද 'නම් පොතේ' මේ පෙදෙස සඳහන් කර ඇත්තේ 'නීතුපත්පාණ' නමිනි. වන වැදී තිබුණු තිරියාය පුදබිමට පුරාවිද්‍යා නිලධාරීන් මුල්වරට පා තබා ඇත්තේ 1930 දීය. එනමුත් ඝන වනාන්තරය එළි පෙහෙළි කොට මාවතක් සකසා එහි පිළිසකර කිරීම් අරඹා ඇත්තේ 1951 අගෝස්තුවේදී බව මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීහු සඳහන් කරති.

තිරියාය ස්තූපය වටා ඉදි කළ වටදාගෙයකි. මෙවැනි වටදාගෙවල් මෙරටින් හමු වී ඇත්තේ 10කි. පොළොන්නරුවේ වටදාගෙය, මැදිරිගිරියේ වටදාගෙය, හැරුණුකොට තිරියාය වටදාගේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් තහවුරු කළ ප්‍රකටම ස්ථාන තුනය. තිරියාය වටදාගේ අවට විහාර, ප්‍රතිමා ගෘහ යනාදියේ නටබුන් ද දැක ගත හැකිය.

කැලෑ වැදී තිබුණු තිරියායට පුරාවිද්‍යා නිලධාරීන් ගොස් කැණීම් කරද්දී චෛත්‍ය ගර්භය මුළුමනින්ම හාරා නිධන් හොරුන් එහි ගර්භයේ තිබූ සියලු දෑ කොල්ල කා තිබූ බව දැකගන්නට ලැබුණු බව වාර්තා කර තිබේ.

> මේ කල්පයේ බුද්ධත්වය ලැබූ කකුසඳ, කෝනාගම, කාශ්‍යප බුදුන් වහන්සේලාගේ පාරිභෝගික වස්තූන් මෙන්ම ගෞතම බුදුන් වහන්සේගේ කේශ ධාතු 8ක් ස්වේදගොන් චෛත්‍යයේ නිදන් කර ඇතැයි බුරුම බෞද්ධ ඉතිහාසයේ සඳහන් වේ.

එහි සුන්බුන් අතර තිබී නිලධාරීන්ට හමු වී ඇත්තේ ඉපැරණි අගස්ති ඇටයක් පමණකි. එම චෛත්‍යයේ ධාතු ගර්භයක් තිබූ බවට සලකුණක් හෝ සොයා ගැනීමට පුරාවිද්‍යාඥයන්ට හැකිවී නැත.

කෙසේ වුව ද බුදුන් වහන්සේගේ ප්‍රථම ධාතුන් වහන්සේ වැඩ සිටින්නේ ගිරිහඬු සෑයේ නොව කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩවිලි හත්පත්තුවේ මාවතගම පිහිටි මකුලාන පුරාණ විහාරයේ බවට ද මතයක් වෙයි.


ඊට අමතරව ප්‍රථම ධාතුන් වහන්සේ දකුණු පළාතේ වලවේ ගඟ අසබඩ අම්බලන්තොට ගිරිහඬු වෙහෙරේ තැන්පත් කර ඇතැයි මතයක් ද තිබෙන බව මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා සඳහන් කරයි.

එනමුත් බුරුම (මියන්මාර) බෞද්ධයන් ද සියවස් ගණනාවක් තිස්සේ බුදුන් වහන්සේගේ කේශ ධාතු නිදන් කර ඇත්තේ රැන්ගුන් නුවර ස්වේදගොන් චෛත්‍යයේ බව විශ්වාස කරති. තපස්සු - භල්ලුක වෙළඳ දෙබෑයන් එදා බුරුමයට ද ගොඩ බැස ඇතැයි පතපොතේ සඳහන් වේ. ඔවුන් එදා කේශ ධාතුවලින් කොටසක් බුරුමයට (ස්වර්ණභූමියට) රැගෙන ගොස් එරට ස්වේදගොන් චෛත්‍යයේ නිදන් කළා ද විය හැකිය.

ස්වේදගොන් චෛත්‍යයේ බුදුවරුන් සිවු දෙනකුගේ ධාතු නිදන් කර ඇතැයි සඳහන් වේ. මේ කල්පයේ බුද්ධත්වය ලැබූ කකුසඳ, කෝනාගම, කාශ්‍යප බුදුන් වහන්සේලාගේ පාරිභෝගික වස්තූන් මෙන්ම ගෞතම බුදුන් වහන්සේගේ කේශ ධාතු 8ක් මෙහි නිදන් කර ඇතැයි බුරුම බෞද්ධ ඉතිහාසයේ සඳහන් වේ.

මෙම චෛත්‍යයේ උස අඩි 367කි. (මීටර් 112) මෙය ලෝකයේ ඉපැරණිම බෞද්ධ ස්තූපය ලෙසින්ද සැලකේ. තපස්සු - භල්ලුක දෙසොහොයුරන්ට බුදුන් වහන්සේ දුන් කේශ ධාතු රැගෙන එදා ඔක්කාලාපා රජු සමයේ ස්වර්ණභූමියට (වර්තමාන මියන්මාර්) පා තැබූ බව එරට ඉතිහාසයේ දැක්වෙයි.

තපස්සු - භල්ලුක වෙළෙඳ දෙබෑයන් එදා වෙළෙඳ සංචාරයේ යෙදෙද්දී ලක්දිව නැගෙනහිර වෙරළට ගොඩ බැස 'ගිරිකණ්ඩි' පෙදෙසේ උස් බිමක කේශ ධාතු සහිත කරඬුව තැන්පත් කර අනතුරුව ඉන් කේශ ධාතු ස්වල්පයක් රැගෙන බුරුම රටට ගෙන ගියා වන්නට ද පුළුවන. ඒ අනුව බුරුමයේ ස්වේදගොන් චෛත්‍යයේ කේශ ධාතු 8ක් තැන්පත් කළායැයි සිතන්නට ද පුළුවන.


ගිරිහඬු සෑය පිළිසකර කිරීමට පෙර

බන්දුල ගුණරත්න

# අහිමි වී ගිය මහා සංස්කෘතිය

## හෙළදිව උරුමය

2 වැනි කොටස



අදින් වසර දහස් ගණනකට පෙර හෙළයන් සතුව තිබුණා යැයි කියන විද්‍යාත්මක දැනුම ගැන හරි හැටි නොදන්නා අපි ඒ ගැන පුදුම වන්නෙමු. එහෙත් ලෝකයම පුදුම කරවිය හැකි **'හෙළ රහස්'** කොතෙක්දැයි අපි නොදනිමු. මේ ලිපි මාලාව ඔස්සේ අපි ඒ හෙළදිව උරුමය සොයා යමු.

මේ ලිපි පෙළ ඉතිහාස ගවේශක/පරිසරවේදී **තිලක් කන්දෙගම** මහතාගේ අදහස් අනුව සැකසෙයි.

භාතිය මදනායක

**රාවණයන් පිළිබඳ ජනප්‍රවාදයේ පවතින කතා සියයට සියයක්ම විශ්වාස කිරීමට තරම් මා පෙළඹී නැත. නමුත් යම්කිසි ඇත්තක් එහි ගැබ්වී ඇති නිසා එම තොරතුරු මත හඹා යමින් සිටින්නෙමි. එසේ හඹා යෑමේදී ලැබුණු තොරතුරු මා මවිතයට පත්කර ඇත. රාවණවරු මහා බල සම්පන්න නායකයන් බව මට තේරී ඇත. පෘථිවිය පිළිබඳව සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ හා ඉන් ඔබ්බට ඇති ජීවීන් සහිත චක්‍රාවාට පිළිබඳ ඔවුන් බොහෝ දේ දැනගෙන සිට ඇත.**

භූ විද්‍යාත්මකව පොළොවේ සුවිශේෂී බලයන් ඇති තැන්වල ඔවුන් රාජධානි පිහිටුවා ගෙන සිට ඇත. මා මවිතයට පත් වන්නේ ඉන් එක රාජධානියක් වූ හෙළ අසුර අධිරාජ්‍යය නම්වූ වර්තමාන ශ්‍රී ලංකාවේ බල සම්පන්න ප්‍රදේශ ඔවුන් හඳුනාගෙන තිබීම පිළිබඳවය) භූගෝල විද්‍යාත්මකව ශ්‍රී ලංකාව පිළිබඳව මට වැටහෙන දේ බොහෝය. එය මාගේ මතයක් ලෙස මට ඉදිරිපත් කිරීමට ඇති අයිතිය මත සිට මා මෙසේ කියමි. ශ්‍රී ලංකාව කිසියම් දිනක දෙකඩ වී යා හැකිය. අතීත ශ්‍රී ලංකාව පිළිබඳව යම් හෝ දැනුමක් ඇති මිනිසුන් මා සමග තර්ක නොකරනු ඇතැයි මම සිතමි. ටොලමි දුටු, ටොලමි සිතියම්ගත කරන ලද ශ්‍රී ලංකාව අද නැත. අද ඇත්තේ කුඩා දිවයිනකි. මෙසේ වූයේ කෙසේද? මම භූ විද්‍යාත්මකව අධ්‍යයනය කළෙමි. වෙගනර් නම් වූ දාර්ශණිකයා ඔහුගේ දැනුම මත පිහිටා උපකල්පනයක් කළේය.

අද උපකල්පනයක යෙදෙන මිනිසෙක් වේ නම් ඔහු අද උන්මත්තකයකු ලෙස සැලකීම සාමාන්‍ය දෙයකි. නමුත් ඔහුගේ මරණයෙන් පසු ඔහු දාර්ශනිකයෙක් වීම කිසිදු අයකුට වැළැක්විය නොහැක්කේ ඔහු කියූ දෑ ඒ මොහොත වන විට සත්‍යයක් බව ඔප්පු වන නිසාය. වෙගනර් ඉදිරිපත් කළ උපකල්පනය මහද්වීප ප්ලාවිත කල්පිතයයි. මහද්වීප ප්ලාවිත කල්පිතය යනු මහාද්වීප කැඩී කැඩී තල්ලු වන බවය.

එම නිසා ගොන්ඩ්වානාලන්තය සහ අංගානාලන්තය ලෙස පෘථිවිය උතුරට සහ දකුණට තල්ලු වී ගියේය. එසේ තල්ලු වී යෑම නිසා දකුණට තල්ලු වූ ප්‍රදේශවල දකුණු බෑවුම ප්‍රපාතයන් මෙන් දළ බෑවුම්ය. මා මෙය මෙම ලිපියට ඇතුල් කරන්නේ මා ඉහත කී කාරණය සනාථ කිරීම සඳහාය. ඒ අනුව ත්‍රිකුණාමලයේ සිට හම්බන්තොට දක්වා වූ ප්‍රදේශය කවදා හෝ දිනයක ශ්‍රී ලංකාව දෙකඩ කරන සීමාවය. මුහුද යටින් පැලුම් ස්තරයක් ඇති බවත් ඒ පැලුම් ස්තරය තුළින් උඩට මුහුදු ජලය ගලා එන බවත් එසේ ගලා එන මුහුදු ජලය දිය බුබුළු ලෙසින් උඩට මතු වන බවත් මෙය පරීක්ෂා කළහොත් ඔබට දැකගත හැකිය. මුහුද ආසන්නයේ මෙම උණුවතුර ළිං හම්බන්තොට මදුනාගල උණුවතුර ළිං ඇත. කින්නියාවේ සහ මහඔය උණුවතුර ළිං ඇත. බිබිලේද එම බුබුළු ඇත. නාවලපිටියේද ඇත. දඹුල්ලේද ඇත. නමුත් එම බුබුළුවල ජලය උණුසුම් නැත්තේ මුහුදේ සිට ඇති උස වැඩි නිසාය. රාවණවරු තමන්ගේ බලය වෙනුවෙන් පිහිටුවූ බල ප්‍රදේශ පිළිබඳ විශාල කටකතා ඇත්තේ මෙම කලාපයන් ගැනය. කොග්ගල නිලමේ නමැති පුස්ථකය මහත් ආන්දෝලනයකට තුඩු දී ඇති පොතකි. එම කතාවේ බොහෝ තැන් බිබිලට සම්බන්ධය.

ත්‍රිකුණාමලය රාවණයන් භාවනා කළ තැනකි. මේ නිසා මා මවිතයටපත් වන්නේ මෙවැනි ප්‍රදේශවල ඇති බලය පිළිබඳව ඔවුන් දැන ගත්තේ කෙසේද යන්න පිළිබඳවය. මෙම ගමන් මාර්ගයේම එක්තරා ස්ථානයක ඇළහැර ගම පිහිටා ඇත. මෙහි තැන් තැන්වල නිවුණු ගිනි කඳුවල ලක්ෂණ ද ඇත. ලග්ගල පාමුල ඇති මෙම ගමෙහි සොයා ගත යුතු බොහෝ සත්‍යයන් ජනකතාවල සැඟවී ඇත. එය සෙවීම සඳහා මෙම ප්‍රදේශ වල කෘෂි කර්මය හොඳින් හැදෑරිය යුතු යැයි මම සිතුවෙමි. ගොවියන් හා එක්ව ඔවුන්ගේ සිරිත් විරිත් අධ්‍යයනය කිරීමට මට හැකි වී ඇත. මෙහි බොහෝ කපු මහතුන් සිටිති. කපු මහතුන්ගේ සේවය ගොවියාට අත්‍යාවශ්‍ය නිසා එය සිදුවී ඇති බව මම දනිමි. මෙය පරීක්ෂා කිරීම සඳහා මාද එවැනි කපු මහතුන් විශාල ප්‍රමාණයක් මා පදිංචි වී සිටින ස්ථානයට කැඳවීමි. ඔවුන්ගේ සියලු යාතිකා එක සමානය. එසේ නම් මෙපමණ කපු මහත්වරු එක ගමක සිටිය යුත්තේ ඇයි දැයි කල්පනා කළ මට ලැබුණු පිළිතුරෙන් මම සෑහීමකට පත්වීමි.



සියල්ලන්ම ගොයම් කපන්නේ එක්වරය. ඒ සඳහා එක්වර එක් කපු මහතකුට සෑම කුඹුරකටම යා නොහැක. එනිසා කපු මහතුන් විශාල ප්‍රමාණයක් සිටිය යුතුය. මහවැලි ව්‍යාපාරය නිසා මෙම සංස්කෘතිය විකෘති වී ගියත් එහි නටබුන් අද ද දැකිය හැකිය. කුඹුරු හාන ගවයන් කොළ පාගන ගවයන් අද ද මේ ගංවල සිටිති. එසේ ගවයකු සිටින ගමක මිනිසුන්ට මෙම ගවයන් හඳුන්වන ආකාරය අනුව බොහෝ ආදරයක් තිබුණු බව මට වැටහුණි. අම්බරුවන් කුඹුරේ සිටිති. ඒ මී හරක්ය. ඒ මී හරකා කුඹුරේ සිටින්නේ කුඹුර හාන විට පමණි. ඉන්පසු ඔහු අතුරුදන් වී යයි. නැවතත් අම්බරුවන් කුඹුරට පැමිණෙන්නේ ඊළග කන්නයේ කුඹුර හාන විටය.

මුදුනන් දැතුරයන් කලාතයන් කුඹුරට පැමිණෙන අනිත් මී හරකුන්ය. උන් කුඹුරට පැමිණෙන්නේ කොළ පාගන විටය. මුදුනා කොළ පාගන්නන්ගේ නායකයාය. එම රැනේ කෙළවර සිටින්නේ කලාතයාය. මැද සිටින්නේ දැතුරයන්ය.

මුදුනා හෙමින් හෙමින් තම රැන රැකගෙන ගොයම් කොළය රැකගෙන ගොයම් කොළය මත කැරකෙන ආකාරය දුටු විට මට දැනුණේ සතුන්ගේ හැසිරීම පිළිබඳ මොවුන් තුළ මේ තරම් දැනුමක් තිබුණේ කෙසේද යන්නය. සෑම කුඹුරක් ආසන්නයේම මඩ කඩිත්තක් ඇත. ඒ දවල් කාලයේ මෙහි රැගෙන එන ගවයන්ට ගිමන් හැරීම සඳහාය. මී ගවයා එළ ගවයා මෙන් නොව අව්ව අප්‍රිය කරන සතෙකි. එම නිසා කොළය පෑගීම සඳහා ඔහු යොදාගන්නේ රාත්‍රී කාලයේය. රාත්‍රී කාලයේ සිදුකරන මෙම කොළ පෑගීම බොහෝ සිරිත් විරිත්වලින් පිරුණ උත්සවයකි. ගොයම් පාගන තැන කමතය. කමත අති පූජනීයය. කමතේ අළුවලින් අඳින සටහනකි. එම සටහනේ තැන්පත් කරන වස්තූන් අට මගලකි. ඉන්පසු කමතට ගොයම් වඩම්මන්නේ මහත් භක්තියකිනි. බොහෝ ගරු ගාම්භීරව කරන මෙම කාර්යයට මුළු ගමම එකතු වන බව මම දැක ඇත. හරකුන්ට විවේකයක් දීම සඳහා ස්ථානයක් සකස් කිරීම අද ද මා දකිමි. ගොයම් පෑගීමට ගන්නා හරකුන්ට අතිරේකව අවශ්‍ය වුවහොත් සේවය ලබා ගැනීම සඳහා සූදානමින් සිටින ගවයන් මඩ වගුරේ විවේක ගන්නා ආකාරය මම ඇසින් දුටුවෙමි. මේ මහා සංස්කෘතිය අපේ ඇස් ඉදිරියේම බොඳවී යන්නේ කාගේ අවාසනාවට දැයි මට නොතේරේ. මහා රාවණයන් විසින් මහා කැප කිරීමක් තුළින් උපයා, සපයා ගත් දැනුම තමන්ගේ නෑ සනුහරය වෙන නිර්ලෝභීව බෙදා දී ඇත. ස්වකීය මී මුත්තන්ගෙන් ලැබුණු ඥානය බියක් සැකක් නැතිව හෙළයන් ඉදිරියට රැගෙන පැමිණියේය. එම නිසා සශ්‍රීක රටක් වූ ශ්‍රී

ලංකාව යටත් කර ගැනීමට විදේශිකයන්ට අසීරු විය. ලෝකයේ බොහෝ රටවල් යටත් කරගෙන ශ්‍රී ලංකාවට පැමිණි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට ශ්‍රී ලංකාව යටත් කර ගැනීමට බොහෝ සටනක් කිරීමට සිදු විය. ඔවුන්ට යටත් කර ගැනීමට හැකි වූයේ මෙරට මිනිසුන්ගේ තිබුණු එක් දුර්වලතාවයක් නිසාය.


යක්ෂ ගෝත්‍රිකයින්ගේ ඉන්තේරු නිමිති මාලාවේ සඳහන් වී ඇති නිමිතිවලින් එකක් "වරිගබඳ අකාමාති මකාවේති" කිරීමය. එනම් වරිගය පාවාදීමය. එදා රජුගේ ඇමැතිවරු කිහිපදෙනෙක් මේ අකටයුත්ත කළේය. ඔවුන් "වරිගබඳ අකාමාති මකාවේති" කළහ. ජාතිය පාවා දුන්හ. එසේ නොකළේ නම් රාවණයන් ඉදිරියට ගෙන ආ දැනුම රාවණවරුන්ගෙන් පසුව රට පාලනය කළ රජවරුන් ඉදිරියට ගෙන එනු ඇත. සිංහලයේ නීතිය හොඳින් ක්‍රියාත්මක වනු ඇත.

රෝමානු, ලන්දේසි නීතියට මෙම රට යටත් නොවෙනු ඇත. මේ රටේ තිබුණු උරුමයන් තවදුරටත් ආරක්ෂා වෙමින් ලෝකයට ආදර්ශවත් වූ රටක් හැටියට පවතිනු ඇත. අපේ උරුමයන් අතර තිබු දේශීය වී වර්ග අපට දැක ගත නොහැකි විය. රාවණවරුන්ගේ ප්‍රධාන ආහාරය බවට පත්වී තිබුණු කළුකුමාර වී, කළුපාට වීවල වටිනාම වී වර්ගයය. මෙම වී වර්ගය ශ්‍රී ලංකාවෙන් වඳ වීමට ආසන්නය. ශ්‍රී ලංකාවේ දේශීය වී පරිස්සමින් රැකගෙන සිටින ගන්නෝරුවේ පවා මේ වී වර්ගය නොමැත. ලග්ගල, උඩසිය, පාත සිය ප්‍රදේශවල මුලදී කළුකුමාර වී තිබුණු නමුත් අද උඩසිය ප්‍රදේශයේ පමණක් තැන් තැන්වල මේ වී තිබෙන බව ලග්ගල හේරත් බංඩා මහතා මට ප්‍රකාශ කළේය. මෙවැනි වී වර්ග අපේ උරුමයක් ලෙස සලකා අප රැක ගත යුතුය. නමුත් අපි එසේ නොකරන්නේ අපි එවැනි ස්වයංජාත වී වෙනුවට අවජාත වී ලෙස හැඳින්විය හැකි වී කරළියට ගෙන ඇති නිසාය.

අතීත රජ දරුවෝ ඉතා ගෞරවයෙන් මෙම බීජ වර්ග සංරක්ෂණය කළ බව සමහර සාක්ෂිවලින් ඔප්පු වේ. ඔවුන් අනාගතය පිළිබඳව බොහෝ දේ සැලසුම් කර ඇත. අනාගතයේ මේ රට අධිරාජ්‍යවාදීන් යටත් කර ගැනීම සඳහා මුදල් පාවිච්චි කරන බව ඔවුන් වටහාගෙන සිටින්නට ඇතැයි මම සිතමි. එසේ වුවහොත් මේ රට බේරාගැනීම සඳහා බොහෝ දැනුම නිදන් කර ඇති බවද මම දනිමි. බොහෝ පූජනීය ස්ථානවල තිබූ නිධන් මේ වන විට නිදන් හොරු විසින් රැගෙන ගොස් ඇති බවද ආරංචි වී ඇත. නමුත් යම්කිසි කාලයක එසේ අනතුරුදායක තත්ත්වයකට රට පැමිණියහොත් රාවණවරු නැවත මෙම මිනිස් සමාජය තුළ නැවත ඉපදෙන බව සක් සුදක් සේ පැහැදිලිය. වර්තමානය එම කාලයයි. තරුණයන් රාවණයන් සොයා ඇවිදිමින් සිටිති. මාක්ස්වාදය සොයමින් රට පුරා එකතු වුණු තරුණයන් වෙනුවට අද ඇත්තේ රාවණයන් සොයන තරුණයන්ය. ඔවුන් දේශීය බීජ ආරක්ෂා කිරීමේ පුරන් කුඹුරු අස්වද්දමින් සිටිති.

ඔවුන් වෙනුවෙන් නිදන් කළ නිධන් අනාගතයේදී මතු වනු ඇති බව මගේ සිත ප්‍රබල අයුරින් මට දැනුම් දෙයි. ඔබ වෙනුවෙන් නිදන්ගතවී ඇති මෙම නිධන් නිධන් හොරු විසින් මංකොල්ලකනු ලබන්නේ නම් එය රැක ගැනීම ඔබ සතු කාර්යයකි. එවැනි නිධාන ගොඩගත් බොහෝ අය අතුරුදන් වී ඇත. සුගලාදේවියගේ මිනිය සහිත නිධානය පොළොන්නරුවේදී ගොඩගත් බවට බොහෝ මිනිසුන් කතා කරති. අද වන විට ඔවුන් විනාශ වී ගොස්ය. එම නිසා අනාගතයේදී මතුවිය හැකි මෙවැනි නිධන් රට වෙනුවෙන් රැකගැනීම රට භාරගැනීමට සිටින පාලකයන්ගේ වගකීම බව මම ප්‍රකාශ කරමි. මේ යටවූ නිධන්ය. යට නොවූ නිධන් දේශීය දැනුමය. එම දැනුම සඳහා පුස්කොළ පොත් තාමත් නිවෙස්වල පුස්කමින් තිබේ. ඒ එකතුකොට සංරක්ෂණය කිරීමද නිධානයක් ආරක්ෂා කිරීමය. ඒ දිනය අද පැමිණ ඇත.

# ආයුධවලින් පණ ලැබූ එරිවීර පට්ටන



**"එදිරිවීර" නමින් වාසගමක් සිංහලයන් අතරත් "එදිරිවීරම්" නමින් වාසගමක් ද්‍රවිඩයන් අතරත් තිබෙනු දක්නට ලැබේ. එමෙන්ම 'එරිවීර පට්ටන' නමින් ප්‍රකට වෙළෙඳ නගරයක් දකුණු ඉන්දීය ඉතිහාසයෙන් කියවන්නට ලැබේ. ඒ අතර මෙරටින් හමුව ඇති වාණිජ සෙල්ලිපි රැසකත් රාජ නියෝග ලිපි කීපයකත් 'එරිවීර පට්ටන' නමින් පිරිසක් හඳුන්වා දී ඇත්තාහ. 'එරිවීර පට්ටන' නමින් පුරාණ සෙල්ලිපිවල නම් කර ඇති ජනවංශය කවුරුන්ද? එකී නම සිංහල, දෙමළ දෙජාතියටම පොදු වාසගමක් බවට පත් වූයේ කෙළෙස ද යන්න සොයන්නට අතීතයට එබී බැලීමි.**

එසේ අතීතයට එබී බැලූ විට ලක් ඉතිහාසයේ එක් කතාවක් අග එරිවීර පට්ටනයන් ඉහළින් ම සටහන්ව ඇති බව පෙනේ. සිංහල සාහිත්‍යයේ මෙන්ම පාළි, සංස්කෘත සාහිත්‍ය කෘතිවලත් 'එරිවීර' යනු යුද ශිල්පී කණ්ඩායමකි. එරිවීර යනු 'හෙල්ල' විසි කරන ශිල්පීන්ගේ අතීත නාමයයි. මේ අනුව හෙල්ල විසි කිරීමේ ක්‍රීඩාවේ නිරත වූවන් හා හෙල්ල තුළින් සටන් පෑ පිරිස එරිවීර බවට පත් ව ඇත්තාහ. ඒ අනුව එරිවීරවරු යනු වෙනම ජන ගෝත්‍රයක් බව පසක් වෙයි. පුරාණ සාහිත්‍යයේ ඔවුන් ගැන සඳහන් වන බොහෝ විත්ති එරිවීර නාමයේ නූතන පද අරුත හිමි ජනයා සමග සමාන දැයි බැලීමි. එවිට පුරාණ තතු මවන එරිවීර රූපය ද නූතන රූපය ද සමාන බව පෙනේ. ඔවුන්ගේ ශරීර ලකුණු ද එසේය. මේ අනුව නූතන වාසගම් ලෙස සිංහලයන්, ද්‍රවිඩයන් ද භාවිත කරන එදිරිවීර, එදිරිවීරම් සහ එයට ඇඳුණු එරිවීර පට්ටන ජනවංශ දිග හැරුම බව පැහැදිලිය.

මේ 'එරිවීරවරු' ආගන්තුක ජනවංශයක් ද නොවේ නම් ස්වදේශික දැයි සොයා බැලිය යුතුය. හෙල්ල විසි කිරීම සඳහා ස්වදේශීවරු සිටිය ද ඔවුන් අභිභවමින් විදේශීය එරිවීරවරු මෙහි පැමිණ ඇත්තාහ. ඒ මෙරට රාජ්‍ය ආරක්ෂාව විදේශීය කුලී හමුදාවක් හිමි කර ගැනීමත් සමගය. ඒ අතර එරිවීරවරු සමාජ පංතියක් ලෙසින් වඩාත් තහවුරු වූයේ සිරිලක ආයෝජනය කළ බහුජාතික වෙළෙඳ සමාගම් නිසාය. ජාත්‍යන්තර වෙළෙඳ බලවේගවල ආරක්ෂාව සඳහා එරිවීරවරු බුරුතු පිටින් මෙහි ගෙනවිත් ඇත්තාහ. ඒ අතර ස්වදේශීය එදිරිවීරවරුන් ද මෙම බහු ජාතික සමාගම්වල සේවයට එක්වන්නට ඇතැයි අනුමානද කළ හැකිය. කෙසේ නමුත් එරිවීරවරුන්ගේ පැවැත්ම තීරණය වූයේ ඔවුන්ගේ හාම්පුතුන් වූ වෙළෙඳ සමාගම් හරහාය.

වාහල්කඩ දෙමළ සෙල්ලිපිය එරිවීරවරුන් පිළිබඳ වැදගත් ම තතු විත්තිය ගෙන හැර පා ඇති මූලාශ්‍රයයි. එහි සඳහන් ලෙස මෙරට තිබූ වෙළෙඳ නගර ආරක්ෂා වී ඇත්තේ එරිවීර පට්ටනයන් හරහාය. එලෙස සහමුලින් ම එරිවීර පට්ටනයන් මත යැපුණු නගරයක් ලෙස වාහල්කඩ සෙල් ලිපිය "කට්ටනේරි" නගරය දක්වයි. මෙලෙස දක්වන කට්ටනේරිය වර්තමානයේ කටුනේරිය බවට හඳුනාගෙන ඇත. එය තහවුරු වන්නේ නූතන කටුනේරිය අදත් දෙමළ තෙළිඟු, මලයාලම්, කර්ණාටක, සෙට්ටි ආදී විවිධ දකුණු භාරතීය මුල්වලින් සුසැදි ජන වර්ගවලින් සමන්විත වන බැවිණි.

එකල්හි මෙන්ම අදත් කට්ටනේරිය වෙළෙඳ නගරයකි. බහුවිධ ජාතීන්, බහුවිධ සංස්කෘතින්ගේ මිශ්‍රණය සහිත කලාපයකි. එය මීගමුව, හලාවත, මන්නාරම දක්වා විහිදී ගිය වාණිජ කලාපයක් ලෙස පැවතී ඇත. වාහල්කඩ සෙල්ලිපිය පවසන පරිදි අතීතයේ එලෙස පැවති ප්‍රදේශය වර්තමානයේ ද විද්‍යමාන වේ.

> ඉතිහාසය මුළුල්ලේ මෙරට ආරක්ෂක වෙළෙඳ පොළේ තීරක බලයක් එරිවීරවරුන් සතු වුයේය. එය දඹදෙණි, කුරුණෑගල, යාපහුව සමයේ පමණක් නොව සීතාවක, කෝට්ටේ, මහනුවර, කොළඹ, ජයවර්ධනපුර සමයේ ද එසේය.

මේ අනුව එරිවීර පට්ටනයන් විසින් සපුරා රැක්මේ යෙදුණු මෙම වෙළෙඳ නගරය නිසා බොහෝ විජාතික සමාගම් එරිවීරයන් සමග ගනුදෙනු කළහ. ශූර ආරක්ෂකයන් වශයෙන් ද තියුණු සටන් ශිල්පීන් ලෙස ද දක්ෂතා සපිරි ඔවුන්ට ව්‍යාපාරිකයන් දේපළ හා ආයතන රැකවරණය භාර කළේය. මෙම තත්ත්වය වඩාත් අපූරුවට පැතිර යන්නේ සිටුවරුන් ද ප්‍රදේශපතින් ද එරිවීරවරුන්ගේ ආරක්ෂාව ලබා ගැනීමත් සමගය.

පසු කාලයේ දී එරිවීරවරුන් රාජ්‍ය දේශපාලන භූමිකාවටද එක් විය. ඒ සිංහල කිරුළ සඳහා මෙරට ජන නායකයන් උනුන් මරා ගැනීමත් සමගය. ඍජුව සතුරු හිස හෙල්ල මානයෙන් පසාරු කළ එරිවීරුවරු බලකාමීන්ට අවශ්‍ය ම සාධකයක් වුහ. එමෙන්ම එරිවීර පට්ටන යන නමට හෙල්ල විසි කරන්නා පමණක් නොව ආයුධ සහිත භටයන් සියල්ල ඇතුළත් විය. ඒ අනුව මෙම ජන ගෝත්‍රය අවි ශිල්පීන්ගෙන් සමන්විත වූ නිසා යුද්ධය බලයේ මාවත කරගත් පොළොන්නරු සමයේ බලගතු ජන කල්ලියක් බවට ඔවුහු පත් වුහ. එරිවීරවරු පිළිබඳ දකුණු භාරතීය තතු විත්තිවල එම නමින් ම සඳහන් වීමෙන් ඔවුන්ගේ මුල් බිම වූ දකුණු භාරතීය බලපෑම් මනාව විද්‍යමානිතය.

සිරිලක ද්‍රවිඩ ආක්‍රමණය සමඟ දෝලනය වන විට වාණිජ ව්‍යාපාරවල පරිධියේ සේවකයන් වූ ඔවුන් තම ජාති මූල සමඟ එක් වී ඇත. මෙහි කදිම තතු විත්තිය වාර්තා වන්නේ මහා විජයබාහු රජ සමයේය. ඔහු සිරිලක පැවති දීර්ඝ චෝළ පාලනය පෙරළා දැමූ රජුය. ඒ වන විට චෝළ පාලකයන්ට සේවය කළ එරිවීරවරු අග නගරයේ ද රට පුරා ද ව්‍යාප්තව සිටියහ. දැවැන්ත ජාතික යුද්ධයක් තුළින් සොළී බලය පැරද වූ මහා විජයබාහුට එරෙහි ව අගනුවරින් කැරැල්ලක් මතුවිය. ඒ කැරැල්ල රෝහණය දක්වා පැතිර ගියේය.

චෝළ අධිරාජ්‍යය පරාජය කළ මහා විජයබාහුට අග නගරයෙන් පලා ගොස් සැඟවී ජීවත් වන්නට තරම් තත්ත්වය බිහිසුණු විය. ඔහුට මේ අභියෝගය එල්ල කළේ එරිවීර පට්ටනයන්ය. ඒ දකුණු භාරතයෙන් මෙහි පැමිණ සිටි වෙළෙඳපති සහෝදරයන් තිදෙනකු වූ ධම්මනෙහකනාථ, සෙට්ඨිනාථ සහ ජන්තගාහකනාථය. මොවුන් මහා විජයබාහුට එරෙහිව නැඟී සිටියේ ක්‍රි.ව. 1074 දීය. එකී කැරැල්ලේ පූර්ණ සේනාව වූයේ එරිවීරවරුය. මේ අනුව ධම්මනේහකනාථ, සෙට්ඨිනාථ සහ ජන්තගාහකනාථ තිදෙනා එරිවීරවරුන් බවට අනුමාන සත්‍යයට එළැඹිය හැකිය. මෙරට මුළු මහත් වාණිජ ව්‍යාපාර බියෙන් භ්‍රාන්ත කළ මේ කැරැල්ල නිසා නගර පාළු වී ගියේය. රට භීතියෙන් වෙළී ගියේය.

චෝළයන් පරාජය කළ ජාතික හමුදාවට එරිවීරවරුන් විසි කරන ලද ආයුධවලට මුහුණ දීම අපහසු විය. එහෙත් එරිවීරවරුන් වනසමින් මහා විජයබාහු අවසානයේ ජය ගත්තේය. ඉන්පසු එරිවීරවරුන්ට තව තවත් ඉඩ ප්‍රස්ථා මෙරට සමාජයේ හිමි විය. රාජ්‍ය ආරක්ෂාව පිළිබඳ අපේක්ෂාවන් නැති ව්‍යාපාර පංතිය සහ ප්‍රභූ පංතිය එරිවීරවරුන්ගේ රැකවරණය වඩාත් ප්‍රිය කළේය. ඒ ඔවුන් ස්වාමියාට දිවි හිමියෙන් සේවය කළ බැවිනි.

පසුව මෙම එරිවීරවරුන් ද මෙරට ජන සමාජයට අනුගත වී සිංහලයන් හෝ ද්‍රවිඩයන් බවට පත්ව දිවි ගෙවන්නට වූහ. නමුත් ඉතිහාසය මුළුල්ලේ මෙරට ආරක්ෂක වෙළෙඳ පොළේ තීරක බලයක් එරිවීරවරුන් සතු වුයේය. එය දඹදෙණි, කුරුණෑගල, යාපහුව සමයේ පමණක් නොව සීතාවක, කෝට්ටේ, මහනුවර, කොළඹ, ජයවර්ධනපුර සමයේ ද එසේය. මන්ද ඔවුන් විසිකරන ආයුධවලින් පණ ලැබු ජනවංශයකි. එම ජනවංශය පොළොන්නරු සමයේ ඉතිහාස පොතට ඇතුළු වූයේ එලෙසිනි.

එම ඓතිහාසික උරුමය තුළින් ඔවුහු මෙරට ජන පදනමේ පැවැත්ම පිළිබඳ ස්ථානය සොයා පාදාගෙන ඇත්තාහ. මෙලෙස සියවස් දහයක් මුළුල්ලේ මෙම ජනවංශය එක් ඇත්තක් පෙන්වා ඇත. ඒ යුද්ධය තීරක වන විට ඔවුන්ගේ ජනවංශ වාසගම්වලින් ලක්දිව හමුදා පිරී ඉතිරී යන සැටිය. මෙය එදත් අදත් එසේය. එදා මහ විජයබාහුට කීකරු වූ එරිවීරවරුන් ඉන්පසු රජ පදවිය පතා නැත. එය මතු දිනෙක යළිත් පැතිය හැකිය. එවිට ඉතිහාසය තුළින් නූතන රිද්මයක් තනන අපුරුව දැකිය හැකිය. ඒ අපූරුවට රිද්මයක් මතු වෙමින් ද ඇත.

සුජිත් අක්කරවත්ත

# අභයගිරියේ ශ්‍රී මහා බෝධියට මොකද වුණේ?

**සිංහල බෞද්ධ සංස්කෘතියෙහිලා බෝධි වන්දනාවට හිමිවන්නේ සුවිශේෂ තැනකි. ශ්‍රී මහා බෝධි ශාඛාව මෙරටට වැඩම කරවීම පිළිබඳ ඉතිහාසයක්, ඊ ලද උපහාරත් බෝධි ඉතිහාසයේ සඳහන් වේ. පැරණිම සිංහල මහා බෝධි වංශය, පාලි මහා බෝධි වංශය, මහා බෝධි වංශ ග්‍රන්ථ පදය, මහාබෝධි වංශ පරිකතා නම් වූ ධර්ම ප්‍රදීපිකාවක්, චුල්ලබෝධි වංශයත් යන කෘති සමූහයක් මේ සම්බන්ධයෙන් ලියැවී තිබේ. බුද්ධත්වයට පත්වීම සඳහා බුදුන් වහන්සේට උපකාරී වූ වන්දනීය බෝ වෘක්ෂයේ දක්ෂිණ ශාඛාව පිළිබඳව ඉතිහාසගත තොරතුරු තිබුණ ද ලක්දිව තිබූ තවත් ශ්‍රී මහා බෝධියක් පිළිබඳ තොරතුරු මේ ලිපියෙන් ගෙන හැර දක්වමු.**



සිද්ධාර්ථ ගෞතම බුදුන් වහන්සේට බුද්ධත්වය සඳහා උපකාර කළ දඹදිව ජය ශ්‍රී මහා බෝධියේ ශාඛාව අනුරාධපුර මහමෙවුනා උයනේ රෝපණය කර ඇති බව අප කවුරුත් දන්නා දෙයකි. එම පූජනීය ශ්‍රී මහා බෝධියට අමතරව දඹදිවින් ලක්දිවට වැඩම කළ තවත් ශ්‍රී මහා බෝධි ශාඛාවක් මෙහි රෝපණය කර තිබේ. මහා වංශයේ මේ පිළිබඳ සඳහනක් නැත. ඊට හේතුව අනුරාධපුර යුගයේ ථෙරවාදී මූලස්ථානය වූ මහා විහාර පාර්ශ්වය සම්බන්ධයෙන් පමණක් මහාවංශය තොරතුරු ඉදිරිපත් කිරීමය. මහා විහාර විරෝධී පාර්ශ්වයක් වූ අභයගිරිය සම්බන්ධයෙන් මහා වංශයේ කරුණු ගෙනහැර දක්වන්නේ අල්ප වශයෙනි.



අභයගිරි විහාරය සම්බන්ධයෙන් හැදෑරීමට ඇති වැදගත්ම මූලාශ්‍රය වන්නේ ක්‍රි.ව.05 වැනි සියවසේ දී ලක්දිවට පැමිණ අභයගිරි විහාරයේ වසර 02 ක කාලයක් වැඩ විසූ චීන ජාතික ෆාහියන් හිමියන් විසින් ඉදිරිපත් කරන තොරතුරුය. එහිදී ෆාහියන් හිමි අභයගිරියේ වූ ප්‍රධාන බෝධි වෘක්ෂය සම්බන්ධයෙන් මෙලෙස විස්තර කොට ඇත.

"මේ රටේ පෙර සිටි රජෙක් මධ්‍යම රාජධානියට දූතයකු යවා පත්‍ර බෝධි වෘක්ෂයෙන් බීජයක් ගෙන්වා ගෙන මේ ප්‍රතිමා මන්දිරය සමීපයෙහි රෝපණය කර වූයේය. එයින් නැඟි බෝධි වෘක්ෂය අඩි දෙසිය ගණනක් උසට වැඩුණේය. මේ බෝ රුක ගිනිකොන දෙසට ඇල වූ හෙයින් එය ඉදිරී වැටිය හැකි යැයි බිය වූ රජතුමා එයට ආධාරකයක් වශයෙන් විශාල ස්තම්භයක් පිහිටුවීය..."

ඒ අනුව රාජ්‍ය අනුග්‍රහය සහිතව ඉන්දියාවට දූතයන් යවා ජය ශ්‍රී මහා බෝධියෙන් ගෙන්වා ගත් බෝ ඇටයකින් ඇති වූ බෝ පැළයක් අභයගිරි විහාරයේ රෝපණය කරන ලද බව එම සඳහනෙහි කියවේ. එමෙන්ම එම බෝධියේ ආරක්ෂාව සඳහා පසුකාලීන රජකු විසින් ඉදිකරන ලද ආධාරක ස්ථම්භයක් සම්බන්ධයෙන් ද තොරතුරු පවසයි.

මුල්කාලීන ඇතැම් විද්වතුන් පෙන්වා දෙන ලද්දේ ෆාහියන් හිමි වාර්තා කරන මෙම බෝධි වෘක්ෂය සුප්‍රකට මහා විහාරයේ පිහිටි බෝධි වෘක්ෂය බවටය. ඒ සඳහා ඔවුන් සාධක වශයෙන් උපයෝගී කර ගත්තේ මහාවංශයේ සඳහන් ආකාරයට ඉන්දියාවෙන් ගෙන්වන ලද බෝධි වෘක්ෂය එය වීමත් දැනට අනුරාධපුර නගරයේ වූ පැරණි විහාරාමවල වූ බෝධි වෘක්ෂයන්ගෙන් ශේෂව පවතින එකම බෝධි වෘක්ෂය එය වීමත්ය. නමුත් ඉතිහාසඥයින් බහුතරයකගේ මතය වූයේ එම බෝධි වෘක්ෂය පිහිටිය යුත්තේ ෆාහියන් හිමි වැඩ විසූ බවට සැලකෙන අභයගිරි විහාර සංකීර්ණයේ බවය.

ඒ අනුව අභයගිරිය සම්බන්ධයෙන් කෘතහස්ත පර්යේෂණයක් කළ සේවා සම්මානිත පුරාවිද්‍යා මහාචාර්ය ටී. ජී. කුලතුංග මහතා එම බෝධි වෘක්ෂය පිහිටි ස්ථානය නිවැරදිව දක්වා ඇති ආකාරයක් හඳුනාගත හැකිය. දැනට අභයගිරි විහාර සංකීර්ණය තුළ බෝධිඝර 05 ක නටබුන් හඳුනාගෙන ඇත. මෙම බෝධිඝර 05 න් ෆාහියන් හිමි පවසන්නේ සුප්‍රකට සමාධි බුද්ධ ප්‍රතිමාව අසල බෝධිඝරය බව ඇතැම් විද්වතුන්ගේ මතය විය. එම මතය ප්‍රතික්ෂේප කරමින් කුලතුංග මහතා පෙන්වා දෙන්නේ එම බෝධිය පිහිටියේ ආසනඝරය වශයෙන් වරදවා වටහාගෙන ඇති පළමු බෝධිඝරය වශයෙන් වර්තමානයේ හඳුන්වන ස්ථානයේ බවය.

ෆාහියන් වාර්තාවේ එන සඳහන පුරාවිද්‍යාත්මක වශයෙන් සනාථ කරමින් ෆාහියන් හිමි පවසන බෝධිය පිහිටියේ එම ස්ථානයේ බව පෙන්වා දෙන මහාචාර්ය කුලතුංග පුරාවිද්‍යාත්මක සාධක අනුව අභයගිරියේ පැරණිතම හා වැදගත්ම බෝධීන් වහන්සේ පිහිටියේ එම ස්ථානයේ බව ද පෙන්වා දෙයි. ඒ අනුව ෆාහියන් හිමි පවසන්නේ අභයගිරි විහාර සංකීර්ණයේ වූ ප්‍රධාන බෝධීන් වහන්සේ පිළිබඳවය.

ෆාහියන් හිමි මෙම බෝධීන් වහන්සේ සම්බන්ධයෙන් ගෙනහැර දක්වන කරුණු මගින් එම බෝධි අංකුරය ගෙන ඒම ද රාජතාන්ත්‍රික ක්‍රියාවලියක ප්‍රතිඵලයක් බව හඳුනාගත හැකිය. මෙලෙස බෝධි අංකුරයක් ගෙන ඒමෙන් මහා විහාරය ලබා තිබූ ජනප්‍රසාදය තම විහාරය වෙත යොමු කර ගැනීමට අභයගිරි විහාරය අපේක්ෂා කළ බව පෙනේ. ඒ අනුව මහා විහාරයේ වූ ප්‍රධාන බෝධිය ඉන්දියාවේ ජය ශ්‍රී මහා බෝධියේ දකුණු ශාඛාව වශයෙන් ජනතාව අතර තිබූ පිළිගැනීම නිසා එම විහාරයට ජනතාවගේ මෙන්ම රාජ්‍ය අනුග්‍රහය ද වැඩි වශයෙන් යොමු විය. එබැවින් අභයගිරිවාසීන් රාජ්‍ය අනුග්‍රහය ද සහිතව ඉන්දියාවේ මහා බෝධියේ බීජයක් ගෙන්වා තම විහාරයේ රෝපණය කිරීම තුළින් ජනප්‍රසාදය තම විහාරයට ලබා ගැනීමට උත්සුක වූ බව අනුමාන කළ හැකිය.

ෆාහියන් වාර්තාවේම අභයගිරි ස්තූපය පිහිටියේ බුද්ධ ශ්‍රී පතුල පිහිටි ස්ථානයක බව දක්වා ඇත. රුවන්වැලි සෑයට වඩා විශාලම අභයගිරි ස්තූපය ඉදිකිරීම තුළින් මහා විහාරයේ ප්‍රධාන ස්තූපය වූ රුවන්වැලි සෑයට අභියෝග කිරීමට බලාපොරොත්තු වූ බවක් ද සිතිය හැකිය. තවද මහා විහාරයේ උපෝසථාගාරය ලෝහප්‍රාසාදය වන විට අභයගිරියේ උපෝසථාගාරය රත්නප්‍රාසාදය වීමෙන් ද එය තහවුරු වේ. එමෙන්ම මහා විහාරයේ ථූපාරාමයට අභියෝග කිරීමට වටදාගෙයක් ද සහිතව මණිථූපාරාමය (මණිසෝමාරාමය, ශිලාසොබ්බකණ්ඨක, ලංකාරාමය) ඉදිකර ඇත. ඒ අනුව මහා විහාරය අභිබවා ඒමට අභයගිරි විහාරයට අවශ්‍යතාවක් පැවැති අතර ඒ සඳහා ඔවුන් රාජ්‍ය අනුග්‍රහයද ලබා ගත් බව පෙනේ. නමුත් මහා විහාරික භික්ෂුවක් විසින් රචිත ලාංකේය වංශකතාව වන මහාවංශයේ එම විහාරයට සම්බන්ධයෙන් සඳහන් කර ඇත්තේ අල්ප වශයෙන් වන බැවින් එම බෝධි වෘක්ෂය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට අපහසුය.

ෆාහියන් හිමි දක්වන බෝධිය ගෙන ඒම සඳහා ලද රාජ්‍ය අනුග්‍රහය සම්බන්ධ කරුණ ඉතාමත් වැදගත්ය. නමුත් මෙහිදී එම කාර්ය සඳහා කටයුතු කරන ලද රජුගේ නාමය සඳහන් නොවීම අඩුපාඩුවකි. මෙම බෝධිය රැගෙන ඒමේ කාර්යය අභයගිරි විහාර සම්ප්‍රදායේ ප්‍රධාන අනුග්‍රහකයකු වශයෙන් කටයුතු කළ මහසෙන් රජුගේ (ක්‍රි.ව.274-301) පුත්‍රයා වූ සිරිමේඝවර්ණ (ක්‍රි.ව.301-328) සමයේ සිදුවූ බවට අනුමාන කළ හැකිය. ඒ අනුව මහසෙන් රජු අභයගිරි විහාරයට අනුග්‍රහය දැක්වූ අතර ඔහු මහා විහාරය විනාශ කොට එහි උඳු වපුරවා එහි වූ ගොඩනැගිලි අංග පවා අභයගිරියට ගෙන ගොස් එහි අලුත්වැඩියා කටයුතු කළ බව මහාවංසය සඳහන් කරයි.

පසුව ඔහු මහා විහාරය ප්‍රතිසංස්කරණය කළ නමුත් මහා විහාර සීමාව තුළම ජේතවනාරාමය නම් නව ස්තූපයක් ඉදිකොට එය අභයගිරි නිකායෙන් පැවත ආ පිරිසකට පැවරූ බවත් ශාසන ඉතිහාසයේ සඳහන් වේ. ඔහුගෙන් පසු රජ පැමිණි ඔහු පුත් සිරිමේඝවණ්ණ රජු නැවත මහා විහාරය ගොඩ නංවමින් එයට අනුග්‍රහය දැක් වූ බව සඳහන් කරන නමුත් ඔහුගේ ද වැඩි පක්ෂපාතිත්වයක් අභයගිරි විහාර පාර්ශ්වය වෙත දැක් වූ බව පැහැදිලි වෙයි.

උදාහරණයක් වශයෙන් මේ සමයේ ලක්දිවට ගෙන ආ බුදුන් වහන්සේගේ වැදගත්ම ධාතූන් වහන්සේ වන දන්ත ධාතූන් වහන්සේගේ භාරකාරිත්වය ලබා දී ඇත්තේ අභයගිරි පාර්ශ්වයට බව මහා වංශයේ සඳහන් තොරතුරු අනුව තහවුරු කර ගත හැකිය. එමෙන්ම එසේ ලැබුණු දළදාවේ උරුමය පොළොන්නරු යුගයේ දී පැවැතියේ අභයගිරි පාර්ශ්වයේම කොටසක් වූ උත්තරමූලය සතුව බව වේලයික්කාර අභිලේඛනයෙන් තහවුරු වෙයි. එබැවින් කිත්සිරිමෙවන් රජු දළදාවේ භාරකාරිත්වය පැවරුවේ අභයගිරියට බව තහවුරු වේ. එම නිසා මහසෙන් රජුගෙන් පසුව බලයට පත් රජවරු අභයගිරි විහාරය සමඟ දැඩි මිත්‍රත්වයක් පෙර රජවරුන්ට වඩා දැක් වූ බවක් ද හඳුනාගත හැකිය.

එමෙන්ම සිරිමේඝවණ්ණ රජු ඉන්දියාව සමඟ දූත සබඳතා පැවැත් වූ බවට සාධක පවතී. ඒ අනුව වංහියුං-ට්සේගේ නම් චීන ජාතිකයා රචනා කරන ලද 'හිංට්වොආන්' නම් කෘතියේ දැක්වෙන ආකාරයට ලක්දිවින් බුද්ධගයාවේ වන්දනාවේ ගිය භික්ෂූන්ගේ ප්‍රයෝජනය සඳහා විශාල විහාරාමයක් කරවා තිබූ බව සඳහන් කරයි. එම විහාරාරාමය කරවන ලද්දේ සිරිමේඝවණ්ණ රජු බවත් ඒ සඳහා ඔහු එවකට ඉන්දියානු අධිරාජ්‍යයා සමුද්‍රගුප්ත රජුගෙන් අවසර ලබා ගැනීමට දූතයන් යැවූ බවත් තහවුරු වී තිබේ.

එමෙන්ම ලංකාව හා ඉන්දියාව අතර මේ සමයේ දූත ගමන් සම්බන්ධයෙන් වැදගත් වූ සටහනක් සමුද්‍රගුප්ත රජුගේ අලහාබාද් ශිලා ලේඛනයේ (ප්‍රයාග ශිලා ලේඛනය) දැක් වේ. එම ශිලා ලේඛනයෙහි දැක්වෙන ආකාරයට ශක, කුෂාණ හා සෛංහලික වැනි ඉතා දුර බැහැර ප්‍රදේශ පවා සමුද්‍රගුප්ත රජු යටකරගත් බව දක්වයි. එහි සෛංහලික වශයෙන් දැක්වෙන්නේ ශ්‍රී ලංකාව බව අනුමාන කෙරේ. මේ අලහාබාද් ශිලා ලේඛනය ප්‍රශස්තියක් වන නිසා ලංකාවේ රජු වූ සිරිමේඝවණ්ණ රජු බෞද්ධාගමික අරමුණු උදෙසා යවන ලද දූත සේවය මෙලෙස අතිශයෝක්තියෙන් වර්ණනා කළ බව ඉතිහාසඥයන්ගේ මතය වී ඇත. ඒ අනුව පෙනී යන්නේ සිරිමේඝවණ්ණ රාජ්‍ය සමයේ ලංකාව හා ඉන්දියාව අතර සමීප රාජතාන්ත්‍රික සබඳතා සිදු වූ බවයි.

මේ සමයේ ඉන්දියාවේ ජය ශ්‍රී මහා බෝධිය අසල විහාරයක් කළ බවත් සිරිමේඝවණ්ණ රාජ්‍ය සමයේ ලංකාව හා ඉන්දියාව අතර සිදුවූ රාජතාන්ත්‍රික සබඳතාවල ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී මහා බෝධියේ බීජයක් අභයගිරියේ රෝපණය කිරීමට ලැබුණු බවත් නිගමනය කළ හැකිය. එමෙන්ම ඇතැම් විට මහා බෝධියේ බීජයක් ගෙන ඒමට ගිය දූත පිරිස මහා බෝධිය අසල ස්වභාවය දැක සංඝාරාමයක් ඉදිකිරීමට රජුට යෝජනා කිරීමෙන් අනතුරුව සංඝාරාමය ඉදිකළා ද විය හැකිය.

ඒ අනුව පෙනී යන්නේ ලාංකේය වංශකතාව අනාවරණය නොකරන අභයගිරි විහාරය හා රාජ්‍යත්වය අතර පැවැති අන්තර් සබඳතාවත්, ලංකාව හා ඉන්දියාව අතර බුදු දහම පදනම් කරගෙන දීර්ඝ කාලයක් තුළ සිදු වූ රාජතාන්ත්‍රික සබඳතාවයනුත් මෙම ෆාහියන් වාර්තාව තුළින් හෙළිකරගත හැකි බවයි.

එමෙන්ම අභයගිරියේ වූ ප්‍රධාන බෝධිය සම්බන්ධයෙන් කරන විස්තරයේ දී එම බෝධියේ ආරක්ෂාව සඳහා ඉදිකළ විශාල ශෛලමය ස්තම්භයක් පිළිබඳව විස්තර කර ඇත. ඒ අනුව,

"…. මේ බෝරුක ගිනිකොන දෙසට ඇල වූ හෙයින් එය ඉදිරී වැටිය හැකි යැයි බිය වූ රජතුමා එයට ආධාරකයක් වශයෙන් විශාල ස්තම්භයක් පිහිටුවීය. මේ ස්තම්භය කොතරම් විශාල ද යතහොත් එය වට කිරීමට මිනිස්සු 08 දෙනෙක් හෝ 09 දෙනෙක් අවශ්‍ය වෙති. බෝධි වෘක්ෂයේ කඳට ආධාරකය තැබූ ස්ථානයෙන් ශාඛාවක් පැන නැඟි එම ස්තම්භය පළාගෙන ගොස් පොළොව කරා මුල් ඇදුණේය. මේ බෝධි ශාඛාව කොතරම් මහත් විද යත් එය වට කිරීමට මිනිසුන් හතර දෙනෙක් අවශ්‍ය වූහ. මේ ශාඛාව නිසා ආධාරකස්තම්භය දෙකට පැලී ගිය නමුත් තවමත් බෝරුක දරා සිටින බැවින් එය මෙතෙක් ඉවත් කොට නැත…."

එයින් පෙනී යන්නේ බෝධි වෘක්ෂයේ ආරක්ෂාව සඳහා ස්තම්භයක් ඉදි කර තිබූ බවයි. මෙම බෝධි වෘක්ෂය පිහිටි ස්ථානය කාලයක් තිස්සේම ආසනඝරය වශයෙන් වරදවා වටහාගෙන තිබූ පළමු බෝධිඝරය වශයෙන් සලකනු ලැබේ. මෙම බෝධිඝරය ආශ්‍රිතව මෑතක දී කරන ලද කැණීමකින් වෘත්තාකාර ප්‍රාකාරයට හරියටම ගිනිකොන දෙසට විරුද්ධ පැත්තෙන් උක්ත ගඩොල් ඇතුරුම කැඩී යන පරිදි විෂ්කම්භය අඩි 2 ½ ක පමණ වූ ආවාටයක් දැකිය හැකිය.

එය ෆාහියන් හිමි පවසන ස්තම්භයේ පාදම බව අනුමාන කළ හැකිය. නමුත් ෆාහියන් හිමි පවසන්නේ ගිනිකොන දිශාවෙන් පිහිටි බවයි. ෆාහියන් හිමියන් ඇතැම් අවස්ථාවල දී සාවද්‍ය ලෙස දිශාවන් දක්වා ඇති බැවින් ස්තම්භය වයඹ දෙසින් පිහිටි බව හඳුනාගත හැකිය. ඒ අනුව බෝධි වෘක්ෂයේ ආරක්ෂාව සඳහා ස්තම්භයන් ඉදි කළ බවට ෆාහියන් හිමි පවසන සඳහන ගෘහ නිර්මාණ ශිල්පය සම්බන්ධයෙන් අධ්‍යයනයේ දී ඉතා වැදගත්ය.

මේ කරුණු අනුව පෙනී යන්නේ ක්‍රි.ව.05 වැනි සියවසේ අභයගිරි විහාරයේ ද ජය ශ්‍රී මහා බෝධියේ ශාඛාවක් වැඩ විසූ බවයි. එහෙත් අවාසනාවකට මෙන් එම බෝධි වෘක්ෂයට වූයේ කුමක් දැයි කිසිදු මූලාශ්‍රයකින් හෙළි නොවෙයි. අනුමාන කළ හැක්කේ එය කාලයාගේ ඇවෑමෙන් විනාශ වී යන්නට ඇති බවය.

එනමුත් එම බෝධි වෘක්ෂය වැඩ විසූ බෝධිඝරය අදටත් විද්‍යාමාන වීම පහන් සංවේගයට හේතුවකි.

ඩබ්ලිව්. එම්. එම්. සංජය වීරකෝන්

# අදත් දැයට සෙත සලසන බින්තැන්නේ සයුර



**දෙස් විදෙස් දන මන බොදු හැඟුමින් වඩ වඩාත් ඔප මට්ටම් කැරෙන ශෛලමය නිර්මාණ වන අනුරපුරේ සමාධි පිළිමය මෙන්ම අවුකන බුදු පිළිමයත්, කලාකාමීන්ගේ මන නුවන් සනහාලන නිමැයුමක් වන ඉසුරුමුණි පෙම් යුවළ මෙන්ම සීගිරිය, රන්ගිරි දඹුල්ල වැනි උස්වූ ගිරි මුදුන්වල අපූරුවට කටාරම් කොටා ඇත්තේ අපේ පැරණි ගල් වඩුවන් බව අමුතුවෙන් කිව යුත්තක් නොවේ. මේ සියලුම ශෛලමය නිර්මාණ අබිබවමින් තනි මිනිසකුගේ ශ්‍රමයෙන් නිර්මිත එදා මෙන්ම අදත් දැයට සෙත සලසන අපූරු නිමැයුමක් ලෙස 'බින්තැන්නේ සාගරයේ' (සොරබොර වැවේ) ශෛලමය සොරොව්ව සඳහන් කිරීම යුක්ති යුක්තය.**

ඈත සුනීල ගගනෝදරය සිසාරමින් නිති පියා සලන කාලවර්ණ ජලජ පක්ෂීන් වන කළු හංසයන් සහ දියකාවුන් රැන් පිටින් සොරබොර වැවේ ජල තලාව කරා පහත් වන දසුන චමත්කාරජනකය. මන්ද මාරුතයෙන් සලිත ලලිත වන ජලතලාවේ ඈත කෙළවරක කිසියම් විදෙස් සංචාරක නඩයක් රැගත් මෝටර් බෝට්ටුවක් පාවී යනු පෙනේ. ජල තලාවේ තවත්කෙළවරක සිට හමන දඟකාර මන්ද මාරුතයේ ගැබ්ව ඇත්තේ කිසියම් මල් සුගන්ධයකි. අවට තුරු වදුළු සිසාරා සවනතට ගලා එන්නේ වනගත විහඟ ගීතාවලියකි. ඇත්තෙන්ම මේ සොඳුරු දසුන් මැවෙනුයේ මෙහි මුලින් සඳහන් කළ බින්තැන්නේ සාගරය යන විරුදාවලිය ලද සොරබොර වැව අවට මනරම් පරිසර පසුබිමේය.

අපේ පැරණි වාරි කර්මාන්තයේ මුදුන් මල්කඩක් සේ අවිවාදයෙන්ම පිළිගැනෙන මේ සාගරයක් බඳු ජලාශය පිහිටා ඇත්තේ මහියංගණ නගරයේ සිට කිලෝ මීටරයක් පමණ ඔබ්බෙනි. ඒ නිසාම මහියංගණයේ පිහිටි මහ සෑ රදුන් වැඳ පුදා ගැනීමට නිතිපතා පැමිණෙන සැදැහැවතුන් මෙන්ම විදෙස් සංචාරක නඩ ද මෙහි ළඟාවනුයේ ශ්‍රී ලංකාවේ අන් කිසිම තැනක දක්නට නොලැබෙන , තනිකරම ගල් පර්වතයක් කපා ඒ මැදින් මහ ජල කඳක් ගලා බසින්නට සලස්වා ඇති සොරබොර වැවේ සොරොව්ව දැකබලා ගැනීමට ය. මෙය තනා ඇත්තේ එවකට 'බුලතා' යන නමින් පසිඳුව සිටි යෝධ පුරුෂයකු විසිනි. මෙම වැවේ සෙසු වැව්වල මෙන් සොරොව්වට ජලය යොමු කැරෙන බිසෝ කොටුවක් නොමැත.

සොරබොර වැවේ බැම්ම අඩි 1500 ක් දිගින් යුක්තය. වැවේ ජල ධාරිතාව අක්කර අඩි 11800 කි . අක්කර 1100 ක බිම් ප්‍රමාණයක් අවුරා ජලය පිරී ඇති මෙහි සොරොව් දොරටුව ගල් පර්වතයක් හරහා අඩි පහක් පළලට කපන ලද විස්මිත නිමැවුමකි.

මෙම වැව ක්‍රි.පූ. 2 වැනි සියවසට අයත් බව සැලකේ. එය යුදකාමී ගැමුණු කුමරු එළාර නම්වූ ආක්‍රමණික දමිළ නායකයාට එරෙහිව සටන් දියත් කළ අවධියයි. එදා ගැමුණු කුමාරයා තම දසමහා යෝධ සෙනෙව්වරුන් සමග අනුරාධපුර දෙසට යන ගමනේදී එවකට 'කබඩාලි පුත්‍ර' යනුවෙන් හැඳින්වූ අද 'කෙසෙල්පතන' නමින් ප්‍රකට ස්ථානයේ කඳවුරු ලා සිට ඇත. එදා බලතිරාල හෙවත් 'බුලතා' නමින් හැඳින්වුණ යෝධයා ගැමුණු කුමරුගේ හමුදාවට එකතුවී ඇත්තේ 'උදුම්බර කිරිපට්ටිය' නම් වූ ප්‍රදේශයේ සිට පැමිණි පසුව යැයි කියැවේ.

රාජ්‍ය සේවයට බැඳුණු බුලතාට පැවරුණු රාජකාරිය වූයේ මීමුරේ ගමෙන් මීපැණිද, කිරිපට්ටිය ගමෙන් එළකිරිද, කෙවුල් ගමෙන් බුලත් ද, එවකට පුවක්පිටිය නම්වූ අද පොපේපිටිය නම්වූ ගමෙන් පුවක් ද දෛනිකවම රජ මැඳුරට සැපයීමය. කඳුවලින් වෙන්ව පිහිටි එම ගම්මාන පසුකර යා යුතුව තිබූ ගමන දුෂ්කර විය.

උඩුදුම්බර හා මිණිපේ යා කරන කොස්ගොල්ලකන්ද ඒ අතර විය. එදා මහියංගණ රජමහා විහාරයට එන යන බැතිමතුන් පරිහරණය කළේ එම කන්ද හරහා වූ මාර්ගයයි. දෛනිකවම රජ මැඳුරට යනෙ'න අතරවාරයේදී එම කඳු දෙක අතරින් ගලා බසින ජලකඳ දුටු බුලතා මේ කඳු හරස්කර බැම්මක් බැඳීමට ඉටා ගත්තේය. එමගින් පහළ කුඹුරු අක්කර දහස් ගණනකට ජලය ලබා දිය හැකි බව කල්පනාවට ගත් බුලතා තම රාජකාරියෙන් විවේක ලද හැම විටම එම කාලය කැප කර කඳු දෙක හරහා බැම්මක් බැඳීම ආරම්භ කළේය.

බුලතා වැඩ කළ උදැල්ල සාමාන්‍ය උදැල්ලකට වඩා දස ගුණයක් තරම් විශාල බවද, ඔහු පරිහරණය කළ පස් අදින කූඩයද ඒ හා සමාන විශාල එකක් බව ද කියැවේ. බුලතාගේ බිරිඳද සාමාන්‍ය ගැහැනියකට වඩා විසි ගුණයක් තරම් හයිය හත්තිය ඇති ගැහැනියක වූවාය. ඇයට 'යකඩ ගැහැනිය' යනුවෙන් අන්වර්ථ නාමයක් ද තිබිණ. ඇය හැමදාම තම සැමියා වැව තනන තැනට 'ඇඹුල' රැගෙන ආ මඟ වැටී තිබුණේ ද වන්දනාකරුවන් මහියංගණය වඳින්නට යනෙ'න කඳුකර මාර්ගය ඔස්සේ ය.කොස්ගල කන්ද හරහා දිනකට දෙවරක් එහා මෙහා යන ගමනේදී ඇය කන්ද මතට පඩි පෙළක් බැඳීමට පෙලඹුණා ය.ඒ වන්දනාකරුවන්ගේ පහසුව තකා ය. ඇය දිනපතාම එම කටයුත්තෙහි නියැළුණා ය.

බුලතා විසින් අඩි 40 ක් උස අඩි 11ක් පළල වැව් බැම්ම බැඳීම අවසන් අදියරට ළඟාවූ අවස්ථාවේ එය මීටර 500 ක් තරම් දිගින් යුක්ත විය. තනිකරම කළු ගලක් කපා තැනූ සොරොව්ව පිහිටියේ වැවට තරමක් ඔබ්බෙනි. මේ වනවිට ඔහුගේ බිරිඳද පඩි 2000 කින් යුක්තව පඩිපෙළ නිමවා තිබිණි.

මේ කාලය තුළදීම ගැමුණු රජතුමා එළාර පරදවා ලද විජයග්‍රහණයද සමග මහියංගණ චෛත්‍යය පිළිසකර කරවීය. එදා රජතුමා චෛත්‍යය යළි විවෘත කළ දිනයේ බුලතා තමා විසින් රහසිගතව තැනූ වැව බලන්නට රජතුමාට ඇරැයුම් කළේය.

එසේම තම බිරිඳ නිමවූ පඩිපෙළ නැරඹීමට විහාරමහා දේවියට ද ආරාධනා කර තිබේ. වැව සහ පඩිපෙළ විවෘත කිරීමෙන් පසු ප්‍රසාදයට පත් රජතුමා සිය සළුව උනා බුලතාට අන්දවා ඔහුට සිය හමුදාවේ ඉහළ තනතුරක් ප්‍රදානය කළ බව ද, විහාරමහා දේවිය තම ආරක්ෂක කාන්තා ඒකකයේ නායිකාව ලෙස බුලතාගේ බිරිඳ පත් කළ බවඳ සඳහන් වේ.


නිමල් විජයතුංග

# කටාරම

නැගෙනහිර පළාතට අයත් අම්පාර දිස්ත්‍රික්කයේ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ලාහුගල ග්‍රාමසේවා වසම තුළ පිහිටි නීලගිරි සෑය පිහිටියේ ලාහුගල රක්ෂිත අභයභූමිය තුළය. ලාහුගල ග්‍රාමයේ සිට හැඩඔය හරහා ඇති අතුරු මාර්ගයේ කි.මී.4.5 ක් පමණ ගමන් කිරීමෙන් මෙම ස්ථානයට ළඟා විය හැකිය. නීලගිරි ස්තූපයේ ඉතිහාසය සොයා බලන විට මුහුණපාන ප්‍රධාන ගැටලුව වන්නේ එම නාමයෙන් නිර්මාණය කරන ලද ස්තූපයක් පිළිබඳව මෙරට කිසිදු පැරැණි මූලාශ්‍රයක සඳහන් නොවීමය. පුරාණ රෝහණ රාජ්‍යයට අයත් මෙම ස්තූපය මහාවංශයේ 24 වැනි පරිච්ඡේදයේ සඳහන් වන කාවන්තිස්ස රජතුමා විසින් කරවන ලද මහානුග්ගල ස්තූපය ලෙස පිළිගැනේ.



නිලගිරි සෑය කැණීම් කිරීමෙන් පසු



ධාතු සහිත මැටි බඳුන නැවත පෙර පරිදි සැකසූ පසු

නිලගීරි සෑය කැණීම් ඇරඹීමට පෙර

# නීලගිරියෙන් හමු වූ ධාතූන් වහන්සේලා බුදුන්ගේ ද?

**මහාවංශයේ සඳහන් මහානුග්ගල චෛතිය මෙය බව එල්ලාවල මේධානන්ද හිමියෝ "මාගම රාජධානිය" ග්‍රන්ථයේ විවරණයක යෙදෙමින් සනාථ කරති. නීලගිරි සෑය සහ ඒ අවට ආරාම සංකීර්ණයේ ඉතිහාසය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා ලිඛිත සාධක විරල වුවද විහාරය අවට සිදු කරන ලද ගවේෂණ මඟින් බ්‍රාහ්මී අක්ෂර සහිත සෙල්ලිපි කිහිපයක් සොයාගනු ලැබීය.**

විශේෂයෙන් නීලගිරි සෑයට මීටර් 200ක් පමණ ඊසාන දෙසින් හමු වී ඇති ශිලා ලේඛනයක මෙම ප්‍රදේශයේ පැවති පබ්බත විහාරයක් සම්බන්ධව තොරතුරු අනාවරණය කරයි. එම ලිපියට අනුව "උත්තර සීවලී පවත" වෙත භාතිකාභය තිස්ස රජුගේ බිසව වූ චූලසීවලී බිසව කරන ලද පූජාවක් සම්බන්ධ තොරතුරු සඳහන් කරයි. මෙම ලිපිය මඟින් සඳහන් කර ඇති කරුණු නීලගිරි සෑයට සෘජු සම්බන්ධතාවක් නොමැති වුව ද භාතිකාභය තිස්ස රාජ්‍ය සමය තුළ මෙම ප්‍රදේශය ක්‍රියාකාරී ස්ථානයක්ව පැවති බව එමඟින් හෙළි වේ.

නීලගිරිය ආශ්‍රිත ගවේෂණ කටයුතු මඟින් හඳුනා ගන්නා ලද ක්‍රි.ව. තෙවැනි සියවසට පමණ අයත් සෙල්ලිපියක් මඟින් තහවුරු කරන්නේ "වියහවිය" නමැති පුද්ගලයෙකු විසින් කුලබරිය මහා විහාරයට අරියවංශ සූත්‍ර දේශනය පැවැත්වීම සඳහා වාර්ෂිකව කහවණු විස්සක් පරිත්‍යාග කළ බවය.

මෙම ලිපියෙහි සඳහන් "කුලබරිය මහවිහර" යන නාමය බොහෝවිට අතීතයේදී නීලගිරි සෑයට ව්‍යවහාර කරන ලද නම විය හැකිය. ඒ අනුව වත්මන් නීලගිරිය නමින් හඳුන්වන මෙම ප්‍රදේශය ක්‍රිස්තු වර්ෂ ආරම්භයේදී කුලබරිය ප්‍රදේශය නමින් ව්‍යවහාර වන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. එහි ඉදි වූ මහා විහාරය (වෙහෙර) කුලබරිය මහ වෙහෙර නමින් ප්‍රකට වන්නට ඇතැයි විශ්වාස කළ හැකිය.

නීලගිරි දාගැබට උතුරු දෙසින් ඇති විහාරාරාම සංකීර්ණයේ නටබුන්, සෙල්ලිපි හා නටබුන් වූ ස්තූප, කටාරම් සහිත ගල්ලෙන් හා ගල්කොරි ද නීලගිරි හෙළ ආශ්‍රිත කටාරම් හා සිතුවම් සහිත ලෙන් හා අනෙකුත් පුරාවිද්‍යාත්මක සාධක ද ඇතුළු තවත් බොහෝ පුරාවිද්‍යා සාධක පෙන්නුම් කරන්නේ නීලගිරිය පුරාවිද්‍යා ස්ථානය එවකට විශාල ප්‍රදේශයක පැතිරුණු විහාරාරාම සංකීර්ණයක් බවයි. නීලගිරි සෑය හා ඊට සම්බන්ධ ආරාම සංකීර්ණය හැරුණු විට ඒ සමීපයේ ඇති නීලගිරි හෙළ හා ආසන්නයේ පිහිටි බෞද්ධාගමික විහාර හා නටබුන් ලාහුගල, කොටවෙහෙර, මඟුල් මහා විහාරය, හුලංනුගේ තරුලෙන්ගල විහාරය, කින්නරගල පුරාවිද්‍යා සංකීර්ණය, ශාස්ත්‍රවෙල විහාරය, කුඩිම්බිගල ගල්ලෙන් ආශ්‍රිත විහාර සංකීර්ණය යන බෞද්ධ විහාරාරාම මෙම ප්‍රදේශයේ තිබූ ප්‍රධාන ආරාම සංකීර්ණයෝය.

මෙම සියලු සාධක මෙන්ම නීලගිරි දාගැබේ ඉදිකිරීම් ලක්ෂණ, කැණීම් මඟින් ස්තූප මළුවේ තිබී මතුකරගත් ඡත්‍ර ගල්වල සාධක, ඡත්‍ර දණ්ඩ 2ක සාධක, ස්තූපය මුදුනේ දැනටත් දක්නට ලැබෙන ස්තූපය හා ස්තූප මළුවෙන් දැනට අනාවරණය කරගෙන ඇති සිරිපතුල් ගල් හා ආසන ගල් පෙන්නුම් කරන්නේ මෙම ස්තූපය ක්‍රිස්තු පූර්ව අවධියේ ඉදිකරන ලද්දක් බවය. පසුකාලීනව එහි ප්‍රතිසංස්කරණයන් සිදු වී ඇති බවද අනාවරණය වේ.

2011 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ මහාචාර්ය රාජ් සෝමදේව මහතාගේ මූලිකත්වයෙන් නීලගිරි සෑය අවට ගවේෂණයක් සිදු කර තිබේ. 2012 දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ගවේෂණ අංශය මඟින් නීලගිරි සෑය අවට ගවේෂණ කටයුතු සිදු කර ඇති අතර කැණීම් අංශය මඟින් 2011 ජූලි මස 05 වැනි දින සිට 2014 අගෝස්තු මස 24 දින දක්වා කාලය තුළ අදියර කිහිපයක් යටතේ කැණීම් සිදු කර ඇත. අඩි 611ක දැවැන්ත වට ප්‍රමාණයකින් හා අඩි 75ක පමණ උසකින් යුත් (දැනට ශේෂව ඇති උස) ස්තූපයේ ගරා වැටී තිබූ ගර්භය හා මළුවෙන් කොටසක් පමණක් කැණීම් කර මතුකරගෙන ඇත. වර්තමානයේ මෙම ස්තූපය සංරක්ෂණය කරමින් පවතී.

ක්‍රිස්තු පූර්ව අවධියේ ඉදිකරන්නට ඇතැයි අනුමාන කරන නීලගිරි ස්තූපය විශාල කරමින් ක්‍රි.ව.1, 2 සියවස් කාලයේදී කංචුකයක් එනම් වැස්මක් නිර්මාණය කර ඇත. කාලයාගේ ඇවෑමෙන් මෙම කංචුකය දිරාපත්වී පදාස වශයෙන් ගරාවැටී තිබේ. කංචුකය නිර්මාණය කිරීමේදී එයට දායකවූ පිරිසට ස්තූපය අභ්‍යන්තරයේ එනම් මධ්‍යයේ ධාතු කරඬු තැන්පත් කිරීමේ අවස්ථාවක් නැතිවී යයි.

එයට හේතුව ස්තූප ගර්භ අභ්‍යන්තරයේ පූජ්‍ය වස්තු තැන්පත් කිරීමට නම් ගර්භය සිදුරු කරගෙන ස්තූපයේ මධ්‍යයට පිවිසීමට සිදුවීමයි. එම නිසා ඒ සඳහා භාවිතා කර ඇති උපක්‍රමය වී ඇත්තේ ඔවුන් නිර්මාණය කළ කංචුකයේ තැනින් තැන කුඩා කුටි නිර්මාණය කර ඒවා තුළ පූජ්‍ය වස්තු තැන්පත් කිරීමයි.

ඒ අනුව ධාතූන් සහිත කරඬු හා වෙනත් පූජ්‍ය වස්තු මැටි හා ශිලාමය බඳුන් තුළ තැන්පත් කර එම බඳුන් කංචුකයේ නිර්මාණය කරන ලද කුටිවල තබා එම කුටිය වැසෙන පරිදි ඉහළින් ගල් පුවරුවක් යොදා තිබිණි.

රෝහණ රාජධානිය බිඳවැටීමෙන් අනතුරුව රාජ්‍ය අනුග්‍රහය නොමැති වීම හා මෙම ප්‍රදේශය ජන ශූන්‍ය වීම නිසා මෙම ස්තූපය වල් බිහිවී ගරාවැටීමට ලක්ව ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් සිදු කරන ලද කැණීම මඟින් බලාපොරොත්තු වූයේ ස්තූපය මත වර්ධනය වී තිබූ වෘක්ෂ හා පැළෑටි ද ගරා වැටී තිබූ කොටස්ද ඉවත්කර සංරක්ෂණය සඳහා ස්තූපය මතුකර ගැනීමයි. මෙම කාර්යය අතරතුරදී ගරා වැටී තිබූ පස් හා ගඩොල් අතර තිබී රන් කරඬු 39ක්, පළිඟු කරඬු 245ක්, වීදුරු කරඬු 12ක් හා රිදී කරඬු 4ක් වශයෙන් ධාතු කරඬු 300ක් ලැබී ඇත. මෙරට ස්තූප කැණීමකින් හමුවූ වැඩිම ධාතු කරඬු සංඛ්‍යාව මෙය වේ.

මෙම සියලුම කරඬු ධාතූන් වහන්සේලා තැන්පත් කිරීම උදෙසා නිර්මාණය කර ඇති බව ඒවායේ නිර්මාණ ලක්ෂණවලින් සනාථ වේ. ධාතු කරඬු හමුවන අවස්ථාව වන විටත් ගරාවැටීමේ ක්‍රියාවලිය හේතුවෙන් විවෘත වී ඒවායේ තිබූ ධාතූන් කොටස් අස්ථානගතව පැවැතිණ. ඒ අතරින් ආරක්ෂිතව පැවැති කරඬු කිහිපයක පමණක් ධාතූන් වහන්සේලාගේ කොටස් ආරක්ෂා වී තිබිණි. මෙම ධාතූන් කොටස් කරඬු තුළ තැන්පත් කිරීමේදී ඒ සඳහා විශේෂ ආවරණයක් නිර්මාණය කර ඇත. එනම් ධාතු බහාලීම සඳහා ධාතු මංජුසා නිර්මාණය කර තිබීමය.



බුදුන් වහන්සේගේ යැයි අනුමාන කරන ධාතූන් වහන්සේලා තැන්පත් කර තිබූ මැටි බඳුන හමුවන අවස්ථාවේ තිබූ අයුරු

විවිධ හැඩයෙන් නිර්මාණය කර ඇති මෙම ධාතු මංජුසා නිර්මාණය කිරීම සඳහා අමුද්‍රව්‍ය ලෙස භාවිත කර ඇත්තේ රන් හා රිදී ලෝහයන් සහ පාෂාණය. මෙම ධාතු මංජුසා අතර පෙට්ටි හැඩයේ මංජුසා 7ක්, සිරිපතුල් හැඩයේ මංජුසා 3ක්, සුර වර්ගයේ මංජුසා 10ක්, අර්ධ ගෝලාකාර පියන් සහිත මංජුසා 4ක්, පාෂාණමය මංජුසා 1ක් හා පත්‍ර එතීම් 1ක් වශයෙන් වර්ග 28ක් දක්නට ලැබේ.

මෙම ධාතු මංජුසා 28 අතරින් සුවිශේෂී මංජුසා 4ක් හඳුනාගත හැකිය. ඉන් ත්‍රිත්වයක් සිරිපතුල හැඩයට නිර්මාණය කර ඇති අතර, අනෙක් මංජුසාව සතරැස් පෙට්ටියක් ආකාරයෙන් නිමවා එහි පියන මධ්‍යයේ සිරිපතුල ලාංඡනයක් කොටා ඇත. මෙම මංජුසා 4 අතරින් සිරිපතුල් සංකේතය කොටන ලද මංජුසාව වැදගත් වන්නේ එහි තිබී ධාතූන් යැයි අනුමාන කළ හැකි අස්ථි හෝ දන්ත කොටසක් ලැබී ඇති නිසාය.

එය පියන් දෙකකින් සමන්විත වන අතර උඩු පියන මි.මී.18×මි.මී.18 ප්‍රමාණයෙන් ද, යට පියන මි.මී.16.5×මි.මී.16.5 ප්‍රමාණයෙන් ද යුක්තය. මෙම පියන් ද්විත්වයේම මධ්‍යයේ තිත් සලකුණු උපයෝගී කරගනිමින් වම් සිරිපතුලක ලාංඡනය නිර්මාණය කර ඇත. මෙම මංජුසාවේ උඩු පියන විවෘත කළ පසු එහි ඇතුළත තවත් කුඩා මංජුසාවක් තබා තිබෙන ආකාරය හඳුනාගත හැකි වේ. එලෙස ඇතුළත තිබූ කුඩා මංජුසාව ද පියන් ද්විත්වයකින් යුක්තව රනින් නිමවා තිබිණි.

එහි උඩු පියන මි.මී.9.5 × මි.මී.9.5 ප්‍රමාණයෙන් ද, යට පියන මි.මී.9 × මි.මී.9 ප්‍රමාණයෙන් ද යුක්තය. විශාල මංජුසාවේ මෙන් මෙම මංජුසාවේ පියන් ද්විත්වයේ ද සිරිපතුලක ලාංඡනය තිත් සලකුණු මඟින් දක්වා තිබේ.

එම කුඩා මංජුසාව විවෘත කළ පසු ඒ තුළ සුදු පැහැයට හුරු අස්ථි හෝ දන්ත කොටසක් තැන්පත් කර තිබෙන බව හඳුනාගත හැකි විය. මෙම ධාතූන් කොටසේ අනන්‍යතාවය හඳුනාගැනීමේදී සාහිත්‍ය මූලාශ්‍රවලින් පිටිවහලක් නොලැබේ. එයට හේතුව නීලගිරි ස්තූපය පිළිබඳව හෝ එහි නිදන් කර තිබූ ධාතූන් වහන්සේලා පිළිබඳව කිසිදු මූලාශ්‍රයක සඳහන් නොවීමය. මේ බව ඉහතදී සඳහන් කරන ලදී.

නීලගිරි ස්තූපයේ උක්ත සඳහන් කරන ලද ධාතු මංජුසාවේ තිබී හමුවූ ධාතූන් වහන්සේගේ අනන්‍යතාවය හඳුනාගැනීමේදී සාහිත්‍ය මූලාශ්‍රවලින් පිටිවහලක් නොලැබෙන බැවින් ඒ සඳහා පුරාවිද්‍යා සාධක විමසා බැලීම වැදගත් වේ. මෙහිදී ප්‍රධාන කරුණු 7ක් පිළිබඳව අවධානය යොමු කරන ලදී.

බුද්ධ පරිනිර්වාණයෙන් පසු බුද්ධ රූපය මානව රූපීව නිර්මාණය කිරීමට පෙර අවධියේ (ක්‍රි.පූ 6- ක්‍රි.ව.1) උන් වහන්සේ සංකේතවත් කිරීම සඳහා සිරිපතුල් ලාංඡනය භාවිත කර ඇත. සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු සියවස් කිහිපයක් ගතවනතුරු භාරතීය හා ලක්දිව කලා ශිල්පීන් බුද්ධ ප්‍රතිමාව නිර්මාණය නොකරන ලද අතර, එයට ආගමික හා සමාජීය කරුණු රාශියක් බලපා ඇත. මෙම අවධියේදී බුදුන්වහන්සේ සංකේතවත් කිරීම සඳහා විවිධ සංකේත භාවිතා කර තිබේ.

එහිදී ශ්‍රී පතුල, වජ්‍රාසනය, ධර්මචක්‍රය, බෝධි වෘක්ෂය, පද්මය හා ඡත්‍රය යන සංකේත වැදගත් වේ. භාරතයේ සාංචි තොරණ, භාරුත් කැටයම්, අමරාවතී චෛත්‍ය කැටයම් හා නාගර් ජුනීකොණ්ඩ කැටයම් අතර මෙම බුද්ධ සංකේත භාවිතය හඳුනාගත හැකිය. එහිදී සාංචි කැටයම් අතර දක්නට ලැබෙන බුදුන් වහන්සේ තව්තිසා දෙව්ලොව සිට සංකස්ස පුරයට වැඩම කිරීමේ කැටයමේදී හිණිමගේ ඉහළ හා පහළ සිරිපතුල යොදා බුදුන් සංකේතවත් කර තිබේ. එසේම නැගෙනහිර තොරණේ මධ්‍ය පුවරුවේ දැක්වෙන මහබිණික්මන කැටයමෙහි කෙළවර සිරිපතුල් ද්විත්වයක් යොදා සිද්ධාර්ථයන් පැවිදි වූ බව දක්වා ඇත. මෙරටින් එබඳු ආකාරයේ බුද්ධ සංකේත යොදා ගන්නා ලද කතා ප්‍රවෘත්ති නිරූපිත කැටයම් පුවරු නොලැබුණ ද ක්‍රිස්තු පූර්ව අවධියේ ආරම්භ වූ බොහෝ විහාරස්ථාන අසල සිරිපතුල් ගල් හා ආසන ගල් දැකගත හැකි වේ.

එහිදී උතුරු කන්තරෝඩය, වල්ලිපුරම් හා මුලතිව් යන ස්ථානවල ද, දකුණේ යටාල, තිස්සමහාරාමය හා සිතුල්පව්ව යන ස්ථානයන්ගේ ද, නැගෙනහිර තිරියාය, රජගල, දිගාවැව, ලාහුගල, කොටවෙහෙර හා මඟුල් මහා විහාරය යන ස්ථානවල ද, අනුරාධපුරයේ මිහින්තලය, අභයගිරිය, ජේතවනය හා රුවන්වැලි සෑය ඇතුළු බොහෝ ස්ථානයන්ගේ ද සිරිපතුල් ගල් දැකගත හැකි වේ. මෙරට කලාකරුවා සිරිපතුල භාවිත කරන ලද්දේ බුදුන් වහන්සේ සංකේතවත් කිරීමටද යන්න සොයා බැලීමේදී පුරාණ මාගම රාජධානියට අයත් තිස්සමහාරාමයේ කිරින්දෙන් ලැබී ඇති ගිරි ලිපිය වැදගත් වේ. එම ලිපියේ සඳහන් වන්නේ බුදුන් වහන්සේගේ අපරිමිත ගුණ අසා පැහැදුනු උපරාජ නාග නැමැත්තකු කිරින්දේ ගලේදී මිථ්‍යා දෘෂ්ටිය අතහැර බුදුන් සරණ ගිය බවයි.

මෙම උපරාජ නාග යනු ඉළනාග රජු (ක්‍රි.ව.35-43) බව මැන්දිස් රෝහණධීර මහතා පෙන්වා දී ඇත. මෙම ලිපියේ ඇති අක්ෂර පේළි හතරට ඉදිරියෙන් දෙපතුල් සටහන කොටා ඇත. ලිපියේ අන්තර්ගත කරුණු හා සැසඳීමේදී මෙම සිරිපතුල

බුදුන් වහන්සේ සංකේතවත් කිරීම සඳහා භාවිත කරන ලද බව පැහැදිලිය. ඒ අනුව ඊට සමකාලීන හා පූර්ව අවධිවලදී මෙරට ශිල්පීන් සිරිපතුල් සංකේතය බුදුන් සංකේතවත් කිරීම උදෙසා භාවිතා කර ඇති බව තහවුරු වේ.

ධාතු කොටස ලැබී ඇති ධාතු මංජුසාවේ උඩු පියනේ හා යටි පියනේ ද, එය තුළ ඇති කුඩා මංජුසාවේ උඩු පියනේ හා යටි පියනේ ද කොටා ඇත්තේ බුද්ධ සංකේතයක් වූ ශ්‍රී පාදයයි. සිරිපතුල් සංකේත සහිත මෙම මංජුසා නිර්මාණය කරන ලද කාලය සොයා බැලීමද මෙහිදී වැදගත් වේ.

ස්තූපයේ ගරාවැටුණු කංචුකයේ බඳුනක තිබී හමුවූ දැව කැබැල්ලක් ඇමෙරිකාවේ බීටා ඇනටලික් ආයතනයට යවා කරන ලද කාබන් 14 විද්‍යාත්මක කාල නිර්ණය මඟින් එම කංචුකය නිර්මාණය කරන ලද අවධිය ක්‍රි.ව. 1 සියවස බව (ක්‍රි.ව.70-230 අතර පරාසයක) තහවුරු වී ඇත.

1. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම ධාතු මංජුසාවේ සිරිපතුල් සලකුණ බුද්ධ ප්‍රතිමාව නිර්මාණයට පෙර අවධියේ භාවිත කරන ලද බුද්ධ සංකේතයක් බවය. එවන් බුද්ධ සංකේතයක් යෙදූ මංජුසාවක තැන්පත් කරන්නට ඇත්තේ බුදුන් වහන්සේගේ ධාතූන් කොටසක් විය යුතුය.

2. ධාතූන් හමුවූ සිරිපතුල් ලාංඡනය සහිත ධාතු මංජුසාව හා සිරිපතුල් හැඩයේ ධාතු මංජුසා ත්‍රිත්වය තැන්පත් කර තිබී ඇත්තේ එකම මැටි බඳුනක් තුළය. උක්ත සඳහන් කරන ලද විශේෂ ධාතු මංජුසා 4ම (සිරිපතුල් හැඩයේ මංජුසා 3 හා සිරිපතුල කොටන ලද ධාතු සහිත මංජුසාව) හමු වී ඇත්තේ එකම මැටි බඳුනක් තුළ තිබියදීය. මෙම මැටි බඳුන හමුවන අවස්ථාව වන විටත් පූර්ණ වශයෙන් බිඳී තිබූ අතර, එම කොටස් අතර තිබී එම ධාතු මංජුසා 4 හා ධාතු කරඬු හමු වී තිබේ. බුද්ධ සංකේත ලෙස භාවිත සිරිපතුල හැඩැති සහ සිරිපතුල කොටන ලද මෙම මංජුසා 4ම එකම බඳුනක් තුළ තැන්පත් කර තිබීම තුළින් පැහැදිලි වන්නේ එම බඳුනේ තැන්පත් කරන ලද ධාතු මංජුසා තුළ තිබූ ධාතූන්ගේ විශේෂත්වයක් නිසා බව අනුමාන කළ හැකිය.

3. නීලගිරි ස්තූපය කැණීමෙන් රන් කරඬු 39ක් හමු වී ඇති අතර, ඉන් 13ක්ම හමු වී ඇත්තේ මෙම ධාතු කොටස සහිත මංජුසාව තැන්පත් කර තිබූ මැටි බඳුනේ තිබියදීය. නීලගිරියෙන් ලැබී ඇති රන් කරඬු වලින් 1/3 ක් හමු වී ඇත්තේ එකම මැටි බඳුනක තිබියදීය. රන් කරඬු විශාල ප්‍රමාණයක් එකම බඳුනක් තුළ තැන්පත් කිරීමෙන් එම බඳුන තුළ ඇති වස්තූන්ට විශේෂ අගයක් ලබාදෙන්නට ඇති බව අනුමාන කළ හැකිය. එවැනි විශේෂත්වයකින් යුක්ත බඳුනේ තිබෙන්නට ඇත්තේ සුවිශේෂී උත්තමයකුගේ ධාතූන් විය යුතුය.

සාහිත්‍ය මූලාශ්‍රයන්හි නීලගිරි ස්තූපය පිළිබඳව සඳහන් නොවුව ද බුදුන් වහන්සේගේ ධාතූන් ඇතැයි අනුමාන කළ හැකි මෙම ස්තූපය මෙරටින් හමුවී ඇති අනෙක් ස්තූපයන් සමඟ සැසඳීමේදී එම ස්තූපයන්ට වඩා විශේෂත්වයකින් යුක්ත ද යන්න විමසා බැලිය යුතුය.

4. මෙරට ස්තූප කැණීමකින් හමුවූ වැඩිම ධාතු කරඬු ප්‍රමාණය වාර්තා වන්නේ නීලගිරි ස්තූපයෙනි. මෙරට පුරා විසිරී පවතින පැරැණි ස්තූප රාශියක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මඟින් කැණීම් කර ඇති අතර එහිදී වැඩිම ධාතු කරඬු ප්‍රමාණයක් හමු වී ඇත්තේ නීලගිරි ස්තූපයෙන් බව පැහැදිලිය.

මීට පෙර එම වාර්තාවට හිමිකම්පෑවේ කෑගල්ලේ දැලිවල කොටවෙහෙරය. ඉන් ධාතු කරඬු 178ක් ලැබී ඇත. නීලගිරි ස්තූපයෙන් ධාතු කරඬු 300ක් හමු වී තිබේ. මෙම ධාතු කරඬු සියල්ල හමුවී ඇත්තේ දැලිවල කොට වෙහෙරෙහි මෙන් ස්තූප ගර්භ අභ්‍යන්තරය කැණීමෙන් නොවීම අවධානය යොමු කළ යුතු කරුණකි. ඒ අනුව නීලගිරි ස්තූපයේ කඩා වැටී තිබූ කංචුකයේ කොටස් ඉවත් කිරීමේදී පමණක් මෙම ධාතු කරඬු හමු වී තිබීම තුළ මතුවන කුතුහලය වන්නේ එහි අභ්‍යන්තරයේ තව කොපමණ ධාතු කරඬු ප්‍රමාණයක් තැන්පත්ව ඇත්ද යන්නයි. ඉන් පැහැදිලි වන්නේ නීලගිරි ස්තූපය මෙරට ස්තූප නිර්මාණ ඉතිහාසයේ සුවිශේෂී ස්තූපයක් බවය. එසේ ධාතු කරඬු අති විශාල ප්‍රමාණයක් මෙහි තැන්පත් කරන්නට යෙදුණේ ස්තූපය තුළ බුදුන් වහන්සේගේ ධාතූන් තැන්පත් කර ඇතැයි යන විශ්වාසය හා භක්තිය නිසා විය හැකිය.

5. මෙරට ස්තූප මළුවක කැණීමකින් හමුවූ වැඩිම සිරිපතුල් ගල් (බුද්ධ සංකේත) ප්‍රමාණය හමුවී ඇත්තේ මෙම ස්තූපයෙනි.

නීලගිරි ස්තූප කැණීම් ව්‍යාපෘතියේදී එහි පළමු පේසා වළල්ලේ සිට මීටර 3ක් පිටතට ස්තූපය වටා මළුව පාදාගෙන ඇත. එම ප්‍රමාණය සම්පූර්ණ මළුවෙන් 1/20ක ප්‍රමාණයකි. එම කොටස තුළ තිබී විවිධ ප්‍රමාණයෙන් යුක්ත සිරිපතුල් ගල් 50ක් හමු වී තිබේ.

මෙරට මහා ස්තූපයන් ලෙස සැලකෙන රුවන්වැලිසෑය, අභයගිරිය හා ජේතවන වන ස්තූපවල මළුව කැණීම්වලින් පවා මෙපමණ සිරිපතුල් සංඛ්‍යාවක් හමු වී නොමැත. ඒ අනුව බුද්ධ සංකේතයක් වූ සිරිපතුල් ගල් 50ක් ස්තූපය උදෙසා පූජා කර තිබෙන්නට ඇත්තේ මෙම ස්තූපයේ බුදුන් වහන්සේගේ ධාතූන් ඇතැයි යන විශ්වාසය නිසා විය හැකිය.

6. මෙරට ස්තූප මළුවක කැණීම් කිරීමෙන් හමුවූ වැඩිම ආසන ගල් (බුද්ධ සංකේත) ප්‍රමාණය හමුවී ඇත්තේ ද මෙම ස්තූපයෙනි. මෙම ස්තූප මළුවේ කරන ලද කැණීම් මඟින් විවිධ ප්‍රමාණයේ ආසන ගල් 12ක් හමුවී තිබේ. මේ අනුව නීලගිරි ස්තූපය වටා බුද්ධ සංකේත ලෙස භාවිතා වූ සිරිපතුල් ගල් හා ආසන ගල් 62ක් තැන්පත්කර තිබීම තුළින් පෙනී යන්නේ ද මෙම ස්තූපයේ ඇති විශේෂත්වයයි.

7. මෙරට ස්තූප මළුවක් කැණීමෙන් හමු වූ වැඩිම ඡත්‍ර ගල් සංඛ්‍යාවක් හමු වී ඇත්තේ නීලගිරි සෑයෙනි. මෙතෙක් කළ සීමිත කැණීමෙන් මේ වන විට ඡත්‍ර ගල් 11 ක සාධක හමු වී තිබේ. ඡත්‍රවල පූර්ණ සිදුරු දක්නට නැත. ඒවා ඡත්‍රාවලියකට අයත් ඒවා නොවන බව පැහැදිලිය.

ස්තූපයේ ප්‍රධාන පිළිසකර අවධි 4 ක් හඳුනාගෙන ඇත. ඡත්‍ර දණ්ඩ දෙකක සාධක මළුවේ දක්නට ලැබේ.

ස්තූපයට ඇති අසීමිත ගෞරවය නිසා එකවර වෙන් වෙන් වශයෙන් ඡත්‍ර කිහිපයක් ඔසවා තබන්නට ඇති බව අනුමාන කළ හැකිය. එනම් බහු ඡත්‍ර ක්‍රමයක් පවතින්නට ඇත.

මේ සියලුම පුරාවිද්‍යා සාධක විශ්ලේෂණාත්මකව සලකා බැලීමේදී නීලගිරි ස්තූපයේ කැණීමෙන් හමු වූ සිරිපතුල් ලාංඡනය සහිත ධාතු මංජුසාවෙන් හමු වූ ධාතූන් වහන්සේ බුදුන් වහන්සේගේ යැයි අනුමාන කළ හැකි බව පෙනේ.

කේ. උදේනි අරුණසිරි
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
රත්නපුර

කටාරම
සංස්කරණය
බන්ධුල ගුණරත්න
'කටාරම', දිනමිණ -ලේක් හවුස්, අංක 35, ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
katarama@lakehouse.lk

2021 අප්‍රේල් 01 බ්‍රහස්පතින්දා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරණ ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.